# යහපත් කර්ම අයහපත් කර්ම

නිශ්චිතවම කර්මය යනු
කුමක්ද ?



පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික හිමි

# යහපත් කර්ම! අයහපත් කර්ම!
# නිශ්චිතවම කර්මය යනු කුමක්ද?

සම්පාදකඃ

පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික හිමි

පරිවර්තකඃ

මන්ජරී පීරිස්

# යහපත් කර්ම! අයහපත් කර්ම! නිශ්චිතවම කර්මය යනු කුමක්ද?

**පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික හිමි**

**පරිවර්තක: මන්ජරී පීරිස්**

# යහපත් කර්ම! අයහපත් කර්ම!
# නිශ්චිතවම කර්මය යනු කුමක්ද?

# පටුන

**ප්‍රස්තාවනාව**

**පරිවර්තකගේ සටහන**

**එසේ නම් කර්මය යනු කුමක්ද?**

**කර්මය සහ නැවත ඉපදීම**

**සාමුහික කර්ම සහ වෙනත් වරදවා වටහා ගැනීම්**

**පරිශිෂ්ටය I: බුදුපියාණන් වහන්සේට අනුව කර්මය සහ නැවත ඉපදීම**

**පරිශිෂ්ටය II: සුනාමිය, බෞද්ධ ධර්මයට අනුව දෘෂ්ටියක්**

## ප්‍රස්තාවනාව

ඔබ කර්මය යන වචනය අන්තර්ජාලයේ සඳහන් ඇමසන් ග්‍රන්ථවලට ඇතුළත් කළහොත්, එය උදේ‍යා්ගිමත් මාතෘකාවක් බවට සැකයෙන් තොරව එහි ප්‍රතිඵල ඔප්පු කරනු ඇත. එහි කර්මය මාතෘකා කර ගත් ග්‍රන්ථ 100කට වඩා ඇති අතර, ඒවායින් බොහොමයක් කර්මය යනු කුමක්ද යන්න පැහැදිලි කිරීම අරමුණු සේ දක්වා ඇත. මෙම මාතෘකාවලින් විනිශ්චය කරමින්, කර්මය ජ්‍යොතිෂය, දෙවියන් පිළිබඳ දැනීම, යහපත් ලිංගිකත්වය, අනාගතය පිළිබඳව අනාවැකි කීම, පරිණාමය වන ආත්මය සහ තවත් බොහෝ දේ සමග ලෙහෙසියෙන් ගැළපේ. එය පැරණි ප්‍රඥාවක්, ශක්තියක්, විද්‍යාවක්, එක් විශ්ව ශක්තියක් සහ ඔබේ අතීතය සහ අනාගතය සුවපත් කිරීමේ මාර්ගයකි. මගේ අවධානයට ලක් වූ මාතෘකා දෙකක් නම්, The Good Karma Divorce: Avoid Litigation, Turn Negative Emotions into Positive Actions, and Get On with the Rest of Your Life, The Light worker's Guide to Everyday Karma: A Karmic Savings and Loan Series Book යනාදී ග්‍රන්ථයි. බෞද්ධ කතුවරුන්ද කර්මය පිළිබඳව බොහෝ ග්‍රන්ථ නිපදවා ඇත. නවතම එකක් වන්නේ Pa-auk Sayadawගේ The Workings of Kamma යන ග්‍රන්ථයයි.

කතුවරයා ඔහුගේ ග්‍රන්ථයේ ආරම්භයේදී මෙසේ පවසයිඃ ''කර්මය සහ කර්මයේ ප්‍රතිඵල පිළිබඳ ක්‍රියාකාරිත්වය ඉතා ගැඹුරුය. එනිසා එය දැකීම දුෂ්කර වන අතර, කර්මය සහ එහි ප්‍රතිඵල පැහැදිලිව දැක ගත හැක්කේ බුදුපියාණන් වහන්සේගේ දැනුමෙන් පමණි. උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට හෝ අර්හත් වහන්සේලාටවත් එම දැනුම නොමැත.'' පෙනෙන ආකාරයට මෙයින් අධෛර්යමත් නොවී, මෙම කතුවරයා පිටු 362කින් යුක්ත ප්‍රස්ථාර සහ 30කට වැඩි රූප සටහන්, සටහන් දහසකට ආසන්නව, පිටු 46කින් යුක්ත අවසන් සටහන්වලින් සම්පූර්ණවූ ග්‍රන්ථයකින් කර්මය පැහැදිලි කරයි. ඔහු ත්‍රිපිටකය කෙරෙහි ආකර්ෂණය වේ. නමුත්, ඊටත් වඩා, විසුද්ධිමග්ග, අභිධම්මමත්ථසඞස වැනි විවරණ සහ කෘති පිළිබඳව වඩා යොමුවී ඇත.

ඔබ දැන් අතේ තබාගෙන ඇති ග්‍රන්ථය වෙනස් ප්‍රවේශයක් ගනී. එය බුදුපියාණන් වහන්සේ ලෙසත්, බුදුදහම යනුවෙන් හැඳින්වෙන ධර්මයේ නිර්මාතෘවරයා ලෙසත්, ඉතිහාසය දන්නා සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ විසින් සුවිශේෂී ලෙස පැහැදිලි කළ කර්මය සහ එයට සම්බන්ධ නැවත ඉපදීම පිළිබඳ ධර්මය ආවරණය කරයි.

බුදුපියාණන් වහන්සේගෙන් ශතවර්ෂ ගණනාවකට පසු උන්වහන්සේගේ ඉගැන්වීම් විවිධ චින්තකයින් සහ විද්වතුන් විසින් විවරණයට භාජනය කරන ලදී, ඒවා අර්ථනිරූපණය කර, පුළුල් කරන ලදී. විවරණය කරන ලදී. වර්ධනය කරන ලදී. මෙම ක්‍රියාවලිය තුළදී, ගැඹුරු අර්ථයන් සමහර විට ඒවායෙන්

පිටතට ගෙන අපැහැදිලි කරුණු පැහැදිලි කර ඇත. නමුත් බොහෝ විට මෙම පාඨ බුදුපියාණන් වහන්සේගේ මුල් ඉගැන්වීම් අපැහැදිලි සහ විකෘති කර ඇත. එමෙන්ම සමහර විට අසාධාරණ නිගමනවලට ඒමට ද හේතු වී ඇත. මෙය කර්මය සහ නැවත ඉපදීම සම්බන්ධයෙන් විශේෂයෙන්ම සත්‍යයක් වී ඇත.

වර්තමානයේ බෞද්ධ ලේඛකයන් විසින් කර්මය සහ නැවත ඉපදීම පිළිබඳව රචිත බොහෝ ග්‍රන්ථවල සඳහන් තොරතුරු සැබැවින්ම බුදුපියාණන් වහන්සේ දේශනා කළ අදහස් සමගින්, සමහර විට උන්වහන්සේගේ පරිනිර්වාණයෙන් ශතවර්ෂ ගණනාවකට පසු වර්ධනයවූ අදහස් සමග ඒකාබද්ධ කළ ඒවා වේ. එසේම ඒවා සියල්ලක්ම බුදුපියාණන් වහන්සේගේ වචන මෙන් ඉදිරිපත් කර ඇත. මෙය ඇකිනාස් හෝ කියර්කෙගාඩ් උපුටා දක්වමින් ඒවා ජේසුස් වහන්සේට ආරෝපණය කිරීම හා සමාන වේ. බොහෝ විට බුදුපියාණන් වහන්සේගේ කර්මය සහ නැවත ඉපදීම පිළිබඳ ඉගැන්වීම් ලෙස සැබැවින්ම ඉදිරිපත් කරනුයේ, සැබැවින්ම උන්වහන්සේගේ පරිනිර්වාණයෙන් වසර 400කට හෝ 500 කට පසු මිලින්දපඤ්හ යේ සඳහන්, එනම්, උන්වහන්සේගෙන් වසර 900කට පසු ජීවත්වූ බුද්ධඝෝස හිමියන් හෝ උන්වහන්සේගෙන් වසර 1400කට පසු ජීවත්වූ, අභිධම්මත්ථසඞ්ග ය රචනය කළ අනුරුද්ධ හිමියන්ගේ අදහස්ය. මෙම පසුකාලීන අදහස් අනිවාර්යයෙන්ම වැරදි යැයි මින් අදහස් නොකෙරේ. ඒවායෙන් සමහරක් බුදුපියාණන් වහන්සේ පැවසූ කරුණු පැහැදිලි කිරීමට හෝ ඒවායේ තර්කානුකූල නිගමනවලට එළඹීම සඳහා උපකාර වේ. නමුත්, ඒවා සියල්ලම විද්වත් සම්ප්‍රේක්ෂණයේ සහ උපකල්පනයේ ප්‍රතිඵලයක් වන අතර, බුදුපියාණන් වහන්සේ ඉගැන්වූයේ උන්වහන්සේගේ බුද්ධත්වය අවබෝධකර ගැනීමේ අත්දැකීම්වල ප්‍රතිඵලවලිනි. එනිසා බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වල පැරණිතම සහ වඩාත්ම විශ්වාසදායක වාර්තාව වන පාළි ත්‍රිපිටකයෙන් ධර්ම ඉදිරිපත් කර ඇති ආකාරයේ පදනම මත මෙම ග්‍රන්ථය කර්මය සහ නැවත ඉපදීම පිළිබඳව සොයා බලනු ඇත.

ග්‍රන්ථයේ සඳහන් කුඩා සංඛ්‍යා එහි පසුපස ඇති සටහන් වෙත යොමු කෙරේ. තද වර්ණයෙන් ඇති විශාල සංඛ්‍යා 1වන පරිශිෂ්ටයේ සඳහන් බුදුපියාණන් වහන්සේගේ දේශනාවලට යොමු කරයි. එයින් ග්‍රන්ථයේ ඇති කරුණු තවදුරටත් පැහැදිලි කරයි. පරිශිෂ්ට දෙක යනු 2004දී ඉන්දියානු සාගරයේ ඇති වූ සුනාමියත් සමගම එම ඛේදවාචකය බෞද්ධ දෘෂ්ටි කෝණයකින් පැහැදිලි කිරීමට උත්සාහ දරමින් ලියන ලද ලිපියකි. මෙම ලිපියට විශාල ප්‍රමාණයක අවධානයක් ලැබුණු අතර, අන්තර්ජාලය තුළ පුළුල් ලෙස නැවත පිටපත් වීම හෝ සඳහන් වීම සිදුවිය. එනිසා එය මෙහි නැවත පිටපත් කිරීම ප්‍රයෝජනවත් වේයැයි මම සිතුවෙමි.

අත්පිටපත කියවා බොහෝ නිවැරදි කිරීම් කරමින් ප්‍රයෝජනවත් යෝජනා ඉදිරිපත් කළ ආනන්දජෝති හිමියන්ට මම ස්තුතිවන්ත වෙමි. සෑම විටම මෙන්, උන්වහන්සේ මා ලියූ සෑම දෙයටම  අනිවාර්යයෙන්ම එකඟ නොවී, ඔහුගේ ප්‍රායෝගික දැනුම සහ අවබෝධය යොදමින් සංස්කරණය කිරීමට තරම් ඔහුගේ කාලය පරිත්‍යාග කර ඇත.

මෙම ග්‍රන්ථය අවධානයෙන් සහ කැපවීමෙන් සිංහල බසට පරිවර්තනය කළ මන්ජරී පීරිස් මෙණෙවියට සහ මෙම කාර්යයේදී ඇයට උපකාර කළ සුජීව දිලංගන මහතාට ස්තුති කරන්නට කැමැත්තෙමි.

පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික හිමි

ඕස්ට්‍රේලියාව

## පරිවර්තකගේ සටහන

මෙම ග්‍රන්ථයේ කතෘ, පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික ස්වාමීන්වහන්සේ එය සිංහලට පරිවර්තනය කිරීමට මට අවසර දීම පිළිබඳව මම උන්වහන්සේට මගේ ප්‍රණාමය පුද කරමි.

විවිධ සහාය ලබා දුන්, මහරගම වජිරඥාණ ධර්මායතනවාසී, පූජ්‍ය ගබ්බෙල වජිරඥාණ ස්වාමීන් වහන්සේට සහ පූජ්‍ය වෙරදූවේ මහින්ද ස්වාමීන් වහන්සේටත් ප්‍රණාමය පුද කරමි.

එසේම එම ග්‍රන්ථයේ අවසාන සෝදුපත් කරදුන් සරත් සෝමරත්න මහතාට ස්තුතිවන්ත වෙමි.

මෙම ග්‍රන්ථය පරිවර්තනය  කරන්නට මට විවිධ සහාය දුන් සුජීව දිලංගන සහ ජීවක මෛත්‍රී යන මහතුන්ටත් ස්තුතිවන්ත වෙමි.

සිංහල බසින් ධර්ම ග්‍රන්ථ පරිහරණය කරන පින්වතුන්ට මෙම ග්‍රන්ථය ප්‍රයෝජනවත් වේයැයි මම විශ්වාස කරමි.

මගේ මේ වෑයම හුදෙක් ධර්ම දානයයි.

මන්ජරී පීරිස්

86, දහම් මාවත,

මහරගම

# බුදුදහමේ කර්මය සහ නැවත ඉපදීම

කර්මය යනු බුදුදහමේ කේන්ද්‍රීය සංකල්පවලින් එකකි. එසේ තිබියදීත්, එය බෞද්ධයන් විසින්ම සහ බෞද්ධ නොවන අයද වරදවා වටහාගෙන ඇති එකකි. මෙම වරදවා වටහා ගැනීම් සාමාන්‍යයෙන් කර්මය පිළිබඳව සිදු කරන ඕනෑම දේශනාවක ආරම්භයේදීම පැහැදිලිව පෙනේ.

# හින්දු ධර්මය, ජෛන ආගම සහ බුදුදහම

පොදු මතය නම් කර්මය සහ නැවත ඉපදීම පිළිබඳව පැරණි ඉන්දියාවේ විශ්වීය ලෙස විශ්වාස කළ බවත්, බුදුපියාණන් වහන්සේ ඒවා සැකයක් නැතිව හුදෙක්ම විශ්වාස කර උන්වහන්සේගේ ධර්මයට ඒවා අන්තර්ගත කළ බවත්ය. සාක්ෂිවලින් පෙන්වා දෙන්නේ වෙනත් ලෙසකින්ය. පැරණිතම හින්දු ධර්ම ග්‍රන්ථ වන වේදයෙන් කර්මය හෝ නැවත ඉපදීම පිළිබඳව කිසිම දැනුමක් පෙන්වා දෙන්නේ නැත. වෛදික චින්තනයට අනුව පුද්ගලයෙකුගේ දෛවය තීරණය වන්නේ ඇතැම් චාරිත්‍ර සහ දෙවිවරුන් විසින්ය, කර්මයෙන් නොවේ. එසේම මරණයේදී පුද්ගලයෙකු නැවත නොඉපදේ, ඔහු හෝ ඇය පියවරුන්ගේ ලෝකයට (පිත්‍රලෝක), එනම් දිව්‍යලෝකයට යනු ඇත. 'සතපථ' බ්‍රාහ්මණ වැනි මුල් කාලීන හින්දු ධර්ම ග්‍රන්ථවල අනෙක් කණ්ඩායම, කර්මය යන වචනය භාවිත කරන්නේ වෛදික පූජා පැවැත්වීමට සහ අදාළ චාරිත්‍ර සිදු කිරීමේ අර්ථයෙන් පමණි.

පළමුවෙන්ම කර්මය සහ නැවත ඉපදීම පිළිබඳව හෝ එවැනි දෙයක් සම්බන්ධයෙන් සඳහන් කළ, ජෛන නොවන සහ බෞද්ධ නොවන ග්‍රන්ථ වන්නේ මුල්කාලයේ උපනිෂද් වන බ්‍රහදාරණ්‍යක, ඡන්දොග්‍ය සහ කෞෂීතකි යන උපනිෂද් වේ. නමුත් මෙම ධර්මවල මත ජෛන සහ බෞද්ධ මතවලින් බොහෝ සෙයින් වෙනස් වේ. උදාහරණ වශයෙන්, කෞෂීතකි යේ සඳහන් කරන්නේ මිනිසුන් මිය ගිය විට, ඔවුන් සියල්ල යන්නේ දිව්‍යලෝකයට ප්‍රවේශය වූ සඳ වෙතට බවයි. එහිදී ඔවුන් සමත් කිරීම පිණිස ප්‍රශ්නයක් අසනු ලැබේ. මෙම ප්‍රශ්නයට පිළිතුරු දිය නොහැකි වුවහොත්, ඔවුන් වර්ෂාව බවට පත්වී පොළොවට පතිත වේ. ඊට පසු ඔවුන්, ඔවුන්ගේ කර්මයට අනුව, පණුවන්, කෘමීන්, මත්ස්‍යයන්, කුරුල්ලන්, සිංහයන් හෝ මිනිසුන් බවට පත් වේ. ප්‍රශ්නයට පිළිතුරු දිය හැකි අය දිව්‍යලෝකයට ඇතුළු වී බ්‍රහ්මයා ඉදිරියට යති. (කෞ. 1.2). මෙහි දී කර්මය යනුවෙන් අදහස් කරන්නේ සදාචාරාත්මක හේතුව ද නැතහොත් වෛදික චාරිත්‍ර නිසි ලෙස ඉටු කිරීම ද යන්න පැහැදිලි

නැත. නමුත්, බොහෝ විට දෙවැන්න එහි අර්ථයයි. ඡන්දොග්‍ය ඊට සමාන දෙයක් උගන්වයි. නමුත් මළවුන් වර්ෂාව ලෙස පොළොවට පතිත වන විට ඒවා ශාක බවට පත් වේ. ඉන් අනතුරුව ඒවා මිනිසෙකු අනුභව කරන විට, ඔහුගේ ශුක්‍රාණු ලෙස ඔහුගේ බිරිඳගේ කුස තුළට ගොස්, නව ජීවියෙකු බිහි වේ. සිත් ගන්නා කරුණ නම්, ''මෙම (ඉගැන්වීම) මීට පෙර බ්‍රාහ්මණයන් දැන නොසිටීම'' බව ඡාන්දොග්‍ය සඳහන් කරයි. වෙනත් වචනවලින් කිවහොත්, එය වෛදික සම්ප්‍රදායට අලුත් දෙයක් විය. සදාචාරාත්මක හේතුකාරක යන අර්ථයෙන්, කර්මය යනු ආරම්භකයන්ට පමණක් හෙළි කළ යුතු රහසිගත ඉගැන්වීමක් (බ්‍ර. 3.2.) බව බ්‍රහදාරණ්‍යක උපනිෂද් යාඥවල්ක්‍ය පැහැදිලි කරයි. නමුත් එවැනි අදහසක් රහසක් ලෙස තබා ගත යුත්තේ ඇයි? එය මුල් වෛදික චින්තනයේ කොටසක් නොවූ නිසාත්, යාඥවල්ක්‍ය ට පොදුවේ සම්මත නොවන චෝදනාවලින් වැළකී සිටීමට අවශ්‍ය වූ නිසාත් විය හැකිය. වෙනත් උපනිෂද්වල කර්මය සහ නැවත ඉපදීම පිළිබඳව සඳහන් නොවේ. 'කඨා' උපනිෂද් ඇත්ත වශයෙන්ම පවසන්නේ පුද්ගලයෙකු මිය ගිය පසු ඔවුන්ට කුමක් සිදුවේද යන්න කිසිවෙකු නොදන්නා බවයි. (කඨ. 1.20.)

එසේම උපනිෂද්වල කාලය සැලකිල්ලට ගැනීම ද අවශ්‍ය වේ. බොහෝ විද්වතුන් සලකන්නේ අද වන විට බ්‍රහදාරණ්‍යක උපනිෂද් ක්‍රි. පූ. 800 හෝ 700 ට පෙර සිට තිබූ බවයි. නමුත් මෙම දින නියම කිරීම් ඉතා අවිනිශ්චිතය. එසේම බුදුපියාණන් වහන්සේ වැඩ විසූ කාලය පිළිබඳ දිනද ඒ හා සමානවම අවිනිශ්චිතය. නමුත්, බොහෝ විද්වතුන් සලකන්නේ බුදුපියාණන් වහන්සේ වැඩ විසුවේ ක්‍රි. පූ. 5වන ශතවර්ෂය තුළදී බවයි.

නමුත්, යම් ආකාරයක කර්මයක් විසින් තීරණය කරනු ලබන යම් ආකාරයක නැවත නැවත උපත සහ මරණය පිළිබඳ මුල්ම සඳහන, බුදුපියාණන් වහන්සේට පෙරත් පැවතියද, බුදුපියාණන් වහන්සේගේ කාලය තුළ මෙම අදහස් විශ්වීයව හෝ ඊටත් වඩා පුළුල් ලෙස පිළිගෙන ඇති බවට තිබෙන සාක්ෂි, ඉහත දුටු පරිදි, ඒත්තු නොයයි. බෞද්ධ ග්‍රන්ථ විසින්ම මේ පිළිබඳව වැඩිදුර සාක්ෂි ඉදිරිපත් කරයි. බුදුපියාණන් වහන්සේගේ කාලයේ සිටි වඩාත් ප්‍රමුඛ පෙළේ ගුරුවරුන් හය දෙනෙකු විසින් කරන ලද ධර්මවල සාරාංශයක් සාමඤ්ඤඵල සූත්‍රයේ සඳහන් වේ. ඒවායෙන් එකක පමණක් කර්මයේ ස්වරූපය පිළිබඳව උගන්වා ඇත (D.I,52-59). ඒ හා සමානවම, කර්මය සහ නැවත ඉපදීම ප්‍රතික්ෂේප කළ අයගේ බෞද්ධ සහ ජෛන ග්‍රන්ථ දෙකෙහිම නිතර විවේචන තිබේ. උදාහරණයක් වශයෙන්, එවකට සිටි ජනප්‍රිය ගුරුවරයෙකු වූ මක්ඛලි ගෝසාල ඉගැන්වූයේ, ''කර්මයක් නැත, ක්‍රියාවක් නැත, උත්සාහ කිරීමේ ප්‍රයෝජනයක් නැත'' යනුවෙනි (A.I,286).

සමහරු කර්මය සහ නැවත ඉපදීම, සාපේක්ෂව අලුත් සහ සාම්ප්‍රදායික නොවන අදහස් ලෙස ප්‍රතික්ෂේප කළ අතර, පායාසි කුමරු වැනි අනෙක් අය

තර්කානුකූල හේතූන් මත ඒවා බැහැර කළහ. ඒ සඳහා පාදක කොට කටයුතු කිරීමට සාක්ෂි නොමැති හෙයින්, මෙම උගත්, සැකයෙන් යුක්ත පුද්ගලයා නිගමනය කළේ: ''වෙනත් ලෝකයක් නැත, ඕපපාතිකව ඉපදෙන ජීවීන් නැත, යහපත් හෝ අයහපත් ක්‍රියාවල කිසිදු විපාක හෝ ප්‍රතිඵල නැත'' යනුවෙනි (D.II,316). පායාසි කුමරු පිළිබඳව ජෛන ධර්ම ග්‍රන්ථවල ද සඳහන් වී ඇති නිසා, ඔහු තරමක් ප්‍රසිද්ධවී සිටිය පුද්ගලයෙකු විය හැකිය.

කර්මය පිළිබඳ පැරණිතම සහ පැහැදිලි සඳහන ජෛන ධර්ම ග්‍රන්ථවල ඇත. ජෛන ආගම බුදුදහමට වඩා සමහර විට දශකයක් හෝ ඊට වඩා වැඩි කාලයකට පෙර සිට පැවතුණි. එහි නිර්මාතෘ මහාවිහාර සහ ඔහුගේ ඉගැන්වීම් පිළිබඳව නිතර බෞද්ධ ධර්ම ග්‍රන්ථවල සඳහන් වී ඇත. කෙසේ නමුත්, කර්මය පිළිබඳ ජෛන ධර්මය, බෞද්ධ ක්‍රමයට වඩා බෙහෙවින් වෙනස්ය. උදාහරණ වශයෙන් ජෛන ආගමට අනුව, සෑම ක්‍රියාවක්ම - චේතනාන්විත වුවත් හෝ එසේ නොමැති වුවත්, එයින් කර්මයක් ඇති වේ. කර්මය යනු ආත්මයට එල්බගෙන සහ බර කර තබනවාට වඩා ද්‍රව්‍යමය වස්තුවක් ලෙස විශ්වාස කෙරේ. එසේම ජෛන ආගම සත්‍යය ලෙස පිළිගන්නේ එක ජීවිතයකින් ඊළඟ ජීවිතයකට ගමන් කරන ආත්මයක් ලෙසයි. නමුත්, බුදුදහම මෙය ප්‍රතික්ෂේප කරයි.[1]

කෙසේ වෙතත්, කර්මය සහ නැවත ඉපදීම පිළිබඳ ජෛන ධර්මවලින් බලපෑම් ඇතිවන්නට ඇති බව නිසැකය. නමුත්, උන්වහන්සේ ඒවා හුදෙක් නිවැරදි හෝ වලංගු යැයි නොපිළිගත් බව පැහැදිලිය. එසේම උන්වහන්සේ ඒවා සිතා නොබලා හෝ අවිචාරවත්ව පිළිගත්තේ නැත. මහාවිහාරට කර්මය සහ නැවත ඉපදීම පිළිබඳව දැකීම් මාත්‍රයක් පමණක් තිබෙන්නට ඇති නමුත්, බුදුපියාණන් වහන්සේට, බුද්ධත්වයට එළඹීමෙන් ඒ පිළිබඳව සම්පූර්ණ අවබෝධය තිබුණි.

පළමු ශතවර්ෂයේ ආරම්භය ඇති වන විට කර්මය සහ නැවත ඉපදීම පිළිබඳ විවිධ අදහස් හින්දු ආගමට එකතු වෙමින් පැවතුණි. නමුත්, එදා සහ පසුව මෙම අදහස් කිසිම ආකාරයකින් විශ්වීයව පිළිගත්තේ නැත. හින්දු ධර්මය සාමාන්‍යයෙන් පෙර සංකල්ප අත්නොහරිමින් නව සංකල්ප විකාශනය කර ගත්හ, නැත්නම් අවශෝෂණය කර ගත්හ. එයින් අදහස් කරන්නේ එය සමහර විට ප්‍රතිවිරෝධී හෝ පරස්පර විරෝධී ධර්ම රාශියක් ඉදිරිපත් කළ බවයි. හින්දු ආගමේ කර්මය සහ නැවත ඉපදීම පුළුල් ලෙස පිළිගත් විට පවා, ඔවුහු තරමක් නොගැළපෙන ලෙස එය එකට එකතු කළහ. දෙවිවරුන්ට මිනිසුන්ගේ කටයුතුවලට මැදිහත්විය හැකි සහ මැදිහත්වන බව, යම් විශේෂිත දෙවිකෙනෙකුට ඇති භක්තිය (භක්ති) තුළින් දෙවියන් ගැලවීමට මඟපාදන බව, පූජනීය ගංගාවල දිය නෑමෙන් නපුර සෝදා දැමිය හැකිය යන්න, යම් චාරිත්‍ර ඉෂ්ට කිරීමෙන්, නිශ්චිත පූජනීය සිද්ධස්ථාන නැරඹීමෙන් හෝ

වාරනාසි වෙත යාමෙන් විමුක්තිය සහතිකයෙන් ලැබෙන බව යන විශ්වාස, කර්මය පිළිබඳ මතය අවලංගු කරයි.

හින්දු ආගමේ සමහර ගුරුකුල දෛවයට (දයිව) අනුග්‍රහ දක්වමින් කර්මය ප්‍රතික්ෂේප කළහ. තවත් සමහරු දරා සිටියේ පුද්ගලයෙකුගේ දෛවය කාලය (කාල), සහජ ස්වභාවය (ස්වභාව), අහඹුව (වද්‍රච්ඡ) විසින් තීරණය කරන බවයි. නොඑසේනම්, කලින් නියම වන (භාවිවශාත) බවයි. ශවෙතාස්වතර උපනිෂදය කර්මය ඇතුළු විවිධ පැහැදිලි කිරීම් ප්‍රතික්ෂේප කරයි. එයට හේතුව වශයෙන් ඔවුන් දක්වන්නේ අවසානයේ ඒ සියල්ල දෙවියන් (Ss.v.2-3) විසින් පාලනය කරනු ලැබීම වශයෙනි. ධර්මශාස්ත්‍රයේ බොහෝ උද්ධෘතයන්හි කර්මය පිළිබඳව සඳහන් වන අතර, එය මගහැරිය හැකි විවිධ ක්‍රම සියල්ල නිර්දේශ කරයි. හින්දු ආගමේ ඇති විශාල ආකර්ෂණය වන්නේ එයට පුළුල් පරාසයක මනෝභාවයන්, ආවේගයන් සහ විදහා පෑම් තිබීමයි.

## කර්මය යන වචනයේ අර්ථය

බුදුපියාණන් වහන්සේගේ කර්මය යන ධර්මය ගැන විමසා බැලීමට පෙර එම වචනය ගැන විමසීම ප්‍රයෝජනවත් වේ. කම්ම යන පාළි වචනය සහ සමාන කර්මය යන සංස්කෘත වචනය ක්‍රමයෙන් මූලයෙන් හට ගෙන ඇත. එහි අර්ථය වැඩ කිරීම, ක්‍රියා කිරීම, සිදු කිරීම, ඉටු කිරීම හෝ කිරීම යනුවෙන් අදහස් වේ. පූර්ව බෞද්ධ බ්‍රාහ්මණ සාහිත්‍යයේ එහි අර්ථය වූයේ වෛදික චාරිත්‍ර සහ වාරිත්‍ර නිවැරදිව සිදු කිරීම, ඒවායේ නිසි ක්‍රියාකාරිත්වය මත විශ්වාසය රඳවමින් ඒවායේ සඵලත්වය සිදු වීමයි. බුදුදහමේ සහ ජෛන ආගමේ සාමාන්‍ය කතා ව්‍යවහාරයෙන් අදහස් වන්නේ මෙම වචනවල සුපුරුදු අර්ථයෙන් වැඩ කිරීමයි, ක්‍රියා කිරීමයි, හෝ කිරීමයි. මේ අනුව ජීවානෝපායක් හෝ වෘත්තියක් යනු කම්මන්ත, ගොවිතැන් කිරීමයි. එනම්, කෘෂිකර්මාන්තය කිරීම කසකම්මයි, අඤ්ජලිකම්ම යනු යම් කෙනෙකු වෙනුවෙන් ගෞරවය දැක්වීමයි, සහ කම්මකාර යනු කම්කරුවෙකු හෝ ශ්‍රමිකයෙකු වේ. නමුත්, බුදුදහමේ තාක්ෂණික යෙදුමක් සේ කර්මය යනු චේතාන්විත මානසික, වාචික සහ ශාරීරික ක්‍රියාවන්ට සදාචාරමය වැදගත්කමක් සහ ප්‍රතිවිපාකයක් ඇත යන අදහසයි. නිවැරදිව කිවහොත්, කර්මය යනු සදාචාරාත්මකව වැදගත් චේතාන්විත ක්‍රියාවකි. විපාක යනු එවැනි ක්‍රියාවක ප්‍රතිවිපාක හෝ ප්‍රතිඵලයයි. මේ කාලයේ යම් කෙනෙකුට ඍණාත්මක හෝ අකැමැති දෙයක් සිදු වූ විට ඔහු පවසන්නේ :''එය මගේ නරක කර්මයයි.'' වඩාත් නිවැරදිව, ''මම නරක විපාක විඳිමි'' හෝ ''මම නරක කර්මවල ප්‍රතිඵල අත්විඳිමින් සිටිමි'' යැයි කියමින්ය.

යම් කෙනෙකු වෙත පිහියක් රැගෙන ඉදිරියට යාම යහපත් හෝ අයහපත් ක්‍රියාවක් දැයි අසමින් කර්මයේ අදහස, චේතනාව හෝ ඉච්ඡාව අවබෝධ කර

ගත හැකිවනු ඇත. බොහෝ අය එය අයහපත් යැයි කියනු ඇත. සැබැවින්ම, බොහෝ විට, එය අපරාධයක් ලෙස ඔවුන් සලකනු ඇත. නමුත්, බෞද්ධයෙකු මෙසේ පිළිතුරු දෙනු ඇතඃ ''එය ක්‍රියාවේ ස්වභාවය අනුව රඳා පවතී.'' පිහිය භාවිත කරන්නා රෝගියෙකුගේ ජීවිතය බේරා ගැනීමට ශල්‍යකර්මයක් කරන ශෛල්‍ය වෛද්‍යවරයෙකු විය හැකිය, හෝ අඳුරු පටු පාරක අවාසනාවන්ත ගොදුරකට පත්වූවෙකුට පහර දෙන අපරාධකරුවෙකු, විය හැකිය. ක්‍රියාවකට එහි සාදාචාරමය ගුණාංගය ලබා දීමේ අභිප්‍රාය එයයි.

## කර්මානුරූප නියතිවාදය

බුදුපියාණන් වහන්සේ කර්මය පිළිබඳව පැවසූ දේ පැහැදිලි කිරීමට පෙර, කර්මය නොවන දේ විමසා බලමු. කර්මය පිළිබඳව වඩාත් පුළුල් ලෙස වරදවා වටහා ගත් දෙය නම් පුද්ගලයෙකුට, ඔහු හෝ ඇය අතීතයේදී සදාචාරාත්මක හෝ සදාචාර විරෝධී ක්‍රියාවන් හේතු කර ගෙන ඔහුට හෝ ඇයට සිදුවන්නේ යැයි යන අදහසයි. කකුලක් කැඩීම, සහකරු හෝ සහකාරිය විසින් රවටනු ලැබීම හෝ දුප්පත් වීම, යන මේ සියල්ල අතීතයේදී සදාචාර විරෝධී ක්‍රියා සිදු කිරීම නිසා සිදු වූයේ යැයි ස්ථිර ලෙස ප්‍රකාශ කරනු ලැබේ. අනෙක් අතට, ආකර්ශණීය මුහුණක් තිබීම, ලොතරැයියක් හෝ තරගයක් ජයග්‍රහණය කිරීම, හිතූ පරිදිම යහපත් යම් දෙයක් කර ඇති නිසා විය හැකිය. කෙනෙකුගේ සමාජ තත්ත්වය, කෙනෙකු උපන් රට, කෙනෙකුගේ සෞඛ්‍ය තත්ත්වය යනාදී මේ සියල්ල සිදුවන්නට ඇත්තේ අතීත කර්මය නිසා විය හැකිය. එවැනි ප්‍රකාශයන් බුදුදහමට ඍජුවම පටහැනි වේ. බුදුපියාණන් වහන්සේට අනුව ව්‍යාජ සහ අනර්ථකාරී අදහස් තුනක් තිබේ - සිදුවන සෑම දෙයක්ම සිදුවන්නේ අතීත කර්ම (පුබ්බෙකතාහෙති) නිසාය යැයි විශ්වාස කිරීම, සියල්ල සිදුවන්නේ උත්තරීතර දෙවියෙකුගේ (ඉස්සරනිම්මානහෙතු), කැමැත්ත නිසා බවත්, සහ සිදුවන සියල්ල හේතුවක් නොමැතිව සිදුවන්නේ (අහෙතු-අප්පච්චයා) යැයි යන විශ්වාසයත්ය. **(1)**

මෙම සෑම විශ්වාසයක්ම ප්‍රතික්ෂේප කිරීමට සාධාරණ හේතු ඇත. නමුත්, අපි අතීත කර්ම පිළිබඳව කරුණ විමසා බලමු. යම් පුද්ගලයෙකුට ඔහු අතීතයේදී කළ දේවලට අනුව සියල්ල සිදුවේ නම්, එවිට තර්කානුකූලව ඔහුගේ මුළු ජීවිතයම කලින් තීරණය කළ දෙයක් විය යුතුයි. එවිට ඔහුගේ මුළු ජීවිතයම කලින් තීරණය කර ඇති නිසා ඔහුට කිසිවක් කිරීමට හෝ වැළකී සිටීමට නොහැකි වනු ඇත. ඔවුන් යහපත් නම්, එය සිදුවන්නේ ඔවුන්ගේ තේරීම හෝ උත්සාහය නිසා නොවේ. පෙර ජීවිතයේ සිදු කළ යම් දෙයක් නිසා සහ නැවත නැවත ඒ ආකාරයට සිදු කිරීමෙනි. මෙය සත්‍යයක් නම්, බුදුපියාණන් වහන්සේගේ ආර්ය අෂ්ටාංගික මාර්ගය ඉගැන්වීමේ අවශ්‍යතාවක් නොවනු ඇත. ඒ අතීත කර්මයට එය කළ නොහැකි වූයේ නම්, ඒ මාර්ගයේ එක් පියවරක් හෝ පුහුණු කිරීම කළ නොහැකි බැවිනි. කර්මානුකූල නියතිවාදයේ

වරදවා වටහා ගැනීම යහපත් හෝ අයහපත් සෞඛ්‍යයට සම්බන්ධ වන උදාහරණයක් ගනිමු. මිනිසුන් විවිධ රෝග සහ කායික පීඩාවලින් දුක්විඳින්නේ ඔවුන් අතීත භවයන්හිදී යම් අකුසලයක් කර ඇති නිසා යැයි වඩා හොඳින් ධර්මය දැනගත යුතු භික්ෂූන් ඇතුළුව මිනිසුන් පැහැදිලි කරනු අපි බොහෝ විට අසා ඇත්තෙමු.

පුරුද්දක් ලෙස බොරු කීම ස්වරාලයේ පිළිකා ඇතිවීමට, ධර්ම දේශනා ශ්‍රවණය ප්‍රතික්ෂේප කිරීම බිහිරි භාවය ඇතිවීමට සහ කුකුල් කකුල් ආහාරයට ගැනීම කකුල්වල ආබාධ ඇතිවීමට හේතුවන කර්මානුරූප ප්‍රතිවිපාකයන් වශයෙන් කියනු මා අසා ඇත. මීට වසර කිහිපයකට පෙර තායිලන්තයේ ජ්‍යෙෂ්ඨ හිමිනමක් මාධ්‍ය තුළින් ප්‍රකාශ කළේ එච්. අයි. වී සහ ඒඩ්ස් යනු විකෘති ලිංගික ක්‍රියාවන්හි යෙදීමේ කර්මානුකූල ප්‍රතිවිපාකයක් බවයි. පෙර කී ලෙස එවැනි අදහස් ප්‍රචලිත කිරීම කෙතරම් පුළුල් ද යන්න සලකා බැලීමේදී, ඔවුන් බුදුපියාණන් වහන්සේගේ ප්‍රකාශ සමග ඒවා සංසන්දනය කරන්නේ කෙසේද යන්න සොයා බැලීම වටී. බුදුපියාණන් වහන්සේ පැවසුවේ රෝග සහ ශාරිරික පීඩාවලට විවිධ හේතු තිබිය හැකි බවත්, කර්මය එයින් එකක් පමණක් බවත්ය. සමහර රෝග අසනීප හටගන්නේ ශාරීරික තුන්දොස් අසමතුලිතතාවය, සමහර රෝග නොසැලකිල්ල නිසා, සමහර ඒවා අනතුරු නිසා, සහ සමහර ඒවා දේශගුණික විපර්යාසයන් නිසාත් බවයි. (2) දුර්වල ආහාර රටා සහ පමණට වඩා ආහාර ගැනීමෙනුත් කායික පීඩා ඇතිවන බව හඳුනා ගත් උන්වහන්සේ ඒ බව බොහෝ දේශනා තුළින් සඳහන් කළහ (A.III,144; Vin.I,199).

එක් අවස්ථාවක බුදුපියාණන් වහන්සේ සඳහන් කළේ උන්වහන්සේ යහපත් සෞඛ්‍යයක් භුක්ති විඳීමට හේතුව මධ්‍යස්ථව ආහාර ගන්නා නිසා බවයි (M.I,473). නැවතත් වරක් සනාථ කළේ අසනීප හෝ සෞඛ්‍යය ස්වයංක්‍රීයව අතීත කර්මවලට සම්බන්ධ කළ යුතු නොවන බවයි. බොහෝ රෝගාබාධවලට ස්වභාවික (එනම් කර්මානුරූප නොවන) හේතු ඇති බව පමණක් නොව, අපගේ අත්දැකීම් එය එසේ බව අපට තහවුරු කරන බවත්, එය බොහෝ දෙනා පිළිගෙන ඇති බවත් බුදුපියාණන් වහන්සේ වදාළහ. බුදුපියාණන් වහන්සේ 21වන ශතවර්ෂයේදී ජීවත් වූවා නම්, උන්වහන්සේ එය නූතන වෛද්‍ය විද්‍යාවට එකතු කරන්නට ඉඩ තිබූ අතර, එය සනාථ කරන්නටද ඉඩ තිබුණි.

### නියත කර්ම

පළමුවැන්නට සම්බන්ධ තවත් ජනප්‍රිය වරදවා වටහාගැනීමක් නම්, කර්මවල

ප්‍රතිවිපාක අනිවාර්යයෙන්ම සිදුවිය යුතු බවයි. මෙම මතයට අනුව, අප විසින් කරන ලද ඕනෑම කර්මයක විපාක අපේ ඉරණමට අනුව අපි අත්විඳින්නෙමු.

උදාහරණ වශයෙන් යම් කෙනෙකු මිනීමැරුමක් සිදුකළහොත්, ඔහු ඊළඟ භවයේදී ඝාතනයකට ලක් වන බවයි. මෙම මතය අපට නියත කර්මය වශයෙන් හැඳින්විය හැකිය. සමහර දේවවාදී ආගම්වල පාක්ෂිකයෝ මෙම අදහස දිව්‍ය සමාවදීම යන ධර්මය සමග අනුග්‍රාහි නොවන ආකාරයෙන් සංසන්දනය කරමින්, දෙවියන් වහන්සේ පව්වලට සමාව දෙනු ඇතැයි පවසන නමුත්, ''ඔබට කිසිවිටක ඔබේ කර්මයෙන් ගැලවිය නොහැක'' යැයි පවසති. මේ පිළිබඳව බුදුපියාණන් වහන්සේ පැවසුවේ කුමක්ද යන්න අපි විමසා බලමු.

ධම්මපදයේ එක් කෙටි පැදියකින් බුදුපියාණන් වහන්සේ නියත කර්මය පිළිබඳ අදහසට දායකවී ඇති බව පෙනේ. **(3)** නමුත්, වඩාත් විස්තරාත්මක ධර්මදේශනයකින් පැහැදිලි වන්නේ උන්වහන්සේ එසේ නොවන බවයි. මෙයින් එකකින් උන්වහන්සේ පැවසුවේ මූලිකව ගුණවත් චරිතයක් සතු පුද්ගලයෙකු විසින් දුරාචාර හෝ ඍණාත්මක ක්‍රියාවක් කිරීමේ ප්‍රතිවිපාක බොහෝ දුරට එසේ නොමැති අවස්ථාවකදීට වඩා දුර්වල එකක් විය හැකි බවයි. ප්‍රතිවිරුද්ධ ලෙස, මූලිකව දුරාචාරවත් සහ ඍණාත්මක චරිතයක් සතු පුද්ගලයෙකු ගුණවත් ක්‍රියාවන් ස්වල්පයක් කිරීමෙන් ඇතිවන්නේ ස්වල්පවූ වෙනසකි. **(4)** පැහැදිලිවම, කර්මානුරූප ක්‍රියාවක අනිවාර්යයෙන්ම සර්ව සම ශක්තියකින් යුක්ත විපාක තිබිය යුතු නැත. නමුත්, ඊට වඩා මනසෙහි සාමාන්‍ය ගුණාංගය හෝ පසුව සිදුවන ක්‍රියා තුළින් වෙනස් කළ හැකිය, හෝ ''දියාරු කළ'' හැකිය. තවත් දේශනයකින් බුදුපියාණන් වහන්සේ පැවසුවේ ඉතා අවාසි සහගත තත්ත්වයන්ගෙන් යුතු පරිසරයක උපත ලැබූවෙකුට (අතීත ඍණාත්මක කර්ම නිසා?) පසුව ඔහු විසින් කරන ලද යහපත් ක්‍රියා නිසා, නිර්වාණයට පවා පත්විය හැකි බවයි. **(5)** නැවතත්, සනාථ කරන්නේ අතීතයෙන් ගෙන ආ ඍණාත්මක කර්ම, වර්තමානයේ සිදු කරන ධනාත්මක කර්මවලින් ආවරණය කළ හැකිය, මැඩ පැවැත්විය හැකිය හෝ නැති (පිටීයති) කළ හැකිය යන්නයි **(6a,b)**.

## කර්මයේ සමාන්තර අවස්ථා (අනුවර්තී වාදය)

කර්මය පිළිබඳව සැමවිටම අවධානය ආකර්ෂණය කර ගන්නා, සාමාන්‍යයෙන් සැක කටයුතු සහිත අවධානයක් සහ බොහෝ හාස්‍යමය මත ප්‍රකාශ කිරීමක් වන කර්මය පිළිබඳ එක් වරදවා වටහාගැනීමක් නම්, කර්මානුකූල විපාක පිළිබඳවයි. එනම් විපාක සැමවිටම එයට හේතුවූ ක්‍රියාවට සමාන්තරව හෝ අවම වශයෙන් බෙහෙවින් සමානය යන මත ප්‍රකාශ කිරීමයි. එය සිතන පරිදි වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම, ''ඇසට ඇසක් සහ දතකට දතක්'' හෝ ''කඩුවෙන් ජීවත් වන්නා කඩුවෙන් මැරෙයි'' යන සිද්ධිය මත ඇති වන විපාක වශයෙන් දැක්වීමකි. එවැනි මතයකට උදාහරණ කිහිපයක් ඉහත දක්වා ඇත. නමුත්, සමකාලීන බෞද්ධ සාහිත්‍යයෙන් තෝරා ගත් තවත් කරුණු කිහිපයක් මෙහි දැක්වේ. ඔබ

දිවුරනවා නම් ඔබේ ඊළඟ ජීවිතයේ මුඛයෙන් දුගඳක් ඇති වේ. ඔබ ලෝභ නම්, ඔබගේ ඊළඟ භවයේදී මූල්‍යමය දුෂ්කරතා ඇති වේ. භික්ෂූන්ට ඖෂධ පරිත්‍යාග කරන්නාට ඊළඟ භවයේදී යහපත් සෞඛ්‍යයක් ඇති වේ. මේ ආකාරයෙන් අනුවර්තී වාදය ඉදිරිපත් කිරීම පිළිබඳ අර්ථ දැක්වීම් ඇතුළත් බුදුපියාණන් වහන්සේගේ දේශනා බොහෝය. කෙසේ වෙතත්, එය එසේ නොවන බව අපට පසුව පෙනී යනු ඇත.

## විශ්වීය කර්ම

මෑතකදී *Scientific American* නමැති සඟරාවට ජෝන් හෝගන් ‘Why I Don’t Dig-Buddhism’ ‘මම බුදුදහම විවේචනය නොකරන්නේ ඇයි?’ නම් ලිපියක් ලිව්වේය.[2] ''අවම වශයෙන් එහි සාම්ප්‍රදායික ස්වරූපයෙන්'' සුදුසුකම් තිබුණද, ඔහු එහි ආගම පිළිබඳව සිත්ගන්නාසුලු නිරීක්ෂණයක් කළේය. හෝගන් මෙසේ ලිව්වේයඃ ''මා වැනි අවලංගු කතෝලිකයන්ට බුදුදහමේ විශාලතම අලෙවි ලක්ෂ්‍යයක් වන්නේ සිතන පරිදි, එය දෙවියන් වහන්සේ සහ වෙනත් අද්භූත මුසාවන් සමග ක්‍රියාවෙහි යෙදීමය.'' මෙම ප්‍රකාශය ව්‍යාජ එකකි. බුදුදහම අවම වශයෙන් එහි සාම්ප්‍රදායික ස්වරූපයෙන්, එය උත්තරීතර දෙවියෙකුට ආයාචනා නොකළත්, ප්‍රායෝගිකව දේවවාදීය. කර්මය සහ නැවත ඉපදීම පිළිබඳ ධර්මවලින් අඟවන්නේ යම් ආකාරයක නත්තල් සීයා වැනි විශ්වීය සදාචාරාත්මක විනිශ්චයකාරවරයෙකුගේ පැවැත්මයි. ඔවුන් අපට නිර්වාණය හෝ කැරපොත්තෙකු ලෙස නැවත ඉපදීම ප්‍රදානය කිරීමට පෙර අපගේ අකීකරුබව සහ නිරවද්‍යතාව සසඳා බලනු ඇත.'' හෝගන්ගේ නිරීක්ෂණය තරමක් යුක්ති සහගතය. කර්මය පිළිබඳ බොහෝ බෞද්ධ පැහැදිලි කිරීම්වලින් ඇඟවෙන්නේ එයට සෑම කෙනෙකුගේම ක්‍රියාවන් පිළිබඳ වාර්තාවක් තබා ගැනීමටත් එක් එක් පුද්ගලයාට සුදුසු විපාක සූදානම් කිරීමටත් හැකියාවක් ඇති යම් ආකාරයක විශ්වීය බලයක් හෝ බලපෑමක් ඇති බවයි. එක් බෞද්ධ විද්වතෙකු මෑතකදී එය විස්තර කළේ ''විශ්වය තුළ ගොඩ නඟා ගත් නම්මා ගත නොහැකි සදාචාරාත්මක නීතියක්'' ලෙසය. කර්මය පුද්ගලයෙකුගෙන් බාහිරව තිබෙන ඉතා සියුම් විශ්වීය ශක්තියක්, ඕනෑම දිව්‍යමය ජීවියෙකු මෙන් බුද්ධිමත්, සාමාන්‍ය දිව්‍යමය ගුණාංග ස්වභාවයන් බොහොමයකින් තොරවූ ගුරුත්වාකර්ෂණයක්, ගැම්මක් හෝ චුම්බකත්වයක් ලෙස ඉදිරිපත් කර ඇත. උදාහරණ වශයෙන්, මිනිස් ස්වරූපය, පෞරුෂත්වය, යාච්ඥාවලට සවන් දෙන්නට සහ පිළිතුරු දීමට ඇති හැකියාව යනාදියයි. මෙම අද්භූත බලවේගය නිසා ලෝකයේ බිලියන හයක ජනතාවගේ සෑම සිතුවිල්ලක්ම, වචනයක්ම සහ ක්‍රියාවක්ම දැන ගැනීමට සහ ඒවා පෙළගැස්වීමට හැකි බවත් පැවසේ. ඊට පසු ද්‍රව්‍යමය වටපිටාව සකස් කර ගන්නා අතර එමගින් සෑම කෙනෙකුටම ඔවුන්ට සාධාරණවූ දඬුවම හෝ ප්‍රතිලාභය ලැබෙන බව පැවසේ. කර්මය පිළිබඳ මෙම සංකල්පය තුළ ඒ සෑම දෙයෙහිම සිටින්නේ උත්තරීතර දෙවියෙකි. නමුත් එය

නිල වශයෙන් හඳුනාගෙන නොමැත. බුදුපියාණන් වහන්සේගේ කිසිම දේශනාවක මෙවැනි කිසිම දෙයක් සඳහන් වී නැත.

**සැමවිටම වෙනත් තැනක, සැමවිටම ඍණාත්මකයි.**

පැහැදිලි හේතු නැති නිසා, කර්මය පිළිබඳ බොහෝ අදහස් ඇත්තේ අතීත භව හෝ අනාගත භව ගැන බව පෙනෙන්නට ඇති අතර, ඒවා මූලික වශයෙන් ඍණාත්මක දේ පිළිබඳව සැලකිලිමත් බව පෙනේ. වැළකී සිටීම සාමාන්‍යයෙන් මෙවැනි දෙයකිඃ ''ඔබ මේ ජීවිතයේදී දුප්පත් නම්, එයට හේතුව ඔබ ඔබේ පෙර භවයේදී ලෝභී වූ නිසාය'', හෝඃ ''ඔබ මේ භවයේදී ලෝභී නම්, ඔබ ඊළඟ භවයේදී දුප්පත් වනු ඇත.'' කර්මය සිදුවූ විගස හෝ අවම වශයෙන් වර්තමාන ජීවිතයේදී එක් යම් අවස්ථාවක දී එහි බලපෑම ඇති විය හැකි යැයි හැඟවෙන්නේ ඉඳහිට පමණි. ඒ හා සමානවම ධනාත්මක කර්ම විපාක පිළිබඳව සාකච්ඡා කරන ධර්ම දේශනා දුර්ලභය. [3]

මෙම අර්ධ, ඒක පාර්ශ්වීය අවධාරණයෙන් ඇති වන හැඟීම නම්, කර්මය පිළිබඳ ධර්මය සැලකිලිමත් වන්නේ අතීතය හෝ අනාගතය සහ අයහපත සහ එහි ඍණාත්මක දුර්විපාක පිළිබඳව බවයි. ''ඔබට කිසි විටක කර්මයෙන් ගැලවිය නොහැකි'' වැනි අදහස්වලින්ද එම දෙයම ඇඟවේ. ධනාත්මක කර්ම පිළිබඳව සඳහන් කළත්, සාකච්ඡා හොඳ හෝ නරක වුවත් පරස්පරතාව ඉන් ඔබ්බට යන්නේ කලාතුරකිනි.

මීට හාත්පසින්ම වෙනස්ව, බුදුපියාණන් වහන්සේගේ කර්මය පිළිබඳ පැහැදිලි කිරීම වඩාත් අපූර්ව, යථාර්ථවාදී සහ පළපුරුදු එකක් විය. උන්වහන්සේ ඉගැන්වූයේ විපාක වර්තමාන ජීවිතයේ, ඊළඟ ජීවිතයේ හෝ පසු ජීවිතවලදී පහළ විය හැකි බවයි.(7)

සමහර කර්මවල ප්‍රතිඵල වහා සිදුවන (ආනන්තරික කර්ම A.III,439) බව උන්වහන්සේ පැවසූහ. අනුමාන වශයෙන් මෙයින් අඟවන්නේ ක්‍රියාවන් සිදු කළ වහා හෝ කෙටි කලකින් අත්විඳිය හැකි බවයි. ඔබ ආගන්තුකයෙකු වෙත ගොස් උපකාර කළ විට, එවැනි යහපත් ක්‍රියාවක ප්‍රතිඵල අත්විඳීමට ඊළඟ භවය එනතුරු බලා සිටිය යුතු නැත. සාමාන්‍යයෙන් ආගන්තුකයාගේ ස්තූති ප්‍රකාශ කිරීමෙන් ඔබට සතුටක් දැනේ. ඔබට ස්තූතියක් හෝ කෘතඥතාවක් නොලැබුණද, ඔබට නිවැරදි දේ කිරීම පිළිබඳව දැනීමෙන් සතුටක් දැනේ. ඇතැම් විට බුදුපියාණන් වහන්සේ ''අප්‍රසන්න හෝ ප්‍රසන්න නොවන'' (අදුක්ඛම-අසුක්ඛං) යන කර්මානුකූල ප්‍රතිවිපාක පිළිබඳවද සාකච්ඡා කළහ. එනම්, සදාචාරමය, මධ්‍යස්ථ වූ ක්‍රියාවන්වල බලපෑමයි. තවත් විටක, ''සදාචාරමය භාවය මිශ්‍ර වූ'' (වීතිමිස්ස ධම්ම, M.I,318) ක්‍රියාවන් පිළිබඳවද උන්වහන්සේ සඳහන් කළහ. බුදුපියාණන් වහන්සේ, සමහර විට අප තීරණ

ගන්නට පෙර, අප කරන දේ හෝ කර ඇති දේ සම්බන්ධයෙන් ''සිත් දෙකකින් - දෙගිඩියාවෙන්'' සිටින බව දැනගන්නට තරම් හැකියාවක් තිබූ බුද්ධිමත් මනෝවිද්‍යාඥයෙක් වූහ. (**8**) සමහර විට අප කරන බොහෝ දේවල්, එසේ කිරීමට අප පෙළඹෙන්නේ ධනාත්මක සහ ඍණාත්මක අදහස්වල මිශ්‍රණයකින් යුක්තවයි. එමඟින් මිශ්‍ර විපාක ඇති වේ. (**9**) එවැනි සියුම් වෙනස්කම් සහ ඒවායේ ඇඟවීම් කර්මය පිළිබඳ සාකච්ඡාවල සඳහන් වන්නේ කලාතුරකිනි.

**සටහන්**

1. බලන්න 'Karma and the Problem of Rebirth' in *Karma and Rebirth in Classical Indian Traditions*, edited by W. D. O'Flaherty, 1983, pp.217ff. [back]
2. http://blogs.scientificamerican.com/cross-check/2011/12/02/why-i-dont-dig- buddhism/ [back]
3. මෙයට සංක්ෂේතමය වන Entry on karma in the Thomas Gale *Encyclopaedia of Buddhism* (2004) න් කර්මය විස්තර කරන්නේ "the belief that acts bring about their retribution…" යනුවෙනි. [back]

# එසේ නම් කර්මය යනු කුමක්ද?

කර්මය නොවන්නේ කුමක්ද යන්න විමසීමෙන් පසු, දැන් අපි එය කුමක් දැයි සොයා බලමු. පළමුව, බුදුපියාණන් වහන්සේ පැවසුවේ, කර්මය පිළිබඳ උන්වහන්සේගේ අදහස වෙනත් කෙනෙකුගෙන් අසා අනාවරණය කරගෙන, එය හොඳ අදහසක් යැයි සිතා, ඊට පසු පිළිගත් එකක් නොවන බවයි. ඒ වෙනුවට, එම දැනුම, උන්වහන්සේ විසින්ම ඍජු ලෙස පෞද්ගලික අත්දැකීමකින් ලබා ගත් ප්‍රතිඵලයක් බවයි. උන්වහන්සේ බුද්ධත්වයට පත් වන විට අවබෝධ කර ගත් අනෙක් සත්‍යයන් මෙන්ම, ''මීට පෙර නොඇසූ'' (පුබ්බේ අනනුස්සුතෙසු, SV,422) දෙයක් බවයි. බුද්ධත්වය ලබන්නට පෙර, පැය කිහිපයක් තුළදී බුදුපියාණන් වහන්සේට තුන් ආකාර ගැඹුරු ඇතුළු නුවණ ලැබුණු අතර, උන්වහන්සේ එම තත්ත්වයන් හැඳින්වූයේ තුන් ආකාර නුවණ (තෙවිජ්ජා) යනුවෙනි. මේ දැණුම් තුන වන්නේ පෙර භවයන් පිළිබඳ දැණුම (පුබ්බෙනිවාසානුස්සති-ඤාණ), සත්ත්වයන් මිය යෑම සහ ඉපදීම පිළිබඳ ඥාණය (චුතූපපාතඤාණ), සහ මානසික කෙළෙස් විනාශ කිරීම පිළිබඳ ඥාණය (ආසවක්ඛය-ඤාණ) යනුවෙනි. (**10**) මේ කාරණා තුනෙන් පළමුවැන්න තුළින් බුදුපියාණන් වහන්සේ විස්මය දනවන ප්‍රබෝධමත් බවක් සහ උන්වහන්සේගේ පෙර භවයන්වල දීර්ඝ ප්‍රදර්ශනය වීමක් පරිපූර්ණ ලෙස දුටුවහ. (**11**) දෙවැන්නෙන් මිනිසුන් ඔවුන්ගේ කර්මයට අනුව මිය යන අයුරු සහ නැවත ඉපදෙන අයුරු දුටුවහ. (**12**) බුදුපියාණන් වහන්සේට කර්මය සහ

නැවත ඉපදීම පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලැබුණේ මෙම තුන් ආකාර දැනුමේ පළමු දැනුම්වත් භාවයෙනි.

බුදුපියාණන් වහන්සේගේ කාලයේ ජීවත්වූ තවත් සමහර පැවිද්දන්ට මෙම අත්දැකීම් අඩුම තරමින් යම් මට්ටමකට තිබූ බව උන්වහන්සේ පිළිගැනීම සිත්ගන්නා කරුණකි. කෙසේ නමුත්, ඔවුන් සාමාන්‍යයෙන් වැරදි නිගමනවලට එළඹුණු බව උන්වහන්සේ පැවසූහ (D.I,13). (**13**) මහාවීර වැනි ගුරුවරු කර්මය සහ නැවත ඉපදීමේ අනුවාදයන් බුදුපියාණන් වහන්සේට පෙර ඉගැන්වූයේ මන්ද යන්න මෙයින් පැහැදිලි වේ.

කලින් සඳහන් කළ පරිදි, කර්මය යනු මිනිසාගෙන් වෙන්වූ විශ්වයේ ඇති යම් බලයක් හෝ ශක්තියක් නොවේ. නමුත් ඔහු හෝ ඇය කෙරෙහි එහි බලපෑම ඇති කරයි. ඒ වෙනුවට, එය විඤ්ඤාණයේ අංගයකි. එය මනෝවිද්‍යාත්මක යාන්ත්‍රණයකි. මනස ක්‍රියාකරන ආකාරයකි. බුදුපියාණන් වහන්සේ මෙම කරුණ කිහිප වතාවක්ම අවධාරණය කළහ. ඒ විශේෂයෙන්ම අභිප්‍රාය (චෙතනා), මානසික සංසිද්ධියක් යනු කර්මය බව උන්වහන්සේ පැවසීමයි. (**14**) චේතනා යනු හුදෙක් ක්‍රියා කිරීමට සලකා බැලීමකට වඩා වැඩි යමක් බව පෙන්වා දිය යුතුයි. එයින් අදහස් වන්නේ උත්සාහයක්, පෙලඹවීමක් සහ චේතනාන්විත ආවේගයක් යනාදී වශයෙනි (චේතනා, පත්ථනා, පණිධි, සංඛාර, A.V,213). යහපත් හෝ අයහපත් අපගේ ක්‍රියා රඳා පවතින්නේ කිසිදු අද්භූත බාහිර බලවේගයක් මත නොව, අපගේ මනස මතය. (**15**) කර්මය යනු ''විශ්වය තුළ ගොඩ නඟා ඇති වෙනස් කළ නොහැකි සදාචාරාත්මක නීතියක්'' යැයි බුදුපියාණන් වහන්සේ කිසි තැනක පවසා නැත, හෝ අඟවා නැත.

එහි සරලම වචනවලින්, අභිප්‍රාය හෝ චේතනාව විඥානය විසින් වෙනස් කරයි. මෙය අපගේ චරිතය හැඩගස්වයි. එමඟින් අප ලෝකයට බලපාන සහ සම්බන්ධවන ආකාරය සහ ඒ නිසාවෙන් එය අපට බලපාන ආකාරය කෙරෙහි බලපෑම් ඇති කරයි.

## කර්මය ක්‍රියා කරන්නේ කෙසේද?

ඉතින් කර්මය ක්‍රියා කරන්නේ කෙසේද? සමහර විට, අපගේ බොහෝ අදහස් විසිරී ඇත, දුර්වලය. ඒ නිසා ඒවාට අනුරූපී විපාක දුර්වල වේ. සමහර ඒවා අවධානයෙන් යුක්ත වී ඇත, සහ අරමුණුවත් වී ඇත. ඒ නිසා ඒවායේ විපාක ශක්තිමත් වේ. ඉඳහිට කෝපවී බැණ වැදීම හෝ ත්‍යාගශීලීව සිදු කරන ක්‍රියාවකින් සැලකිය යුතු කර්ම විපාකයක් ඇති වීම අපහසුය. ''නිතර සිතමින් යම් දේවල් පිළිබඳව කල්පනා කරන'' (අනුවිත්තක, අනුවිචාර) සහ විශේෂ සිතුවිලි හෝ ක්‍රියා ''ලුහුබැඳ යන ... නොකඩවා කරගෙන යන, අත්තිවාරමක්

දැමූ, පවත්වා ගෙන ගිය, තහවුරු කර ගත්'' (e.g. A.I,29; M.I,116; A.V,342) යම් නිශ්චිත ආකාරවල හැසිරීම්වලට ''ඇබ්බැහිවීම'' (අනුයුත්ත) පිළිබඳව බුදුපියාණන් වහන්සේ සඳහන් කළහ. සමහර හැසිරීම් චරිත ගතිලක්ෂණ බවට පත්වීමට පටන් ගත් විට, ඔවුන්ගේ විපාක කැපී පෙනෙන ලෙස පෙනෙන අතර, එය පුද්ගලයෙකුගේ ජීවිතයට වඩාත් ප්‍රබෝධමත් ලෙස බලපායි. **(17a,b)** ප්‍රචණ්ඩකාරී පහරදීමක් හෝ මිනීමැරුමක් වැනි ක්‍රියාවක් සිදු කිරීමට ගත වන්නේ කෙටි කාලයක් වුවද, එයින් ඇතිවන විපාකය ඉතා ප්‍රබල සහ කැපී පෙනෙන විපාකයක් විය හැකි නිසා එම පුද්ගලයා ප්‍රකෝපනයට පත් කරන, පාලනය කර ගත නොහැකි දැඩි ආවේගය ඒ හා සමානවම ඉතා ප්‍රබල විය යුතුයි. සමහර චේතනාවල විපාක වඩා ප්‍රබල, ප්‍රතිවිරෝධී චේතනාවන් කිහිපයකින්, සම්පූර්ණයෙන්ම වෙනස් වන තත්ත්වයට පවා වෙනස් කළ හැකිය. ''ඔබ මිනීමැරුවොත්, ඔබ අපායේ නැවත ඉපදෙනු ඇත'' යන ප්‍රකාශ බොහෝ විට කෙනෙකුට අසන්නට ලැබේ. බුදුපියාණන් වහන්සේ එවැනි ප්‍රකාශවලට එකඟ නොවන බව පැවසීම සිත්ගන්නා කරුණකි. **(18)** එය සලකා බලන්න.

20 හැවිරිදි තරුණයෙක් මිනීමැරුමක් සිදු කරයි, අවුරුදු 20ක සිර දඬුවමක් ලැබීමෙන් පසු නිදහස් වීමෙන් තවත් වසර 30ක් ජීවත් වෙයි. ඔහු අපරාධය සිදු කිරීමට පෙර, දශක දෙකේදී සාමාන්‍ය දරුවෙකු සහ තරුණයෙකු වශයෙන් කිසිම අපරාධ වාර්තා නොමැතිව ජීවත් වූවෙකි. එම ඝාතන ඛේදවාචකයට හේතුවූ සුළු බහින්බස්වීම පාලනය කර ගත නොහැකි වීම මෙම අපරාධයට උදාහරණයකි. ඔහුට සිරදඬුවම් ලැබීමෙන් පසු පළමු අවුරුදු කිහිපය තුළදී ඔහුගේ පවුල ඔහුගෙන් වෙන් විය. ඔහු සිදු කළ දේ නිසා සහ අත්වූ සිරදඬුවමේ කම්පනය නිසාවෙන් දැඩි කළකිරීම සහ ලැජ්ජාව අත්වින්දේය. නමුත්, ක්‍රමයෙන් ඔහු ආදර්ශවත් සිරකරුවෙකු බවට පත් විය. නිදහස ලැබීමෙන් පසු කරදරකාරී තත්ත්වයට පත්වූ තරුණයන්ට උපකාරවීම සඳහා ආයතනයක් පිහිට වූයේය. බොහෝ දෙනෙකු අපරාධ කිරීමෙන් බැහැර විය. ''මිනීමරුවන් නිරයේ නැවත ඉපදේ.'' වැනි ප්‍රකාශවලින් ඇතිවන ප්‍රශ්නය නම්, ඔවුන් අතිශය සරල කළ, විශේෂ අවස්ථාවකට නිසි සාක්ෂි නොමැතිව හුදෙක් පොදු නීතියක් **(19)** මිනිස් මනසේ ඇති අනගි සහ විවිධ වූ ස්වාභාවික හෝ මනඃකල්පිත දේ අගය කිරීමට අපොහොසත් වීමයි. ඉහත සඳහන් කළ උපකල්පනය කරන ලද, මිනීමරුවා සම්බන්ධයෙන් ගත් කල, ඔහුගේ බරපතල කර්මයේ විපාකය සහ ඝාතනය ඉතා බරපතල කර්මය (ගරුක කර්මය) ඔහුට ඇතිවූ වේදනාකාරී පසුතැවිල්ල, ශෝකය සහ කණගාටුව යන මේ සියල්ලෙන් ඔහුගේ ක්‍රියාවේ විපාක අඩුවනු ඇත. ඉතිරි වී ඇත්තේ තවදුරටත්, දියාරු වූ හෝ සමහර විට, පසුව බොහෝ වසර ගණනාවක් ඔහු විසින් කරන ලද යහපත් කර්මවලින් සම්පූර්ණයෙන්ම හෝ අහෝසිවීමට ඉඩ ඇති ඒවාය. Oskar Schindler ගේ *Schindler's Arch* නම් ග්‍රන්ථයෙන් සහ *Schindler's List* නම් චිත්‍රපටයෙන් සැබෑ ජීවිතයෙන් ලබා ගත් උදාහරණයක් ගෙන බලමු.

ඕනෑම ප්‍රමිතියකට අනුව, ෂින්ඩ්ලර් අපකීර්තියට පත් චරිතයකි. ඔහු නාසි පාර්ශ්වයේ සාමාජිකයෙකි. ජර්මනියේ රහස් තොරතුරු රැස්කිරීමේ ඔත්තු සේවයේ යෙදෙමින් ඔහුගේම රටට ද්‍රෝහියෙක් වූයේය. ඔහු හැබිචෝල් පරදාර සේවනයේ යෙදුණු, නින්දිත ව්‍යාපාරිකයෙකු සහ නීතිවිරෝධී ව්‍යාපාරිකයෙකු, සහ බේබද්දෙකු ද විය. නමුත්, 1943දී නාසි අපරාධ දැකීමෙන් ඔහු වෙනස් විය. තමාට සහ තම පවුලේ අයට ඉතා සැබෑ තදබල හදිසි අන්තරායක් තිබියදී ඔහු මහත් වූ ධෛර්යයෙන් 1200ක් පමණ මිනිසුන් යම් මරණයට පත්වීමකින් මුදවා ගත්තේය. ඒ සියලු දෙනා සම්පූර්ණයෙන් ආගන්තුකයෝ වූහ. පරස්පර විරෝධී ලෙස, බොහෝදුරට දුසිරිතෙන් පිරුණු ෂින්ඩ්ලර්ට අල්ලස් ගැනීම, බොරු කීම, අපහාස සහ තර්ජනය කරමින් මුදල් ගැනීම සහ චාටු බස් කීම යන ඔහුගේ වංක ව්‍යාපාර කටයුතු නිවැරදි කර ගැනීමෙන් මෙම මිනිසුන් බේරා ගැනීමට හැකි වන්නට ඇත. ඔහු ඍණාත්මක කර්ම බොහෝ සිදු කර ඇත. නමුත්, බොහෝ ධනාත්මක කර්ම ඉතා ප්‍රබල වී ඍණාත්මක කර්ම අභිබවා ගොස් ඇත. මෙවැනි කතන්දර කර්මයට ප්‍රවේශ වන, අපට සුපුරුදු කලු සහ සුදු, යහපත් සහ අයහපත් යනාදිය පිළිබඳව අප ඉතා සැලකිලිමත් විය යුතුයි. එවැනි විශේෂ අවස්ථාවකට නිසි සාක්ෂි නොමැතිව හුදෙක් පොදු නීතියක් යොදා ගැනීමට විරුද්ධව බුදුපියාණන් වහන්සේ අනතුරු ඇඟවීම් සිදු කිරීම පුදුමයට කරුණක් නොවේ. (**19**).

## විපාක

දැන් අපි කර්මයේ ප්‍රතිඵල වන විපාක විමසා බලමු. චේතාන්විත සදාචාරාත්මක ධනාත්මක ක්‍රියාවන් එහි සරලතම වචනවලින් විග්‍රහ කළහොත්, එසේ කරන්නා කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරයි. චේතාන්විත, සදාචාරාත්මක, ඍණාත්මක ක්‍රියාවන්වලින් ඍණාත්මක ප්‍රතිඵල ඇති වේ. බුදුදහමේ සදාචාරාත්මක, ධනාත්මක සහ ඍණාත්මක ක්‍රියාවන්ගෙන් සමන්විත වන දේ අනෙක් බොහෝ ආගම් සහ බොහෝ ආචාරධර්මවාදීන් විසින් යහපත් සහ අයහපත් යැයි පොදුවේ පිළිගත් දෙයට බෙහෙවින් සමානය. (**20**) නමුත්, අරමුණ වැදගත් වන අතර, යමක් කිරීමට අරමුණු කිරීම සහ සැබැවින්ම යමක් කිරීම අතර වෙනසක් ඇත. කෙනෙකු සමග යමක් බෙදා හදා ගැනීමට සිතීම ධනාත්මක විපාක ලැබෙන යහපත් කර්මයකි. නමුත්, සිතුවිල්ලට ඔබ්බෙන් ගොස් සැබැවින්ම බෙදා හදා ගතහොත්, එයින් වඩා ශක්තිමත් ධනාත්මක විපාකයක් ඇති වේ. සමහර ක්‍රියාවල ප්‍රතිඵල ස්ථිර සහ වෙනස් කළ නොහැකි ඒවා වේ (මිච්ඡත්ත-නියතරාසි, සම්මත්ත-නියත රාසි). මේවා අතිශය ධනාත්මක හෝ අතිශය ඍණාත්මක ක්‍රියාවන් වේ. [1] නමුත්, විපාක අවිනිශ්චිත (අනියත) විය හැකි වෙනත් ක්‍රියා ඇත. එයට හේතුව ඒවා අවස්ථානුකූලව දියාරුවීමට හෝ සමහර විට අහෝසිවීමටද නැඹුරු විය හැකි නිසාය. (**21**)

කර්මය පිළිබඳ බොහෝ පැහැදිලි කිරීම්වල පෙර සඳහන් කළ කර්මානුකූල අනුවර්තී වාදය ද ඇතුළත් වේ. එනම් කර්මානුකූල ක්‍රියාවක විපාකය එම ක්‍රියාවට අනන්‍ය හෝ ඉතා සමාන යන අදහසයි. ඒ අනුව, ඔබ ලෝභී නම්, ඔබ දුප්පත්වී ඉපදෙනු ඇත, ඔබ ත්‍යාගශීලී නම්, ඔබ පොහොසත් වී ඉපදෙනු ඇතැයි යන අදහසයි. කර්මානුකූල අනුවර්තී වාදය යන අදහස බුදුපියාණන් වහන්සේ අනුමත කළ බව පෙනෙන්ට තියෙන ධර්ම දේශනා කිහිපයක් ඇත. මේ දේශනා සැබැවින්ම එසේ දැයි බැලීමට මඳක් විමසා බැලීම වටී. (22) කර්මය පිළිබඳ වඩාත් ප්‍රකට එවැනි ධර්මදේශනාව වන්නේ චූළකම්මවිභංග සූත්‍රයයි. (22) මේ දේශනාවේදී බුදුපියාණන් වහන්සේ පැවසුවේ ඇත්තටම, ගරු සැලකිලි දැක්වීමට සහ ගෞරව කිරීමට සුදුසු අය කෙරෙහි එසේ කිරීමෙන් උසස් පන්තියේ පවුල්වල නැවත ඉපදීමට හේතු වන අතර, ඝාතනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස කෙටි ආයුෂ අපේක්ෂාව, කුඩුකේඩුකමින් සහ ඊර්ෂ්‍යාවෙන් නිදහස්වීමෙන් ආකර්ෂණීය මුහුණේ ලක්ෂණවලින් යුතුව නැවත ඉපදීම, අනෙක් අයගේ කටයුතුවලදී ත්‍යාගශීලීවීමෙන් ඊළඟ භවයේදී ධනවත්වීම යනාදිය පිළිබඳවයි.

මෙම අවසාන ප්‍රකාශය ගැන අප විමසා බලමු. පොහොසත් වීම යනු විශාල මුදල් ප්‍රමාණයන්ට ප්‍රවේශවීමට හැකියාව තිබීමයි. මුදල් ද්‍රව්‍යමය වස්තුවකි. නමුත්, ත්‍යාගශීලීත්වය වැනි මනෝවිද්‍යාත්මක තත්ත්වයක් කඩදාසි බැංකු නෝට්ටු සහ ලෝහමය කාසි වැනි ද්‍රව්‍යමය වස්තූන් ඇති පුද්ගලයෙකුට ආකර්ෂණය වන්නේ කෙසේද? විමසා බැලිය යුතු තවත් දෙයක් ඇත. ධනවත්වීම අනිවාර්යයෙන්ම ආශීර්වාදය ලත් සහ ආකර්ෂණීය තත්ත්වයක් ද? ඒ හේතුකර ගෙන යහපත්වීමට සුදුසු ''ප්‍රදානයක්'' ද? ධනවත් පුද්ගලයෙකුට තෘප්තිමත් නොවූ, මානසික අවපීඩනයෙන් පෙළෙන, කාලකණ්ණි හෝ නිදන්ගත ලෙස රෝගාතුර අයෙකු විය හැකිද? සමහර විට එසේ කළ හැකි බවට බොහෝ මිනිසුන් එකඟ වනු ඇත. එසේ තිබියදී, ත්‍යාගශීලීත්වය වැනි ගුණාංගයක්, සතුට සමග එකට යා හැකි හෝ යා නොහැකි, ධනවත්වීමට මඟපෙන්වන්නේ ඇයි? දුප්පත්වීම හෝ අවම වශයෙන් මධ්‍යස්ථ වත්කම් සහ සතුටින් සහ තෘප්තිමත් ලෙස ජීවත්වීම ඊට වඩා යෝග්‍ය නොවේද? නැවතත්, සමහර විට, බොහෝ දෙනෙකු එයට එකඟ වනු ඇත. මෙම හේතු සහ වෙනත් හේතු නිසා, ත්‍යාගශීලීත්වය සහ ධනය අතර සම්බන්ධයක් හෝ චූළකම්මවිභංග සූත්‍රයේ සඳහන් වෙනත් කර්මානුකූල සහසම්බන්ධතා දැකීම දුෂ්කරය. ධර්මදේශනාවේ සඳහන් ධනාත්මක විපාක විමසා බැලුවහොත්, එහි පොදුවේ ඇති එක් දෙයක් නම්, ඒවා සියල්ලම අවම වශයෙන් ජනප්‍රියවීම් සිතින් මවාගැනීම්, සතුට සමග සම්බන්ධ කර තිබීමයි. සෑම කෙනෙකුම දීර්ඝායුෂ, ධනය, කීර්තිය, හැකියාව සහ ලස්සන ලබා ගැනීමට සිහින දකී. එයට හේතුව මතුපිටින් සලකා බැලීම එවැනි තත්ත්වයන් සතුට සමග සම්බන්ධ කිරීමයි. මෙම අදහස බොහෝ සෙයින් පැතිරුණු උපකල්පනයක් වුවද, ගැඹුරු සහ වඩාත් යථාර්ථවාදීව සලකා බැලීමේදී මෙම අදහස කෙරෙහි

බරපතල සැකයක් ඇති කරයි. එයට හේතුව, කර්මය යනු මනෝවිද්‍යාත්මක සංසිද්ධියක් බැවින්, තර්කානුකූලව එහි ප්‍රතිඵලය ද මනෝවිද්‍යාත්මක විය යුතුවීමයි. [2] මේ අනුව, ධනාත්මක කර්මවල විපාක, සතුට, තෘප්තිය, පහසුව, ස්වයං අගය කිරීම, විශ්වාසය සහිත බව, ප්‍රීති ප්‍රමෝදය, පැහැදිලි සවිඥානයක්, යහපත් ප්‍රබෝධයක්, යනාදී ධනාත්මක මානසික තත්ත්වයන්වලින් යුක්ත විය යුතුයි. ඍණාත්මක කර්මවල විපාක යනු, අසතුට, වරදකාරිත්වය, ලැජ්ජාව, මානසික අවපීඩනය, ස්වයං-පිළිකුල, බලාපොරොත්තු සුන්වීම, කනස්සල්ලෙන් සිටීම, තදින් බියවීම, තැතිගැන්ම යනාදී ඍණාත්මක මානසික තත්ත්වයන් ඇති වීමයි. අවසානයේ පුද්ගලයෙකු සතුටෙන් සහ තෘප්තියෙන් සිටින බවට අපට කිව හැක්කේ ඔහු සතු වස්තූන්ගේ ප්‍රමාණය, ඔහුගේ මුහුණේ හැඩරුව, ඔවුන්ට සමීප පරිසරය, ආයු කාලය හෝ ඔහුට කායික ආබාධයක් නොතිබීම නොවේ. නමුත්, මේ සාධක කෙරෙහි ඔහුට ඇති ආකල්පය බවයි. එසේ නම්, ඝාතනය කිරීම, ආයුෂ අඩුවීමටත්, ත්‍යාගශීලී බව, වස්තුව ලැබීමටත්, යනාදී වශයෙන් හේතුවන බව චූළකම්මවිභංග සූත්‍රයේ බුදුපියාණන් වහන්සේ පැවසූයේ යැයි සඳහන් වූයේ ඇයි?

බුදුපියාණන් වහන්සේ දීර්ඝ සහ කෙටි ආයු කාලය, ලස්සන සහ අවලස්සන, ධනවත් සහ දුප්පත් බව ආදිය භාවිත කළේ සතුට සහ අසතුට සඳහා රූපක වශයෙන් විය හැකිය. චූළකම්මවිභංග සූත්‍රයේ බුදුපියාණන් වහන්සේ ආමන්ත්‍රණය කළ පුද්ගලයාටද - උන්වහන්සේ එවැනි දේ පැවසුවේ කුමන හේතුව නිසාද යන්න පැහැදිලි කිරීමට උපකාර විය හැකිය. උන්වහන්සේ සමග සංවාදයේ යෙදුණ පුද්ගලයාගේ නම සුභ වූ අතර, දේශනය පුරාම බුදුපියාණන් වහන්සේ ඔහු ඇමතුවේ ''ශිෂ්‍ය'' (මාණව) වශයෙනි. මෙයින් ඇඟවෙන්නේ සුභ තරුණයෙකු බවයි, සමහර විට සෑහෙන තරම් තරුණ බවයි. පෙර කී ලෙස, බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ අදහස් සරල වචනවලින් සිදු කරන්නට ඇති අතර, එය පොදු හැඳිනගැනීම් සහ උන්වහන්සේ සමග සංවාදයේ යෙදුණු අයගේ විචක්ෂණශීලී බවේ අඩුව සැලකිල්ලට ගනිමින් විය හැකිය. මෙම අර්ථනිරූපණය නිවැරදි නම්, එයින් අදහස් වන්නේ චූළකම්මවිභංග සූත්‍රයේ බුදුපියාණන් වහන්සේගේ වචන වචනාර්ථයෙන් ගතහොත් අප නොමඟ යනු ඇති බවයි.

බුදුපියාණන් වහන්සේගේ ධර්මදේශනා වර්ග දෙකකින් යුක්ත බව අවධානයට ගන්නට ලැබීම සිත්ගන්නා කරුණකි. එනම්, වක්‍ර අර්ථයෙන් (නෙයියත්ථ), අර්ථනිරූපණය අවශ්‍ය වන අතර, ඒවා වචනානුසාරයෙන් ගත යුතු නොවේ. ඍජු අර්ථයෙන් යුක්ත දේශනාවලින්, (නීතත්ථ) හරියටම පවසන දෙයෙහි අර්ථය වශයෙනි. චූළකම්මවිභංග සූත්‍රය පළමුවැන්නට උදාහරණයක් ලෙස මම දක්වමි. එය වචනානුසාරයෙන් ගත යුතු නොවේ. (**23**)

## කර්මය සහ කායික ස්වරූපය

බුදුපියාණන් වහන්සේ හේතු-කාරකව හට ගත් ශරීරය (**කරජකාය,** A.V,300) සහ ශරීරය ''පැරණි කර්මය'' (පුරාණ-කම්ම, S.IV,132) හේතු කර ගත් ඵලය පිළිබඳව සාකච්ඡා කරන විට, උන්වහන්සේ කායික පෙනුම හෝ උපලක්ෂණ අතීතයේ සිදු කරන ලද යහපත් හෝ අයහපත් ක්‍රියාවල විපාක වශයෙන් අදහස් නොකළහ. (**24**) ඒ වෙනුවට, උන්වහන්සේ අදහස් කළේ අප නැවත ඉපදෙන විට එය සාමාන්‍යයෙන් භෞතික ශරීරයක් බවට පත්වෙන අතර, ඒ නිසා ශරීරය කර්මය නිසා ඇතිවන බව පැවසීම තර්කානුකූලව පිළිගත හැකිය.

විපාකයට භෞතික ක්ෂේත්‍රය තුළ විද්‍යමාන විය හැකිය යන අදහස ඇති තවත් ස්ථානයක් වන්නේ ත්‍රිපිටකයේ ලක්ඛණ සූත්‍රයේය. එහි ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකුගේ (මහා-පුරිස-ලක්ඛණ) සලකුණු පිළිබඳව සඳහන් කරයි. මෙම සංකල්පයට අනුව, බුද්ධත්වයට පත් වූ උතුමන්වහන්සේලාගේ ශරීරය විශේෂ සලකුණු 32ක් ප්‍රදර්ශනය කරයි. මෙම සලකුණු සමහරක් නූතන මනසට ඉතා කුතුහලයක් සහ විකාර රූපී බවක් ඇති කරයි. පෙනෙන ආකාරයට ඒවා පැරණි ඉන්දියානුවන්ට අනුග්‍රහයක් වශයෙන් සම්බන්ධ කර ගැනීමට හේතුවී ඇත. මෙම ධර්මදේශනාවට අනුව, බුදුපියාණන් වහන්සේට සලකුණු 32ක් තිබුණු අතර, ඒ සියල්ලම ''උන්වහන්සේගේ අතීත භවයන් බොහොමයකදී බොහෝ ප්‍රයෝජන ගෙන දෙන ප්‍රබල ක්‍රියාකාරකම් සිදු කිරීම, කයෙන්, වචනයෙන් සහ සිතින්, නොසැලෙන ලෙස යහපත් හැසිරීමෙන් යුක්තවීමේ ප්‍රතිඵලයි''. උදාහරණ වශයෙන් උන්වහන්සේට වේගයෙන් දුවන මුවෙකුගේ වැනි පාද තිබුණේ පෙර භවයන්හිදී උන්වහන්සේ ගුරුවරයෙකු වශයෙන් උන්වහන්සේගේ ශිෂ්‍යයන්ට ඔවුන්ගේ පාඩම් ඉක්මනින් අධ්‍යයනය සඳහා උපකාර කර තිබීමයි. උන්වහන්සේට දැලකින් වැසුණු අත ඇඟිලි සහ පා ඇඟිලි තිබුණේ උන්වහන්සේ අනෙක් අයට කරුණාවෙන් සැලකීමේ ප්‍රතිඵලයක් ලෙසය. අනෙක් අයට මෘදු සහ සැලකිලිමත් අයුරෙන් කතා කළ නිසා, උන්වහන්සේට නළල ලෙවකෑමට හැකි තරම් දිගු දිවක් තිබුණි. බුදුපියාණන් වහන්සේගේ ගැඹුරු නිල් පැහැ දෑස්, උන්වහන්සේගේ කරුණාබර සහ දයාබර බැල්මේ ප්‍රතිඵලයකි. බුදුපියාණන් වහන්සේගේ දිගු දැත්වලින් නොනැමී දණහිස් ස්පර්ශ කළ හැකි වූයේ වෙනත් පුද්ගලයන්ට උපකාර කිරීම ආදියට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙසය (D.III,142). මෙය අතීත කර්ම සමග කායික ගුණාංග පැහැදිලි ලෙස සම්බන්ධ කරයි. මෙම සමහර විපාක කර්මානුකූල සමාන්තකරණයට උදාහරණ වන බව පෙනේ. කර්මයේ ප්‍රතිවිපාකවලට ප්‍රධාන වශයෙන් මානසික බලපෑමක් ඇති බව සහ කර්මානුකූල සමාන්තකරණය (අනුවර්තීවාදය) බොළඳ අදහසක් බවත් යන පෙර සඳහන් කළ ප්‍රකාශයට අනුව, මෙය පැහැදිලි කළ හැක්කේ කෙසේද? විශේෂ සලකුණු 32 ක පිළිබඳ ධර්මය අයත් වන්නේ බොහෝ විට බෞද්ධ ධර්ම ග්‍රන්ථවන ත්‍රිපිටකයෙහි නවතම පංතියේ බව බොහෝ විද්වත්හු එකඟ

වෙති. මෙම ධර්මය, බුදුපියාණන් වහන්සේ වෙනත් මිනිසුන්ට වඩා කායිකව වෙනස් නොවන බව විස්තර කර ඇති ත්‍රිපිටකයේ බොහෝ ප්‍රකාශයන්ට පටහැනි බව පෙන්වා දිය යුතුයි. අජාසත්ත රජු බුදුපියාණන් වහන්සේ බැහැ දැකීමට ගිය විට, ඔහුට අවට සිටින භික්ෂූන් වහන්සේලාගෙන් බුදුපියාණන් වහන්සේ වෙන් කොට හඳුනා ගැනීමට නොහැකි වූ අතර, (D.I,50) පුක්කුසාති බුදුපියාණන් වහන්සේ සමග පැය ගණනාවක් කතා කරමින් සිටියද, තමන් කතා කරමින් සිටියේ බුදුපියාණන් වහන්සේ සමග බව අවබෝධකර ගත්තේ පසුවය (M.III,238). බුදුපියාණන් වහන්සේට සලකුණු කිසිවක් තිබුණා නම්, අජාසත්ත සහ පුක්කුසාති එය දැක ඔවුන් සිටින්නේ ඒ උත්තරීතර පුද්ගලයා අභිමුඛයේ බව වහාම දැන ගන්නට ඉඩ තිබුණි. ගයාවට යන මාර්ගයේදී 'උපකට' බුදුපියාණන් වහන්සේ සක්මන් කරමින් සිටිණු හමුවිය. ඔහුට බුදුපියාණන් වහන්සේගේ වඩා හොඳින් පෙනුණේ උන්වහන්සේගේ ''පැහැදිලි ඉන්ද්‍රියයන් සහ දීප්තිමත් සමේ ස්වාභාවික වර්ණයයි.'' (M.1,170). ඔහු උන්වහන්සේගේ විශේෂ සලකුණු තිබුණු බවක් දුටු බවට සඳහන් නොකළේය. බුදුපියාණන් වහන්සේට සැබැවින්ම එවැනි සලකුණු තිබුණේ නම්, පැහැදිලිව පහසුවෙන් පෙනෙන්නට තිබිය යුතුයි. එබැවින් බුදුපියාණන් වහන්සේ කායික වශයෙන් සාමාන්‍ය හෝ උන්වහන්සේගේ කායික සාමාන්‍යබව උපකල්පනය කරමින් විස්තර කළ ග්‍රන්ථ රාශියක් අප සතුව තිබේ. සුළු සංඛ්‍යාවක් උන්වහන්සේට සලකුණු 32ක් තිබූ බව කියති. මේ අනුව, සලකුණු 32ක් තිබෙන බවට සඳහන් උද්ධෘත අලුතෙන් ඇතුළු කළ දෙයක් ලෙස උපකල්පනය කිරීම සාධාරණය.

නමුත් සලකුණු 32ක් පිළිබඳ ධර්මයෙන්ම, කර්මානුරූප ප්‍රතිවිපාක ශරීරය තුළ විද්‍යමාන විය හැකිය යන අදහස වෙනත් ප්‍රශ්න මතු කරයි. අප කලින් දුටු පරිදි, අතීතයේ සිදු කළ යහපත් ක්‍රියාවන් මගින් කායික සුන්දරත්වය ලෙස විදහා දැක්විය හැකි යැයි චූළකම්මවිභංග සූත්‍රය අර්ථ දැක්විය හැකිය. එනම්, සුන්දරත්වය යහපත් දේ කිරීමෙන් ලැබෙන ''ප්‍රතිඵලයකි.'' කෙසේ වෙතත්, ලස්සන කුමක්ද සහ ලස්සන නොවන්නේ කුමක්ද යන්න පිළිබඳ මත කාලයෙන් සහ ස්ථානයෙන් යන දෙකෙන්ම වෙනස් වේ. සමහර විට මුළුමනින්ම අනපේක්ෂිත සහ ප්‍රබෝධ කරන ආකාරයෙනි. උදාහරණයක් ලෙස, උතුරු බුරුමයේ සහ තායිලන්තයේ 'කායන්' මිනිසුන් අසාමාන්‍ය ලෙස දිගු බෙල්ල ලස්සන යැයි සලකන අතර, මීට ශතවර්ෂයකට පමණ පෙර චීන ජාතික පිරිමි, ගැහැණුන්ගේ කුඩා පාද ඉතා ආකර්ෂණීය යැයි තීරණය කළහ. වර්තමානයේ බොහෝ මිනිසුන් එවැනි අවලක්ෂණයන් හේතු කර ගෙන අප්‍රසාදයට ලක් විය හැකිය. 17වන ශතවර්ෂයේ යුරෝපීය පරමාදර්ශී කාන්තාව සුදුමැලි සහ තරබාරු පුද්ගලයෙකි. මෙම ගතිලක්ෂණ වර්තමානයේ දුර්වල සෞඛ්‍යය හා සම්බන්ධ වේ. වර්තමානයේ, පරමාදර්ශී වන්නේ සිහින් සහ හමේ දුඹුරු පැහැයයි. නිවසට සමීපව, සලකුණු 32 ක්, පැරණි ඉන්දියාවේ සුභදායක සහ ප්‍රියජනක ලෙස සලකණු ලැබුණි. අද ඒවා ඕනෑම දෙයක්

ලස්සනයි මෙන්, අස්වාභාවික ලෙස සලකනු ලැබේ. ඉතින් ප්‍රශ්නය මෙයයි: කායික ලක්ෂණ සමග යහපත් පුද්ගලයෙකුට යම් සංස්කෘතියක සහ එවැනි ලක්ෂණ ආකර්ෂණීය යැයි සලකන මොහොතක, අනාගතයේදී රූමත්ව නැවත ඉපදීමට කලින් තීරණය කරන සාධකය කුමක්ද? පැහැදිලි කිරීම් කිසිවක් ඉදිරිපත් වී නොමැත. සැබැවින්ම, එවැනි ඇඟවීම් කිසි විටකත්, සලකා බලන බවක් නොපෙනේ. නැවතත්, කර්මය යනු සම්පූර්ණයෙන්ම සර්වඥ ඥාණයක් ලෙස සිතීමේ ගැටලුව අපට මතුවී ඇති නමුත්, එය නිල වශයෙන් හඳුනාගෙන නැත. මේ සියල්ල පැවසීමෙන් පසු, විපාක විද්‍යමාන වන කායික වපසරිය ස්වල්පයක් තිබිය හැක. පුද්ගලයෙකුගේ මනසෙහි තත්ත්වය, සමහර රෝග උත්සන්න වීමට, අන් අය සුවපත් කිරීමට උපකාර කිරීමට, හෝ සැබැවින්ම සමහර රෝග ඇතිවීමට ද, යනාදී වශයෙන් ඔහුගේ සෞඛ්‍යයට යම් බලපෑමක් ඇති කළ හැකි බව, සාමාන්‍යයෙන් පිළිගැනේ. මෙයට සමහර කායික පීඩාවලට කර්මානුකූල හේතුවක් තිබිය හැකි බව බුදුපියාණන් වහන්සේ කළ ප්‍රකාශය අනුරූපී වේ. (2)

සමහර පර්යේෂණවලින් පෙනී යන්නේ ඇතැම් මානසික ක්‍රියාකාරකම් මොළයට බලපෑමක් ඇති කළ හැකි බවයි. සංගීත පුහුණුව ලැබූ දරුවන්ට එසේ පුහුණුවක් නොලැබූ අයට වඩා ඉහළ බුද්ධි ඵලයක් ඇති බවට සාධක සාක්ෂි ඇත. මූලික පර්යේෂණවලින් පෙනී යන්නේ ''මානසිකව ක්‍රියාශීලීව'' සිටීම වයසට යෑම නිසා ඇති වන මොළයේ පිරිහීමෙන් සිදු වන චිත්ත වික්ෂේපය යන රෝගය වළක්වා ගත හැකි බවයි. කෙසේ වෙතත්, මේ සියල්ල සහ ඔබ මේ ජීවිතයේදී භික්ෂුවකට පයින් ගැසුවොත් ඊළඟ ජීවිතයේදී උපතින්ම විකෘත වූ පාදයක් සමග ඉපදෙනු ඇතැයි යන අදහස අතර විශාල වෙනසක් ඇත. කයට කර්මය බලපාන තවත් උදාහරණයක් නම්, ඇතැම් මානසික තත්ත්වයන් මුහුණට බලපාන අවස්ථාවන් පිළිබඳවයි. බුදුපියාණන් වහන්සේ පැවසුවේ කරුණාබර චිත්ත ස්වභාවයක් හෝ ගැඹුරු අභ්‍යන්තර ශාන්තියක් තුළින් මුහුණට දීප්තිමත් පැහැයක් ලබා දිය හැකි බවයි. (S.I,5; III,236; V,301) කෙසේ නමුත්, එවැනි කායික ලක්ෂණවලින් මානසික තත්ත්වයන් වෙනස් වන විට ඒවා විපාක ලෙස සැලකිය හැකිද යන්න නිශ්චිත නැත.

### ගොඩනැගිලි ගිණිතැබීම

සැබෑ ජීවිතයේදී සිදුවෙන්නට හැකි උදාහරණ දෙකක් කර්මයේ ක්‍රියාකාරීත්වය පැහැදිලි කිරීමට උපකාරී විය හැකිය. එක් මිනිසෙකු දිනක් නිවසට යාමට වාහනය පදවාගෙන යන විට, ඔහුගේ නිවස ගිනිගෙන ඇති බව දකියි. ගිනි නිවන හමුදාව මේ වන විටත් පැමිණ ගින්න නිවීමට උත්සාහ කරමින් සිටියහ. අසල්වාසීහු අවට සිට ගෙන බලා සිටියහ. මිනිසා එම දර්ශනයෙන් බියෙන් තැති ගෙන ඊළඟ පැය දෙක දැඩි කනස්සල්ලෙන් ගත කරන්නේ අවම වශයෙන් තම නිවස සහ දේපළවලින් කොටසක්වක් ඉතිරි වනු ඇතැයි

බලාපොරොත්තුවෙනි. ගින්නෙන් සියල්ල විනාශ වන බවට පැහැදිලි වන විට, ඔහුට බලාපොරොත්තු සුන්වීමක් ඇති විය. සානුකම්පිත අසල්වැසියෙකු ඔහු ඇයගේ නිවසට කැඳවාගෙන ගොස් ඇත්තේ ඔහුට ටික වේලාවක් ඉඳගෙන සිටිමින් ඉදිරි දින කිහිපය තුළ ඔහු කළ යුත්තේ කුමක්ද යන්න සැලසුම් කිරීමටය. ඔහු දිරිමත් කිරීම සඳහා ඈ මෙසේ කීවාය: ''හොඳයි, අඩුම තරමින් ඔබට රක්ෂණයක්වත් තිබේ.'' හදිසියේම ඔහුගේ මුහුණේ බියපත් බැල්මක් ඇති විය. ඔහු කෙඳිරිගාමින් ඔහුගේ අත්දෙක මත හිස රැඳෙව්වේය. කාර්යබහුලවීම නිසා පසුගිය මාසයේදී තමා රක්ෂණ ඔප්පුව කල්ඉකුත්වෙන්නට හැරි බව ඔහුට මතක් විය. ඊළඟ මාස කිහිපය තුළ ඔහු සිදුවූ විපත්තිය සම්බන්ධයෙන් වෙහෙස වන විට, ඔහුට මානසික අවපීඩනයෙන්, කෝපයෙන් සහ කණගාටුවෙන් වේදනා විඳින්නට සිදු විය. අවසානයේ ඔහු එයින් එගොඩ විය. නමුත්, ඔහුට ගින්න පිළිබඳව මතක් වන විට, සහ ඔහුගේ රක්ෂණ ඔප්පුව යාවත්කාලීන  කිරීමට නොහැකි වීම සම්බන්ධයෙන් තවදුරටත් ඉඳහිට කෝපයෙන් ඔහුටම දෝෂාරෝපණය කර ගත්තේය.

නගරයේ අනෙක් පැත්තේ, එම වේලාවේම තවත් ගින්නක් ඇති වී කාන්තාවකගේ ව්‍යාපාරය ගින්නෙන් විනාශ වූයේ යැයි කියමු. ඇයද දොම්නසින් සහ සාංකාවෙන් ප්‍රතික්‍රියා කළ නමුත්, පැය කිහිපයක් තුළ එය ඉවසා දරා ගත්තාය. ඇයගේ සාමාන්‍ය ධෛර්යවත් තත්ත්වය සම්පූර්ණයෙන්ම උපදවා ගත්තාය. ඇයගේ ක්ෂණික ප්‍රශ්නය සම්බන්ධයෙන් කටයුතු කිරීමට උත්සාහ කළාය. ඇයගේ ප්‍රතික්‍රියාව එවැනි අවස්ථාවක සැබැවින්ම අනපේක්ෂිත එකක් වන නමුත්, කොහෙත්ම නොහැකි දෙයක් නොවේ. එම පුරුෂයා කාන්තාවට වඩා ඉතා වෙනස් ආකාරයට ප්‍රතික්‍රියා කළේ ඇයි? ඔහුගේ දුක්විඳීම සහ කණස්සල්ල එතරම් දික්ගැස්සුනේ ඇයි? කාන්තාවගේ එම තත්ත්වය කෙටි කලකට පමණක් සීමා වූයේ ඇයි? පිළිතුර වන්නේ ඔවුන්ට අදාළ කර්ම නිසා බවයි. එනම්, ඔවුන්ගේ වෙනස්වූ අතීත කර්ම නිසාය. පුරුෂයා සම්බන්ධයෙන් ගත් කල, ඔහුගේ ජීවිතයේ වැඩි කාලයක් ඔහු යම් බාධාවක් අත්විඳින විට හෝ යම් දෙයක් වැරදුන විට ඔහු ඒවාට ප්‍රතික්‍රියා දක්වා ඇත්තේ සෘණාත්මකවය. ඔහු කුපිතවීමට, ඇවිස්සීමට සහ නොඉවසන තත්ත්වයට පත්වෙමින්, කෝපයෙන් ඔහුට හෝ අනෙක් අයට චෝදනා කරමින්, සහ සියලු ප්‍රතිවිපාකමය සෘණාත්මක හැඟීම් අත්විඳිමින්, සෙමින් මැසිවිලි කියන්නට පටන් ගත්තේය. ගින්දරට සහ ඒ හා පැවති දුක්විඳීම්වලට ඔහු දැක්වූ ප්‍රතික්‍රියා වන්නේ ඔහුගේ පෙර කර්මවල විපාකයි. එසේම ඔහු දැන් දක්වන ප්‍රතික්‍රියා තවදුරටත් බලවත් වනු ඇත. ඉදිරි අනාගතයේදී ඔහු ඒ ආකාරයටම ප්‍රතික්‍රියා දැක්වීමට බොහෝ ඉඩ කඩ ඇත. ඔහුගේ සෘණාත්මක තරහෙන් පිපිරීමෙන් වැඩි බලපෑමක් ඇති නොවීය. නමුත්, එකකට පසු තවත් එකක්, පෙර තත්ත්වය වර්තමාන තත්ත්වය ශක්තිමත් කරමින්, ක්‍රමයෙන් ගොඩනැගුණු විට, අවසානයේ එය ඔහුගේ චරිතයේ කොටසක් බවට පත් වී

ඇත. ඔහු සෘණාත්මක ලෙස පරාජයේදී ප්‍රතික්‍රියා දැක්වීම දැන් සම්පූර්ණයෙන්ම නොවැළැක්විය හැකිය. ඔහුගේ වර්තමාන ප්‍රතික්‍රියා වචනාර්ථයෙන් තීරණය වන්නේ ඔහුගේ අතීත ක්‍රියාවන් මගිනි. නිවෙස ගිනිගැනීම ඔහු හෝ වෙනත් කෙනෙකුගේ කර්මය හේතුකරගෙන සිදු වූවක් නොවේ. එය හුදෙක් ලෝකයේ සිදු විය හැකි සිදුවීමකි. එයට හේතුවක් හෝ හේතු තිබුණි. නමුත් එය කර්මානුරූප එකක් නොවේ. එය විදුලි දෝෂයක් නිසා, අකුණු සැර වැදීම නිසා, සමහර විට ගිනි තැබීම නිසා සිදු විය හැකිය. ඔහු එයට ප්‍රතික්‍රියා දැක්වූ ආකාරය, නිවෙස ගිනි ගැනීම පිළිබඳව ඔහුට හැඟුණු ආකාරය, ඔහුගේ පෙර කර්මයේ විපාකයි. කාන්තාව ඒ හා මුළුමනින්ම සමානම සිද්ධියක්වූ ඇයගේ ව්‍යාපාරය විනාශවීම පිළිබඳව වෙනස් ආකාරයකට ප්‍රතික්‍රියා දැක්වූයේ ඇයි? එයට හේතුව ඇය සැමවිටම ස්වභාවිකවම ධෛර්යවත් සහ කලබල නැති ගතිලක්ෂණ ඇයගේ අතීත භවයකින්ම ගෙන එන්න ඇතැයි බෞද්ධයෙකු කියනු ඇත. නමුත් මේ අවස්ථාවේදී, ඇය තරුණ වියේදී යම් දෙයක් සඵල නොවුණු විට සෘණාත්මකව ප්‍රතික්‍රියා දක්වා ඇත. නමුත් කාලයත් සමග එය කෙතරම් අනර්ථ ප්‍රතිඵල ගෙන දෙන්නක්ද යන්න ඇයට පසක් විය. ඈ විවිධ නොකැලඹීමේ විධි වේදයන් ඉගෙන ගත්තාය. අවසානයේ භාවනාවට යොමු වූවාය. ඇයගේ විවිධ ප්‍රතික්‍රියා පිළිබඳව සෝදිසියෙන් සිටිමින් ඒවායෙන් ඈත්වීමට භාවනාව ඇයට උගන්වනු ලැබුණි. මෙය ක්‍රමයෙන් ඇගේ ජීවිතයේ විවිධ උඩු යටිකුරුකම් හමුවේ වඩාත් සමබරවීමටත්, උපේක්ෂාවෙන් යුක්ත හැඟීමකින් ජීවිතය පවත්වා ගැනීමටත් ඉඩ සලස්වන ලදී. තවමත් ඇය විවිධ පසුබැසීම්වලදී සෘණාත්මකව ප්‍රතික්‍රියා දක්වන නමුත්, සෑම අවස්ථාවකදීම එම ස්වභාවය මඳක් අඩුය. සාපේක්ෂව සන්සුන්ව රැඳී සිටීමේ හැකියාව, එනම් ඇයගේ කර්ම විපාක නිසා ඇති වී තිබේ. ඇයගේ ව්‍යාපාරය විනාශ වූයේ ඇයගේ අතීත කර්මවල ප්‍රතිඵල නිසායි. එනම්, ඇයගේ අතීත කර්මයි. නැවතත්, ඇයගේ ව්‍යාපාරය ගිනිගැනීමට හේතුව ඇයගේ හෝ වෙනත් කෙනෙකුගේ කර්මය නිසා නොවේ. එය හුදෙක් ''එවැනි දේවලින් එකකි.''

## ස්වභාවික හේතු, කර්මානුකූල හේතු

මෙම උදාහරණ දෙක බොහෝ දෙනෙකුට අවබෝධ කරගන්නට හැකි වනු ඇත. නමුත්, සමහරු මෙසේ අසනු ඇතඃ ''නමුත් යහපත් අය සමහර විට දුක්විඳින්නේ ඇයි? අයහපත් පුද්ගලයන් දඬුවම් රහිතව නිදහස් වන්නේ ඇයි?'' බෞද්ධ දර්ශනය හේතු සාධක උගන්වයි. එහි අදහස සිද්ධීන්වලට හේතුවක් හෝ හේතු තිබෙන බවයි. නමුත්, එය ස්වාභාවික හේතු සහ සදාචාරාත්මක හේතු වශයෙන් වෙනසක් දක්වයි. වැසි කුණාටුවක් යනු ස්වාභාවික සිද්ධියක් සහිත ස්වාභාවික හේතුවක් හෝ හේතු මාලාවකි. වර්ෂාව නිසා මගේ සති අන්ත සැලසුම් නාස්තිවීම පිළිබඳව කෝපවීම සහ ශනිදා සහ ඉරිදා දේශගුණයට සාප කරමින් කෝපයට පත්වීම කර්මානුකූල

සිදුවීමක් වන අතර, එයින් සෘණාත්මක විපාක ඇති වේ. සැබැවින්ම කෝපයෙන් ඇති වන පීඩාකාරී බවෙන් මතුවන අප්‍රසන්න හැඟීම විපාකයි. මට වර්ෂාව පාලනය කළ නොහැකිය. නමුත්, මට වර්ෂාව පිළිබඳ ආකල්පය කෙරෙහි මගේ ප්‍රතික්‍රියා සම්බන්ධයෙන් යම් පාලනයක් ඇත, නැතහොත් පාලනය කළ හැකිය. බෞද්ධ මනෝවිද්‍යාව වේදනාව (දුක්ඛ) සහ දුක්විඳීම (දෝමනස්ස) යන දෙක අතර වෙනසක් දක්වයි. **(25)** වේදනාව කායික දෙයක් වන අතර, දුක්විඳීම මනෝවිද්‍යාත්මක දෙයකි. මා බර දෙයක් මගේ පාදය මතට අත හැරියොත්, මට කායික වේදනාවක් අත්විඳින්නට සිදුවෙයි. එසේම උනන්දුව රහිත වීම පිළිබඳව මා කෝපවෙනු ඇත, ශාප කරනු ඇත, බැණ වදිනු ඇත, සහ තදින් කෝපයට පත් වෙනු ඇත. මෙම දෙවන ප්‍රතික්‍රියාව මා අත්විඳින අප්‍රසන්නබව සංකීර්ණ කරයි. මට වේදනා නාශයක් නොමැති නම්, මගේ වේදනාව පාලනය කර ගත නොහැකි වනු ඇත. එයට ස්වභාවික හේතුවක් හෝ හේතු ඇත. නමුත්, වේදනාව කෙරෙහි ඇති ප්‍රතික්‍රියාව සම්බන්ධයෙන් පාලනයක් ඇත, නැතහොත් පාලනයක් කළ හැකිය. වර්ෂාව නිසා මේ සතිඅන්තයේ පිටත ක්‍රියාකාරකම් කිරීමට නොහැකි බව සතුටින් පිළිගෙන මා වෙනත් දෙයක් කිරීමට තෝරාගෙන, එය කරමින් මට ප්‍රීතිමත් විය හැකිය. මිනිසුන් වේදනාව හෝ සතුට අත්විඳීමට අදාළ වන සංකීර්ණ හේතු රාශියක් ඇත. ඒවා නම් වැරදි හෝ හරි වේලාවේ වැරදි හෝ හරි ස්ථානයේ සිටීම, හෝ එය ''හුදෙක් එවැනි දේවලින් එකක් වීම'' නිසාය. විශ්වය සහ ඒ තුළ ඇති සෑම බලයක් සහ වස්තුවක්ම නිරන්තරයෙන්ම ක්‍රියාශීලී තත්ත්වයක පවතී. සමහර විට දේවල් සහ සිදුවීම් අපගේ වාසිය පිණිස ගමන් කරන අතර, සමහර විට ඒවා අපට අහිතකර ලෙස ගමන් කරයි. විශ්වය කරන දේ හෝ කරන්නට ඇති දේ පාලනය කිරීමට හෝ අනාවැකි කීමට අපට ඇති හැකියාව සීමිතය. ඉතින් යහපත් මිනිසුන්ට සමහර විට වේදනා විඳින්නට සිදුවීම සහ අයහපත් මිනිසුන්ට සමහර විට සතුට භුක්ති විඳින්නට සිදුවන්නේ ඇයි? එයට හේතුව, අනෙක් සියලු දෙනා මෙන්ම, ඔවුන්ද ජීවත් වන්නේ ක්‍රියාශීලී විශ්වයක නිසාය. මිනිසුන් සතුට හෝ දුක්විඳීම අත්විඳින්නේ ඇයිද යන්න තවත් කාරණයකි. ඒ ඔවුන්ගේ කර්මය හේතුකරගෙනය. අපගේ මනස ක්‍රියා කරන්නේ කෙසේද කියා තේරුම් ගන්නට, ඉගෙන ගන්නට සහ ක්‍රමයෙන් වෙනස් වන්නට හැකි නම්, අපට දුක්විඳින්නට සිදු වන්නේ ඉතා අඩුවෙනි, අපට දුක්විඳීම්වලින් නිදහස් විය හැකි තත්ත්වයට පවා එළඹිය හැකිය. එවිට අපට නිරන්තර සාමය සහ සතුට පවතින තත්ත්වයක වාසය කළ හැකිය.

## කර්මය පිළිබඳව අනුමාන කිරීම

කර්මය විසින් තීරණය කරනු ලබනවා යැයි කීමට වඩා කර්මය විසින් අප පාලනය කරනු ලබන බව පැවසීම නිවැරදිය. විපාක පවා පාලනය කරනු ලබන බව අප දැක ඇති නිසා, එනම් අපගේ කර්මානුකූල පසුතලයෙන්,

අපගේ චේතනාවල තීව්‍රතාවෙන්, මිශ්‍ර චේතනාවලින් ක්‍රියා කිරීමෙන්, යම් විශේෂ ක්‍රියාවකට පසු අප කරන දේ ආදී වශයෙනි. එක් ඒකල ක්‍රියාවක් අනිවාර්යයෙන්ම නිශ්චිත ශක්තියක හෝ සමානුපාතිකයක තනි බලපෑමකට මඟපාදයි යන අදහස බහු-ආංශික සංසිද්ධි සරල කර දක්වයි - එනම් කර්මයයි. සම්මෝහවිනෝදනියේ නිවැරදිව මෙසේ සඳහන් කරයි: ''එක් හේතුවකින් එක් ප්‍රතිඵලයක් හෝ බොහෝ ප්‍රතිඵල ඇති නොවේ. බොහෝ හේතුන්ගෙන් එක් ප්‍රතිඵලයක් පමණක් ඇති නොවේ. නමුත්, ඊට වඩා, බොහෝ හේතුන්ගෙන් බොහෝ ප්‍රතිඵල ඇති වේ.''[3] එහි ප්‍රතිඵලයක් ලෙස, ඕනෑම විශේෂ කර්මයකින් ඇති වන විපාක පිළිබඳව අනුමාන කිරීම කළ නොහැකි දෙයක් සහ බුද්ධිමත් දෙයක් නොවන බව පවා බුදුපියාණන් වහන්සේ පැවසූහ. **(26)** මෙසේ පවසමින් උන්වහන්සේ අදහස් කළේ කර්මයේ සාමාන්‍ය පොදු ධර්මතා පිළිබඳව අවබෝධ කිරීමට උත්සාහ කිරීම සඳහා කරදර නොවිය යුතු බව නොවේ. නමුත්, එක් පුද්ගලයෙකුට යම් අත්දැකීමක් ලැබීමට කරන කර්මයක් හේතුවුණේ ද, හෝ තවත් පුද්ගලයෙකු යම් දෙයක් කිරීමෙන් කුමන විපාකයක් ඇති වේද, හෝ තුන්වන පුද්ගලයෙකු විසින් ඔහු කරන දෙයින් ඔහුට කුමන ආකාරයක භවයක් ලැබේද යනාදී ලෙස අදහස් පළ කිරීම නිවැරදි විය නොහැකිය. අපේම කර්මානුකූල පසුබිම, ආශාවන්, චේතනාවන් සහ ප්‍රතික්‍රියාවන් දැන ගැනීම දුෂ්කරව තිබියදී, අනෙක් අයගේ දේවලට ඉඩ හැරීම දුෂ්කරය. ඕනෑම මට්ටමක නිරවද්‍යතාවයකින් මෙය කිරීමට ප්‍රඥාවක් සහ ඇතුළු-නුවණක් ඇත්තේ බුද්ධත්වයට පත් උතුමන් වහන්සේ නමකට පමණි. **(27)**

මෙසේ පවසමින්, කර්මය පිළිබඳ මූලික සංකල්පය අවබෝධ කර ගැනීම සහ ඒ පිළිබඳව මෙනෙහි කිරීම ආධ්‍යාත්මික ජීවිතයට උපකාරී වන බව සත්‍යයකි. කෙනෙකුගේ ක්‍රියාවන් සම්බන්ධයෙන් ඉක්මනින් හෝ පසුව බලපෑමක් ඇති කරනු ඇති බව සලකන විට, එය යහපත් දේ කිරීමට සහ නපුරෙන් වැළකී සිටීමට ප්‍රබල පෙළඹවීමක් වේ.**(28a,b)** අනෙක් අය අයහපත් ලෙස හැසිරෙන විට හෝ ඔවුන්ගේ අයහපත් හැසිරීම නිසා අප ඔවුන්ගේ ගොදුරක් වූ විට, ඔවුන් කරන දෙයින් අප මෙන්ම ඔවුන්ටද එය බලපාන බව සිහියට නැගීමෙන්, අප විවේචනාත්මකවීමෙන්, ස්වයං-ධාර්මිකතාව, කෝපයට පත්වීම හෝ පළිගන්නාසුලු වීම වැනි දේවල්වලින් අපට නිදහස්වීමට උපකාරී වේ. **(29a,b)** අනෙක් අය ගුණවත්, වික්‍රමාන්විත හෝ පරාර්ථකාමී සහ එයින් යහපත උදාකරගන්නා ආකාරය අප දකින විට, අපට ඔවුන්ගේ හැසිරීම ඕනෑකමින් අනුකරණය කිරීමට උත්සාහ කළ හැකිය.

**සටහන්**

1. පුද්ගලයෙකුගේ මව, පියා හෝ අර්හතුන් වහන්සේලා ඝාතනය කිරීම, බුදුන්වහන්සේ නමකට තුවාල කිරීම හෝ සංඝයා අතර භේද ඇති කිරීම

ඉතා සෘණාත්මක කර්ම වශයෙන් නිකායයන්වල සඳහන් කර තිබුණත්, ඒවා ක්ෂණික ක්‍රියා සහ ස්ථිරවම ඇතිවන ප්‍රතිවිපාක ලෙස විශේෂයෙන්ම, කොතැනකවත් පවසා නැත. (ආනන්තරිය) බලන්න A.I,27; III,438-9 and Sn.231. [back]

2. දේවල් සඳහා හේතු පහ, එනම් ඍතුමය හේතු (උතු-නියාම), ජීවවිද්‍යාත්මක හේතු (බීජ-නියාම), කර්මානුකූල හේතු (කම්ම-නියාම), මනෝවිද්‍යාත්මක හේතු (චිත්ත-නියාම) සහ (ධම්ම නියාම)යි. මෙය ක්‍රි. පූ. 5 වන සියවසේ අත්ථසාලිනී හි මුලින්ම සඳහන් කරන ලද විවරණමය අදහසකි. යථාර්ථය නම්, කර්මානුකූල හේතු සහ මනෝවිද්‍යාත්මක හේතු සමාන බවයි.[back]
3. එකතො හි කාරණතො න ඉධ කිඤ්චි එකං ඵලම්-අනෙකං, නාපි අනෙකෙහි කාරණෙහි ඒකං, අනෙකෙහි පන කාරණෙහි අනෙකම්-ඒව හෝති, p.147). [back]

# කර්මය සහ නැවත ඉපදීම

බුදුපියාණන් වහන්සේට අනුව, උන්වහන්සේ සසර ලෙස හැඳින්වූ, ඉපදීම, මියයෑම සහ නැවත ඉපදීම, යන අඛණ්ඩ ක්‍රියාවලිය වේදනාව සහ දුක්විඳීම්වලින් අන්තර්ගතවී ඇත.

මෙම ජීවිතයේදී පැවැත්ම තුළ ඇතුළත් වී, ග්‍රහණය වී ඇති සියලු වේදනාවන් සහ පීඩාවන් අපට වළක්වා ගත හැකි වුවද, ඊළඟ භවයේදී එය මගහැරිය හැකි බවට සහතිකයක් නැත. මේ අනුව, බුදුපියාණන් වහන්සේගේ අවසාන පරමාර්ථය වන්නේ නැවත ඉපදීම නැවැත්වීමට ඉගැන්වීමයි.

මරණයෙන් පසු සිදුවන්නේ කුමක් ද යන්න පිළිබඳව අදහස් තුනකි. භෞතිකවාදය පවසන්නේ අපගේ පැවැත්ම නවතින බවයි. ප්‍රධාන දේවවාදී ආගම් විශ්වාස කරන්නේ අපගේ විශ්වාස සහ හෝ අපගේ ක්‍රියාවලට අනුව අප සදාකාලික ස්වර්ගයට හෝ දඬුවමකට යටත්වන බවයි. බුදුදහම, ජෛන ආගම, හින්දු ආගමේ සමහර අනුවාදයන්, සුළු ආගම් සහ ආධ්‍යාත්මික ව්‍යාපාර කිහිපයක් පවසන්නේ මරණයේදී අප පුනරුත්පත්තියක් ලබන බව, හෝ බෞද්ධ පාරිභාෂිතය භාවිත කිරීම සඳහා අප නැවත ඉපදෙන බවයි. නැවත ඉපදීම සඳහා බුදුපියාණන් වහන්සේ භාවිත කරන ලද යෙදුම නම් ''නැවත ඉපදීමයි'' (පුනබ්භව, D.II,15), ''එක් දරුගැබකින් තවත් දරුගැබකට පියවර ගැනීමයි'' (ගබ්භා ගබ්භං, Sn.278), හෝ සමහර විට ''පැවැත්මකින් පසු පැවැත්මකට'' (භවාභවං, A.III,69; Sn.1060).

කර්මය මෙන්ම, නැවත ඉපදීම හෝ පුනරුත්පත්තිය පිළිබඳ අදහස බුදුපියාණන් වහන්සේගේ කාලයේදී පුළුල් ලෙස පැතිර නොතිබුණි. වේදයේ එය සඳහන් නොවන අතර, මුල් උපනිෂද් බොහොමයකත් සඳහන් නොවේ. උදාහරණ වශයෙන්, තෛත්තිරීය උපනිෂද් උගන්වන්නේ ''මෙම ලෝකය හැර යන විට පුද්ගලයෙකුගේ ආත්මය ආහාර බවට පත්වන බවයි, ජීවිත-මූලධර්මය... මනස තේරුම් ගැනීම හෝ අසීමිත ප්‍රීතිය'' (Tai.3.10.5). නැවත ඉපදීම පිළිබඳ අදහස ප්‍රධාන වශයෙන් සමහර වෛදික නොවන, සාම්ප්‍රදායික නොවන ගුරුවරු අතර වලංගුව තිබෙන බව පෙනේ. නමුත්, තවත් සමහරු එම අදහස භෞතිකවාදයට හෝ ස්වර්ගයට පාක්ෂිවෙමින් ප්‍රතික්ෂේප කර ඇත.

අපගේ ක්‍රියාවන්ට සදාචාරාත්මක වටිනාකමක් ලබාදීමට සහ අපගේ අත්දැකීම්වල ගුණාත්මක භාවයට බලපෑම් කිරීම මෙන්ම, කර්මයේ ඇති වැදගත් ආවරණය වන්නේ අප නැවත ඉපදීමට හේතුකරවීමයි. එක් දෘෂ්ටි කෝණයකින්, කර්මය වර්ග දෙකකින් යුක්තයි - ධනාත්මක සහ සෘණාත්මක වශයෙනි. තවත් දෘෂ්ටි කෝණයකින්, කර්මය සෘණාත්මක වන අතර, එය අපට නැවත ඉපදීමට හේතු කරවයි. අපගේ අභිප්‍රායික ක්‍රියාවන් සියල්ලක්ම ඇලීමෙන් සහ දැඩි ආශාවෙන් (උපාදාන සහ තණ්හා) ගැඹුරු මට්ටමෙන් මුල් බැස ඇත. කර්මයද දැඩි ආශාවට සමාන වේ. **(30a,b,c)** දැඩි ආශාව අප අලුත් ජීවිතයකට බලෙන් යොමු කරන සහ ඉදිරියට තල්ලු කරන ශක්තිය නිර්මාණය කරයි.

ද්‍රව්‍යමය ආහාර වර්තමාන ජීවිතයේ අප ඉදිරියට ගෙනයන ආකාරයටම, කර්මයද අප අනුපිළිවෙලට යන ජීවිත කරා ගෙනයමින් පවතී. **(31)**

නැවත ඉපදීම සිදුවන්නේ කෙසේද? බුදුපියාණන් වහන්සේට අනුව ඕජෝගුණය හෙවත් (ආයු), තාපය (උස්මා) සහ විඥානය (විඤ්ඤාණ) ශරීරයෙන් බැහැර වන විට මරණය සිදුවී ඇතැයි පැවසිය හැකිය. **(32)** නැවත ඉපදීම සිදුවීමට අවශ්‍ය තත්ත්වයන් වන්නේ දෙමව්පියන්ගේ ලිංගික සංසර්ගය (සන්නිපතිත), මවගේ ගැබ්ගැනීමට ඇති සරුබව (උතුනී) සහ නැවත ඉපදීමට අවශ්‍ය විඤ්ඤානයයි (ගන්ධබ්බ). **(33)** මෙම විඤ්ඤානය ''ඉහළට ගමන් කරයි'' (උද්ධගාමි), ඊට පසු ''පහළට බසියි'' (අවක්කන්ති) නොදැනුවත්ව (අසම්පජාන) මවගේ සරු දරුගැබට (D.III,103; S.V,370) පිවිස, එහි ''පදිංචි වේ'' (ඔක්කමිස්සථා, D.II,63). මෙම අවකාශමය විස්තරය බොහෝ විට රූපකයක් පමණක් විය හැකිය.

## අන්තර්භවය

බුදුදහමේ සමහර ගුරුකුලවල උගන්වන්නේ මරණයෙන් පසු විඥානය නැවත ඉපදීමට පෙර යම් නිශ්චිත කාලයක් අන්තර්භවයක (අන්තර්භව) උඩ කරකැවෙමින් සිටින බව හෝ නැවතී තිබෙන බවත්ය. තවත් සමහරු ශරීරයෙන් විඥානය වෙන්වූ වහාම නැවත ඉපදීම සිදුවෙන බව ස්ථිරව ප්‍රකාශ කරති. මරණය සහ නැවත ඉපදීම අතර අන්තරයක් ඇති බව බුදුපියාණන් වහන්සේගේ වචනවලින් හඟවයි. ''කෙනෙකු මරණයට පත් වූ විගස - නමුත්, ඒ වන විට නැවත උත්පත්තියක් නොලැබ සිටින'' අවස්ථාව පිළිබඳව බුදුපියාණන් වහන්සේ වදාළහ (S.IV,400). උන්වහන්සේ බොහෝ අවස්ථාවල පවසා ඇත්තේ නිර්වාණයට පත්වූවෙකුට ''මෙතැනක් නැත, එතැනක් නැත, අන්තර්භවයක් නැත'' බවයි (උදාහරණ S.IV,73; Ud.8). එයින් අදහස් වන්නේ මේ ජීවිතය, ඊළඟ භවය සහ අනුමාන කරන පරිදි, අන්තර්භවයයි. ගන්ධබ්බය පවතින්නේ මෙම අන්තර්භවය තුළ බව පෙනෙන ආකාරයට එය පවත්වා ගෙන යන්නේ සැඟවුණු තණ්හාව (තණ්හා) වන අතර, එය විස්තර වන්නේ හැඟීම් අවුළවන්න (උපාදාන) ලෙසයි. (**34**)

## කර්මය නැවැත්වීම, නැවත ඉපදීම නිමා කිරීම

පුද්ගලයෙකුගේ ධර්මය පුහුණු කිරීම පරිණතවූ විට, සාමාන්‍ය ජීවනාවලියට ඔහුට බලපාන විවිධ ප්‍රසන්න සහ අප්‍රසන්න අත්දැකීම් සඳහා ඔහුගේ ස්පර්ශයට (ඵස්ස) නොඇලීම වැඩිවේ. (**35**) ආධ්‍යාත්මික පුහුණුවේ මුල් අවස්ථාවන්හිදී, ඉඳුරන් පිළිබඳ දොරටු (ඉන්ද්‍රිය-සංවර) වන, සදාචාරාත්මක සංයමය (සීල) සහ සවිඥානක අවධානය (සති) ආරක්ෂා කරගැනීම, ඇලීමෙන් බැහැරවීම සඳහා ප්‍රයෝජනවත් වේ. නමුත්, පුද්ගලයෙකු, ඔහු මිය යන අවස්ථාවේදී නොකැළඹුණු ස්වභාවයක සිටියත්, සාංකාවක, පෙනෙන ආකාරයට බියක් පෙනෙන්නට නොතිබීම හෝ ඇලීමෙන් හෝ දැඩි ආශාවකින් සිටි බවට පෙනෙන්නට නොතිබුණත්, ඔහු නැවත ඉපදේ. එයට හේතුව ගැඹුරු මට්ටමෙන්, අවිඥානක මට්ටමෙන්, අවශේෂ තණ්හාව සහ තණ්හාව සඳහා ඇති ප්‍රවණතාව තවමත් පවතින බැවිනි. බුදුපියාණන් වහන්සේ තණ්හාව විස්තර කළේ, තණ්හාව ඇතැම් විට විද්‍යමාන වන්නේ ඉඳුරන් සම්බන්ධ අත්දැකීම්වලට (කාමාසව) ඇති ආශාව, සුදුස්සෙකු වීමට ඇති තණ්හාව (භවාසන) සහ නොදැන සිටීමට ඇති ආශාව (අවිජ්ජාසව) ලෙසය. සමහර විට නොපවතින බව සඳහා ඇති තණ්හාව (විභවාසව), එනම් උච්ඡේදනය පිළිබඳව ද උන්වහන්සේ සඳහන් කළහ. අවසාන වශයෙන් මෙම ඇලුම් කරන්නාවූ අත්දැකීමෙන් නිරන්තරව තල්ලුවීමේ නිෂ්ඵල බව දැකීමෙන්, එම අමනොඥ දෙයින් ඉවත්වෙමින්, වෙන කවරදාකටත් වඩා තීව්‍ර සහ නව්‍ය බැඳීමකින් සහ එයින් පසුකාලීනව ඇතිවන හැඟීම් කෙරෙහි නිරන්තරව දැඩි කැමැත්තක් ඇති කර ගැනීමෙන් සම්පූර්ණ නොඇලීමක් ඇති වේ.

පුද්ගලයෙකුට රහත්ඵලයට පිවිසීම හෝ නිදහස්වීම (බෝධි හෝ විමුත්ති) කළ හැක්කේ ඔහුගේ තණ්හාව සඳහා ඇති නැඹුරුව දැක ඔහුට එය අකර්මක කළ හැකි වූ විට පමණය. **(36)** සමහර විට බුදුපියාණන් වහන්සේ තණ්හාව බීජවලට (බීජ) සමාන කළහ. බීජවලට දීර්ඝ කාලයක් අක්‍රීයව පැවතිය හැකි නමුත්, සුදුසු අවස්ථාවලදී මුල් ඇද හදිසියේම ජීවය ලැබිය හැකිය. **(37a,b)** රහත්ඵලයට පත් පුද්ගලයාගේ සංජානනය මෙම තණ්හාවේ කුඩාම බීජය පවා විනාශ කර ඇති නිසා, තවදුරටත් නැවත ඉපදීමක් සිදු නොවේ. ඒවා තවදුරටත් ප්‍රතික්‍රියා නොදක්වයි, ඒවා හුදෙක් ආශාවක්, මමත්වයක් හෝ ස්වකීය වාසියක් නොතකමින් ක්‍රියා කරයි. ''කළ යුතුව තිබූ දේ'' ඔවුන් කර ඇත. ආශාවෙන් තොරවූ ඔවුන් තවදුරටත් කර්ම නිර්මාණය නොකරනු ඇත. ඒ නිසා ඔවුන්ගේ ජීවිත කාලය අවසාන වූ විට, ඔවුන් නැවත නොඉපදෙනු ඇත. ඔවුහු නිර්වාණයට පත්වෙති. ඊළඟට පැහැදිලිව පෙනෙන ප්‍රශ්නය නම්: ''නිර්වාණය යනු කුමක් ද හෝ නිර්වාණය තිබෙන්නේ කොහේද?'' මෙයට පිළිතුරු දීමට තවත් ග්‍රන්ථයක් අවශ්‍ය වේ. මේ අතර, බුදුපියාණන් වහන්සේ පැවසූ දේ උපුටා දැක්වීම ප්‍රමාණවත් වනු ඇත: ''නිර්වාණය යනු ඉහළම සතුටයි'' (Dhp.203).

රහත්ඵලයට පත්වූ පුද්ගලයෙකු ධනාත්මක හෝ ඍණාත්මක කිසිම අලුත් කර්ම සිදු නොකරන අතර, ඔවුන් පෙර සිදු කරන ලද ඕනෑම කර්මයක විපාක අත්විඳින්නටද සිදුවීම සිත්ගන්නාසුලු දෙයකි. ඒවා අවශේෂ කර්ම ලෙස හැඳින් වේ. කෙසේ නමුත්, ඔවුන් රහත්ඵලයට එළඹීම තෙක් මාර්ගයේදී ලැබූ අත්දැකීම් තුළදී ඔවුන් අප්‍රසන්න විපාක ලැබීමට හේතුවන කර්ම කිසිවක් සිදු කළේය යන්න සිදු විය නොහැකි දෙයකි. එයට හේතුව ඔවුන් ප්‍රඥාව, නොඇලීම සහ විශේෂයෙන්ම, ආදරය, කරුණාව, මුදිතාව සහ උපේක්ෂාව වැනි ධනාත්මක තත්ත්වයන් දියුණු කරමින් සිටීමයි. **(38)**

## නැවත ඉපදීම සහ විශේෂ තත්ත්වයන්ට පැමිණීම

භාවනාව දියුණු කර තමන්ගේ මනස ඉතා ඉහළ මට්ටමකට පිරිසිදු කර ඇති පුද්ගලයෙකු නැවත ඉපදීම පිළිබඳ ක්‍රියාවලිය පාලනය කිරීමේ මට්ටමක සිටිය හැකිය. එවැනි හැකියාවන් දුර්ලභ වන අතර, අතිමහත් බහුතරයකට ප්‍රවේශ විය නොහැකි වුවද, ඒ පිළිබඳව සඳහන් කිරීම වටී. නැවත ඉපදීම සාමාන්‍යයෙන් සිදුවන්නේ අවිඥානකව සහ පුද්ගලයෙකුගේ කැමැත්තෙන් තොරවයි. කෙසේ වෙතත්, පෙනෙන ආකාරයට සමහර පුද්ගලයන්ට සමස්ත ක්‍රියාවලිය තුළම සවිඥානකව සහ පූර්ණ ලෙස දැනුවත්ව සිටීමටද (සම්පජඤ්ඤ) හැකි බව පෙනේ. **(39)** සමහර පුද්ගලයන්ට අන්තර්භවය තුළ ගැවසෙමින් සිටියදී පවා රහත්ඵලයට එළඹිය හැකිය. එවැනි පුද්ගලයෙකු බුදුපියාණන් වහන්සේ හැඳින්වූයේ ''අන්තර්භව තත්ත්වයේ නිර්වාණයට පත්වූ වර්ගයක්'' (අන්තරාපරිනිබ්බායී, S.V,69) ලෙසය. ඒ පිළිබඳ වැඩි විස්තර ලබාදී

නැති නමුත්, තමන්ගේ මරණය සිදුවන අවස්ථාවේදී නිර්වාණයට පත්වීමට බොහෝ සමීපව සිටි පුද්ගලයෙකුට එවැනි හැකියාවක් තිබිය හැකි බව පැහැදිලිය.

**මරණ මොහොතේ ඇති වන සිත හෙවත් චුතිසිත**

බුදුපියාණන් වහන්සේගේ කර්මය සහ නැවත ඉපදීම පිළිබඳ ධර්මයට සමහර, අලුතෙන්ම මතුවන තත්ත්වයන් අපි විමසා බලමු. ඒවා බුදුපියාණන් වහන්සේගේ ධර්මය සමග එකගවනවාට වඩා, ඒවා විකෘති කළ හැකිය. බුදුපියාණන් වහන්සේ අවබෝධ කළේ මනස මානසික සිදුවීම් (විඤ්ඤාණසොත) ''ප්‍රවාහයක් හෝ ගංගාවක්'' ලෙසයි. පසුකාලීන චින්තකයන් අනුමාන කළේ එය සැබැවින්ම ඉතා වේගයෙන් ඇති වී පහව යන තනි පුද්ගල චින්තන අවස්ථා (චිත්තවීථි) ලෙසයි. එහෙම වුනත්, පසුකාලීනව, න්‍යාය වර්ධනය වූයේ පුද්ගලයෙකු මිය යාමට පෙර ඇති වන මෙම චින්තන අවස්ථා (චුතිචිත්ත) කොන්දේසියක් නොව, නමුත් ඔවුන්ගේ ඊළඟ භවය තීරණය කරන බවයි. බුදුපියාණන් වහන්සේගේ කිසිම දේශනාවක හෝ පසුකාලීනව ඇතිවූ අභිධම්ම පිටකයේවත් අවසාන චින්තනය පිළිබඳ න්‍යායයේ වැදගත්කම සඳහන් වී නොමැත. බුදුපියාණන් වහන්සේ මිය යන හෝ බරපතල ලෙස රෝගාතුරවී සිටි මිනිසුන්ට උපදෙස් දුන් අවස්ථා බොහොමයක් ත්‍රිපිටකයේ සඳහන් වී ඇත. එනමුත්, එසේ කිරීමට වඩාත් සුදුසු අවස්ථාව ලෙස කෙනෙකුට සිතිය හැකි එවැනි අවස්ථාවක හෝ උන්වහන්සේ අවසාන සිතුවිල්ල පිළිබඳ අදහස කිසිවිටකත් ගෙන ආවේ නැත.

මහානාම, වරක් තමන්ගේ මනස අවුල් සහගතව සහ වික්ෂිප්තව (මුට්ඨසති) තිබෙන මොහොතක මිය ගියහොත් එය ඔහුට සෘණාත්මක භවයක් ලැබේයැයි යන සාංකාව පිළිබඳව බුදුපියාණන් වහන්සේ සමග පැවසුවේය. බුදුපියාණන් වහන්සේ ඔහුට සහතික වූයේ ඔහු දීර්ඝ කාලයක් විවිධ ආධ්‍යාත්මික ගුණවගාවන්හි යෙදීම නිසා එවැනි දෙයක් සිදුවේ යැයි යන බිය ඇති කර ගැනීම අනවශ්‍ය බවයි (**40**) (S.V,369).

උපකල්පනය කරනු ලබන අවසාන චින්තනයේ වැදගත්කම පිළිබඳ න්‍යාය මුලින්ම නොවැඩුණු ස්වරූපයෙන් මිලින්දපඤ්හයේ (ක්‍රි.පූ 1වන ශතවර්ෂයේ හෝ දෙවන ශතවර්ෂයේදී පමණ) සඳහන් විය. එහි මෙසේ සඳහන් විය: ''යමෙකු අවුරුදු සියයක් නුසුදුසු දේ කළේ නමුත්, මරණ මංචකයේදී එක් මොහොතක බුදුපියාණන් වහන්සේ පිළිබඳව සිහි කළේ නම්, ඔහු දෙවියන් අතර උපත ලබයි''(Mil.80). විසුද්ධිමග්ගය රචනා කරන විට (ක්‍රි. පූ 5වන ශතවර්ෂය) මෙම අදහස සියුම් ලෙස අවබෝධ කරගෙන තිබුණි. එසේම එය ථේරවාදී සම්‍යක් ව්‍යවහාරිකයක් (Vism.458-60) ලෙස සලකනු ලැබුණි. බුදුපියාණන් වහන්සේ විසින් උගන්වා නොතිබීමට අමතරව, කෙනෙකුගේ

ඊළඟ ජීවිතයේ තත්ත්වයන්හි තීරණාත්මක සාධකය වන්නේ අවසාන චින්තන මොහොතය, යන න්‍යාය සමග දාර්ශනික, සදාචාරාත්මක සහ තාර්කික ගැටලු කිහිපයක් ඇත.

යම් පුද්ගලයෙකු සාපේක්ෂව යහපත් ජීවිතයක් ගත කර තිබුණත්, ඔහුගේ මරණයට පෙර ඇති වූ ඍණාත්මක කාංසාව සහ ව්‍යාකූලත්වය තුළ ඔහුට ඍණාත්මක සිතුවිලි ඇතිවූයේ නම්, මෙම න්‍යායට අනුව, ඔහුට අයහපත් උපතක් ලැබෙනු ඇත. ඒ හා සමානවම යම් කෙනෙකු අවකල් ක්‍රියාකර, සල්ලාල ජීවිතයක් ගත කර මරණ මොහොතේ පහසුවෙන් සහ සැනසිල්ලෙන් නික්ම යෑම නිසා වාසිදායක නැවත ඉපදීමක් ලැබුවේ යැයි සිතමු. මෙම තත්ත්වය අපගේ චේතනාත්මක සිතුවිලි, කතාව සහ ක්‍රියා, අපගේ වර්තමාන සහ ඊළඟ භවයට යන අපගේ සමස්ථ අනාගතයටම බලපාන්නේ යැයි යන කර්මය පිළිබඳ සම්පූර්ණ අදහස ප්‍රතික්ෂේප කරයි. තවදුරටත්, මිලි තත්පරයක් පමණවූ දීර්ඝ (ඛණ) යැයි කියනු ලබන එක් එක් සිතුවිලි අවස්ථා එකක් හෝ දෙකක්, වසර ගණනාවක් යහපත් හෝ අයහපත් සිතුවිලි, වචන සහ ක්‍රියා කෙසේ අවලංගු කරන්නේදැයි අවබෝධ කිරීම ඉතා අසීරු දෙයකි.

මෙම න්‍යායයෙන් හේතු කාරකය සැලකිල්ලට ගැනීමටද අපොහොසත් වේ. සෑම දෙයක්ම කොන්දේසි සහිත නම්, බුදුපියාණන් වහන්සේ එසේ ඉගැන්වූයේ නම්, අවසාන සිතුවිලි පිළිබඳ මොහොත, දෙවන අවසාන සිතුවිලි පිළිබඳ මොහොත මගින් නියම කළ යුතු වන අතර, ඒ නිසා එය තුන්වන සිතුවිලි පිළිබඳ මොහොතෙන් ආදී වශයෙන් නියම කළ යුතු වේ. මෙයින් අදහස් කරන්නේ අප සිතන දේ, කියන දේ, කරන දේ සහ දැන් කරන දේවලින් අප මිය යන විට අපේ සිතේ තිබෙන දේ කෙරෙහි බලපෑමක් ඇති කරන බවයි. එම නිසා, අවසාන සිතුවිලි පිළිබඳ මොහොත අවධාරණය කිරීම යනු ඵලයට අතිශයෝක්තිමය වැදගත්කමක් ලබා දීම සහ පුද්ගලයෙකු මෙතැන සහ දැන් ජීවත්වන්නේ කෙසේද යන්න වූ හේතු හෝ හේතූන් නොසලකා හැරීමයි.

# සාමූහික කර්ම සහ වෙනත් වැරදි වැටහීම්

## සාමූහික කර්ම

මෑත දශක කිහිපය තුළ සාමූහික කර්ම හෝ කණ්ඩායම් කර්ම යනුවෙන් හැඳින්වෙන යමක් සත්‍ය ලෙස පිළිගෙන සහ සාකච්ඡාවට බඳුන් කර ඇත. මෙම න්‍යායට අනුව, මිනිස් කණ්ඩායම්වලට හෝ මුළු ජාතියටම පවා සිතන පරිදි ප්‍රතිඵල අත්විඳින්නට සිදුවේ. (සුපුරුදු පරිදි, ධනාත්මක සාමූහික කර්ම පිළිබඳව කිසි විටකත් සාකච්ඡා නොකරන බව පෙනේ. සැමවිටම සාකච්ඡා කරන්නේ ඍණාත්මක කර්ම පිළිබඳවයි.) ගරු බුහුමන් ලැබූ ටිබෙට් ජාතික

ප්‍රධානියෙකු වන ලති රිම්පොච් මැතකදී කියා සිටියේ සමූලඝාතන සිදුවන සමයේදී යුදෙව් ජනතාව විඳිණු ලැබූ දුක්වේදනා, ඔවුන් සියල්ලක්ම පෙර ජීවිතවලදී කළ විශාල දුෂ්ටකම්වල ප්‍රතිඵල බවයි. තවත් සමහරු කියා සිටියේ ඛෙමර් රූජ් හි පැවති මිනීමරු පාලනය ද කාම්බෝජයේ ජනතාව විසින් අතීතයේදී සිදු කරන ලද එවැනි පාපිෂ්ට කර්මයක ප්‍රතිවිපාක බවයි. සාමුහික කර්ම පිළිබඳ අදහස පැහැදිලිව සඳහන් කරන ලද කිසිවක් බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වල දක්නට නොලැබේ. සාම්ප්‍රදායික ශබ්ද කෝෂවල සාමුහික කර්ම සම්බන්ධයෙන් පාළි හෝ සංස්කෘත පද නොමැත. මෙම අදහස පසුකාලීන බෞද්ධ ධර්ම ග්‍රන්ථවලද නොමැති බව පෙනේ. කෙසේ නමුත්, වාසුබන්ධු විසින් රචිත අභිධර්මකොෂභාෂ්‍ය හි අදහස් දැක්වීමක් කර ඇති අතර, සාමුහික කර්ම පිළිබඳව කළ එම විස්තරයේ අර්ථදැක්වීමක් ලෙස මෙසේ සඳහන් කළ හැකියඃ ''බොහෝ අය යුද්ධයේදී, දඩයමකදී හෝ කොල්ලකෑමේදී, බොහෝ පිරිසක් මිනීමැරීමේ අදහසින් සම්බන්ධ වුවහොත්, සහ එයින් එක් පුද්ගලයෙකු පමණක් මිනීමැරීම සිදුකළහොත්, ඝාතනය පිළිබඳව වැරදිකරු කව්ද? සොල්දාදුවන් යනාදීන් එකම ප්‍රතිඵලයක් ඉටුකර ගැනීමට එකඟවෙමින් සිටින නිසා, ඝාතනය සිදු කළ පුද්ගලයා හා සමානවම සියලු දෙනාම වැරදිකරුවන් වේ. පොදු ඉලක්කයක් තිබීම නිසා, ඔවුන් සියල්ල ඝාතනය සිදු කළ පුද්ගලයා හා සමානවම වැරදිකරුවන් වන්නේ, ඔවුන් සියල්ලම එකිනෙකා අන්‍යෝන්‍යව කතාවෙන් නොව, හරියටම මැරීම යන කරුණ සඳහා එකට එකඟවීම පිණිස පෙලඹවීම නිසාය. නමුත්, බලහත්කාරයෙන් හමුදාවට බැඳීමට බලකෙරුණු පුද්ගලයා වැරදිකරුද? ඔහු යෝජනාව සකස් කළේ නම් හැර ප්‍රත්‍යක්ෂවම එසේය. 'මගේ ජීවිතය බේරාගැනීම සඳහා වුවද, මම ජීවියෙකු නොමරමි.''' [1] සැබැවින්ම වාසබන්ධු සාමුහික කර්ම ඉදිරිපත් කරන්නේ නම්, ඔහු ඒ සඳහා ලබා දුන් උදාහරණය එතරම්ම ඒත්තුගැන්වෙන්නේ නැත. අපි එය ප්‍රවේශමෙන් සලකා බලමු. මෙම උදාහරණයේ සඳහන් සියලුම පුද්ගලයන් පොදු ඍණාත්මක අරමුණක් ඇතිව එකට එක්වන්නට ඇත. එසේම වාසබන්ධු නිවැරදිව පවසා ඇති ආකාරයට සියලු දෙනාම යම් ඍණාත්මක කර්ම සිදු කරන්නට ඇත. කෙසේ වෙතත්, ඔවුන්ගේ තනි අභිප්‍රායයන්ගේ ස්වභාවය සහ තීව්‍රතාවය වෙනස් වන්නට ඇත. සැලසුම් කළ දේ පිළිබඳව සමහරු උද්‍යෝගීමත් වන්නට ඇත. තවත් සමහරු ඊට වඩා අඩු වන්නටත්, එක් පුද්ගලයෙකුට හෝ දෙදෙනෙකුට බරපතල ලෙස අවිනිශ්චිත බවක් ඇති වන්නට ද ඇත. තවද, එක් එක් පුද්ගලයාගේ කර්මානුකූල පසුබිම වෙනස් වනු ඇත.

එක් අයෙකු මීට පෙර බොහෝ අපරාධ කළ, අනුකම්පා රහිත අපරාධකරුවෙකු විය හැකි වන අතර, තවත් කෙනෙකු අපරාධ කිරීමේ නවකයෙකු විය හැකිය. තුන්වැන්නා මූලික වශයෙන් හොඳ නමුත්, ඔහුගේ මිතුරන් විසින් පහසුවෙන් නොමඟ යැවිය හැකි දුර්වලයෙකු විය හැකිය. කල්ලියේ සෑම සාමාජිකයෙකුටම අපරාධය සිදු කිරීමට පසුව දැනෙන සහ

ක්‍රියාකරන ආකාරය එබඳු විවිධාකාර චේතනාවන් සහ පසුබිම් සහිතව, කුරිරුබව නිසා ඇතිවන තෘප්තියේ සිට අනුකම්පා විරහිත අසංවේදිතාව දක්වා පසුතැවිල්ලක් ඇතිවීමට තරම් විවිධාකාර විය හැකිය. මුළුමනින්ම සාධාරණ ලෙස ඒත්තු ගත හැකි සේ පෙනෙන මේ සියල්ල සහ බොහෝ දුරට පිළිගත හැකි වෙනස්කම් සැලකිල්ලට ගත් විට, කණ්ඩායමේ එක් එක් පුද්ගලයන්ගේ විපාක ඉතා වෙනස් ශක්තිවලින් යුක්ත විය හැකි බවත්, එය විවිධ කාලවලදී සහ ඉතා වෙනස් ආකාරයට විද්‍යමාන වනු ඇතැයි සිතීම යථාර්ථවාදී වේ. මේ අනුව, මෙම උද්ධෘතය දෙස දෙවන වරට බැලීමෙන් පෙනී යන්නේ, සැබැවින්ම එයින් අදහස් වන්නේ එය නම්, එය සාමුහික කර්මය සම්බන්ධයෙන් ඒත්තු ගැන්වෙන තර්කයක් නොවන බවයි. සාමුහික කර්මය වැනි දෙයක් හැඟවෙන බෞද්ධ සම්ප්‍රදායේ එක් සිදුවීමක් නම්, බුදුපියාණන් වහන්සේගේ ඥාතීන් වන ශාක්‍යයන් පිළිබඳ කතාවයි. කෝසලයේ රජවූ විඩූඩභ ''කිරිබොන ළදරුවන්'' ඇතුළු ''සියලු ශාක්‍යයන්'' සමූලඝාතනය කළේය. උපකල්පනය කරන පරිදි, ඔවුන් එම ඉරණම අත්විඳින්නේ පෙරදී ගඟක ජලය පිළිබඳව ඇතිවූ ආරවුලකදී එම ගඟට ''ශාක්‍යයන්'' වස එක් කළ බැවිනි (Ja.IV,152). ඇත්ත වශයෙන්ම, මෙම දුෂ්ට ක්‍රියාව ශාක්‍යයන් කිහිප දෙනෙකු පමණක් සිදු කරන්නට ඉඩ ඇත. ශාක්‍යයන්ගේ ප්‍රධානියා එයට අණ දෙන්නට ඇති අතර, වෙනත් බොහෝ දෙනෙකු එය අනුමත කරන්නට ඇත. බහුතරය, විශේෂයෙන්ම, ළදරුවන් සහ දරුවන්ට ඒ සම්බන්ධයෙන් කිසිදු සම්බන්ධයක් නොතිබෙන්නට ඇත. ඒ නිසා මෙම කතාව සම්බන්ධයෙන් සාමුහික කර්මය යන අදහස ව්‍යංගයක් වේ. අප මෙය පැහැදිලි කරන්නේ කෙසේද? කථාව ත්‍රිපිටකයේ නැත. නමුත්, ජාතක අටුවාවේ ඇත. එය අවිනිශ්චිත, නමුත් පසුකාලීන ලේඛනයකි. සමහර විද්වතුන් සලකන්නේ එය ඉන්දියාවේ නොව, ශ්‍රී ලංකාවේ රචනය වූවක් බවයි. කතුවරයා කවුරු වුවත්, සාමුහික කර්මය පිළිබඳව අදහස් නිශ්චිත ධර්මයක් ලෙස ඉදිරිපත් කරනවාට වඩා, ඔහු හුදෙක් සිදු කර ඇත්තේ කතන්දරයක් කීම පමණක් බව පෙනේ. සාමුහික කර්ම පිළිබඳව අදහස වර්ධනය කිරීම සඳහා පසුකාලීන විචාරකයන් කිසිවෙකු කතාව උත්තේජකයක් ලෙස නොගැනීම නිසා මෙම උපකල්පනය ශක්තිමත් වී ඇත. එසේම, මහාවංස ටීකාවෙන් කථාවේ තවත් අනුවාදයකින් පවසන්නේ සමූලඝාතනයෙන් දිවි ගලවා ගත් අය සිටි බවත්, ඒ නිසා ''සියලු ශාක්‍යයන්'' වෙනත් අය නිර්මාණය කළ ඍණාත්මක විපාකයට ගොදුරු වූ බවට වූ ප්‍රකාශයට බලපෑමක් ඇතිවන බවයි. සමූහයක් තුළ ඇතැම් අය විසින් කරන ලද ක්‍රියාවල ප්‍රතිවිපාක එකම කණ්ඩායමේ සිටින අනෙක් අයටත් අත්විඳින්නට සිදු විය හැකි බවට පවසන සාමුහික කම්ම අනුවාදය, බුදුදහමේ වඩාත්ම මූලික සංකල්පවලින් එකකට පටහැනිය, එනම්, එක් එක් පුද්ගලයා තම තමන් වෙනුවෙන් වගකිව යුතු බවයි. සාමුහික කර්ම පිළිබඳ මුල්ම තේරුමේ නිශ්චිත සඳහන මට හමුවූයේ, 19වන ශතවර්ෂයේ ගුප්ත විද්‍යාඥ හෙලේනා බ්ලවට්ස්කි විසින් රචිත ලේඛනවලිනි.

ඇයගේ 1889දී රචිත *The Key to Theosophy* දේවඥානයට මාර්ගය නම් ග්‍රන්ථයෙන් ඇය හඳුන්වනු ලැබූ '' National Karma ජාතික කර්ම (තමන් කළ ක්‍රියාවට වගකිවයුතු)'' නමැති ඇය විසින් පිහිටවූ සමිතිය තුළින් ප්‍රකාශයට පත් කළාය. මෙම අදහස පසුකාලීනව ගුප්ත විද්‍යාව පිළිබඳ විවිධ ඇදහිලිවන්තයින් භාවිතයට ගත් අතර, ඊට පසු ඔවුහු නව යුගයේ චින්තනයට එය අවශෝෂණය කර ගත්හ. එතැන් සිට එය බුදුදහම දක්වා ව්‍යාප්තවී ඇත. සාමූහික කර්මයේ මෑතකාලීන සම්භවයක් තිබියදීත්, එයට සාම්ප්‍රදායික බුදුදහමේ කිසිදු ප්‍රමුඛතාවක් නොතිබුණද, එය සත්‍ය ධර්මයෙහි කොටසක් ලෙස සාමූහික කර්මය පිළිබඳව මෙතරම් උගත් සහ එසේ නොමැති බෞද්ධ ගුරුවරුන් කථා කිරීම පුදුමයට කරුණකි. එසේ වුවද, සාමූහික කර්ම පිළිබඳව කිසිදු බෞද්ධ ධර්ම ග්‍රන්ථයක සඳහන් නොවීම නිසා එය අසත්‍ය යැයි තර්ක කිරීම වැරදිය. වඩාත් වැදගත් ලෙස, බුදුදහමේ සියලු සත්‍යයන්ට අනන්‍ය සාධාරණ හිමිකම් කීමට හැකියාවක් නැත. සමහර විට බුදුපියාණන් වහන්සේ හෝ පසුකාලීන බෞද්ධ විශේෂ හැකියාවන් ඇත්තන්ට නැති ''ඥානයක්'' සහ අවබෝධයක් බ්ලවට්ස්කි මැතිණියට සහ අනෙක් අයට තිබුණේද? එමනිසා, සාමූහික කර්මය පිළිබඳ අදහසේ වලංගුභාවයක් තිබේදැයි වඩාත් ප්‍රවේසමින් විමසා බැලීම වටී.

සාමූහික කර්මය පිළිබඳ අදහසෙහි විවිධ අනුවාදයන් ඇත. විශාල පිරිසක් එක් විශේෂිත කණ්ඩායමක නැවත ඉපදී, ඔවුන් විසින් බෙදා ගන්නා ලද ඍණාත්මක කර්ම නිසා, ඊට පසු එකට එක්ව දුක්විඳින්නේ යැයි යන මතය පුද්ගලයෙකු විසින් දරන්නට ඉඩ ඇත. තවත් අනුවාදයකට අනුව, අහිංසක පුද්ගලයන් සුළු පිරිසකට ඔවුන් අයත් එක කණ්ඩායමක විශාල පිරිසක් විසින් කරන ලද ඍණාත්මක කර්ම නිසා දුක්විඳින්නට සිදුවිය හැකි යැයි පැවසේ. මෙම පළමු අනුවාද දෙකේදී උපකල්පනය කරන පරිදි, දුක්වේදනා පැමිණෙන්නේ යුද්ධ, දුර්භික්ෂ, වසංගත, භූමිකම්පා හෝ වෙනත් ස්වාභාවික විපත් ස්වරූපයෙන්ය. මෙම දෙවන න්‍යායේ තවත් අනුවාදයක් නම්, තමන් හා සම්බන්ධ කෙනෙකුට භයානක යම් දෙයක් සිදුවීමෙන් පුද්ගලයෙකුට තමන් කළ දුෂ්ටකමකට දුක් විඳිය හැකි බවයි. ආබාධිත දරුවෙකු බිහි කිරීම කායිකව හෝ මානසිකව ආබාධිත දරුවාගේ අයහපත් කර්මයක ප්‍රතිඵලයක් නොව, දෙමාපියන්ගේ කර්මයක් නිසා සිදු වන බව මිනිසුන් පවසන බව එක් අවස්ථාවක ජ්‍යෙෂ්ඨ භික්ෂුවක් පවසනු මම අසා ඇත්තෙමි.

ආත්මයක් නොමැති ජීවිත පරම්පරාවක් තුළින් කර්මය සම්ප්‍රේෂණය කරන්නේ කෙසේ දැයි අවබෝධ කර ගන්නට, බුදුදහම පිළිබඳ ආධුනික ප්‍රකාශකයෙකු සහ ඊනියා ''සදාකාලික දර්ශන විද්‍යාව'' අනුගමනය කරන්නෙකු වන ආනන්ද කුමාරස්වාමි හට නොහැකි විය. ඒ නිසා ඔහු බුදුදහම එක්තරා ආකාරයක විශ්වීය පාරම්පර්යය කර්මයක් යැයි සිතින් අවබෝධ කර ගත්තේය. ''කිසිම මිනිසෙකු තනිව ජීවත්වන්නේ නැත. නමුත්, අපි මුළු මැවිල්ලම ... එක්

ජීවිතයක් ලෙස සලකමු. එමනිසා සෑම පුද්ගලයෙකුම යහපත් හෝ අයහපත් දේ ... සඳහා දායකවන පොදු කර්මයක බෙදාගැන්මක් ලෙස සලකමු. එක් නිශ්චිත කර්මයක් පුද්ගලයෙකුගෙන් පුද්ගලයෙකුට, සියුම් ශරීරයක පවා නොපසුබට උත්සාහයක් නැතිව, පසුකර යාමක් පරිකල්පනය කිරීමේ අති දුෂ්කරතාව, මිනිසා හෝ සැබැවින්ම මුළු විශ්වයම එක් ජීවයක් හෝ ආත්මයක් ලෙස ඉදිරිපත් කිරීමෙන් වළක්වාලයි. මේ අනුව, අපට අපගේ කර්මය ලැබෙන්නේ අපගේ මුතුන් මිත්තන්ගෙන් මිස, හුදෙක් 'අපේම' අතීත අත්දැකීම්වලින් නොවේ. අප විසින් නිර්මාණය කරන ඕනෑම කර්මයක් සදාකාලයටම මනුෂ්‍යත්වයට උරුමවනු ඇත.''[2]

සාමුහික කර්මය සම්බන්ධයෙන් හැඳින්විය හැකි උදාහරණයක් නම්, ඉතා මෑතදී, එනම් 2004දී ඉන්දියානු සාගරයේ ඇතිවූ සුනාමියයි. මෙම ව්‍යසනය පැවති දින කිහිපය තුළදී සුප්‍රසිද්ධ සිංගප්පූරු භික්ෂුවක පැවසුවේ සුනාමි විපතට පත්වූවන්ගෙන් බහුතරයක් වූ මසුන් මරන්නන් දශක ගණනාවක් මුළුල්ලේ සිදු කළේ මත්ස්‍යයන් මැරීම බවත්, මෙය ඒවායේ කර්මානුකූල ප්‍රතිවිපාක බවත් ප්‍රාදේශීය පුවත්පතක වාර්තාවී තිබුණි.

සාමුහික කර්ම පිළිබඳ අදහස සමග එහි ඕනෑම ආකාරයක ධර්මය හෝ මතවාද පිළිබඳ, තාර්කික, සාක්ෂිමය, සදාචාරාත්මක සහ සාමාන්‍ය බුද්ධි ගැටලු රාශියක් ඇත. ඒවායින් සමහරක් අපි විමසා බලමු. සාධාරණීකරණය සම්බන්ධයෙන් සාමුහික කර්ම න්‍යායයන් දීර්ඝයි. නමුත්, ඒවායේ විස්තර කෙටිය. උදාහරණයක් ලෙස, කර්මය එහි සියලු හේතු සමූහය සහ ප්‍රතිඵල සංවිධානය කරන්නේ කෙසේද? එක් පුද්ගලයෙකු එක් කර්මානුකූල ප්‍රතිවිපාක විඳීමට සහ තවත් පුද්ගලයෙකු තවත් කර්මානුකූල ප්‍රතිවිපාක විඳීමටත් අවශ්‍ය සියලු දත්ත ගබඩා කරන්නේ කුමන ආකාරයටද සහ සැකසෙන්නේ කෙසේද? විශාල ප්‍රමාණයක පුද්ගලයන් එම කණ්ඩායම තුළ, එක් නිශ්චිත ස්ථානයක මේ වේලාවට නැවත ඉපදීමට, අවශ්‍ය දුක්විඳීම් අත්විඳීම සහතික කිරීම සඳහා අවශ්‍ය වන සංවිධානය සහ ක්‍රියාත්මක වීම සිදුවන්නේ කෙසේද? කර්මයට මෙම අසාමාන්‍ය ලෙස සංකීර්ණ විධිවිධාන යෙදීමට ඇති බලය සහ ශක්තිය කුමක්ද? පැහැදිලි කිරීම් කිසිවක් පෙනෙන්නට නැත.

සාමුහික කර්ම යැයි කියනු ලබන දේ පිළිබඳ නිශ්චිත උදාහරණ ගවේෂණය කළහොත්, එම අදහස කෙතරම් ගැටලු සහගත දැයි අපට පෙනෙනු ඇත. කිසියම් ආකාරයක සාමුහික කර්ම සැබැවින්ම ක්‍රියාත්මක වන්නේ නම්, මෙවැනි දෙයක් අවශ්‍ය වනු ඇත. දෙවන ලෝක සංග්‍රාමයේදී යුරෝපීය යුදෙව් පෙදෙසක යුදෙව්වන්ට විරුද්ධව නාසිවරුන් කළ අතිශය දෝෂී අපරාධ දෙස බලමු. නාසිවරුන් බලයෙන් අල්ලාගත් සහ 1939 - 1945 දක්වා එහි ජීවත්වූ දුෂ්ටයන් මිලියන හයකට නැවත ඉපදීමට අවශ්‍ය කර්මයට කෙසේ හෝ යම් ක්‍රියා පිළිවෙලක් ගොඩනගන්නට සිදුවන්නට ඇත. අන්තගාමී සැමිටික

ජනවර්ගයේ පුද්ගලයෙකු බලයට පත්වීම සඳහා ජර්මනියේ සමාජීය සහ දේශපාලන තත්ත්වය සංවිධානය කිරීම සඳහා දශක ගණනාවකට පෙර සැලසුම් කිරීමට සිදුවන්නට ඇත. මෙයට සමගාමීව, නාසිවාදයට සහාය දුන් හෝ ඊට විරුද්ධවීමට තරම් උදාසීන හෝ බියගුලු වූ ආකල්ප සහ දෘෂ්ටීන් ඇති ජර්මනියේ නැවත ඉපදීමට මිලියන ගණනාවක වෙනත් පුද්ගලයන් තෝරා ගැනීමට අවශ්‍ය වන්නට ඇත. අවශ්‍යවූ මිලියන හයක වින්දිතයන් ඔවුන්ගේ අතීත දුෂ්ට ක්‍රියා සඳහා ප්‍රමාණවත් ලෙස පීඩාවිඳීමෙන් පසු, කර්මයට අසංඛ්‍යාත සංකීර්ණ හේතු සහ ප්‍රතිවිපාක විධිමත් කිරීමට සහ හසුරුවන්නට සිදුවන්නට ඇත. යුද්ධය අවසන් වූ ආකාරයටම, සෑම කෙනෙකුටම ඔවුන්ට සාධාරණවූ දඬුවම්ද අත්විඳින්නට සිදුවිය. ඕනෑම උත්තරීතර ජීවියෙකු සර්වඥ වන්නේ නම්, කර්මයද සර්ව බලධාරි විය යුතුයි!

දැන් අපි 2004දී ඇතිවූ සුනාමිය පිළිබඳව විමසා බලමු. එය සාමුහික කර්මයට උදාහරණයක් ලෙස බොහෝ විට දක්වන සිද්ධියකි. සුනාමියෙන් මිනිසුන් 200,000ක් පමණ මිය ගියහ, තවත් මිලියනයක් තුවාල ලැබූ අතර, තවත් සිය දහස් ගණනකට නිවෙස් අහිමි විය. සුනාමියක් ඇතිවීමට සෘජුවම නිරීක්ෂණය කළ හැකිවූ හේතුව භූමිකම්පාවක් බවත්, එයින් සුමත්‍රා වෙරළට ඔබ්බෙන් වූ සාගර පතුලේ ඇති භූ චලන සම්බන්ධ තහඩු විස්ථාපනය වූ බවත් ඉතා අල්ප දැනුම ඇත්තෙකු පවා දනී. මෙමගින් විශාල ශක්තියක් මුදා හරින ලද අතර, එයින් විශාල තරංග ඇති වී තිබේ. සුනාමිය සාමුහික කර්මයක ප්‍රතිවිපාකවීමට නම්, එයට කරුණු කිහිපයක් අවශ්‍ය වේ. සමූලඝාතන සම්බන්ධයෙන්, කර්මයට පූර්ව සැලසුම් සිදු කිරීම අවශ්‍ය වනු ඇත. එවිට, එනම් ඔවුහු ඒ ප්‍රදේශයේ නැවත ඉපිද, පදිංචිව සිටීම, ඒ අවස්ථාවේ එම ප්‍රදේශයට පැමිණීම නිසා, එනම්, දෙසැම්බර් 26දා උදෑසන නියමිත වේලාවේ විශාල පිරිසක් පීඩාවට පත් වූ ප්‍රදේශයේ සිටිය යුතුයි. අසාමාන්‍ය ලෙස, මහා ජල ගැල්මේ අවුල මැද, කුලප්පුවීම, කඩාවැටෙන ගොඩනැගිලි සහ සුන්බුන් වේගයෙන් හමා යන විට, කර්මයට බොහෝ දේ සූදානම් කරන්නට සිදුවන්නට ඇත. එසේ නම්, කරදරයට පත්වූ දහස් ගණන් මිනිසුන්ට ඔවුන් සහභාගිවූ ක්‍රියාවලට නියමිත කර්මානුකූල ප්‍රතිවිපාක අඩු වැඩි වශයෙන් ලැබෙන්නට ඇත. කර්මානුකූලව මරණය හිමිව තිබූ අය මරණයට පත්වන්නට ඇත. බරපතල ලෙස තුවාල සිදුවීමට නියමිත අය ඒ තත්ත්වවලට පත්වන්නට ඇත. එසේම සුළු තුවාල පමණක් සිදුවන්නට නියමිත අයට එසේ වන්නට ඇත. නිවෙස් අහිමිවන්නට පමණක් නියමිත අයට එසේ වන්නට ඇත. මේ යනාදී වශයෙන් සිදුවන්නට ඇත. නමුත්, ඊටත් වඩා අසාමාන්‍ය දෙයක් නම්, සුනාමිය සාමුහික කර්මය සඳහා උදාහරණයක් වීමට නම්, කර්මයට හුදෙක් මිනිසුන්ට පමණක් නොව, පෘථිවියේ භූ චලන සම්බන්ධ තහඩුවලට පවා නිවැරදි වපසරියට, නිවැරදි වේලාවට යමින් දහස් ගණන් මිනිසුන්ගේ විපාකවලට අනුකූල වන සේ තරංගවලට විපාක වශයෙන් බලපෑම් කිරීමට හැකි බව පිළිගැනීම අවශ්‍ය වේ. කර්මයට ආරෝපණය කළ හැකි සම්ප්‍රේක්ෂණයට ඇති අසාමාන්‍ය

හැකියාවන්ට නිමාවක් නැති බව පෙනේ. සැබැවින්ම මේ සියල්ලම සත්‍ය විය හැකිය. මෙවැනි දෙයක් මඳ වශයෙන් හෝ බුදුපියාණන් වහන්සේ උගන්වා නැති බව දැනගන්න.

**පැවැත්මේ විෂය පථය**

තවමත් නිර්වාණයට පත් නොවූ පුද්ගලයෙකු මිය ගිය විට, ඔවුන් නැවත ඉපදෙන අතර, ඔවුන්ට යම් තැනක ඉපදීමට සිදු වේ. බුදුපියාණන් වහන්සේට අනුව, යම් කෙනෙකුට නැවත ඉපදිය හැකි විවිධ ස්ථාන ඇත. එනම්, දිව්‍ය පථ, මිනිස් ලෝකය, සත්ත්ව ලෝක, ප්‍රේත ලෝක, අසුර ලෝක සහ අපාය යනාදියයි.41 තවදුරටත් ඉදිරියට යාමට පෙර, මෙම පද සමහරක් කෙටියෙන් පැහැදිලි කරමු. තාවකාලිකව විඳවන අපාය නිරය වෙනුවට භාවිත කර ඇත. එසේ කිරීමට හොඳ හේතුවක් ඇත. නිරය, බටහිර මනසෙහි සදාකාලික දඬුවම් ලබාදෙන ස්ථානයක් පිළිබඳව ක්‍රිස්තියානි සංකල්පයට අනුව වෙන්කළ නොහැකි ලෙස සම්බන්ධ කර ඇත. මරණ මොහොතේදී පුද්ගලයෙකු විනිශ්චය කර, දඬුවමක් ලෙස සදාකාලික නිරයට විසිකර දමනු ලබයි. බෞද්ධ ධර්මයේ සඳහන් නිරයට යම් ආකාරයකින් සමාන නමුත්, එය පුද්ගලයෙකුගේ, බාහිර නියෝජිතයෙකුගේ තීරණයක් හෝ විනිශ්චය කිරීමේ ප්‍රතිඵලයක් නොවේ. එය පුද්ගලයෙකු විසින් තමන්ගේම මනසින්, නිර්මාණය කරන ලද, ආකෘතිවලින් ජීවිතය පුරාම ඇති වූ අභිප්‍රායික සිතුවිලි, වචන සහ ක්‍රියාවන් මගින් හැඩගස්වා ඇත. එනම් ඔවුන්ගේ කර්මයි. වඩා වැදගත් දෙය නම්, මෙම තත්ත්වය සදාකාලික නොවන නමුත්, එය නිර්මාණය කළ කර්ම ගෙවෙන තෙක් එහි රැඳෙනු ඇත. එම තත්ත්වය වඩා සුදුසු ලෙස හැඳින්විය යුත්තේ නිරයට වඩා, අපාය ලෙසයි. වඩාත් පොදු පාළි වචනය වන්නේ අපාය 'නැතිවීම', දුග්ගති 'දුෂ්කර මාර්ගය', නිරය යනු 'පහළට වැටීම' සහ විනිපාත 'විනාශය' යනුවෙනි.

වර්තමානයේ ස්වර්ගය සහ නිරය (හෝ අපාය) වැනි වචන බොහෝ විට සැක සහිත සිනහවක්, සමහර විට හොඳ හේතුවක් සමගින් බොහෝ මිනිසුන්ගේ මුහුණුවල ඇති කරයි. ඉතින්, පැවැත්මේ විෂය පථ පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වලින්, විශේෂයෙන්ම, අපාය සම්බන්ධයෙන් අප කුමක් කළ යුතුද? බොහෝ 'නූතන' බෞද්ධයෝ සංකල්පය පසෙකට දමා ආචාරධර්ම සහ භාවනා ඉගැන්වීම් කෙරෙහි අවධානය යොමු කරති. එය බොහෝ සෙයින් නිදහස් මතධාරී ක්‍රිස්තියානුවන් අපාය පිළිබඳව කිසිම සඳහනක් නොකිරීමට උත්සාහ දැරීම මෙන්ය.

නමුත් බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වල පැවැත්මේ විෂය පථ අවශ්‍ය අංගයකි. එසේම ඒවා නොමැති යැයි මවා පෙන්වීම අවංක කමින් තොරවීමකි. බුදුපියාණන් වහන්සේගේ දේශනාවල සාමාන්‍යයෙන් දිව්‍යලෝකය, අපාය සහ

වෙනත් මනුෂ්‍ය නොවන, සත්ත්ව නොවන විෂය පථ පිළිබඳව විස්තර කර ඇති අතර, උන්වහන්සේගේ කාලයේදී මිනිසුන් ඒවා හොඳින් අවබෝධ කරගෙන ඇත. ඒවා සමහරක් නම්, දිව්‍යලෝක සම්බන්ධයෙන් සුන්දර මාළිගා සහ අපාය සම්බන්ධයෙන් උතුරන සැරව සහිත කල්දේරම් යනාදියයි. නමුත් සැමවිටම නොවේ. අපාය පිළිබඳව පැරණි ඉන්දියාවේ එක් අදහසක් නම්, (මේ කාරණය සම්බන්ධයෙන් පාතාල, නිරය) එය ඇත්තේ සාගරයේ පතුලේ බවයි. මේ සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේ පැවසුවේ :''සාමාන්‍ය නූගත් පුද්ගලයෙකු 'අපාය මහා සාගරය පතුලේ තිබෙන' බව පවසන විට, ඔහු පවසන්නේ සත්‍ය හෝ සැබෑ නොවන දෙයකි. අපාය යනු සැබැවින්ම වේදනාකාරී හැඟීමක් හඳුන්වන නමකි'' (S.IV,206).

මෙම ප්‍රකාශයට වැඩි අවධානයක් හිමි විය යුතුයි. එයින් බුදුපියාණන් වහන්සේ පවසන්නේ අපාය යනු අවකාශයේ ස්ථානයක් නොව, අත්දැකීමක් බවයි. මෙය එසේ නම්, අනුමාන වශයෙන් ඊළඟට දිව්‍යලෝකය, පීඩාවට පත් වූ ආත්මයන්ගේ ආදියේ විෂය පථ සැමවිටම ස්ථාන විය යුතුම නැත, සමහර විට අත්දැකීම් විය හැකිය. මෙම ආකෘතිය වඩා හොඳින් ගැලපෙන අතර, බුදුපියාණන් වහන්සේ ලබා දුන් ප්‍රමුඛතාව සමග වඩා අනුකූල වේ. ''මනස මානසික තත්ත්වයන්ට මුල් වේ. මනස ඒවායේ ප්‍රධානියාය. ඒවා සියල්ලම මනසින් සාදන ලද ඒවාය.'' ''ලෝකය මනසින් සෑදී ඇත'' (Dhp.1; S.I,39). ඒ නිසා දිව්‍යලෝකය යනු මිනිස් පැවැත්මක් ලෙස සිතිය හැකිය. ප්‍රධාන වශයෙන් පහසුව, සැනසිල්ල, සතුට සහ ප්‍රීතියෙන් සිටිය හැකි තත්ත්වයකි. අපාය යනු දැඩි වේදනාකාරී සහ ඉටු නොවන යනාදියෙන් විස්තර වන තත්ත්වයකි.

**මෙපමණ වරදවා වටහා ගැනීම් ඇයි?**

කර්මය බුදුදහමේ එතරම් වැදගත් සහ ප්‍රධාන ධර්මයක් නම්, එය එතරම් පුළුල් ලෙස සහ වැරදි ලෙස වටහාගෙන ඇත්තේ මන්දැයි විමසිය හැකිය. මේ සඳහා හේතු කිහිපයක් තිබිය හැකිය. පළමුවැන්න නම් කර්මය යනු සංකීර්ණ සංකල්පයක් වන බැවිනි. කර්මය මිනිස් විඥානයේ අංගයකි, සියුම් ගැටෙනසුලු ප්‍රවණතාවලින් යුක්ත සිතුවිලි සහ හැඟීම්, අදහස්, චිත්තවේගයන් සහ වෙනත් අත්දැකීම් ඒ හරහා වේගයෙන් දුවමින් පවතින ඉතා සංකීර්ණ සහ බහුවිධ සංසිද්ධියකි. බොහෝ මිනිසුන්ට ඔබ ත්‍යාගශීලී නම් ඔබ නැවත පොහොසත්වී ඉපදෙනු ඇතැයි සහ ඒ හා සමාන මත, ව්‍යාජ වුවත්, සරල අදහස් ග්‍රහණය කර ගැනීම පහසුය. සමහර විට, ''දඬුවම අපරාධයට ගැලපේ'' යන යුක්තිය පිළිබඳ මිනිසුන්ගේ මතයට ආකර්ෂණය වනු ඇත. මේ නිසා, බුදුදහම ඉතිහාසයේ මුල් අවධියේ සිටම කර්මය පිළිබඳව හුදෙක් එවැනි සරල සහ අතිශය සරල කළ භාෂාවෙන් ග්‍රන්ථ රචනා වී ඇත. පාළියෙන් විමානවත්ථු, පෙතවත්ථු (ක්‍රි. පූ. 3වන හෝ 2වන ශතවර්ෂය), සහ ධම්මපද

අට්ඨකථා (ක්‍රි. පූ. 4 හෝ 5වන ශතවර්ෂය) සහ සංස්කෘතයෙන් කම්මවිභංග මේ සඳහා උදාහරණ වේ.

මෙයට සමාන තවත් නිෂ්ඵල කෘතියක් වන්නේ *Buddha Teaches the Sutra Cause and Effect in the Three Times* (*Fo Shuo San-shi Yinguo Jing*) යන ග්‍රන්ථයයි. මෙම ග්‍රන්ථයේ අන්තර්ගත වන්නේ උපකල්පනය කරන පරිදි, බුදුපියාණන් වහන්සේ දේශනා කළ සහ චීන බසට කුමාරජීව පරිවර්තනය කරන ලද්දකි (344-413). සැබැවින්ම සියලු සාක්ෂිවලින් පෙන්වා දෙන්නේ කුමාරජීවගෙන් ශතවර්ෂ ගණනකට පසු, එය රචනාවී ඇත්තේ චීනයේ බවයි. එහි ප්‍රබන්ධමය මූලාරම්භය එය චීනයේ විශාල වශයෙන් ජනප්‍රියවීම වළක්වා නොතිබූ අතර, අද පවා එය බොහෝ විට චීනයේ බෞද්ධ විහාරස්ථානවල මුද්‍රණය කර නොමිලේ බෙදාහරිනු ලැබේ. බුදුපියාණන් වහන්සේගේ කර්මය පිළිබඳ ඉගැන්වීම් විකෘති කිරීම සහ ඒ පිළිබඳව නොදන්නාකම සදා පවත්වාගෙන යාමේ භූමිකාව ඉතා ගැඹුරුය. මෙම ග්‍රන්ථයට අනුව, ඔබට පැළඳීමට හොඳ ඇඳුම් තිබේ නම්, ඒ ඔබ අතීත භවයන්හි භික්ෂූන්ට වස්ත්‍ර පූජා කිරීම නිසාය. ඔබ නිරන්තරව කුසගින්නෙන් නම්, ඔබ පෙර භවයන්හි කෑදරයෙකු වීම නිසාය. දරුවන් සහ දරුමුණුබුරුවන් බොහෝ සිටින්නේ පෙර භවයන්හි සිරකළ කුරුල්ලන් සහ සතුන් නිදහස් කිරීම නිසාය. වඳ ස්ත්‍රීන්ද එසේමයි - ඒ ඔවුන් පෙර භවයන්හි විවිධ ලිංගික සම්බන්ධතා ඇතිව සිටීමයි. බුදුපියාණන් වහන්සේ ඉදිරිපිට පහන් දැල්වීමෙන් හොඳ ඇස් පෙනීම ඇතිවීම, සංචාරකයන්ට මාර්ගය පෙන්වා සීටීම ප්‍රතික්ෂේප කිරීම අන්ධව උපත ලැබීම, සහ බුදුපියාණන් වහන්සේට නමස්කාර කරන්නන් සමච්චලයට ලක් කිරීමෙන් කොඳු ඇටයේ අසාමාන්‍ය පිටට නෙරුම, එනම් කුදු වීම සිදුවේ යැයි මෙම ග්‍රන්ථයේ සඳහන් වේ. The *Fo Shuo San-shi Yinguo Jing* ග්‍රන්ථය සහ වෙනත් ග්‍රන්ථවලින් සරල නූගත් ගොවීන් හට වඩාත් කාරුණික සහ සදාචාරාත්මක ජීවිත ගත කිරීම සඳහා ධෛර්යවත් කළා විය හැකිය. අනෙක් අතට, ඔවුන් විසින් විකෘති කරන ලද කර්ම අනුවාදයන් තවමත් උගත් භික්ෂූන් සහ භික්ෂුණීන් සහ උපාසක උපාසිකාවන් පිළිගනිමින් සහ ගොඩනගමින් පවතී.

කර්මය පුළුල් ලෙස වරදවා වටහාගැනීමට තවත් හේතුවක් නම්, බෞද්ධ සංස්කෘතීන්හි ආගමික අධ්‍යාපනය කෙරෙහි දක්වන සාම්ප්‍රදායික ප්‍රවේශය විය හැකිය. ක්‍රිස්තියානීන් හෝ මුස්ලිම්වරුන් ඔවුන්ට අදාළ ධර්ම ග්‍රන්ථ ඇසුරු කිරීම අසාමාන්‍ය නොවේ. සාම්ප්‍රදායික බෞද්ධ රටවල පූජනීය ධර්ම ග්‍රන්ථ සමග ඇති ඇසුර නිතර සිදු නොවේ. මේ සම්බන්ධයෙන් තේරුම් ගත හැකි හේතු තිබේ. මෑතක් වන තුරුම ගිහි බෞද්ධයන්ගෙන් බහුතරයක් නූගත්, නැතහොත්, සුළු වශයෙන් සාක්ෂරතාවක් ඇති අය වූහ. තවද, බයිබලය හෝ කුරානය මෙන් නොව, පාළි බෞද්ධ ධර්ම ග්‍රන්ථ ඉතා විශාලය. එහි ඉංග්‍රීසි පරිවර්තනයේ වෙළුම් 40කට වඩා වැඩිය. ඊට අමතරව, ධර්ම ග්‍රන්ථ 20වන ශතවර්ෂය වන තුරුම ස්වභාෂාවලට පරිවර්තනය කර නොතිබූ අතර, දැන්

පවා එම ස්වරූපයෙන් පුළුල් ලෙස ලබා ගැනීමට නැත. සමහර උගත් භික්ෂූන් වහන්සේලා සහ භික්ෂුණීන් වහන්සේලා පවා තමන් විසින්ම ඒ පිළිබඳව කතා කිරීමට ඉඩ දීමට වඩා, ධර්ම ග්‍රන්ථ කියවීමට පුරුදුවී ඇත්තේ පැරණි විවරණ තුළින්ය. මෙම විවරණ සමහරක බුදුපියාණන් වහන්සේගේ වචනවල ඇති ඥානය අන්තර්ගතව නැත.

මේ සියල්ලේ අවසාන ප්‍රතිඵලය වන්නේ බෞද්ධයන්ගෙන් බහුතරයක් බුදුපියාණන් වහන්සේගේ  ධර්මය පිළිබඳ ඔවුන්ගේ දැනුම සඳහා වැඩි අවධානයක් උන්වහන්සේගේ සත්‍ය වචනවලට වඩා, කටකතා හෝ ජනප්‍රිය ද්විතීයික ලේඛන මත යැපීමයි. ඒවායින් බොහොමයක් ඉහත දක්වා ඇති වැරදි වැටහීම් තුළ අන්තර්ගත වී ඇත.

කර්මය පිළිබඳ බටහිර සංකල්පය සාමාන්‍ය ජනතාවට ක්‍රම ක්‍රමයෙන් සහ විවිධ ප්‍රභවයන්ගෙන් හුරුපුරුදු විය. එනම්, හින්දු ආගම පිළිබඳ මුල්කාලීන ආධුනික දැනුමකින්, දේවඥානයෙන්, ඊනියා ''ගුප්ත ප්‍රඥාවෙන්'' සහ වඩාත් මෑතදී නව යුගයේ සාහිත්‍යයෙන් ආදී වශයෙනි. මෙම ප්‍රභවයන් කර්මය පිළිබඳව පුළුල්තම සහ වඩාත් සාමාන්‍ය අර්ථයෙන් එකඟ වන නමුත්, ඒවා ඉතා විවිධාකාර සහ විස්තර සම්බන්ධයෙන් ගත් කල පරස්පර විරෝධී ද වේ. මේ අනුව, කර්මය දුර්වල ආකාරයෙන් සිතා බැලූ සහ අපැහැදිලි මත, ඇතුළත් අවිනිශ්චිත පටලැවිල්ලක් සඳහා සියල්ල ඇතුළත් වචනයක් බවට පත්ව ඇත. ඒවායෙන් සමහරක් බුදුපියාණන් වහන්සේට ආරෝපණය වේ.

කර්මය පිළිබඳව සාමාන්‍යයෙන් කතා කරන ආකාරය බටහිර රටවල ඒ පිළිබඳ ව්‍යාකූලත්වය තහවුරු කර තිබේ. සමහර මුල් බටහිර රටවල බෞද්ධයෝ ''කර්මය නමැති යකඩ නීතිය'' ලෙස එය හැඳින්වූහ. අද පවා ''නීතිය'' යන වචනය සම්පූර්ණයෙන්ම, සැමවිට කර්මය යන වචනයට පෙර තිබේ. කර්මය සමග බහුලව භාවිත වන වෙනත් වචන නම්, ''විපාක'', ''ප්‍රතිඵලය'', ''දඬුවම'', සහ ''මඟහැරිය නොහැකි'' යන්නයි. මුල්කාලීන බෞද්ධ ධර්ම ග්‍රන්ථවල ''කර්ම නියමය'' යන වචනයට සමාන කිසිවක් නොමැති බව දැනගැනීම වැදගත් වේ. ඉතින් කර්මය නීතියක් බවට පත්වීම දක්වා යාම කෙසේ සිදුවූවේද? මනෝවිද්‍යාත්මක හේතුන් සහ ප්‍රතිවිපාක පිළිබඳ අපක්ෂපාතී ක්‍රියාවලියක් නොපැහැදිලි ලෙස ඉදිරිපත් කරන විපාක පිරිනමන්නෙකු සහ දඬුවම්කරන්නෙකු විසින් විපාක සහ දඬුවම් ක්‍රියාවේ යොදවන ක්‍රමයක් ඇතිවූයේ කෙසේද? බුදුදහමේ පළමුවන බටහිර විද්වතුන්, පළමු බටහිර බෞද්ධයන් මෙන්, සාමාන්‍යයෙන් එම තත්ත්වයට අවතීර්ණ වූයේ ක්‍රිස්තියානි පසුබිම්වලිනි. මෙය ඔවුන්ගේ බුදුදහම පිළිබඳ අවබෝධය කෙරෙහි බලපෑමක් ඇතිකරන ලද බව පුදුමයක් නොවේ. දෙවියන් වහන්සේගේ දේව නියෝග ''නීතිය'' වශයෙන් හැඳින්වේ. එනම් ඒකාන්ත,

වෙනස් කළ නොහැකි සහ අනිවාර්ය නීති නොතකා කටයුතු කිරීමෙන් ''ප්‍රතිවිපාක'' බිහි කිරීමයි.

මෙම දිව්‍යමය ප්‍රතිවිපාකවලින් ගැලවිය නොහැකිය. කර්මයද එසේමයි. පුරෝගාමී බටහිර බෞද්ධයෙකු වන ක්‍රිස්මස් හම්ප්‍රීගේ කර්මය පිළිබඳ අදහස් මේ ආකාරයේ චින්තනයට සංකේතමයකි.

''සදාචාර නීතියේ පාලනය පිළිබඳව අර්ථයෙන් ගත් කල, මෙම ගුණය සහ අවගුණය පිළිබඳ නීතිය, විශේෂයෙන්ම හින්දු, බෞද්ධ හෝ දේවධර්මවාදී නොවේ. එය සියලු පෙරදිග දර්ශනයට මූලික වන අතර, එය දේශනා කරනු ලැබුවේ ශාන්ත පාවුලු විසිනි. 'සහෝදරවරුනි, රැවටෙන්න එපා. දෙවියන්වහන්සේ සරදම් කරන්නේ නැත. කුමක් වුවත්, මිනිසෙකු වපුරන ඕනෑම දෙයක් ඔහු නෙළා ගන්නේය.'' [3] මේ ආකාරයේ පාරිභාෂිතයකින් සහ එයින් පැන නගින චින්තනයෙන් අවධාරණය වන්නේ, විපාක සහ දඬුවම් ලබාදෙන දෙවිකෙනෙකු පිළිබඳ සංකල්පයයි. එසේම ඉහත සඳහන් ආකාරයට, කර්මයෙන් විශේෂයෙන් සංකේතවත් වන්නේ, නම හැර අන් සියල්ලෙහිම උත්තරීතර ජීවියෙකු, ලෙස සාමාන්‍යයෙන් සංකල්පනය කිරීමයි.

## වැරදි වැටහීමෙන් ඇතිවන ප්‍රතිඵල

ඉහත විස්තර කර ඇති පරිදි, කර්මය පිළිබඳ ධර්මය වරදවා වටහාගැනීමේ ප්‍රතිඵල මොනවාද? සාම්ප්‍රදායික බෞද්ධ සංස්කෘතීන් සහ බටහිර/ක්‍රිස්තියානි ලෝකය අතර ඇති සමාජ ප්‍රශ්න පිළිබඳ ආකල්පවල සැලකිය යුතු තරම් වෙනස්කම් ලෙස නිරීක්ෂකයන් දිගු කලක් තිස්සේ පෙන්වා දී ඇත. පළමුවැන්න වඩාත් උදාසීන වන අතර, දෙවැන්න වඩාත් ක්‍රියාශීලී වේ. දශක තුනකට වඩා වැඩි කාලයක් බෞද්ධ ආසියාවේ ජීවත් වූ මට මෙම නිරීක්ෂණය සමග එකඟවීමට සිදු වේ. සාම්ප්‍රදායික බෞද්ධයන් බොහෝදුරට කරුණාවන්ත, ත්‍යාගශීලී සහ විනීත මිනිසුන් වේ. නමුත්, මෙම කරුණාවන්තකමෙන් සමහර විට ප්‍රත්‍යක්ෂ වන්නේ සමාජ ගැටලු සහ ඒවා සමග කටයුතු කිරීමට ස්ථිර ක්‍රියාමාර්ග කෙරෙහි ඇති උනන්දුව සහ ඉතා හදිසි හැඟීමක් ලෙසය. එක් ආකාරයකින් හෝ වෙනත් ආකාරයකින් වරප්‍රසාද නොලත් පුද්ගලයන් ඔවුන්ගේ කර්ම විපාක විඳින බව නැවත නැවතත් අපට ඇසෙයි. නූතන බුරුමයේ වඩාත්ම ගෞරවයට පාත්‍රවූ විද්වතෙකු සහ භාවනා ගුරුවරයෙකුවූ මහාසි සයදව් මෙම ආකල්පය මනාව සාරාංශ ගත කළේය : ''කිසියම් හේතුවක් නිසා හෝ වෙනත් ලැබීමට සුදුසු බවක් නොමැතිව මේ ලෝකයේ මිනිසෙකුට කිසිවක් සිදු නොවේ.'' [4] ඉහත සඳහන් කළ ආකාරයට, මෙම කියමන බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ දෙයට ඍජුවම පටහැනි වේ. *Fruit of Karma* යන ග්‍රන්ථයේ කතුවරිය වූ සුදස්ස ඔන්කොම් ඇයගේ නවකතාවේ සාමණේර කෙනෙකු සහ කතාවේ ප්‍රධාන චරිතය අතර

සංවාදයක් දක්වා ඇත. කතුවරිය වියපත් සහ බුද්ධිමත් භික්ෂුවක වූ එාරා බ්රූ බෞද්ධ ධර්මය පැහැදිලි කිරීමට භාවිත කරයි. එක් සංවාදයකදී එාරා බ්රූ සංඝයා සහ සාමණේරයන් අතර තිබෙන ප්‍රශ්නයක්වූ දූෂණය ගැන සඳහන් කරයි. සාමණේර මෙසේ අසයි: 'තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා අපට උදව් කළ හැක්කේ කෙසේද?' 'මට සමාවන්න. ඔබ අප යනුවෙන් කිව්වේද? නැත, අපට කළ හැකි දෙයක් නැත. අප සාගරයේ බිංදුවක් පමණි. අපට වඩා දහස් වාරයක් බලසම්පන්න දේශපාලනමය බලය ඇති අයටද එය කළ නොහැකිය. අප එය කර්ම ක්‍රියාවලියට පැවරිය යුතු වේ.' පූජ්‍ය එාරා බ්රූ කණගාටුවෙන් පැවසූහ.'' [5] මිනිසුන්ට, ආයතනවලට සහ සමාජවලට සිදුවන සෑම දෙයක්ම අතීත කර්මය නිසා සිදුවන බවට විශ්වීය විශ්වාසයක් ඇති බැවින්, දේශනා, පත්‍රිකා, සහ ග්‍රන්ථවල නිමක් නැතිව නැවත නැවතත් වැරදි වටහා ගැනීමක් සිදු වී ඇති විට, එාරා බ්රූගේ දෛවවාදය ඇති වීම පුදුමයට කරුණක් නොවේ.

බුදුදහම පිළිබඳ විශාරදයෙකු වන මහාචාර්ය ඩේල් එස්. රයිට් මෙසේ ලියයි: ''කර්මය එහි සංස්කෘතික බලපෑමෙන් සමාජීය සහ දේශපාලනමය වශයෙන් බලරහිත විය හැකිය. මෙසේ කිරීමට අදහස් නොකිරීමෙන්, කර්මය සැබැවින්ම සමාජයේ අක්‍රියතාව හෝ විවිධාකාර පීඩන හමුවේ ඇති යටත්වීම්වලට සහාය විය හැකිය.'' [6] බෞද්ධයෙකු සහ බුදුදහම පිළිබඳ විශාරදයෙකු වන මහාචාර්ය ඩේවිඩ් ලොයි මෙසේ ලියයි: ''ලිංගිකත්වය, වර්ගවාදය, කුලය, ආර්ථික පීඩාව, උපතින් ඇතිවන ආබාධ සහ වෙනත් සියලු දෙයකටම හේතු යුක්ත සේ කර්මය භාවිත කරමින් පවතී. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ගත් කල, දේශපාලන ප්‍රභූවරයන්ගේ බලය නිසා, ඔවුන්ට ධනය සහ බලය ඒ නිසා ලැබිය යුතු බව, සහ ඒවා නොමැති අය ඔවුන්ගේ පෙර ජීවිතවල හැසිරීම නිසා කර්ම වශයෙන් අත්විඳින බව යනාදී වශයෙන් ඔවුන් යටත් කර ගැනීමට සුදුසු බව ලැබීමට කර්මය භාවිත කරනු ලැබේ.'' [7] කණගාටුදායක යථාර්ථය නම්, කර්මය පිළිබඳව යොදා ගෙන ඇති සමහර වැරදි වැටහීම් සමාජ අක්‍රියතාවට සහ උදාසීනත්වයට යොමුවීම සඳහා නිදහසට කරුණක් ලෙස යොදාගෙන තිබීමයි.

නමුත්, සමහර ක්‍රියාවන් පමා කිරීමට ඒවා භාවිත කර ඇති අතර, අනෙක් ඒවා සාධාරණීකරණයටත් ඒවා භාවිත කර ඇත. මේ සඳහා උදාහරණයක් මිලින්දපඤ්හයේ ඇත. නාගසේන භික්ෂුව සමග කළ සංවාදයේදී මිලින්ද රජතුමා ධර්ම ග්‍රන්ථවලින් උද්ධෘත දෙකක් උපුටා දැක්වූයේය: ''ලෝකයේ කිසිවෙකුට හානියක් නොකිරීමෙන් ඔබ ආදරයට සහ රැකබලා ගැනීමට ලක්වනු ඇත, දඬුවමක් ලැබිය යුත්තාට දඬුවම් කරන්න, එසේම යහපත් දේ කිරීමට දිරිමත් කරන්න.'' (Ja.IV,71 and Ja.V,116) හුදෙක් දඬුවම් වශයෙන් වැරදිකරුවන්ගේ අවයව කපා ඉවත් කිරීම හෝ එල්ලා මැරීමේ තත්ත්වයට පවා දඬුවම් දීම අවශ්‍ය විය හැකි බව රජතුමා පෙන්වා දුන් අතර, එය

බුදුපියාණන් වහන්සේ වදාළ 'කෙනෙකුට හානි නොකිරීම අගය කිරීමට සුදුසු'ය යන්නට පටහැනි බවත් පැවසුවේය.

රහත්ඵල ලාභියෙකු බව කියනු ලබන නාගසේන හිමියන් පිළිතුරු දුන්නේ වැරදිකරුවෙකුට දඬුවම් කරන අයෙකු ඔවුන් කරන හානියට වගකිව යුතු නැති බවයි. ඒ වෙනුවට, වැරදිකරුවා ඔහුගේ වැරදි කර්මයට දුක්විඳින අතර, දඬුවම ක්‍රියාත්මක කරන්නාට චෝදනා හිමිවන්නේ නැති බවයි (Mil.185-6). මෙම ව්‍යාජ තර්කය ඕනෑම ක්‍රියාවක් සාධාරණීකරණය කිරීම සඳහා යොදා ගත හැකි වන අතර, සැබැවින්ම ඉතිහාසය මෙය සිදු කර ඇති බවට උදාහරණවලින් පිරී ඇත. බුදුදහමට විරුද්ධකම් කළ ටිබෙට් ජාතික රජු ලංදර්මා 842 වර්ෂයේදී භික්ෂුවක විසින් ඝාතනය කරනු ලැබුණි. මෙම ක්‍රියාවේ සාම්ප්‍රදායික යුක්තිසහගත කිරීම නම්, රජු තව තවත් ඍණාත්මක කර්ම කර ගැනීමෙන් බේරා ගැනීම පිණිස ඔහු කෙරෙහි අනුකම්පාවෙන් සැබැවින්ම භික්ෂුව ක්‍රියා කළ බවයි. මෙම දුරදර්ශී ඝාතනය සෑම වර්ෂයේදීම ටිබෙටයේ, භූතානයේ සහ ලදඛ්හි සුප්‍රසිද්ධ 'බ්ලැක් හැට්' නැටුම සමගින් සමරනු ලැබේ. විනිසුරුවෙකු ලෙස ඔහුගේ වෘත්තීය ජීවිතය තුළදී පුරෝගාමීව කටයුතු කළ, බටහිර ක්‍රිස්මස් හම්ෆ්‍රීස්, විවිධ මරණ දඬුවම් නියම කළ අතර, ඔහුගේ ස්වයං ලිඛිත චරිතාප්‍රදානයේ ඔහු මෙය සාධාරණීකරණය කළේ, විනිසුරුවරයා, ''කර්ම නීතියේ නීතිමය ලියවිල්ලක් පමණක්'' යැයි පවසමිනි. [8] ඔහු එල්ලා මැරීමට නියම කළ එක් පුද්ගලයෙකු වූයේ තිමති එවන්ස් වන අතර, පසුව ඔහු නිදොස් බවට ඔප්පු වුණි. නමුත්, මෙම බේදනීය යුක්තිය ඉටු කිරීමට නොහැකිවීම ඔහුගේ දෘෂ්ටියට ගැලපෙන්නේ කෙසේ දැයි හම්ෆ්‍රීස් පැහැදිලි කළේ නැත. සමහර විට ඔහු එය පහදා දෙන්නට ඇත්තේ එවන්ස් ඔහුගේ පෙර ජීවිතයේදී සිදු කළ මිනීමැරුමකට විපාකයක් ලෙස විය හැකිය.

ඇත්ත වශයෙන්ම, මිනිසුන් සෑමවිටම ආගමික විශ්වාසයන් විකෘති කර ඇත්තේ ඔවුන්ගේ අභිමතාර්ථයන්ට සරිලන අයුරෙනි. ඔවුන්ගේ ක්‍රියාවන් සාධාරණීකරණය කරමින් ඔවුන් කෙරෙහි 'දැහැමි මතුපිටක' ඔපයක් දමයි. නමුත් මෙසේ කිරීම එක් දෙයකි. එවැනි විකෘති කිරීම් පූජනීය සාහිත්‍යයට ඇතුළත් කිරීම තවත් දෙයකි. කර්මය පිළිබඳව ව්‍යාජ අර්ථකථන අඩංගුවන මිලින්දපඤ්හය සහ පාළි අටුවා යන දෙකම ථේරවාද සම්ප්‍රදායේ බලයලත් ග්‍රන්ථ ලෙස සලකනු ලැබේ. සම්පූර්ණයෙන්ම ත්‍රිපිටකයට සමානය. ඇත්ත වශයෙන්ම හැඳින්වීමේදී සඳහන් කළ ආකාරයට, කර්මය සහ නැවත ඉපදීම පිළිබඳව කරන ලද පැහැදිලි කිරීම් කිහිපයක් මේ දෙක අතර සදහටම වෙනසක් පෙන්වයි. අධිකරණ වධහිංසා පැමිණවීම්, අත් පා ඉවත් කිරීම සහ එල්ලා මැරීම සාධාරණීකරණය කිරීම සඳහා මිලින්දපඤ්හය, කර්මය අනිසි ලෙස භාවිතා කිරීම සියලු බෞද්ධ රටවල් අඛණ්ඩව එල්ලා මැරීම පවත්වා ගෙන යාමට එක් හේතුවක් වූවේද? එය අහෝසි කිරීම සඳහා සංඝයා හෝ නීති වෘත්තිය කිසිවිටක උද්ඝෝෂණ නොකරන්නේ ඇයි? මම සැක කරමි.

නමුත්, බෞද්ධ ලෝකය තුළ පවතින කර්මය පිළිබඳ පොදු වරදවා වටහාගැනීම් නිශ්චිතවම බොහෝ දුරට තිබිය හැකිය.

පුද්ගලික මට්ටමින් කර්මය පිළිබඳව ව්‍යාජ අදහස් ක්ෂණික සහ අතිශයින් ඍණාත්මක බලපෑමක් ඇති කළ හැකිය. මගේ අත්දැකීම්වලින් දෙකක් මෙය නිදර්ශනය කිරීමට ප්‍රමාණවත් වේ. වරක් එක් මිනිසෙක් තම බිරිඳ සමග මා හමුවීමට පැමිණියහ. දෙදෙනාම අසහනයෙන් සිටි බව පෙනුණි. මොන්ගෝලභාවයෙන් පෙළෙන ඔවුන්ගේ පළමු දරුවා පවුලට එකතු වීමත් සමග, පවුලට කෙනෙකු එකතුවීම පිළිබඳව ඔවුන් තුළ තිබූ සතුටුදායක බලාපොරොත්තුව කලකිරීමෙන් සහ ශෝකයෙන් බිඳවැටුණු බව ඔවුහු පැවසූහ. සැබැවින්ම මෙසේ සිදුවූයේ පෙර භවයකදී ඔවුන් සිදු කළ අකුසලයක ප්‍රතිඵලයක් නිසා දැයි සහ එය සත්‍යයක් දැයි ඔවුහු ඇසූහ. මම කර්මයේ ඇති සියුම් වෙනස්කම් පැහැදිලි කිරීමට උපරිම උත්සාහයක් ගත්තෙමි. නමුත් ඇති වූයේ සීමිත සාර්ථකත්වයකි.

තම දරුවාගේ තත්ත්වය සම්බන්ධයෙන් ඔවුන් වගකිව යුතු බව පවසන ලද භික්ෂුව මට වඩා වසර ගණනාවකින් ජ්‍යෙෂ්ඨ පුද්ගලයෙකු පමණක් නොව, මෑතකදී තායිලන්තයේ රජුගේ ගෞරවයටද පාත්‍රවූවෙකි. උන්වහන්සේගේ පැහැදිලි කිරීම්වලට අමතරව, මගේ පැහැදිලි කිරීම් සැලකිල්ලට ගත්තේ සුළු වශයෙනි. පසුව මෙම යුවළ වෙනත් ආගමක් සඳහා බුදුදහම අත්හළ බව මට දැනගන්නට ලැබුණි.

තවත් අවස්ථාවක ධර්මය පිළිබඳව සැබෑ උනන්දුවක් සහ හොඳ දැනුමක් ඇති පුද්ගලයෙකු සමග මම කතා කරමින් සිටියෙමි. අප කතා කරමින් සිටින විට ඔහුගේ බෙල්ලේ පැත්තක ඉදිමීමක් තිබෙනු දැක මම ඒ පිළිබඳව ඔහුගෙන් ඇසුවෙමි. ඔහු පැවසුවේ තයිරොයිඩ් ග්‍රන්ථයේ පිළිකාවක් තිබූ බවත්, එය දැන් අවසාන අදියරේ පවතින බවත්ය. ඔහු නිතිපතා භාවනාව පුහුණු කරන බවත් එය යම් තරමටමකට ඔහුට මිය යාම ඉවසා දරාගැනීමට යම් මට්ටමක පිළිගැනීමක් ඇති කර ගැනීමට උපකාරී වී ඇති බවත් පැවසුවේය. ඔහු මෙසේ ද පැවසුවේයඃ ''ඊට අමතරව, මා මගේ පෙර භවයේදී යම් වරදක් කර ඇති නිසා මෙසේ සිදුව ඇත.'' ඔහු මේ සියල්ල පැවසුවේ බලහත්කාරයෙන් සතුටු සිතක් ඇති කර ගනිමින්ය. නමුත්, ඔහුගේ බිය සහ ශෝකය ඔහුගේ වචන පිටුපස තිබෙනු හඳුනා ගැනීමට අපහසු නොවීය. සමීපවෙමින් පවතින ඔහුගේ මරණය ගැන ඔහුට ඇතිවූ ස්වභාවික හැඟීම් සහ කාංසාව සම්පූර්ණයෙන්ම නිසැකවම ඔහුගේ රෝගයට ඔහු වගකිව යුතු යැයි විශ්වාස කිරීම තුළින් උග්‍ර වී ඇත. එබැවින් කර්මය වරදවා වටහා ගැනීම හුදෙක් ධර්මය පිළිබඳ හෝ න්‍යායාත්මක කාරණයක් පමණක් නොවේ, එය මිනිසුන්ගේ ජීවිතවලට ද බලපෑමක් ඇති කළ හැකිය. එය ඔවුන්ට වරදකාරිත්වය, පසුතැවීම සහ ස්වයං දෝෂාරෝපණයකින් පීඩාවක් ඇති කළ හැකිය.

බටහිරට ධර්මය පැමිණීමෙන් කර්මය පිළිබඳ බුදුපියාණන් වහන්සේගේ සංකල්පය නැවත සලකා බැලීම, එය ඇසුරු කිරීම, එය වෙන්කොට හඳුනා ගැනීම, පසුව විචාරකයන් සහ නූතන ප්‍රකාශ එය අර්ථකථනය කරන්නේ කෙසේද යනාදිය සලකා බැලීමේ අවශ්‍යතාව වැඩි වී ඇත. ජනප්‍රිය බටහිර හැඳිනගැනීම් තුළ බුදුදහමට සාමාන්‍යයෙන් ''හොඳ ඇගයීමක්'' ඇත. නමුත් කර්මය පිළිබඳ විෂය පැමිණි විගස මෙම හැඳිනගැනීම වෙනස් වේ. අවම වශයෙන් කල්පනාකාරී පුද්ගලයන් අතර, කර්මය යනු දුක්ඛිත තත්ත්වයන් හමුවේ උරහිස් පහතට හෙළමින් කරදරයට පත්වූවන්ට ඔවුන්ගේ පෞද්ගලික ඛේදවාචකයන්ට දොස් නැගීමට නොපැසුණු නියතිවාදී ස්වරූපයක් ලෙස පෙනේ. මෙමගින් වටිනා ධර්මය වෙනත් ලෙසකින්ට වඩා ආකර්ෂණයවන සහ ඒත්තුගැන්වෙන ස්වභාවය අඩුවෙන් පෙනේ. එයින් එය සාධාරණීකරණය වූ විවේචනයට පවා විවෘත වේ.

එවැනි බොහෝ විවේචන අතර උදාහරණවලින් එකක් නම්, ආගම් පිළිබඳ තියුණු විවේචකයෙකු වන ආචාර්ය රිචඩ් ඩෝකින්ස්ගේ *The God Delusion* නම් ග්‍රන්ථයයි. ඩෝකින්ස් මෙම ග්‍රන්ථයෙන් බුදුදහම පිළිබඳව එක් සඳහනක් පමණක් කර ඇති අතර, අනිවාර්යයෙන් ඒ කර්මය පිළිබඳවයි. ඔහු මෙසේ ලියයිඃ ''ජුලියා ස්වීනී ද බුදුදහම පිළිබඳව කෙටියෙන් විස්තර කරන විට..., ඉලක්කයට නිවැරදිය. සියලු ආගම් අතරින් බුදුදහම වඩාත්ම හොඳ එකක් බවට පත් වේ. නමුත්, අතීත ජීවිතවල පාපයන් නිසා, පුනරුත්පත්ති ඉණිමගේ පහළට ඇද දැමීමේ මූලධර්මය නිසා, එය සැහෙන තරමට අප්‍රසන්න වේ. ජුලියා ස්වීනී තායිලන්තයට ගිය විට අතිශය දරුණු ලෙස අංගවිකළ දරුවෙකු රැකබලා ගන්නා එක් කාන්තාවක් හමුවූවාය. 'මම ඔහු රැකබලාගන්නා පුද්ගලයාට මෙසේ කීවෙමි. මෙම අසරණ දරුවා ඔබ රැකබලා ගැනීම හොඳයි.' ඇය මෙසේ පැවසුවාය, 'අසරණ දරුවා යැයි නොකියන්න. මේ ආකාරයට ඉපදීමට ඔහු පෙර ආත්මයේදී මහත් බරපතල දෙයක් කරන්නට ඇත.''' [9] බෞද්ධ දර්ශනය සහ මනෝවිද්‍යාව පිළිබඳව ස්වල්පයක් දන්නා හෝ කිසිවක් නොදන්නා තනි පුද්ගලයෙකුගේ අදහස් අනුව බුදුදහම විනිශ්චය කිරීම අසාධාරණ වන්නේ ජීවවිද්‍යාව හෝ පරිණාමය විනිශ්චය කිරීම මෙන්ම සම්පූර්ණයෙන්ම එම විද්‍යාවන් ගැන නොදන්නා පුද්ගලයෙකුගේ අදහස් මත වීම අසාධාරණයක් වන නිසාය. එසේ වුවද, ජුලියා ස්වීනීට තොරතුරු සපයන්නා කර්මය පිළිබඳ වැරදි වැටහීම් ලබා දුන්නේ බෞද්ධ භික්ෂූන්ගේ දේශනා හෝ කෙටි පත්‍රිකාවලින් බවට ඇත්තේ සුළු සැකයකි.

සමහරු ඇඟවූයේ බෞද්ධයන් කර්මය පිළිබඳ ධර්මය මුළුමනින්ම ඉවත දැමිය යුතු බවයි. ඩේවිඩ් ලෝයි මෙසේ පැවසුවේයඃ ''අපි කර්මය පිළිබඳව කුමක් කරමුද? කර්මය සමකාලීන බුදුදහමට ප්‍රශ්නයක් වී නැතැයි මවා පෑමේ තේරුමක් නැත. බුදුදහම නූතන අවබෝධයට අනුව මනාව ගැලපේ. නමුත් කර්මය පිළිබඳ සාම්ප්‍රදායික අදහස් නොවේ.'' [10] ටිබෙට් බුදුදහම පිළිබඳ

බටහිර ගුරුවරයෙකුවූ ෂේන්පෙන් හූබාම් තුන්වන ලෝකයේ මිලියන සංඛ්‍යාත මිනිසුන් ඔවුන්ගේ අතීත කර්ම නිසා කුසගින්නෙන් පෙළෙන බව යන අදහස පිළිබඳව අපහසුතාවට පත්ව ඇත. ඇය සිතන්නේ මෙම අපහසුවට පත්කරවන අදහස මඟහරින්නට හොඳම ක්‍රමය නම්, කර්මය පිළිබඳ යථාර්ථය ප්‍රතික්ෂේප කිරීම බවයි. ඇ මෙසේ ලියයිඃ ''... කර්මය පිළිබඳ අදහස අසත්‍යයකි'', එය හුදෙක් ''අප ව්‍යාකූල අවස්ථාවක හිරවී සිටින විට පමණක් උපකාරී විය හැකි තාවකාලික සත්‍යයකි. එය අවසානයේ සත්‍යයක් නොවේ...'' [11] නැවතත් බුදුදහම පිළිබඳ පැරණිතම සාක්ෂිය වූ ත්‍රිපිටකයේ බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ දේ, සහ පසුකාලීනව එහි අනුවාදයන් අතර ඇති වෙනස හඳුනා ගැනීමට ඇති නොහැකියාව පිළිබඳ ගැටලුව අපට තිබේ. මිනිසුන් ඔවුන්ගේ අතීත කර්ම නිසා කුසගින්නෙන්, රෝගවලින්, සමාජීය පීඩා ආදියෙන් දුක් විඳින බව බුදුපියාණන් වහන්සේගේ ධර්මයෙන් ඇඟවීමට අවශ්‍ය නැත.

## කුසල් අනුමෝදන් කිරීම

මෙය කුසල් අනුමෝදන් කිරීම යන ධර්මයට සම්බන්ධ ප්‍රශ්නයකි. මෙයින් අදහස් කරන්නේ යහපත් ක්‍රියාවක් සිදු කර එහි යහපත් විපාක මිය ගිය පුද්ගලයෙකුට අනුමෝදන් කිරීමයි. බුදුපියාණන් වහන්සේ උගන්වා නොමැති නමුත්, කුසල් අනුමෝදන් කිරීමේ හැකියාවක් ඇතැයි බෞද්ධයන් සම්පූර්ණයෙන්ම සහ විශ්වීය ලෙස පිළිගෙන ඇත. නමුත් බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ දේවලින් සමහරකට මෙය සම්පූර්ණයෙන්ම පටහැනි බව පෙනී යයි. කුසල් අනුමෝදන් කිරීමේ අදහස බොහෝ විට යොදා ගැනීම සිදු වී ඇත්තේ බ්‍රාහ්මණ ආගමේ සද්ධා චාරිත්‍රයෙනි. කුඩා බෝල හෝ සහල් හෝ බාර්ලි, මිය ගිය අය වෙත ඔවුන්ගේ කුසගින්න නිවාලීම පිණිස යම් සූත්‍රයක් සජ්ඣායනය කරමින් සම්ප්‍රේෂණය කළ බවට විශ්වාස කෙරේ. පෙනෙන ආකාරයට මුල් කාලයේ සමහර බෞද්ධයන් මෙම අදහස පිළිගෙන එය කුසල් සම්බන්ධයෙන් ආදේශ කළ බව කියැවේ. භෞතිකවාදී චාර්වක ගුරුකුලය මුළුමනින්ම නිවැරදි ලෙස සද්ධා චාරිත්‍රයට සරදම් ලෙස මෙසේ සඳහන් කර ඇතඃ ''සද්ධාවට සැබැවින්ම මියගිය පුද්ගලයන් තෘප්තිමත් කළ හැකි නම්, එවිට මේ ලෝකයේ සංචාරකයන් ගමනක් අරඹන විට, ඔවුන් ගමන සඳහා ආහාර පාන සූදානම් කර ගැනීම අවශ්‍ය නොවේ, එයට හේතුව ඔවුන්ගේ ඥාතීන්ට නිවසේ සිට ඔවුන් වෙනුවෙන් ආහාර අනුභව කළ හැකි නිසාය.''[12]

බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් පිළිබඳ මනා අවබෝධයක් ඇති ඕනෑම කෙනෙකුට කුසල් අනුමෝදන් කිරීමේ අදහස සමගින් ඇතිවෙන තවත් බරපතල ගැටලු කිහිපයක් ගැන සිතිය හැකිය. උදාහරණ වශයෙන් යම් කෙනෙකුට කුසල් අනුමෝදන් කළ හැකි නම්, තර්කානුකූලව ඔවුන්ට

අවගුණය හෝ නපුරද අනුමෝදන් කිරීමේ හැකියාවත් තිබිය යුතුයි. මෙයින් අදහස් වන්නේ කෙනෙකුට කිසි විටකත් නොකළ යහපතකට ප්‍රයෝජන ගැනීමට හැකි බවත්, සිදු කළ අයහපත් කර්ම වළක්වා ගත හැකි බවත්ය. මෙය කර්මය පිළිබඳ සම්පූර්ණ සංකල්පයටම හානි සිදුකරනු ඇත. බුදුපියාණන් වහන්සේ මෙසේ පැහැදිලි කළහ: ''තමා විසින්ම අකුසල් කෙරෙයි, තමා විසින්ම අකුසලයෙන් වැළකෙයි, තමා විසින්ම පිරිසිදු වෙයි. පිරිසිදු බව හෝ අපිරිසිදු බව රඳා පවතින්නේ තමා මතය. කිසිම කෙනෙකුට තවත් කෙනෙකු පිරිසිදු කළ නොහැකිය'' (Dhp.165). සුත්ත නිපාතයෙන් බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: ''මිනිසුන් මරණයෙන් යටපත් වන විට, ඔව්හු මෙහි සිට ඊළඟ ලෝකයකට යති. පියාට පුතාට උපකාර කළ නොහැකිය. අනික් ඥාතීන්ටද ඊට වඩා දෙයක් කළ නොහැකිය''(Sn.579). මුල්කාලීන බෞද්ධයන් කුසල් අනුමෝදන් කිරීමේ හැකියාව පිළිබඳව දෙගිඩියාවෙන් සිටි කාලවකවානුවක් ගැන ජාතක පොතේ ඉදිරිපත් කර ඇත. මුල් ධර්මයට සැබෑ ලෙස එක් ජාතක පොතක මෙසේ සඳහන් වේ: ''පුද්ගලයෙකු විසින් තමාගේ යහපත උදාකර ගනී. එසේම පුද්ගලයෙකු තමාගේම අයහපත උදාකර ගනී. යහපත හෝ අයහපත පුද්ගලයෙකුට තවත් කෙනෙකු වෙනුවෙන් කළ නොහැකිය'' (Ja.III,263). නමුත්, එක් යහපත් පුද්ගලයෙකු පිළිබඳ වූ තවත් කතාවක, ඔහු රැස්කළ සියලු කුසල්, කුසල් නොමැති පුද්ගලයෙකුට පවරන බව කියා ඇත (Ja.II,112). ධම්මපද අට්ඨකථා තිබූ කාලය වන විට, සැබැවින්ම කෙනෙකුගේ කුසල් මිලදී ගත හැකි යැයි යන විශ්වාසයක් තිබුණි (Dhp-a.III,12a). නමුත්, කුසල් අනුමෝදන් කිරීම පිළිබඳව පුළුල් ලෙස පිළිගත් කාලයක පවා, මෙම ජනප්‍රිය මිථ්‍යා විශ්වාසයට එරෙහිව හඬනැගීම් තවදුරටත් තිබුණි. ක්‍රි. පූ. දෙවන ශතවර්ෂයේදී අශ්වඝෝෂ මෙසේ ලිව්වේය: ''යම් කෙනෙකුට යහපත් දේ සිදු කර, ඊට පසු එය තවත් කෙනෙකුට දීම සිදු කළ නොහැකිය. යම් කෙනෙකුට එසේ කිරීමට අවශ්‍ය වුවත්, අනෙක් අයට එය ලබා ගත නොහැකිය. කෙනෙකු විසින් සිදු කරන ක්‍රියාවල ප්‍රතිඵල විනාශ නොවේ, ඒවා අත්විඳින්නේ ඔහුමයි. නමුත්, යම් කෙනෙකු නොකළ ක්‍රියාවන්ගේ ප්‍රතිඵල අත් විඳිය හැකිය යන්න සත්‍ය නොවේ'' (බුද්ධචරිත XX,28).

මුලදී විසඳිය නොහැකි ගැටලුවක් යැයි පවසන දේ ඇදහිලිවන්තයින් වෙත ඉදිරිපත් කර, පසුව එය වළක්වා ගැනීමට පහසු ක්‍රමයක් ආගම් විසින් ඉදිරිපත් කිරීම අසාමාන්‍ය දෙයක් නොවේ. බුදුපියාණන් වහන්සේගේ කාලයේදී බ්‍රාහ්මණ ආගම නපුරු විපාකවල අත්දැකීම් මගහැරීමේ බොහෝ ක්‍රම උගන්වන ලදී. ඒවා නම්, විශේෂ මන්ත්‍ර, යම් දෙවිවරුන්ට යාච්ඤා කිරීම, පූජනීය ගංගාවලින් දිය නෑම, යම් පූජනීය ස්ථානවලට යෑම යනාදියයි. යම් චාරිත්‍ර ඉටු කිරීමෙන් කෙනෙකුගේ ජීවිතයට මූලික වෙනස්කමක් ඇති කළ හැකිය යන විශ්වාසය, විශේෂයෙන් ඔවුන්ට ආධ්‍යාත්මික ප්‍රතිලාභ ලැබේය යන්න බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුව පටහැනි වේ. එසේ

නම්, බොහෝ බෞද්ධයන් කුසල් අනුමෝදන් කිරීමේ අදහස පිළිගන්නේ ඇයි ද කියා අසන්නට පුළුවනි.?

කුසල් අනුමෝදන් කිරීම සැබැවින්ම කළ හැකි දැයි මම ජ්‍යෙෂ්ඨ සහ උගත් ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේලාගෙන් විමසා සිටියෙමි. ඔවුන්ගේ ප්‍රතිචාර සාමාන්‍යයෙන් එයම වී තිබුණි. සුළු ව්‍යාකූල ගතියක්, ඇත්ත සඟවා කතා කිරීම සහ අවසානයේ එය කළ නොහැකි බව අකමැත්තෙන් පිළිගැනීම වශයෙනි. මම තවදුරටත් ඇසූ විට, ''එසේ නම් එය කරන්නේ ඇයි?'', පිළිතුර සාමාන්‍යයෙන් මෙයයි, 'මිනිසුන්ට තමන්ගේ ආදරණීය මිය ගිය තැනැත්තාගේ ප්‍රයෝජනය සඳහා යමක් කළ යුතුයි යන හැඟීම නිසා, යථාර්ථය පිළිබඳ බෞද්ධ අවබෝධය ඒ සඳහා ඉඩ නොදෙන බවත්, ඒ නිසා භික්ෂූන් වහන්සේලා කුසල් අනුමෝදන් කිරීමේ වැඩ පිළිවෙලක් අවමංගල්‍ය උත්සවවලදී සහ ඊට පසු වර්ෂවල පවත්වන උත්සවවලදී ද මිනිසුන් කෙරෙහි අනුකම්පාවෙන් සිදු කරති. මිනිසුන්ගේ හැඟීම්, විශේෂයෙන් ඔවුන් ශෝකයට පත්වී සිටින අවස්ථාවක සංවේදීතාවෙන් තොරව එසේ කිරීම ප්‍රශංසනීය වේ. නමුත්, ධර්මය පැහැදිලි කිරීම ඊටත් වඩා ප්‍රශංසනීයයි. අවසානයේ හොඳම සැනසිල්ල, ජීවිතයේ නිතිපතා සිදුවන වෙනස්වීම්වලට එරෙහි ප්‍රබලතම ආරක්ෂක ආවරණය වන්නේ සත්‍යයයි. තවත් කෙනෙකුට කුසල් අනුමෝදන් කිරීම කළ නොහැකි වුවද, ඔවුන් වෙනුවෙන් කරන ලද යහපත් සහ ගුණවත් ක්‍රියාවන් ගැන ප්‍රීතිවීමට අවස්ථාවක් ඔවුන්ට ලබා දිය හැකිය. එම පුරුද්ද සිංහල බසින් පින් අනුමෝදනය හෙවත් 'පුණ්‍යානුමෝදන' යනුවෙන් හැඳින්වේ. එවැනි දෙයක් බුදුපියාණන් වහන්සේ ඍජුව සඳහන් නොකළද, එය ඉතා මුල් අවස්ථාවේදී බුදුදහමේ දක්නට ලැබුණු අතර, ධර්මයටද පටහැනි නොවේ. මෙම පරිචය තුළ මෑතකදී මියගිය පුද්ගලයෙකුගේ පවුලේ අය සහ මිතුරන් යම් දානමය සහ ගුණවත් - කුසල් වැඩෙන කටයුතු කරන අතර, ඊට පසු සරල උත්සවයකදී මියගිය පුද්ගලයා වෙනුවෙන් එසේ කරන බව ප්‍රකාශ කරයි. මියගිය පුද්ගලයා තවමත් අන්තරාභවයේ (අන්තරාභව) සිටී නම්, ඔහුට ඒ බව දැනේ. නැතහොත් වෙනත් ආකාරයෙන් දැනගැනීමට හැකිවන අතර, එමගින් ඔහුට ප්‍රීතිප්‍රමෝදය සහ සැනසීම ලබා දිය හැකිය. සාම්ප්‍රදායිකව එම යහපත් ක්‍රියාව වන්නේ මියගිය පුද්ගලයා වෙනුවෙන් සාමාන්‍යයෙන් භික්ෂූන් කණ්ඩායමකට ආහාර වේලක් පිරිනැමීමයි. නමුත්, ශ්‍රී ලංකාවේ මිනිසුන් රෝහලක එක් වාට්ටුවක රෝගීන්ට හෝ මහලු අය සඳහා ආහාර ලබා දීම, හෝ මියගිය අය උනන්දුවක් දැක්වූ පුණ්‍ය ආයතනයකට පරිත්‍යාගයක් කිරීම හෝ පාසලකට පොත්පත් පරිත්‍යාග කිරීම ආදියේද යෙදෙණු මම අසා ඇත්තෙමි. පුණ්‍යානුමෝදනාවේ විවිධ යහපත තිබේ. එය මියගිය පුද්ගලයා (ඔහු සිහි කිරීම පිළිබඳව සතුටක් ඇතිවීමෙන්) නඟාසිටුවීමටත්, ශෝකයට පත්වන අයට සැනසීමක් ලැබීමටත්, එම පරිත්‍යාග ලබන්නාට ඇති ප්‍රයෝජන සහ සැබැවින්ම එය ධර්මයට අනුකූල වීම යනාදි ප්‍රයෝජන සඳහන් කළ හැකිය.

## කර්මය සහ නැවත ඉපදීම - කථා එකතුවක්

බුදුපියාණන් වහන්සේගේ කර්මය සහ නැවත ඉපදීම පිළිබඳ ධර්මයේ සමහර ඇඟවීම් විමසමින් ඒවා ගැන නිතර අසනු ලබන ප්‍රශ්න කිහිපයකට පිළිතුරු දීමට උත්සාහ කරමින් අපි මෙම ගවේෂණය අවසාන කරමු.

(අ) නැවත ඉපදීම පිළිබඳ අදහස බටහිර රටවල ප්‍රචලිත වී ඇති බැවින්, යම් මට්ටමකට පිළිගෙන ද ඇති නිසා. ඔවුන්ගේ පෙර ජීවිත සිහිපත් කළ හැකි යැයි කියමින් මිනිසුන් ග්‍රන්ථ රාශියක් බිහි කර ඇත. මිනිසෙකුට තිබේයැයි කියනු ලබන අතීත ජීවිත මතකයන් යළි ප්‍රකෘතියට පත් කර ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන මාර්ගෝපදේශ ලබා දෙන ග්‍රන්ථ පවා ඇත. පොළඹවනසුලු මෙම කියමන් ස්වල්පයක් සැලකිල්ලට ගැනීම හෝ සමහර විට, අවිධිමත් පිරික්සීමට ලක් කිරීම සුදුසු වේ. තමන්ගේ පෙර භවයේදී තමා ක්ලියෝපැට්රා බවට පැහැදිලි මතකයක් තිබූ බවට පැවසූ පුද්ගලයන් අවම වශයෙන් හතර දෙනෙකු තමා දන්නේ යැයි මගේ මිතුරෙකු පවසා ඇත. ඊනියා අතීත ජීවිත මතකයන් බොහෝ විට හැඟවීමක, ඕනෑවට වඩා සිදු කළ විචිත්‍රවත් පරිකල්පනයක්, තමාගේ සැබෑ ස්වරූපයට වඩා සිත්ගන්නාසුලු ලෙස පෙනී සිටීමට හෝ අමතකවූ මතකය හඳුනා නොගැනීමෙන් තොරව නැවත පැමිණෙන විට, එය අලුත් සහ නැවුම් දෙයක් ලෙස විශ්වාස කිරීම crypto-amnesia. [13] වැනි හේතු නිසා ඇති වූ හැඟීමක ප්‍රතිඵලයකි.

නමුත් නිශ්චිතවම සියල්ලම එසේ නොවේ. වර්ජිනීයා වෛද්‍ය විද්‍යාලයේ හිටපු අධිමානසික විද්‍යාඥ, මහාචාර්ය ඉයන් ස්ටීවන්සන් පෙර ජීවිතයක් සිහිපත් කිරීමට සමත්වූ දරුවන් පිළිබඳව අධ්‍යයන මාලාවක් ප්‍රකාශයට පත් කර තිබේ. ස්ටීවන්සන්ගේ සොයාගැනීම් කෙරෙහි අවම වශයෙන් විද්‍යාත්මක ප්‍රජාවගේ අවධානය ලැබී ඇත. ස්ටීවන්සන්ගේ අඩිපාරේ ගමන් කළ අනෙක් අය වන්නේ ආචාර්ය, බී. ජිම්. ටකර් සහ මහාචාර්ය අර්ලෙන්ඩුර් හැරල්ඩ්සන් ය.

ඉතින් අප ඇත්තටම නැවත ඉපදුනොත්, සමහර අය විමසන්නේ වැඩි පිරිසකට ඔවුන්ගේ පෙර ජීවිත අමතක වන්නේ ඇයි ද යන්නයි? නමුත් සමහර විට අවම වශයෙන් ඔවුන් ළදරුවන්ව සිටියදී ඔවුන්ට පුළුවනි. අතීත ජීවිතයේ මතකයන්වල ප්‍රතිඵලයක් විය හැකි දේ පිළිබඳව දරුවන් අසාමාන්‍ය ලෙස නොකියන නමුත්, බෞද්ධ ලෝකයෙන් ඔබ්බට නැවත ඉපදීම පුළුල් ලෙස පිළිනොගන්නා හෙයින්, ඔවුන්ගේ දෙමාපියන් එවැනි දේ නොසලකා හරින අතර, හුදෙක් බොළඳ විහිළුවක් ලෙස බැහැර කරනු ඇත. දරුවා වැඩෙන විට ඔහුගේ හෝ ඇයගේ වර්තමාන ජීවිතයේ නව සංවේදනීය හැඟීම්වල බලපෑම හුදෙක් අතීත ජීවිත මතකයන් සම්පූර්ණයෙන්ම වසා දමයි. නැතහොත්, අතීත මතකයන් වර්තමාන ජීවිතයේ මතකයන් සමග පටලැවේ. කෙසේ නමුත්,

බහුතරයකට ස්වාභාවික සංවේදක අහිමි කරන ටැංකියක් බඳු ගර්භාෂයේ සිටින මාස නවය තුළදී, සියල්ල මකා දමන නමුත්, හුදෙක් අසම්පූර්ණ සහ අසම්බන්ධ අතීත මතකයන් කිහිපයක් පමණක් ඉතිරි වේ. පෙනෙන ආකාරයට, එවැනි මතකයන් බුදුපියාණන් වහන්සේ විස්තර කළ ආකාරයට, සාමාන්‍යයෙන් නැවත ලබා ගත හැක්කේ නිර්වාණය අවබෝධ කිරීමට මොහොතකට පෙර කාලය තුළ පමණි. බුදුපියාණන් වහන්සේ එම අවස්ථාව මෙසේ පැහැදිලි කළහ: ''මනස අවධානය යොමු කරමින්, පිරිසිදු කරමින්, පවිත්‍ර කරමින්, සහ කැළැල් රහිතව, නම්‍යශීලී සහ කෙළෙස්වලින් නිදහස්, හැඩගැන්විය හැකි, ස්ථිර සහ නොකැළඹෙන'' යනුවෙනි. (D.I,76)

(ආ) බෞද්ධ ලෝකය පුරා නැවත ඉපදීම වලංගු ලෙස පිළිගැනේ. කෙසේ වෙතත්, බරහිර රටවල බොහෝ මිනිසුන් එය සලකන්නේ කුතුහලයෙන් සහ වියනොහැකි දෙයක් ලෙසය. සදාකාලික ස්වර්ගය හෝ නිරය පිළිබඳ අදහසට අවම වශයෙන්, නොපැහැදිලි අර්ථයකින් තවමත් යම් පිළිගැනීමක් ඇත. නමුත්, මැදහත්ව කිවහොත්, නැවත ඉපදීම අඩු වැඩි වශයෙන් ඇදහිය නොහැකිය. බොහෝ මිනිසුන්ගේ මනසට නැවත ඉපදීම සම්බන්ධයෙන් ඇති ප්‍රධාන ප්‍රශ්නය එහි ඇති නුහුරු බවයි. එසේම බොහෝ බුද්ධිමත් මිනිසුන් අඩක් පුළුස්සන ලද ''ගුප්ත'' සහ සංසරණය වන නව යුගයේ මත සමග ඉදිරිපත් කළ විට සලකා බැලීමට තරම් නොවටිනා බව පවසමින් ප්‍රතික්ෂේප කරන බවට සැකයක් නැත.

නමුත් නැවත ඉපදීම පිළිබඳව අවම වශයෙන් යම් පිළිගැනීමක් ඇතැම් බුද්ධිමතුන් සහ වැදගතුන්ගෙන් ලැබී ඇත. දාර්ශනික පෝල් එඩ්වඩ්ස් නැවත ඉපදීම හෝ පුනරුත්පත්තිය පිළිබඳව වැදගත් සාක්ෂිමය සහ තර්කානුකූල ගැටලු යැයි තමා විශ්වාස කරන දේ ඉස්මතු කර තිබේ. නමුත්, දාර්ශනිකයන් වන සී.ජේ. ඩුකාස් සහ ජේ. එම්. ඊ. මැක්ටැගර්ට් වැනි අය සහ සූසන් බ්ලැක්මො වැනි විද්වතුන් නැවත ඉපදීම පශ්චාත් විමර්ශන ප්‍රතිඵලයක් පැහැදිලි කිරීමක් විය හැකි යයි සලකා ඇත. [14]

(ඇ) බුදුපියාණන් වහන්සේට අනුව, පැවැත්මේ ගතිලක්ෂණ තුන වන්නේ දුක් විඳීම (දුක්ඛ), අනිත්‍ය (අනිච්ච) සහ අනාත්ම (අනත්ත) ය. අනාත්ම යන්නෙන් ප්‍රකාශ කරන්නේ සදාකාලික, නොවනස්වන ආත්මයක්, ජීවයක් හෝ භෞතික හෝ අභෞතික දේවල සාරය පිළිබඳ අදහස් මායාවක් බවයි. සමහර පුද්ගලයන් මේ පිළිබඳව ඇසූ විට, ඇතැම් විට ඔවුන් වටහා ගෙන ඇති ආකාරයට අසන්නේ: ''ආත්මයක්, ජීවයක් හෝ ආධ්‍යාත්මයක් නැත්නම්, එක් ජීවිතයක සිට ඊළඟ ජීවිතයට යන්නේ කුමක්ද?'' ගැටලුව යථාර්ථයට වඩා පැහැදිලිව පෙනේ. බුදුපියාණන් වහන්සේ එවැනි ආත්මයක් නොමැති බව ඉගැන්වූයේ නැත - උන්වහන්සේ ඉගැන්වූයේ ස්ථිර, නොවෙනස්වන, අද්භූත ආත්මයක් නොමැති බවයි. සමකාලීන මනෝවිද්‍යාවේ දී මෙන්ම, බුදුදහමේදීද,

ආත්මය යනු නිරන්තරයෙන් ක්‍රමයෙන් ඇති වන හැඟීම් සහ මතකයන්, ගතිලක්ෂණ සහ චිත්ත ස්වභාවයන් එක්ව විඥානය ඇති කරන පොකුරක් බව වටහාගෙන ඇත. යම් කෙනෙකු මෙය හඳුනාගත් විට, එය අන් දේවලින් වෙන්වූ ස්වාධීන සහ කාලය පුරා බාධක මැද නිරතව සිටීමට අවශ්‍ය හැඟීම් ලබා දෙයි. මෙම නිරීක්ෂණය සහ පර්යේෂණය පාදක කොට කටයුතු කරන ආත්මය ඒ තුළ පැහැදිලිව පවතින්නේ, එය නිරන්තරයෙන් වෙනස්වනසුලු තත්ත්වයක් වුවද, සැබෑ අත්දැකීමක් නිසාය. එක් ජීවිතයක සිට තවත් ජීවිතයකට ගමන් කරන්නේ මෙම ආත්මයයි. එක පේළියක තිබෙන බිලියඩ් බෝල තුනක් ගැන සිතන්න. එක් එක් බෝල අනෙක ස්පර්ශ කරන අතර, හතරවන බිලියඩ් බෝලය තුන්වන බෝලයෙන් මඳක් දුර සිට ඒවාට පෙළ ගැසෙයි. දැන් සිතන්න, මිනිසෙකු සිව්වන පන්දුවට ඔහුගේ යෂ්ටියෙන් බෝලයට පහර දෙන්නේ යැයි සිතන්න. එය මේසය හරහා වේගයෙන් ගමන් කර, පේළියේ තිබෙන පළමු පන්දුවට පහර දෙයි. චලනය වන පන්දුව ක්ෂණිකව නතර වනු ඇත. දෙවන පන්දුව නිශ්චල වේ. අවසාන පේළියේ තිබෙන තුන්වන පන්දුව මේසය හරහා වේගයෙන් ගොස් පොකොට්ටුවට වැටේ. සිදුවී ඇත්තේ කුමක්ද?

සිව්වන පන්දුවේ ශක්තිය පේළියේ ඇති පළමුවැනි සහ දෙවැනි බෝල හරහා ගමන් කර, තුන්වන බෝලය තුළට ගමන් කර, එය සක්‍රිය කරමින්, මේසය හරහා ගමන් කරයි. එවැනි ආකාරයටම, අපට පහසුවෙන්ම ආත්මය වශයෙන් හැඳින්විය හැකි, මානසික ශක්තිය එක් ශරීරයකින් තවත් එකකට ගමන් කරයි. සැබැවින්ම, එක් මාධ්‍යයක් හරහා ගමන් කර තවත් වස්තුවක් ප්‍රාණවත් කිරීමට ඉඩ සලසන සත්‍ය නම්, එහි ඇති වෙනස්වන බවයි (අනිච්ච). එය මෙය නොවේ. නමුත්, ආත්මයකට හෝ ජීවයකට වෙනස් නොවෙමින් එක් ස්ථානයක හෝ මානයක සිට තවත් එකකට යා හැකිය යන අදහස පැහැදිලි කිරීම අපහසුය.

(ඈ) මෙයින් පහත දැක්වෙන්නේ අනන්‍යතාව පිළිබඳ ප්‍රශ්නයයි. ආත්මය නිර්මාණය කරන විඥානය සැබැවින්ම වෙනස් වන්නේ නම්, නැවත ඉපදුණු පුද්ගලයා මියගිය පුද්ගලයාට සමාන යැයි සැලකීම තර්කානුකූලව පිළිගත හැකිද? එසේම නැවත ඉපදුණු පුද්ගලයා මියගිය තැනැත්තාට වඩා වෙනස් නම්, වර්තමාන ජීවිතයේ දී, පෙර ජීවිතයේ දී සිදු කළ කර්මවල ප්‍රතිඵල අත් විඳිය හැකි යැයි පැවසීම තර්කානුකූලව පිළිගත හැකිද? බුදුපියාණන් වහන්සේ හරියටම මෙම ප්‍රශ්න සම්බන්ධයෙන් කථා කිරීම වැදගත් වේ. උන්වහන්සේ පැවසුවේ, ක්‍රියාව සිදු කරන තැනැත්තා එම ප්‍රතිඵල අත්විඳින තැනැත්තාට වඩා වෙනස් බවයි. නමුත්, ඔවුන් සම්පූර්ණයෙන්ම වෙනස් යැයි කීම අන්තවාදී වීමකි. පසුව උන්වහන්සේ තම ස්ථාවරය යළිත් අවධාරණය කළේ නිරන්තරයෙන් වැඩෙමින් පවතින අන්තර්-සම්බන්ධිත මනෝ භෞතික සාධක

ප්‍රවාහයක් විසින් ආත්මය පිළිබඳ ''හැඟීම'' පුද්ගලයා තුළ පුරුදු කරවන බවයි. **(42)**

උදාහරණ භාවිත කිරීමේ තර්කන ක්‍රියාවලියක් තුළින්, බුදුපියාණන් වහන්සේ අදහස් කළේ කුමක්ද යන්න පැහැදිලි කරගත හැකිය. අවුරුදු 60ක් තිස්සේ පැවත එන පාපන්දු කණ්ඩායමක් ගැන සිතන්න. මෙම කාලය තුළ බොහෝ ක්‍රීඩකයන් කණ්ඩායමට එක්වී, වසර පහක් හෝ දහයක් ක්‍රීඩා කර, එයින් ඉවත් වී වෙනත් ක්‍රීඩකයන් එම ස්ථානයට පත්වී ඇත. එනමුත්, මුල් ක්‍රීඩකයන් එක් අයෙකුවත්, දැන් එම කණ්ඩායමේ නැත. මුල්ම අය ජීවතුන් අතර පවා නැත. එහෙත්, ''කණ්ඩායම'' පවතින බව පැවසීම තවමත් වලංගු වේ. අඛණ්ඩ වෙනසක් තිබියදී එහි අනන්‍යතාව හඳුනාගත හැකිය. ක්‍රීඩකයන් දැඩි, ස්ථිර වස්තූන් වන නමුත්, කණ්ඩායමේ අනන්‍යතාව සෑදී ඇත්තේ කුමකින්ද? ක්‍රීඩකයන්ගෙන් කොටසක් ලෙස පමණක් නොව, එහි නම, එහි අතීත ජයග්‍රහණ පිළිබඳ මතකයන්, ක්‍රීඩකයන් සහ ආධාරකරුවන් ඒ කෙරෙහි ඇති හැඟීම්, එහි කණ්ඩායම් හැඟීම්, ආදියෙනි.

ඒ හා සමානවම, මවක් පවුලේ ඡායාරූප ඇල්බමය රැගෙන තමන්ගේ කුඩා කාලයේ ඡායාරූප ඇයගේ දරුවන්ට පෙන්විය හැකිය. විද්‍යාව අපට පවසන්නේ ඇය තරුණ වියේදී තිබූ ඇයගේ ශරීරයේ එක් කුඩා අංශුවක්වත් දැන් ඒවාට සමාන නොවන බවයි. ඇයගේ තරුණ කාලයේ තිබූ සිතුවිලි, අදහස් සහ විශ්වාස යන මේ සියල්ල දැන් වෙනස් වී ඇත. තරුණ කාලයේ ඇයගේ මුහුණේ ලක්ෂණ පවා, අපැහැදිලි ලෙස සමාන බවක් තිබුණත්, ඇයගේ දරුවන්ට හඳුනාගැනීම දුෂ්කරය. එනමුත්, පුදුමයට පත්වන දරුවන් ඔවුන්ගේ මවගෙන්: ''ඒ ඔබද අම්මේ?'' කියා ඇසූ විට, ඇය පිළිතුරු දෙන්නේ ''ඔව්'' යනුවෙනි. කිසිවෙකු ඇයට බොරු කියන බවට චෝදනා නොකරනු ඇත. ශරීරය සහ මනස නිරන්තරව වෙනස් වන නමුත්, නැවත ඉපදුණු පුද්ගලයා මියගිය පුද්ගලයාගේ අඛණ්ඩ පැවැත්මක් යැයි පැවසීම තවමත් වලංගු වේ. ඒ වෙනස් නොවන ඕනෑම ආත්මයක් එක් පුද්ගලයෙකුගෙන් තවත් පුද්ගලයෙකු ලෙස පසුකර යෑම නිසා නොව, මතකයන්, චිත්ත ස්වභාව, ගතිලක්ෂණ, මානසික පුරුදු සහ මානසික ප්‍රවණතා තුළ අනන්‍යතාව නොනවත්වා පවතින නිසාය. මේ අනුව, පුද්ගලයෙකු එක් ජීවිතයකින් තවත් ජීවිතයකට ගමන් කරන බවත්, පෙර ජීවිතයේදී සිදු කළ කර්ම විපාක මේ ජීවිතයේදී අත්විඳිය හැකි බවත් පැවසීම වලංගු වේ.

(ඉ) උත්තරීතර දෙවියෙකු කෙරෙහි විශ්වාස කිරීමට පක්ෂව ඉදිරිපත් කරන ලද එක් තර්කයක් නම් ආචාරධර්ම අර්ථවත් වන්නේ දෙවිකෙනෙකු සාරධර්ම පිළිබඳ සදාකාලික තීරකයෙකුව සිටින විට පමණක් යන්නයි. හරි වැරැද්ද පිළිබඳව මිනිසුන්ට පැහැදිලි අදහසක් ඇතැයි සිතිය හැක්කේ එය දෙවියන්ගේ

දේව නියෝග මගින් නියම කර ඇති බැවිනි. ඔවුහු මෙම දේව නියෝග පිළිපදින බැවින් තර්කය ඇතිවන්නේ දෙවියන්ට ඇති ආදරය නිසා හෝ එසේ නොවූවහොත්, මෙතැන හෝ ඊටපසු දෙවියන්ගේ දඬුවමට ඔවුන් බිය නිසාය. මේ අනුව දෙවියෙකු නොමැතිව යහපත් දේ කිරීමට සහ අයහපත් දෙයින් වැළකීමට පෙළඹවීමක් නැතිවිය හැකිය. සැබැවින්ම, දෙවියන් නොමැතිව යහපත් සහ අයහපත් දේ කුමක්ද යන්න අප නොදන්නවා විය හැකිය. ඩොස්ටොයව්ස්කි මෙම තර්කය ප්‍රසිද්ධ ලෙස සාරාංශගත කළේය: ''දෙවියන් නොමැතිව සියල්ලටම අවසර ඇත.'' මෙම තර්කය සමග විශාල ගැටලු ඇත. සියලු සෑම සිතාගත හැකි දුෂ්ටකමක්ම දෙවියෙකු සිටියදී කර ඇති බව නිසා නොවේ, සමහර විට දෙවියෙකු කෙරෙහි ගැඹුරු විශ්වාසයක් ඇති අය පවා එසේ කර ඇත.

නමුත්, පවතින එකම තේරීම් දෙක වන්නේ දේවවාදය සහ සදාචාරාත්මක නියතිවාදයද? උත්තරීතර ජීවියෙකු විශ්වාස කරන අය සහ එසේ නොකරන අය අතර විවාදයකට කර්මය කිසිවිටකත් ඇතුළත් නොවුවද, කර්මය විසින් සලකා බැලිය යුතු වටිනා තුන්වන විකල්පයක් ඉදිරිපත් කරයි. කර්මය පිළිබඳ බෞද්ධ ධර්මය සදාචාරාත්මක විශ්වයක් සඳහා පදනමක් සපයයි. එය සදාචාරාත්මක, නිවැරදි ශික්ෂාපද සාධාරණීකරණය කරයි. දිරිගන්වයි. එය දෙවියෙකු පිළිබඳ මතය සත්‍ය ලෙස පිළිනොගෙන යහපත් දේ කිරීමට සහ අයහපත් දෙයින් වැළකීමට අවශ්‍ය පෙළඹවීම ලබා දෙයි. බෞද්ධ දර්ශනයට උත්තරීතර දෙවියෙකු පිළිබඳ සංකල්පය ඇතුළත් නොකළද, එය බොහෝ දුරට සදාචාරාත්මක ධර්මවලට එළඹී ඇත්තේ ප්‍රධාන දේවවාදී විශ්වාසයන් විසින් උගන්වන ලද ඒවාට සමානවමය. යථාර්ථය නම් දෙවියෙකු නොමැතිව සාදාචාරයක් තිබිය හැකි බවයි. ''ආදරය, ගෞරවය, කාරුණික සැලකිල්ල, සමගිය සහ සාමය'' (A.III,289) සඳහා යොමු වන හෙයින් යහපත් දෙයට අප අනුගත විය යුතු බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. එසේම අන්‍යයන් කෙරෙහි අනුකම්පාවෙන් අප අයහපත් දේ කිරීමෙන් වැළකිය යුතු බවත්, එසේ නොවුනහොත්, කර්ම ප්‍රතිවිපාක ඉතා අයහපත් විය හැකි බවත් උන්වහන්සේ පැවසූහ.

(ඊ) මරණින් පසු ජීවිතය නතර වන බව විශ්වාස කරන අය සමහර විට තරයේ දරා සිටින්නේ පශ්චාත් විමර්ශන පරීක්ෂණ පැවැත්ම ඇතුළු නැවත ඉපදීම පිළිබඳ සියලු න්‍යායයන් ප්‍රාර්ථනා ඉටුකිරීමේ ප්‍රතිඵලයක් බවයි. එයට හේතුව, මරණය පිළිබඳව ස්වාභාවික බියක් සහ සදාකල් ජීවත්වීමට ආශාවක් මිනිසුන් තුළ තිබීමයි. ඔවුහු ඔවුන්ගේ පරිකල්පනයේ යම් ආකාරයක මරණින් මතු ප්‍රීතිමත් ජීවිතයක් නිර්මාණය කරති. එබැවින් පශ්චාත් විමර්ශන පරීක්ෂණ පැවැත්ම පිළිබඳ විශ්වාසයේ තර්කය වන්නේ හුදෙක් සැනසිල්ලකි. මෙම

ප්‍රකාශය සමග තර්ක කිරීම දුෂ්කර වනු ඇත. කෙසේ වෙතත්, එවැනි ප්‍රකාශයක් කර්මය පිළිබඳ බෞද්ධ අදහසට කිසිසේත් අදාළ නොවනු ඇත. අනික් අතට, සම්පූර්ණයෙන්ම සියලු ආගම් සලකන්නේ සදාකාලික ජීවිත එක් ආකාරයකින් හෝ වෙනත් ආකාරයකින් ප්‍රියජනක දෙයක් ලෙසයි. එනම් යහපත් දේ කිරීමෙන් ලැබෙන්නේ පාරිතෝෂයක් ලෙසත්, හෝ සැබෑ දෙවියෙකු කෙරෙහි විශ්වාසයක් තිබීම, බලාපොරොත්තු විය යුතු දෙයක් ලෙසත්ය. බුදුදහම එය සලකන්නේ විසඳිය යුතු ප්‍රශ්නයක් ලෙසයි. බුදුපියාණන් වහන්සේට අනුව, ලෝකයට අඛණ්ඩව නැවත ඉපදීම සාමාන්‍යයෙන් අන්තර්ගත වන පැවැත්මට අයත්වන සියලු ප්‍රශ්නවලට නිරාවරණය වීමකි. එනම්, ලෙඩරෝග, අනතුරු, ආදරණීයයන් අහිමිවීම, සමාජීය කඩාකප්පල්වීම්, ජරාව සහ අවසානයේ මරණයට පත්වීම් යනාදියයි. දිව්‍යලෝකයේ සදාකාලික ජීවිතය සහ අවසානයේ මරණයට පත්වීම් යනාදියයි. දිව්‍යලෝකයේ සදාකාලික ජීවිතය පිළිබඳ අදහස පුද්ගලයෙකු ''නතර කළ යුතුයි, වැළැක්විය යුතුයි සහ පිළිකුල් කළ යුතුයි'' (A.I,115) බුදුපියාණන් වහන්සේ පැවසූහ. එම ඉලක්කය ඒකාන්තයෙන්ම නිර්වාණයට වඩා පහත් යැයි උන්වහන්සේ සැලකූහ. දිව්‍යලෝකයේ සදාකාලික ජීවිතය පවා, සත්‍යයක් නම්, ඉක්මනින් හෝ පසුව, එහි විඩාව සහ අර්ථවිරහිත හැඟීමක් ඇතිවිය යුතුමයි. බුදුදහමේ අරමුණ සංසාරය, ඉපදීමේ ක්‍රියාවලිය, මරණය සහ නැවත ඉපදීම අවසාන කිරීමයි. එසේ නම්, ප්‍රාර්ථනාවන් ඉටුකිරීමේ න්‍යාය කොතරම් වෙනත් පශ්චාත් විමර්ශන න්‍යායන්වලට යෙදිය හැකි වුවත්, බුදුදහමට යෙදිය නොහැකිය.

(උ) කර්මය පිළිබඳ බුදුපියාණන් වහන්සේගේ ධර්මයේ ඇති ප්‍රබල කරුණුවලින් එකක් නම්, එය බොහෝ මිනිසුන්ගේ අදහසක් වන යුක්තිය සහ සාධාරණය සමග හොඳින් ගැලපීමයි. සදාකාලික නිරය දුෂ්ට ක්‍රියාවන්වලට සහ ජීවිතකාලය පුරාම සිදු කළ දුෂ්ට ක්‍රියාවන්ට හෝ ව්‍යාජ දෙවිකෙනෙකුට නමස්කාර කිරීම, ආදියට පවා සමානුපාතික නොවන දඬුවමක් ලෙස පෙනී යයි. අවුරුදු 50ක්, 80ක් හෝ 100ක් යහපත් ලෙස දිවි ගෙව්වත්, සමහරු එය හඳුන්වන්නේ සදාකාලික දිව්‍යලෝකය සඳහා ඉතා සාධාරණ පසුබිමක් බවයි. අප කරන කර්මය සඳහා අප අත්විඳින විපාක ඊට හාත්පසින්ම දළ වශයෙන් සමානුපාතික වේ.

මෙම ග්‍රන්ථයේ පිටකවරයේ ඇති ඡායාරූපය ජාවා හි මහා බොරොබුදූර් විහාරයෙන් කර්මවිභංගයේ දර්ශනයක් නිරූපණය කරන්නකි. දකුණු පසින් මිනිසුන් මාළු සහ ඉබ්බන් පිසින අතර, වම් පසින් එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුහු අපායේ නැවත උපදිති. එහිදී ඔවුහු ජීවමානව තැම්බෙති. එවැනි හේතුඵල තත්ත්වයක් අතිශය සරල සහ අතිශය බොළඳ එකක් වුවද, විපාකයේ

ශක්තිය සහ කාලසීමාව එයට හේතුවූ කර්මය පිළිබිඹු කරයි යන අදහස එයින් පළ කරයි. හිට්ලර් වැනි මිනිසෙකු නිරයට යාමට සුදුසු නමුත්, ඔහු සදහටම නිරයට යාමට සුදුසු ද? එය ඔහු කළ ඉතා දුෂ්ට ක්‍රියාවන්වලට වඩා වැඩියෙන් භයානක බව පෙනේ. යහපත් දේ කිරීමෙන් යහපත් අත්දැකීම් සහ අයහපත් දේ කිරීමෙන් අයහපත් අත්දැකීම් වශයෙන් කුමන ආගමකට අයත් වුවත්, හෝ කුමන දෙවියන්ට නමස්කාර කළත්, කර්මය අපක්ෂපාති වේ. එසේම කර්මයේ යුක්තිය උඩට ඔසවා තබන ආකාරයේ ස්වරූපයක් ද ඇතුළත් බව පෙනී යයි. ජෙෆරි දහ්මර්, ඉඩි අමීන්, පොල් පොට්, හිමලර්, ස්ටාලින් සහ වෙනත් අය වඩාත් දුෂ්ට මිනිසුන්ට අත්වන විපාක පවා අවසානයේ ක්‍රමයෙන් අවසන් වනු ඇත. ඔවුන්ට නිදහස් වීමට තවත් අවස්ථාවක් උදාවනු ඇත. සෑම අර්ථයකින්ම, කර්මය පිළිබඳ ධර්මය සාධාරණය, අපක්ෂපාතීය, යුක්තිසහගතය.

Notes

1. අභිධර්මකොෂභාසය වෙළුම 1, ප්‍රංශ භාෂාවට පරිවර්තනය කරන ලද්දේ Louis de La Vallee Poussin, ඉංග්‍රීසියට පරිවර්තනය කරන ලද්දේ Leo M. Pruden 1991, p. 649. [back]
2. බුදුපියාණන් වහන්සේ සහ බුදුදහමේ අනුගමනය කරන ප්‍රතිපත්තියක් *Buddha and the Gospel of Buddhism*, 1916, p.233-4. [back]
3. කර්මය සහ නැවත ඉපදීම, 1994,p.16. සැබැවින්ම හම්ෆ්‍රීස් බෞද්ධයෙකුට වඩා පරම විඥානාර්ථවාදියෙක් වේ. [back]
4. කර්ම න්‍යාය, p.3. [back]
5. කර්ම ඵලය, 1994, p.113. [back]
6. 'බුදුදහමේ කර්මය පිළිබඳව ස්වාභාවික මතයක් සඳහා වැදගත් ප්‍රශ්න Critical Questions Towards a Naturalized Concept of Karma in Buddhism', *Journal of Buddhist Ethics*, Volume 11, 2004. [back]
7. මුදල් ලිංගිකත්වය යුද්ධය කර්ම *Money Sex War Karma*, 2008, p.55. [back]
8. කවයේ දෙපැත්ත *Both Sides of the Circle*, 1978, p.48. [back]
9. දෙවියන් පිළිබඳ මිථ්‍යා විශ්වාස *The God Delusion*, 2006 p.394. [back]
10. p.53. [back]
11. මරණයට වඩා මරණයට පත්වීමට බොහෝ දේ ඇත *There is more to Dying than Death*, 2006, p.62. [back]
12. සර්වදර්ෂනසංග්‍රහ, පෙරදිග සාහිත්‍යයට අයත් නිර්මාණවල එකතුවක් Sarvadarśanasaṁgraha, *Bibilotheca Indica*, 1858, p.10. [back]
13. අමතකවූ මතකයක් නැවත පැමිණිවිට එය හඳුනා නොගැනීම පිළිබඳව On crypto-amnesia see Ian Wilson's *Mind Out of Time: Reincarnation Investigated*, 1981. [back]

14. Paul Edwards, පුනරුත්පත්තිය - ඉතා වැදගත් පිරික්සුමක් *Reincarnation: A Critical Examination*, 1996; C. J. Ducasse, මරණින් මතු ජීවිතය පිළිබඳ විශ්වාසය ගැන ඉතා වැදගත් පිරික්සුමක් *A Critical Examination of the Belief in a Life after Death*, 1961; John McTaggart, මානව අමරණීයත්වය සහ පූර්ව ජන්මය *Human Immortality and Pre-existence*, 1916; Susan Blackmore, ජීවත්වීමට මැරෙන - විද්‍යාව සහ මරණයට ආසන්න අත්දැකීම *Dying to Live: Science and the Near-death Experience*,1993. [back]

## පරිශිෂ්ට 1 - කර්ම සහ නැවත ඉපදීම පිළිබඳව බුදුපියාණන් වහන්සේ

(1) ප්‍රඥාවන්තයන් විසින් පරිස්සමින් සලකා බලා, ඔවුන්ගේ තාර්කික නිගමනයකට පැමිණි විට, කිසිවක් නොකිරීමට හේතු විය යුතු මෙම පටුමතවාදී අදහස් තුනක් තිබේ. ඒ තුන කුමක්ද? (අ) පුද්ගලයෙකුට අත්විඳින්නට සිදුවන ප්‍රසන්න, වේදනාකාරී හෝ මධ්‍යස්ථ යන කුමන හෝ අත්දැකීම් සියල්ලම අතීත කර්ම නිසා බව උගන්වන පැවිදි අය සහ බ්‍රාහ්මණයන් සිටී. [1]

(ආ) පුද්ගලයෙකුට අත්විඳින්නට සිදුවන ඕනෑම ප්‍රසන්න, වේදනාකාරී හෝ මධ්‍යස්ථ අත්දැකීම් සියල්ලම දෙවියන් වහන්සේගේ කැමැත්ත නිසා බව උගන්වන තවත් පිරිසක් ඇත.

(ඇ) ඕනෑම ප්‍රසන්න, වේදනාකාරී හෝ මධ්‍යස්ථ අත්දැකීම් පුද්ගලයෙකුට අත්විඳින්නට සිදුවන්නේ කිසිම හේතුවක් නැතිව බව උගන්වන තවත් පැවිදි සහ බ්‍රාහ්මණ පිරිසක් ද ඇත. දැන් ඕනෑම ප්‍රසන්න, වේදනාකාරී හෝ මධ්‍යස්ථ අත්දැකීම් අත්විඳින්නට සිදුවන්නේ ඔවුන්ගේ අතීත කර්මය නිසා බව උගන්වන පැවිදි සහ බ්‍රාහ්මණයන් වෙත ගොස් ඇත්ත වශයෙන්ම ඔවුන් මෙය ඉගැන්වූයේදැයි මම ඔවුන්ගෙන් විමසුවෙමි. ඔවුන් එසේ කළ බවට සනාථ කළ විට මම ඔවුන්ට මෙසේ පැවසුවෙමි: ''එසේ නම්, මම ප්‍රාණඝාත කරන්නෙමි, සොරකම් කරන්නෙමි, වැරදිකාමයේ හැසිරෙන්නෙමි, බොරු කියන්නෙමි, නුසුදුසු ලෙස වචන භාවිත කරන්නෙමි, තෘෂ්ණාවෙන් සහ මුළා කරවන අදහස්වලින් පිරී සිටින්නෙමි, ඒ මේ සියල්ල සිදුවන්නේ මගේ අතීත කර්ම නිසාවෙනි.'' සෑම දෙයකටම හේතුව ලෙස අතීත ක්‍රියාවන් මත පසුබසිමින්, යහපත් දේ කිරීමට හෝ අයහපත් දෙයින් වැළකීමට කැමැත්තක් නැතිවීමෙන්, ඔවුන්ට උත්සාහයක් දැරීමක්වත් කළ නොහැකි වේ. යහපත් හෝ අයහපත් ක්‍රියාවලට සැබෑ හේතුව ඔවුන් නොදන්නා හෙයින්, ඔවුන්ගේ මනස අවුල්

සහගත වේ. ඔවුන් තමන් ආරක්ෂා නොකරයි, එයින් ''තපස්'' යන යෙදුම පවා ඔවුන්ට තර්කානුකූලව පිළිගැනීමට නොහැකි වේ. එවැනි ධර්මයක් සහ අදහස් දරන තාපසයන් සහ බ්‍රාහ්මණයන් ප්‍රතික්ෂේප කිරීමට මගේ පළමු සාධාරණ හේතුව එයයි AN 3.62.

(2) මොලියසිවක බුදුපියාණන් වහන්සේට මෙසේ පැවසුවේය: ''යහපත් ගෝතමයාණන් වහන්ස, ප්‍රසන්න, වේදනාකාරී හෝ මධ්‍යස්ථ අත්දැකීම් කවරක් වුවද, ඒ සියල්ල අතීත කර්ම නිසා හට ගෙන ඇති බව උගන්වන තාපසයෝ සහ බ්‍රාහ්මණයෝ සිටිති. ඔවුන් පිළිබඳව ඔබවහන්සේට කිව හැක්කේ කුමක්ද?'' බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: ''සිවක, හැඟීම් හටගන්නේ පිත ඇවිස්සීම නිසාය. මෙය පුද්ගලයෙකු දැනගෙන සිටිය හැකිය. එය ලෝකය විසින් සාමාන්‍යයෙන් පිළිගන්නා කාරණයකි. දැන් එම තාපසයන් සහ බ්‍රාහ්මණයන් එවැනි ධර්මයන් දරාගෙන සිටින විට, ඒවා පුද්ගලයෙකු විසින් දන්නා දෙයට සහ ලෝකය සාමාන්‍යයෙන් පිළිගත් දේවලට ඔබ්බෙන් යයි. එමනිසා, ඒවා වැරදි යයි මම කියමි. සමහර හැඟීම් සෙම ඇවිස්සීමෙන්, වාතය ඇවිස්සීමෙන්, හෝ සියලු තුන්දොස් එකට කිපීමෙන් ඇති වන හැඟීම්ය. සමහර විට දේශගුණික වෙනස්කම් ඇතිවීමෙන්, වෙනත් ඒවා අනතුරු සහ තවත් ඒවා කර්මය නිසා සිදුවේ. සමහර හැඟීම්වලට එවැනි හේතු ඇති බව පුද්ගලයෙකුට දැනගත හැකි වන අතර, එය සාමාන්‍යයෙන් ලෝකය විසින් පිළිගන්නා කරුණකි. ඒ නිසා, තාපසයන් සහ බ්‍රාහ්මණයන් වැරදි යැයි මම කියමි''S.II,229.

(3) අහසේ නොවේ, මුහුද මැද නොවේ, කඳුබෑවුම් තුළට යාමෙන් නොවේ, පොළොව මත සිටගෙන නොවේ, කෙනෙකුට අයහපත් කර්මවලින් නිදහස් විය නොහැක Dhp.127.

(4) ''යම් පුද්ගලයෙකු මෙසේ කියන්නේ නම්: 'යමෙක් කර්මය නිර්මාණය කළ ආකාරයටම අත්විඳියි', එය එසේ නම්, එවිට පුද්ගලයෙකුට ආධ්‍යාත්මික ජීවිතයක් ගත කළ නොහැකිය. එවිට දුක් විඳීමෙන් අවසානයක් කරා යන්නට ක්‍රමයක් නොමැති වනු ඇත. නමුත්, යම් කෙනෙකු මෙසේ කිවහොත්: 'යම් පුද්ගලයෙකු යම් ආකාරයකින් අත්විඳිය යුතු කර්මයක් නිර්මාණය කළ විට, ඔහු එහි ප්‍රතිඵලය හරියටම ඒ ආකාරයෙන් අත්විඳියි.' එවිට ආධ්‍යාත්මික ජීවිතයක් ගත කිරීමට හැකිවනු ඇත. දුක් විඳීම් අවසන් කිරීමට ක්‍රමයක් ඇතිවනු ඇත.

උදාහරණයක් වශයෙන්, සමහර මිනිසුන් සුළු අයහපත් ක්‍රියා සිදු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අපායට යනු ඇත. මේ අතර, තවත් පිරිසක් එම සුළු අයහපත් ක්‍රියාවේම යෙදී ඇති නමුත්, එයද සුළු වශයෙන් හෝ ශේෂ

වශයෙන් නොරඳවමින් එහි ප්‍රතිඵලවල බහුල කර්මය මේ ජීවිතයේදී ගෙවා දමයි. මෙම පළමු පුද්ගලයා අපායට යන්නේ ඇයි? එයට හේතුව, මෙම පුද්ගලයාගේ ශරීරය, ගුණවත් හැසිරීම, මනස සහ ප්‍රඥාව වැඩී නොමැති නිසාය. ඔහු සීමිත සහ පහත් චරිතයකින් යුක්ත නිසා සහ දුක් විඳිමින් ජීවත්වන නිසාය. එවැනි පුද්ගලයෙකු වැදගත්කමක් නැති අකුසල කර්ම නිර්මාණය කරන විට, එය ඔහු අපායට යොමු කරයි.

හරියටම එම සුළු අයහපත් කර්මයම නිර්මාණය කරමින් වුවද, එයද, සුළු වශයෙන් හෝ ශේෂ වශයෙන් නොරඳවමින් අත්විඳින්නේ කුමන ආකාරයේ පුද්ගලයෙක්ද? මෙතැන, යම් පුද්ගලයෙකු ශරීරය, ගුණවත් හැසිරීම, මනස, සහ ප්‍රඥාවෙන් වැඩී ඇත්නම්, ඔහු අසීමිත පුද්ගලයෙකු වන අතර, ඔහුට උසස් චරිතයක්ද ඇත. ඔහු අසීමිත ආදරයෙන් ජීවත්වෙයි. එවැනි පුද්ගලයෙකු එම සුළු අයහපත් කර්මයම නිර්මාණය කරයිද, එම සුළු කර්මය පවා ශේෂයක් වශයෙන් ස්වල්පයක්වත් ඉතිරි නොකර මේ ජීවිතයේදීම ගෙවා දමයි. මිනිසෙකු කුඩා වතුර භාජනයකට ලුණු ගොඩක් දැම්මේ යැයි සිතමු. ඔබ කුමක් සිතන්නේද? එම ලුණු ගොඩ භාජනයේ ඇති වතුර ස්වල්පය බීමට නොහැකි තරම් ලුණු රස ඇති කරයිද?''

''එහෙමයි, බුදුපියාණන් වහන්ස,[2] එසේ වනු ඇත. ඇයි? එයට හේතුව, භාජනයේ ඇති ජලය සීමිතයි. එනිසා ලුණු ගොඩ, එහි ලුණු රසය වැඩි කර බොන්නට නොහැකි වනු ඇත.''

''දැන් ගංගානම් ගඟට ලුණු ගොඩක් මිනිසෙකු දැම්මේ යැයි සිතමු. ඔබ කුමක් සිතන්නේද? එම ලුණු ගොඩින් ගංගානම් ගඟේ ජලය ලුණු රසය වැඩි නිසා බොන්නට නොහැකි වේද?''

''නැත ස්වාමීනී, එසේ නොවනු ඇත. ඇයි? එයට හේතුව ගඟේ බොහෝ ජලය තිබෙන නිසා, එම ලුණු ගොඩ නිසා ලුණු රස වැඩිවීමක් හෝ බීමට නොහැකි තත්ත්වයක් ඇති නොවනු ඇත'' A.I,249.

(5) ලෝකයේ මෙම හතර ආකාරයේම මිනිස්සු ජීවත් වෙති. ඒ හතර කුමක්ද? එක් පුද්ගලයෙකු අඳුරෙන් අඳුරට, තවත් කෙනෙකු අඳුරෙන් ආලෝකයට, තවත් කෙනෙකු ආලෝකයෙන් අඳුරට, සහ තවත් කෙනෙකු ආලෝකයෙන් ආලෝකයට යොමු වෙයි.

(අ) පුද්ගලයෙකු අඳුරේ සිට අඳුරට ගමන් කරන්නේ කෙසේද? යම් පුද්ගලයෙකු පහත් පවුලක සිට, අඩු කුලයක. දඩයම්කරුවන්ගේ, උණබම්බු ආශ්‍රිත වැඩ කරන්නන්, කරත්ත හදන්නන්, හෝ මල් එකතු කරන්නන්ගේ පවුලක උපත ලැබුවේ යැයි සිතමු.[3] සොච්චම් ආහාර සහ බීම ඇති, හුදෙක් යැපීම දුෂ්කර වන දුප්පත් පවුලක්, ඔහු අවලක්ෂණ, විරූපී, නිතර රෝගීවන,

දුර නොපෙනෙන, අංගවිකල, කොර, හෝ අංශභාගයෙන් පෙළෙන අයෙකි. ඔහුට ජීවිතයේ ප්‍රසන්න දේවල් පහසුවෙන් ලැබෙන්නේ නැත. තවද, ඔහු කයෙන්, වචනයෙන් සහ මනසින්, වැරදි කරයි. එසේ කරමින්, මරණයෙන් පසු කයෙන් වෙන්වීමත් සමග, දුප්පත් පරිසරයක, රළු ස්ථානයක, අඳුරු ගමනාන්තයක, හෝ අපායේ පවා ඔහු නැවත උපත ලබයි.

(ආ) අඳුරෙන් අලෝකයට ගමන් කරන්නේ කෙසේද? යම් පුද්ගලයෙකු මීට පෙර සඳහන් කළ සියලුම දුබලතාවන් සහ දුෂ්කරතා සහිත අඩු පහසුකම් සහිත පවුලක නැවත ඉපදී සිටිනු ඇතැයි සිතමු. නමුත්, ඔහු කයෙන්, වචනයෙන් සහ මනසින් දැන් යහපත් දේ කරනු ඇතැයි සිතමු. එසේ කිරීමෙන් පසු, මරණයෙන් පසු, ශරීරය බිඳී යාමත් සමග, ඔහු යහපත් ගමනාන්තයක, දිව්‍ය ලෝකයක පවා නැවත උපත ලබනු ඇත.

(ඉ) ආලෝකයේ සිට අඳුරට යොමුවන පුද්ගලයෙකු කෙබඳුද? ඉහළ පවුලක පොහොසත්, උතුම්, බ්‍රාහ්මණ හෝ ගෘහස්ථ පවුලක, ධනවත්, සහ මහා වස්තුවක් සහ ඉඩකඩම්, රත්රන්, රිදී, ධනසම්පත් සහ වෙනත් බඩුභාණ්ඩ, සහිත ජීවිතයක් ගත කිරීමට කෙනෙකු උපත ලබා ඇත්තේ යැයි සිතමු. ඔහුට කඩවසම්, ආකර්ශණීය, අතිශයින් සුන්දර වර්ණයක් ඇතැයි සිතමු. ඔහුට ජීවිතයේ හොඳ දේවල් පහසුවෙන් ලැබේ යැයි සිතමු. නමුත් ඔහු කයෙන්, වචනයෙන් සහ මනසින් අයහපත් දේ කරයි. එසේ කරමින් සිටියදී ඔහුගේ මරණින් පසු, කය බිඳීමෙන් පසු, විරහිතතාවට, රළු ස්ථානයක, අඳුරු ගමනාන්තයක, අපායේ පවා ඔහු උපත ලබයි.

(ඊ) අවසානයේ, ආලෝකයෙන් ආලෝකයට ගමන් කරන පුද්ගලයා කෙබඳුද? යම් පුද්ගලයෙකු සියලු ලාභ ප්‍රයෝජන සහ වාසි සමගින් ඉහළ පංතියේ පවුලක නැවත ඉපදී ඇතැයි අපි සිතමු. ඔහු කයෙන්, වචනයෙන් සහ මනසින් යහපත් හැසිරීමෙන් යුක්ත යැයි අපි සිතමු. එසේ සිටිමින් ඔහු මරණ මොහොතේ කයෙන් බිඳී, යහපත් ගමනාන්තයක, දිව්‍ය ලෝකයක පවා නැවත ඉපදෙනු ඇතැයි සිතමු. ලෝකයේ ජීවත්වන මිනිසුන් වර්ග හතර මේ ආකාරයේය S.I,93.

(6a) පුද්ගලයෙකු තමන් කරන ලද යහපත් කර්මවලින් අකුසල් කර්ම ආවරණය කරන්නේ නම්, වලාකුළකින් නිදහස් කරන ලද සඳ මෙන් මේ ලෝකය ආලෝකමත් කරයි 173.

(6b) වර්ග හයක් ඇත. ඒ හය මොනවාද? අඳුරු (කණ්හා) වර්ගයට අයත් පුද්ගලයන් අඳුරු තත්ත්වයන් ඇති කරයි. අඳුරු වර්ගයට අයත් පුද්ගලයන් ආලෝකමත් (සුක්ක) තත්ත්වයන් ඇති කරයි. අඳුරු වර්ගයට අයත් පුද්ගලයන් අඳුරු හෝ ආලෝකමත් නොවන නිර්වාණය ඇති කරයි.

ආලෝකමත් වර්ගයට අයත් පුද්ගලයන් අඳුරු තත්ත්වයන් ඇති කරයි. ආලෝකමත් වර්ගයට අයත් පුද්ගලයන් ආලෝකමත් තත්ත්වයන් ඇති කරයි. අවසානයේ ආලෝකමත් වර්ගයට අයත් පුද්ගලයන් අඳුරු හෝ ආලෝකමත් නොවන නිර්වාණය ඇති කරයි.

(අ) අඳුරු වර්ගයේ කෙනෙකු අඳුරු තත්ත්වයක් ඇති කරන්නේ කෙසේද? යම් පුද්ගලයෙකු පහත් පෙළේ පවුලක - අඩු කුලයක, දඩයම් කරන, උණ බම්බු හා සමග රැකියා කටයුතු කරන, කරත්ත හදන, හෝ මල් එකතු කරන, ආහාර පාන හිඟ, හුදෙක් යැපීම දුෂ්කර වන පවුලක්, අවලක්ෂණ, විකෘතී, නිතර රෝගීවන, දුර පෙනීම දුර්වල, අංගවිකල, කොර හෝ අංශභාගී තත්ත්වයක නැවත ඉපදී ඇතැයි සිතමු.  ඔහුට ජීවිතයේ ප්‍රසන්න දේවල් පහසුවෙන් ලැබෙන්නේ නැත. ඔහුට හොඳ ආහාර පාන, ඇඳුම්, වාහන, මල්මාලා, සුවඳවිළවුන්, සුමුදු ආලේප, ඇඳඇතිරිලි, නිවෙස්, සහ ආලෝකරණ ලැබිය නොහැක. ඔහු කයෙන්, වචනයෙන් සහ මනසින් වැරදි සිදු කරයි. මේ නිසා මරණයේදී කය බිඳී යන විට, ඔහු උත්පත්තිය ලබන්නේ අවාසනාවන්ත තත්ත්වයකය. අයහපත් ගමනාන්තකය. පහත් ලෝකයකය. සමහර විට අපායේ පවා ඉපදිය හැකිය. මෙය අඳුරු වර්ගයක, අඳුරු තත්ත්වයක් ඇති කර ගන්නා පුද්ගලයෙකු පිළිබඳ උදාහරණයකි.

(ආ) අඳුරු වර්ගයේ පුද්ගලයෙකු ආලෝකමත් තත්ත්වයක් ඇති කරන්නේ කෙසේද? මෙහිදී පුද්ගලයෙකු මීට පෙර සඳහන් කළ සියලුම දුබලතා සහ දුෂ්කරතා සමගින් පහත් පෙළේ පවුලක නැවත උපත ලබා ඇත. නමුත්, ඔහු යහපත් දේ කයෙන්, වචනයෙන් සහ මනසින් සිදු කරයි. එසේ කිරීමෙන් පසු ඔහු මරණයෙන් පසු කය බිඳීයාමෙන් පසු යහපත් ගමනාන්තයක, දිව්‍යලෝකයේ පවා නැවත උපත ලැබිය හැකිය. මෙය අඳුරු වර්ගයේ පුද්ගලයෙකු ආලෝකමත් තත්ත්වයක් ඇති කර ගැනීම පිළිබඳ උදාහරණයකි.

(ඇ) ඊළඟට, අඳුරු වර්ගයේ පුද්ගලයෙකු අඳුරු හෝ ආලෝකමත් නොවන නිර්වාණය නිපදවන්නේ කෙසේද? මෙහිදී යම් කෙනෙකු පහත් පවුලක ඉපිද ... නමුත්, ඔහුගේ හිස සහ රැවුල මුඩු කර, කසාවත් සිවුරු පොරවා, ගෘහස්ථ ජීවිතයෙන් නිකම නිවෙසක් නැති තත්ත්වයට පත් වෙයි. එසේ කර, ඔහු මනසේ කෙළෙස්, ප්‍රඥාව දුර්වල කරන  බාධා පහ අත් හරී. සිහි කල්පනාව ඇති කරන අත්තිවාරම් හතර තුළ ඔහුගේ මනස මනාව තහවුරු කර ගනිමින්, ඔහු රහත්ඵලයට නිවැරදිව මනස වර්ධනය කරන සප්ත බොජ්ඣංගධර්ම දියුණු කරගනිමින් නිර්වාණයට පත්වෙයි. එම තත්ත්වය අඳුරු හෝ ආලෝකමත් නොවේ.

(ඈ) ආලෝකමත් වර්ගයේ පුද්ගලයෙකු අඳුරු තත්ත්වයකට පත්වන්නේ කෙසේද? මෙහිදී යම් පුද්ගලයෙකු ඉහළ පෙළේ පවුලක, ධනවත්, උතුම්,

බ්‍රාහ්මණ හෝ ගෘහස්ථ, මහා ධනසම්භාරයක් සහ දේපළ, රත්රන්, රිදී, වස්තූන් සහ වෙනත් බඩුභාණ්ඩ සහිත පොහොසත් පවුලක, ඊට අමතරව කඩවසම්, පියකරු, අතිශයින් සුන්දර සමේ පැහැපත් බවක් ඇතිව, උපත ලබයි. ජීවිතයේ හොඳ දේවල් ඔහුට පහසුවෙන් ලැබෙයි. නමුත්, ඔහු කයෙන්, වචනයෙන් සහ මනසින් අයහපත් දේ කරයි. එසේ කිරීමෙන් අනතුරුව, මරණයෙන් පසු කය බිඳී යන විට, ඔහු නැවත ඉපදෙන්නේ අවාසනාවන්ත තත්ත්වයකය. අයහපත් ගමනාන්තකය. පහත් ලෝකයකය. සමහර විට අපායේ පවා උපත ලැබිය හැකිය.

(ඉ) ආලෝකමත් වර්ගයට අයත් පුද්ගලයෙකු අලෝකමත් තත්ත්වයක් ඇති කර ගන්නේ කෙසේද? මෙහිදී යම් පුද්ගලයෙකු කලින් සඳහන් කළ සියලු වාසි සහ පහසුකම් සහිත උසස් පවුලක නැවත උපත ලබා ඇතැයි සිතමු. ඔහු කයෙන්, වචනයෙන් සහ මනසින් යහපත් හැසිරීමේ යෙදෙයි. එසේ කරමින් සිට, මරණයේදී කයෙන් බිඳී යාමෙන් පසු යහපත් ගමනාන්තයක උපත ලබයි. සමහර විට දිව්‍ය ලෝකයේ පවා උපත ලැබිය හැකිය.

(ඊ) අවසාන වශයෙන්, නොකැලැල් වර්ගයට අයත් පුද්ගලයෙකු අඳුරු හෝ ආලෝකමත් නොවන, නිර්වාණය නිපදවන්නේ කෙසේද? මෙහිදී යම් පුද්ගලයෙකු ඉහත සඳහන් කළ සියලු වාසි සහ පහසුකම් සහිත උසස් පවුලක උපත ලබා ඇත. ඊට පසු ඔහු භික්ෂුවක් බවට පත් වී බාධා පහ අත්හරී. සිහිකල්පනාව දියුණු කිරීමට අවශ්‍ය හතර ආකාර අත්තිවාරම කෙරෙහි ඔහු මනස මනාව යොදමින්, රහත්ඵලය අත්කර ගැනීමට අවශ්‍ය සප්ත බොජ්ඣංගධර්ම නිවැරදිව දියුණු කරයි. අඳුරු හෝ ආලෝකමත් නොවන නිර්වාණය ඔහු නිපදවා ගනියි. මෙය අඳුරු වර්ගයේ පුද්ගලයෙකු අඳුරු හෝ ආලෝකමත් නොවන නිර්වාණය නිපදවා ගන්නා ආකාරය පිළිබඳ උදාහරණයකි A.III,384-87.

(7) කර්මයේ ප්‍රතිඵල මොනවාද? කර්මයේ ප්‍රතිඵල තුන්ගුණයක් බව මම කියමි. එනම්, මෙම ජීවිතයේ අත්විඳීමට, ඊළඟ භවයේ අත්විඳීමට, සහ පසුව යම් අවස්ථාවකදී අත්විඳීමට වශයෙනි. මෙය කර්මයේ ප්‍රතිඵල වශයෙන් හැඳින්වේ A.III, 415.

(8) මෙම හතර වර්ගයේ පුද්ගලයෝ මේ ලෝකයේ සිටිති. මේ හතර කුමක්ද? දොස් ලැබිය යුතු, ප්‍රධාන වශයෙන් දොස් ලැබිය යුතු, සුළු වශයෙන් දොස් ලැබිය යුතු සහ නිර්දෝෂී යනාදී වශයෙනි.

(අ) කෙනෙකු දොස් ලැබි යුත්තෙකු වන්නේ කෙසේද? මෙහිදී, ඔහු කයෙන්, වචනයෙන් සහ මානසික ක්‍රියා කරමින් දොස් ලැබිය යුත්තෙකු බවට පත් වේ.

(ආ) කෙනෙකු වැඩි වශයෙන් දොස් ලැබිය යුත්තෙකු බවට පත්වන්නේ කෙසේද? මෙහිදී පුද්ගලයෙකු කයෙන්, වචනයෙන් සහ මානසික ක්‍රියා තුළින් වැඩි වශයෙන් දොස් ලැබිය යුත්තෙකු බවට පත් වේ.

(ඉ) පුද්ගලයෙකු සුළු වශයෙන් දොස් ලැබිය යුත්තෙකු වන්නේ කෙසේද? මෙහිදී ඔහු කයෙන්, වචනයෙන් සහ මනසින් ක්‍රියා කරමින් සුළු වශයෙන් දොස් ලැබිය යුත්තෙකු බවට පත් වේ.

(ඊ) කෙනෙකු නිර්දෝෂී පුද්ගලයෙකු බවට පත්වන්නේ කෙසේද? මෙහිදී එම පුද්ගලයා කයෙන්, වචනයෙන් සහ මනසින් නිර්දෝෂී ලෙස ක්‍රියා කරයි. ලෝකයේ සිටින හතර ආකාරයේ මිනිසුන් මොවුන්ය A.II,136.

(9) මා විසින් දියුණු කරගත් ඍජු දැනුමෙන් අවබෝධ කර ගැනීමෙන් අනතුරුව වදාළ හතර ආකාරයේ කර්මය මෙයයි. ඒ හතර මොනවාද? අඳුරු ප්‍රතිඵල සමග අඳුරු කර්ම තිබේ. ආලෝකමත් ප්‍රතිඵල සමග ආලෝකමත් කර්ම තිබේ. අඳුරු සහ ආලෝකමත් දෙකම සහිත ප්‍රතිඵල සමග අඳුරු සහ ආලෝකමත් යන කර්ම තිබේ. අඳුරු හෝ ආලෝකමත් නොවන ප්‍රතිඵල සමග අඳුරු සහ ආලෝකමත් නොවන කර්ම ඇත. එසේම කර්ම විනාශ කිරීමට මෙහෙයවන කර්ම ද තිබේ. මා විසින් දියුණු කරගත් ඍජු දැනුමෙන් අවබෝධ කිරීමෙන් අනතුරුව වදාළ හතර ආකාරයේ කර්ම මේවාය A.II,2130.

(10) තුන්වැදෑරුම් නුවණ අවබෝධ කර ගත් පුද්ගලයෙකු සිටින්නේ සැනසිල්ලේය. ඔහු නැවත පැවැත්මක් ඇතිවීම විනාශ කර ඇත. අවබෝධයක් ඇති අය, එවැනි පුද්ගලයෙකු බ්‍රහ්ම හෝ ශක්‍රදෙවිඳුන්ට සමාන කළ හැකි බව දනිති [4] Sn.656.

(11) සිත නාභිගත කළ, පිරිසුදු කළ, වරදින් පිරිසිදු වූ සහ වරදින් බැහැරවූ, නම්‍යශීලී සහ අකුසල්වලින් නිදහස් වූ, අනුහුරු කළ හැකි, ස්ථිර, අචල සහ නොකැළෙඹෙන මනසින් යුක්ත පුද්ගලයා පෙර භවයේ මනසේ පැවැත්ම කෙරෙහි මනස යොමු කරයි, නැඹුරු කරයි. ඔහුට පෙර ජීවිත, සිහිපත් වේ: එකක්, දෙකක්, සියයක්, දහසක්, ලක්ෂයක් ... ඔහු සිහිපත් කරයි: ''මේ මගේ නමයි, ඒ මගේ ගෝත්‍රයයි, මගේ කුලය මෙයයි, මගේ ආහාර වූයේ ඒවායි. මම එම ප්‍රසන්න සහ වේදනාකාරී තත්ත්වයන් අත්වින්දෙමි. මම එපමණ කාලයක් ජීවත් වූයෙමි. එතැනින් මිය ගොස්, මම තවත් තැනක උපන්නෙමි. එහිදී මගේ නම මෙයයි, මගේ ගෝත්‍රය එයයි, යනාදී වශයෙන්.'' මේ ආකාරයෙන් කෙනෙකුට විවිධ අතීත උත්පත්තීන්, ඒවායේ තත්ත්වයන් සහ විස්තර මතක් වේ. එය හුදෙක් මිනිසෙකු ඔහුගේ ගමේ සිට තවත් ගමකට, එතැනින් තවත් එකකට, ඊට පසු ඔහුගේ ගමට නැවත පැමිණීම වැනි දෙයකි. ඔහුට මෙසේ සිහිපත් විය හැකිය: ''මම මගේ ගමේ සිට, වෙනත් ස්ථානයකට පැමිනියෙමි.

එහිදී මම මෙය කළෙමි, අරක කළෙමි, තවත් දෙයක් කළෙමි. එතැන සිට ඔහු තවත් තැනකට ගියේය. එතැන සිට තවත් ස්ථානයකටත්, ඊට පසු මගේ ගමට ඒම වැනිය.'' මෙය භාවනාමය ජීවිතයේ ඵලයකි.

(12) ඊට පසු මනස අවධානයෙන් සහ පිරිසිදුව... ස්ථිරව සහ නොකැළඹෙමින්, පුද්ගලයෙකු සත්ත්වයන්ගේ මරණය සහ නැවත ඉපදීම පිළිබඳ දැනුමට මනස යොමු කරයි, නැඹුරු කරයි. දිව්‍යමය ඇසින්, පිරිසිදුව සහ සාමාන්‍ය මිනිසුන් අභිබවා යනවිට, එම පුද්ගලයාට මිනිසුන් මරණයට පත්වීම සහ නැවත ඉපදීම දැක ගත හැකියඃ ඔවුනොවුන්ගේ කර්මයට අනුකූලව, පහත් සහ උසස්, ප්‍රයෝජන ලබන සහ නොලබන, ප්‍රීතිමත් සහ අවාසනාවන්ත ගමනාන්තවලට පත්වන ආකාරය දැක ගත හැකිය. ඔහු දනීඃ ''කය, වචනය සහ මනස මුල්කර ගත් අයහපත් හැසිරීම නිසා, හෝ උතුම් පුද්ගලයන් හෙළා දැකීම හෝ මිත්‍යාදෘෂ්ටික අදහස් හේතු කර ගෙන, මෙම සත්ත්වයෝ කර්මයේ දුර්විපාකවලින් දුක් විඳිති. මරණයෙන් පසු කයෙන් බිඳී, ඔවුහු පහත් ලෝකවල, අයහපත් ගමනාන්තවල, දුක් විඳින තත්ත්වයන්වල, ඇතැම් විට අපායේ පවා නැවත උත්පත්තිය ලබති.'' එය හරියටම, මංසන්ධියකට ඉහළින් උස ගොඩනැගිල්ලක් තිබෙන්නාක් මෙන්ය. හොඳ ඇස් පෙනීමක් ඇති මිනිසෙකුට එතැන සිටගෙන සිටින විට, මිනිසුන් නිවසට ඇතුළු වෙන සහ පිටත්ව යන ආකාරය, පාරේ ඇවිදිමින් සහ මංසන්ධියේ වාඩිවී ඉන්නා ආකාරය දැක ගත හැකිය. ඔහු මෙසේ සිතනු ඇතඃ ''මේ මිනිසුන් නිවසට ඇතුළු වේ, පාරේ ගමන් කරයි, මංසන්ධියේ වාඩිවී සිටී.'' මෙය භාවනාමය ජීවිතයේ ඵලයයි D.I,82.

(13) සමහර තාපසයන් සහ බ්‍රාහ්මණයන් සදාකාලිකවාදීන් වන අතර, ඔවුන් තරයේ දරා සිටින්නේ ආත්මය සහ ලෝකය සදාකාලික බවයි. ඔවුන් මෙසේ කියන්නේ කුමන පදනමක් මතද? සමහර විට, යම් තාපසයන් හෝ බ්‍රාහ්මණයන් උත්සාහය සහ වෙහෙස, උනන්දුව, ඕනෑකම සහ නිවැරදි අවධානය තුළින් ඔවුන්ගේ බොහෝ අතීත ජීවිත..., සියලු තත්ත්වයන් සහ විස්තර සමගින් නැවත මතක් කර ගැනීමට හැකි ඒකාග්‍රතාවට එළඹිය හැකි තත්ත්වයට පත්වී ඇත. එවිට ඔහු මෙසේ පවසයිඃ 'ආත්මය සහ ලෝකය කඳු මුදුනක් මෙන්, කණුවක් මෙන් ඝන, සදාකාලික විය යුතුයි. ජීවීන් කලබලයෙන් අතන මෙතැන යයි, සංසරණය වෙයි, මිය යයි, නැවත ඉපදේ, මෙය සදාකාලිකව නොකඩවා සිදු වේ. මා මෙසේ කියන්නේ ඇයි? එයට හේතුව මා සිදු කරන භාවනාවෙන්, මම බොහෝ පෙර ජීවිත මතක් කර ගෙන ඇත්තෙමි. ආත්මය සහ ලෝකය සදාකාලික බව මා දන්නේ එසේය' D.I,13-14.

(14) මා කර්මය යනුවෙන් හඳුන්වන්නේ චේතනාවයි (චේතනා). අදහස් කිරීමෙන් අනතුරුව පුද්ගලයෙකු ක්‍රියා කරන්නේ කයෙන්, වචනයෙන් හෝ මනසින්ය A.III, 415.

(15) මනස මානසික තත්ත්වයන්ට පෙරාතුව පවතී. මනස ඒවායේ ප්‍රධානියාය. ඒ සියල්ලම මනසින් සෑදී ඇත. පුද්ගලයෙකු අයහපත් මනසකින් කතා කරයිද හෝ ක්‍රියා කරයිද, දුක් විඳීම, ගවයා පිටුපස රෝදය ගමන් කරන්නාක් මෙන් ඔහු පසුපස යයි. මනස මානසික තත්ත්වයන්ට පෙරාතුව පවතී. මනස ඒවායේ ප්‍රධානියාය. ඒ සියල්ලම මනසින් සෑදී ඇත. යම් කෙනෙකු පිරිසිදු මනසකින් කතා කරයිද, ක්‍රියා කරයිද, සතුට ඔහු පසු පස යන්නේ සෙවනැල්ල මෙන්ය Dhp.1,2.

(16) සත්ත්වයන් (ඔවුන් වැනි අය සමග) දිසාවට ආකර්ෂණය වෙමින් සම්බන්ධ වෙන බවට අපේක්ෂා කෙරේ. ප්‍රාණඝාත කරන්නන් එවැනි අයගේ දිසාවට ආකර්ෂණය වෙමින් ප්‍රාණඝාත කරන්නන් සමග සම්බන්ධ වේ. සොරකම් කරන්නන්, කාමයෙහි වරදවා හැසිරෙන්නන්, බොරු කියන්නන්, භේදකරන ආකාරයෙන් කතා කරන්නන්, රළු භාෂාවෙන් කතා කරන්නන් සහ නිෂ්ඵල දේ කතා කරන්නන්, එසේ ක්‍රියාකරන්නන්ගේ දිසාවට ආකර්ෂණය වෙමින් සම්බන්ධ වේ S.II,167.

(17 a) ''එය මා වෙත එන්නේ නැත'' යනුවෙන් කියමින් වරද පිළිබඳව සැහැල්ලුවෙන් නොසිතිය යුතුයි. වතුර කලයක් පිරෙන්නේ එක් වරකට එක බිංදුවක් බැගින්ය. එසේම මෝඩයෙකු වරදින් පිරෙනු ඇත. ''එය මා වෙත නොඑනු ඇත'' යැයි කියමින් යහපත පිළිබඳව සැහැල්ලුවෙන් නොසිතිය යුතුයි. ජල බඳුනක් පිරෙන්නේ එක වරකට බිංදුවක් බැගින්ය. එසේම ප්‍රඥාවන්තයා යහපත් දෙයින් පිරේ Dhp.121.

(17 b) කෙනෙකු නිතරම සිතන සහ සලකා බලන ඕනෑම දෙයකට මනස ඒ ආකාරයෙන් නැඹුරු වේ. යම් පුද්ගලයෙකු ආශාව, දුෂ්ට දේ හෝ කෲරත්වය පිළිබඳව සිතන්නේ නම් සලකා බලන්නේ නම්, ආශාවෙන් තොර, දුෂ්ටකමෙන් තොර, සහ කෲරත්වයෙන් තොර [5] සිතුවිලි අත්හරිනු ඇත. මනස ආශාව, දුෂ්ටකම් සහ කෲරත්වය කෙරෙහි නැඹුරු වනු ඇත. කෙනෙකු නිතරම ආශාවෙන් තොරවීම, දුෂ්ට කමින් තොරවීම, කෲරත්වයෙන් තොර සිතුවිලි සහ සලකා බැලීමේ යෙදෙන්නේ නම්, ආශාව, දුෂ්ටකම් සහ කෲර සිතුවිලි අත්හැරෙනු ඇත. මනස ආශාවෙන් තොර, දුෂ්ටකමෙන් තොර සහ කෲරබවෙන් තොර සිතුවිලි කෙරෙහි නැඹුරු වනු ඇත M.I,115-16.

(18) මේ ආකාර ධර්මයක් සහ අදහසක් සමහර තාපසයන් සහ බ්‍රාහ්මණවරුන් දරා සිටී :''යම් කෙනෙකු ප්‍රාණඝාත කිරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම හෝ බොරු කියන්නේ නම්, ඔහු මේ භවයේදීම වේදනාව සහ ශෝකය අත්විඳියි.' නමුත්, සමහර විට, අප දකින්නේ කෙනෙකු මල්මාලාවලින් සැරසී, පිදුම් ලබමින්, ස්නානය කර, කෙස් සහ රැවුල කපා මනා පෙනුමක් ලබාදෙමින්, ඔහු සම්පූර්ණයෙන්ම රාජකීයෙකු මෙන් කාන්තාවන් සමග

විනෝදවෙන ආකාරයයි. ''මෙම මිනිසා සියලු සුඛෝප‍භෝගීබව සහ සතුටුවීම්වල නියැලීමට කර ඇත්තේ කුමක් දැ''යි ඇසූ විට පිළිතුර මෙසේ ලබා දී ඇතː 'මෙම මිනිසා රජතුමාගේ සතුරාට පහරදී ඔහු මරා දමා ඇත. රජු ඒ පිළිබඳව සතුටු වී ඔහුට ඒ සඳහා ප්‍රදානයක් කරන ලදී. ඔහු මේ සියලු සුඛෝපභෝගී ජීවිතය සහ සතුටුවීම් ලබන්නේ ඒ හේතුවෙනි.' ඊට පසු සමහර විට අප දකින්නේ පුද්ගලයෙකුගේ දෑත් තදින් පිටුපසට කඹයකින් බැඳ, හිස මුඩු කර, වීදියෙන් වීදියට, අඩියෙන් අඩියට, බෙරයක අශුභ හඬ අනුව, පෙරට්ටුවේ ගෙනයාමයි. ඊට පසු නගරයේ දකුණු දොරටුවෙන් පිටතට ගෙන හිස ගසා දමනු ලැබේ. 'මේ මිනිසා කළ වරද කුමක්ද?' කියා ඇසූ විට, පිළිතුර වන්නේː 'මේ මිනිසා රජුගේ සතුරෙකි. ඔහු මිනිසෙකු හෝ ගැහැණියක මරා දමා ඇත. ඒ නිසා රජු ඔහු සිරගත කර, ඔහුට එවැනි දඬුවමක් දුන්නේය.' රජතුමනි, ඔබ කවදා හෝ එවැනි දේවල් දැක තිබේද, අසා තිබේද?'' ''මම අසා ඇත්තෙමි ස්වාමීන් වහන්ස, සමහර විට නැවතත් එසේ අසන්නට ඉඩ ඇත.''

''එම නිසා, රජතුමනි, මෙහි සහ දැන් ප්‍රාණඝාත කරන කුමන හෝ පුද්ගලයෙකු වේදනාව සහ ශෝකය අත්විඳින බව පවසන එම තාපසයන් සහ බ්‍රාහ්මණයන් පවසන්නේ නිවැරදි දේද නැත්නම් වැරදි දේද?''

''වැරදි දේ ස්වාමීනී.''

''එසේම හිස් මුසාවන් දොඩවන අය ගුණවත්ද නැත්නම් දුරාචාරවත්ද?''

''දුරාචාරවත්.''

''දුරාචාරවත් අය සහ අයහපත් චරිත හුරුපුරුදු වන්නේ වැරදි ලෙසද නැතිනම් යහපත් ලෙසද?''

''ඔවුන් පුහුණු කරන්නේ අයහපතයි.''

''වැරදි දේ පුහුණු කරන ඔවුන් දරන්නේ වැරදි අදහස්ද නැත්නම් හරි අදහස්ද?''

''වැරදි අදහස්.''

''වැරදි අදහස් දරන අය කෙරෙහි විශ්වාසය තැබීම බුද්ධිමත් ක්‍රියාවක්ද?''

''නැත ස්වාමීනී, එසේ නොවිය යුතුයි'' S.IV,343.

(19) තාපසයෙකු හෝ බ්‍රාහ්මණයෙකු මෙසේ පවසන විටඃ (අ) ''සැබැවින්ම, දුෂ්ට ක්‍රියා සහ වැරදි හැසිරීම්වලට ප්‍රතිවිපාක ඇත,'' මම ඔහු සමග එකඟ වෙමි. ''ප්‍රාණඝාත කළ අයෙකු, සොරකම් කළ අයෙකු, කාමයෙහි වරදවා හැසිරුණු පුද්ගලයෙකු, අයහපත් වචන භාවිත කළ, ලෝභී, අයහපත් සහ මුළාවූ අදහස්වලින් යුක්ත පුද්ගලයෙකු මම දුටුවෙමි.'' මරණයෙන් පසු කය වෙන්වන විට, ඔහු අගහිඟකම් ඇති ස්ථානයක, රළු ස්ථානයක, එක් අඳුරු ගමනාන්තයක, අපායේ පවා නැවත උපදින බව මම දුටුවෙමි'' යැයි ඔහු පවසන විටද මම ඔහු සමග එකඟ වෙමි. නමුත්, ''දුෂ්ටකම් සිදු කරන සෑම දෙනාටම අයහපත් නැවත උත්පත්තියක් ලැබේ යැයි'' ඔහු පවසන විට, මම එයට එකඟ නොවෙමි.

(ආ) තාපසයන් හෝ බ්‍රාහ්මණයන් මෙසේ පවසන විටඃ ''සැබැවින්ම, දුෂ්ට සහ වැරදි හැසිරීම් හේතු කරගෙන ප්‍රතිඵල ඇතිවන්නේ නැත,'' ඒ සමග එකඟ නොවෙමි. ඔවුන් මෙසේ කිව්වොත්, ''මෙහිදී ප්‍රාණඝාත කළ සහ වෙනත් දුෂ්ටකම් සිදු කළ අයෙකු මිය ගිය විට නැවත උපත ලැබුවේ සතුටෙන් සිටිය හැකි ස්ථානයකයි, දිව්‍යලෝකයේ පවාය.'' කියා ඔහු කිවහොත්, මම ඔහු සමග එකඟ වෙමි. නමුත්, ඔහු මෙසේ කිවහොත්ඃ ''එවැනි දුෂ්ටකම් සිදු කරන සෑමදෙනාටම යහපත් නැවත උත්පත්තියක් ලැබේය.'' මම ඔහු සමග එකඟ නොවෙමි.

(ඇ) යම් තාපසයෙකු හෝ බ්‍රාහ්මණයෙකු මෙසේ කිව්වොත්ඃ ''සැබැවින්ම, යහපත් ක්‍රියාවන් සහ යහපත් හැසිරීම්වලට ප්‍රතිඵලයක් ඇත,'' මම ඔහු සමග එකඟ වෙමි. ඔහු මෙසේ කී විටඃ ''මම ඔහු ප්‍රාණඝාතයෙන් සහ වෙනත් දුෂ්ටකම්වලින් වැළකෙණු දැක ඇත්තෙමි. ඔහු මිය ගිය විට උත්පත්තිය ලැබුවේ යහපත් තත්ත්වයකය,'' මම ඔහු සමග එකඟ වෙමි. නමුත් ඔහු මෙසේ පැවසූ විටඃ ''යහපත් දේ කරන සෑම දෙනාම යහපත් නැවත ඉපදීම්වලට පත්වෙති.'' මම ඔහු සමග එකඟ නොවෙමි.

(ඈ) යම් තාපසයෙකු හෝ බ්‍රාහ්මණයෙකු මෙසේ පවසන විටඃ ''සැබැවින්ම දුෂ්ට ක්‍රියා, වැරදි හැසිරීම්වලට ඵලයක් නැත,'' මම ඔහු සමග එකඟ නොවෙමි. ඔහු මෙසේ පැවසූ විටඃ ''ප්‍රාණඝාතයෙන් සහ වෙනත් අකුසල් ක්‍රියාවලින් වැළකුණු පුද්ගලයෙකු මිය ගිය විට ඔහු අයහපත් තත්ත්වයක උපත ලබනු මම දැක්කෙමි.'' මම ඔහු සමග එකඟ වෙමි. නමුත්, ඔහු මෙසේ පැවසූ විටඃ ''අයහපතින් වැළකෙන සියලු දෙනා අයහපත් ස්ථානවල උපත ලබති'' මම ඔහු සමග එකඟ නොවෙමි.

(ඉ) මෙයට හේතුව කුමක්ද? ප්‍රාණඝාත කිරීම සහ වෙනත් අයහපත් දේ කරන්නා සම්බන්ධයෙන් මරණයෙන් පසු ඔහුට අයහපත් උත්පත්තියක් ඇතිවෙන්නේ කෙසේද? බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්හඃ ''මීට පෙර,

හෝ පසුව ඔහු අයහපත් යැයි හැඟෙන ක්‍රියාවක් සිදුකරන්නට ඇත, නැත්නම්, ඔහු මිය යෑමට පෙර, මෝහයෙන් සිටින්න ඇත. එනිසා ඔහුට මරණයෙන් පසු අයහපත් උත්පත්තියක් ලැබේ. ඝාතනයක් සිදු කළ නිසා සහ වෙනත් අයහපත් දේ කළ නිසා, ඔහුට ඒවායේ ප්‍රතිවිපාක මෙතැන, හෝ ඊළඟ භවයේදී හෝ ඊට පසු භවයකදී අත්විඳින්නට සිදුවනු ඇත.

(ඊ) ප්‍රාණඝාත කරන සහ වෙනත් අකුසල් කරන පුද්ගලයා මිය ගිය විට යහපත් නැවත ඉපදීමක් ලැබීම සම්බන්ධයෙන්ඃ බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හඃ ''පෙරදී ප්‍රසන්න ලෙස දැනෙන යහපත් ක්‍රියා ඔහු කරන්නට ඇත, නැතහොත් පසුව ප්‍රසන්න යැයි හැඟෙන ක්‍රියා ඔහු කරන්නට ඇත, හෝ මිය යන්නට පෙර ඔහුට සම්මාදිට්ඨිය තිබෙන්නට ඇත. නමුත්, ප්‍රාණඝාත සහ වෙනත් අකුසල් සිදු කළ නිසා, ඔහුට මෙතැනදී, ඊළඟ භවයේදී හෝ ඊට පසු යම් භවයකදී ඒවායේ ප්‍රතිඵල අත්විඳින්නට සිදු වනු ඇත. ඒවා ඔහුගේ කර්ම විපාක වනු ඇත.''

(උ) ප්‍රාණඝාතයෙන් සහ වෙනත් අකුසල් ක්‍රියාවලින් වැළකී මරණයෙන් පසු යහපත් නැවත ඉපදීමක් ලබන පුද්ගලයෙකු සම්බන්ධයෙන්ඃ ප්‍රසන්න යැයි ඔහුට හැඟුණු යහපත් කර්ම ඔහු පෙරදී කරන්නට ඇත, හෝ පසුව ප්‍රසන්න යැයි හැඟුණු ක්‍රියා කරන්නට ඇත, හෝ මිය යන්නට පෙර අදහස් පැහැදිලි කර ගන්නට ඇත. ඒ නිසා ඔහු මිය යන විට ඔහුට යහපත් නැවත ඉපදීමක් ලැබෙනු ඇත. ඔහු ප්‍රාණ ඝාතයෙන් සහ වෙනත් අකුසල් කර්මවලින් වැළකුණු නිසා, ඒවායේ ප්‍රතිඵල ඔහු මේ භවයේදී, හෝ ඊළඟ භවයේදී, හෝ ඊට පසු භවයකදී අත්විඳිනු ඇත.

(ඌ) ප්‍රාණඝාතය සහ වෙනත් අකුසල් සිදු වන ක්‍රියාවලින් වැළකී, මරණින් පසු අයහපත් නැවත ඉපදීමක් ලැබූ පුද්ගලයෙකු සම්බන්ධයෙන්ඃ අප්‍රසන්න යැයි හැඟෙන අයහපත් ක්‍රියාවක් ඔහු පෙරදී සිදු කළේ නම්, හෝ පසුව අප්‍රසන්න යැයි හැඟෙන ක්‍රියාවක් පසුව කළේ නම් හෝ මරණ මොහොතේ ඔහු අදහස්වලින් මුළාවී සිටියේ නම්, ඒ නිසා ඔහු මිය ගිය විට ඔහුට අයහපත් නැවත ඉපදීමක් ලැබෙනු ඇත. නමුත්, ඔහු ප්‍රාණඝාතයෙන් සහ වෙනත් අකුසල් සිදු වන ක්‍රියාවලින් වැළකුණු නිසා, ඔහු මේ භවයේ, හෝ ඊළඟ භවයේ හෝ ඊට පසු භවයකදී ඒවායේ ප්‍රතිඵල අත්විඳිනු ඇත.

(1) එබැවින්, හොඳ ප්‍රතිඵල ලබා ගැනීමට අපොහොසත් වන සහ අපොහොසත් ලෙස පෙනෙන කර්ම ඇත. හොඳ ප්‍රතිඵල ලබා ගැනීමට අපොහොසත් නමුත් හැකියාවක් තිබෙන බවට පෙනෙන කර්ම ඇත. යහපත් ප්‍රතිඵල ලබා ගැනීමට හැකියාවක් ඇති, සහ එසේ හැකියාවක් තිබෙන බවට පෙන්නුම් කරන කර්ම ද ඇත. එසේම යහපත් ප්‍රතිඵල ලබා ගැනීමට හැකියාවක් ඇති, නමුත් හැකියාවක් නැති බවට පෙන්නුම් කරන කර්ම ද ඇත.

එම නිසා අප කර්මය යහපත් හෝ අයහපත් බව පෙනෙන අයුරෙන්ම ඒවා විශ්ලේෂණය නොකළ යුතු බව බුදුපියාණන් වහන්සේ වදාළහ M.III,214.

(20 a) මහාලි නම් ලිච්ඡවී පුද්ගලයා බුදුපියාණන් වහන්සේගෙන් මෙසේ ඇසුවේයඃ ''බුදුපියාණන් වහන්ස, අයහපත් කර්ම සිදු කිරීමට හේතුව සහ කාරණය කුමක්ද?''

''මහාලි, ලෝභය, ද්වේෂය සහ මෝහය, නොසැලකිලිමත් අවධානය සහ වැරදි ලෙස යොමු කළ මනස, අයහපත් කර්ම සිදු කිරීමට හේතුව සහ කාරණයයි.''

''එසේ නම්, යහපත් කර්ම සිදු කිරීමට හේතුව සහ කාරණය කුමක්ද?''

''අලෝභය, අදෝෂය සහ අමෝහය, සැලකිලිමත් අවධානය (යොනිසොමනසිකාර) සහ නිවැරදි ලෙස යොමු කළ මනස (සම්මාපණිහිත-චිත්ත) ප්‍රසන්න කර්ම සිදු කිරීමට අවශ්‍ය හේතු සහ කාරණා වේ.''

මෙම ගුණාංග දහය ලෝකයේ නොතිබුණේ නම්, අධර්මිෂ්ඨ හැසිරීම්, ධර්මයට පටහැනි හැසිරීම්, සහ ධර්මිෂ්ඨ හැසිරීම්, සමගිබව පෙරදැරිවූ හැසිරීම් හෝ ධර්මයට අනුකූලවීම් නොපෙනෙනු ඇත. නමුත්, මෙම ගුණාංග දහය ලෝකයේ පවතින නිසා, අධර්මිෂ්ඨ හැසිරීම්, ධර්මයට පටහැනි හැසිරීම්, සහ ධර්මිෂ්ඨ හැසිරීම්, ධර්මයට අනුකූලව හෝ එකඟවූ හැසිරීම් දැකිය හැකිය'' A.V,87.

(20 b) බුදුපියාණන් වහන්සේ චුන්දගෙන් මෙසේ ඇසූහඃ ''ඔබ කැමැති කාගේ පවිත්‍ර කිරීමේ චාරිත්‍රවලට ද?''

''බුදුපියාණන් වහන්ස, බටහිර බ්‍රාහ්මණයන් විසින් උගන්වන ලද ජල බඳුන් රැගෙන යන, ලිලී මල්මාලා පළඳින, පූජනීය ගින්දරට වන්දනා කරන, සහ ජලයේ කිමිදෙමින් පිරිසිදු කිරීමේ චාරිත්‍රවලට මම කැමැත්තෙමි.''

''චුන්ද, එම බ්‍රාහ්මණයන් ඔවුන්ගේ පිරිසිදු කිරීමේ චාරිත්‍ර උගන්වන්නේ කෙසේද?''

'' ඔවුන් කියන්නේඃ ''යහපත් මිනිසා, මෙය කරන්න. අළුයම අවදිවී, ඇඳ මත ඉඳිමින්ම, පොළොව ස්පර්ශ කරන්න. ඔබට එය කළ නොහැකි නම්, නැවුම් ගොම ස්පර්ශ කරන්න. ඔබට එයද කළ නොහැකි නම්, කොළ වර්ණ තණකොළ ස්පර්ශ කරන්න. එයද ඔබට කළ නොහැකි නම්, ගින්දරට හෝ සූර්යයාට හෝ වන්දනා කරන්න, නැත්නම්, සවස් වරුව ඇතුළුව, ජලයේ

තුන්වරක් කිමිදෙන්න.'' ඔවුන් උගන්වන පිරිසිදු කිරීමේ චාරිත්‍ර මේවායි, ඒ මා වඩා කැමැති ඒවායි.''

''හොඳයි, තථාගතයන් වහන්සේගේ පිරිසිදු කිරීමේ චාරිත්‍ර බටහිර බ්‍රාහ්මණයන් උගන්වා ඇති ක්‍රමයට වඩා සම්පූර්ණයෙන්ම වෙනස්ය.''

''තථාගතයන් වහන්සේට අනුව, පුද්ගලයෙකු පිරිසිදු වන්නේ කෙසේද?''

''චුන්ද, කයෙන් අපිරිසිදු වන්නේ තුන් ආකාරයකටයි, වචනයෙන් හතර ආකාරයකටයි, මනසින් ද තුන් ආකාරයකටයි.

(අ) කයෙන් අපිරිසිදුවන තුන් ආකාරය කුමක්ද? මේ සම්බන්ධයෙන්, ඔහු යම් කෙනෙකු ප්‍රාණඝාත කරයි, කෲර, ලේ තැවරුණු, දැඩි ප්‍රහාර සහ ප්‍රචණ්ඩතාව, සත්ත්වයන්ට අනුකම්පා විරහිතවීම යනාදියයි. ඔහු ගම්වල හෝ වනාන්තරවල ජීවත්වන අනෙක් අයගේ වස්තූන් සොරකම් කරයි. ඔහු කාමයෙහි වරදවා හැසිරෙයි, දෙමාපියන්, සහෝදර සහෝදරියන් හෝ ඥාතීන්, ධර්මය විසින් ආරක්ෂා කරන, දැනටමත් විවාහ ගිවිසගෙන සිටින, විවාහක කාන්තාවන් සමග, නීති උල්ලංඝනය කිරීම පිළිබඳ දඬුවම් නියමවූ කාන්තාවන් සමග හෝ දැනටමත් වෙනත් කෙනෙකුට පොරොන්දුවූ අය සමග කාමයේ හැසිරෙයි. මේ ආකාරයෙන් ශරීරයේ අපිරිසිදුකම තුන් ගුණයකි.

(ආ) වචනයෙන් සිදු වන හතර ආකාර අපිරිසිදුවීම මොනවාද? මේ සම්බන්ධයෙන්, යම් කෙනෙකු බොරු කියයි. සභාවකට හෝ රැස්වීමකට, පවුලේ හමුවීමකට, සමාජයකට හෝ අධිකරණයට හෝ ඔහු සාක්ෂිකරුවෙකු ලෙස කැඳවූයේ නම්, සහ මෙසේ ඇසුවේ නම්ඃ 'ඔබ දන්නා දේ කියන්න,' එවිට, නොදැන, ඔහු දන්නා බව හෝ දනිමින්, ඔහු නොදන්නා බව ඔහු පවසයි. නොදකිමින්, ඔහු දුටු බව කියයි, දකිමින්, නොදැක්ක බව ඔහු කියයි. ඔහු සිතාමතාම, ඔහුගේ හෝ වෙනත් කෙනෙකුගේ වාසිය සඳහා හෝ යම් සුළු ලාභයක් සඳහා බොරු කියයි. ඔහු භේද ඇතිවන ආකාරයෙන් කතා කරයි. යම් දෙයක් මෙතැන ඇසුණු විට, ඔහු එය වෙනත් තැනක නැවත කියයි. නැතහොත් එතැනදී යම් දෙයක් ඇසුණු විට එය මෙතැන නැවත කියයි. එසේ කරන්නේ මිනිසුන් අතර භේද භින්න ඇති කිරීමටය. ඔහු එක්සත්ව සිටින අය අතර බෙදීම ඇති කරයි. ඔහු භේද භින්න නිර්මාණය කරන්නෙකි. ඔහු භේද ඇති කිරීමට කැමැත්තක් ඇත්තෙකි. ඔහු රළු, දැඩි සහ සිත් රිදවන, අමනාප ඇති කරන, කෝපයට සමීප වන, සිත් එක්තැන් කරවීමට ප්‍රයෝජනවත් නොවන වචන ප්‍රකාශ කරමින්. කුරිරු ලෙස කතා කරයි. ඔහු හිස් කතාවේ යෙදෙයි. කතා කරන්නේ නුසුදුසු වේලාවේය, වැරදි දේ, ඵලයක් නැති කරුණු පිළිබඳව ධර්මය සහ ධර්ම පුහුණුවට පටහැනි දේ

පිළිබඳව කතා කරයි. මේ ආකාරයට වචනයෙන් අපිරිසිදු බව හතර ආකාරයෙන් සිදුවේ.

(ඇ) තුන්ආකාර අපිරිසිදුවීම් මනසින් සිදුවන්නේ කෙසේද? මෙතැන, යම් කෙනෙකු අනුන්ගේ වස්තුව සහ දේපළ කෙරෙහි සම්පූර්ණයෙන්ම දැඩි ආශාවකින්, සැම විටම මෙසේ සිතන්නේ නම්: ''ඔවුන්ට අයිති දේ මට අයිති වන්නේ නම්.' ඔහුගේ මනස සම්පූර්ණයෙන්ම නොමනාපයෙන් සහ ද්වේෂයෙන් පිරී ඇති අතර, සැමවිටම සිතන්නේ: 'මෙම සත්ත්වයන් මරණයට පත් වේවා, ඝාතනය වේවා, කපා කොටා දමත්වා, විනාශ වේවා, සහමුලින්ම වැනසී යත්වා' ඔහු වැරදි අදහස් දරයි, මෙවැනි වැරදි දෘෂ්ටිකෝණයක් තිබේ: 'දන්දීමෙන් ප්‍රයෝජනයක් නැත, පූජා කිරීම්ද එසේමයි, යහපත් සහ අයහපත් ක්‍රියාවල ප්‍රතිඵල නැත, මෙම ලෝකය පවතින්නේ නැත, මරණයෙන් ඔබ්බටද ලෝකයක් නැත. මවෙක් නැත, පියෙක් නැත, ඕපපාතිකව උපදින සත්ත්වයන් නැත, මුළු ලෝකයේම නිසියාකාර හෝ නිසියාකාරව ධර්මය පුරුදු පුහුණු කරන හෝ මේ ලෝකය සහ මේ ලෝකයෙන් ඔබ්බට ඔවුන්ගේම ඍජු දැනුමෙන් අවබෝධ කර ගත්, සහ අනෙක් අයට එම ධර්මය අවබෝධ කරවන අව්‍යාජ තවුසන් හෝ බ්‍රාහ්මණයන් නැත.' මනස අපිරිසිදු වන තුන් ආකාරය මෙසේය.

ඍණාත්මක කර්ම පිළිබඳ පරිපාටි දහය මෙයයි. යම් කෙනෙකු අළුයම අවදිව, ඇඳේ සිටම පොළොව ස්පර්ශ කරන්නේ නම්, හෝ පිරිසිදුවීමේ අනෙක් චාරිත්‍ර කිසිවක් සිදු කළත්, මෙම ඍණාත්මක කර්ම දහයේ යෙදී සිටින්නේ නම්, ඔහු කෙසේ නමුත්, අපිරිසිදු වේ. ඒ ඇයි? එයට හේතුව, මෙම ඍණාත්මක කර්ම දහයම අපිරිසිදු සහ කෙළෙස් සහිත වීමයි. මෙසේ සදාචාරාත්මක බවට හානි කරන මෙම කර්ම පිළිබඳ පරිපාටි දහයේ නිරතවන මිනිස්සු අපාය, සත්ත්ව ලෝක, පීඩාවට පත්වූ ආත්මවල පවත්නා ප්‍රදේශ සහ වෙනත් අයහපත් ගමනාන්ත දකින නිසාය A.V,263.

(21) එක්රැස් කිරීම් තුනක් ඇත, ස්ථාවර ප්‍රතිඵල සමග වැරදි, ස්ථාවර ප්‍රතිඵල සමග හොඳ, සහ නිශ්චිත නැති දේවල් යනාදී වශයෙනි D.III,217.

(22) බ්‍රාහ්මණ ශිෂ්‍ය 'සුභ' බුදුපියාණන් වහන්සේට මෙසේ පැවසුවේය: ''ගෞතමයාණන් වහන්ස, සමහර මිනිසුන් පහත්වීමට සහ අනෙක් අය උසස්වීමට හේතුව සහ කාරණය කුමක්ද? මිනිසුන් කෙටිකල් ජීවත්වන, දීර්ඝ කාලයක් ජීවත්වන, රෝගී සහ සෞඛ්‍ය සම්පන්න, අවලක්ෂණ සහ රූමත්, දුර්වල සහ බලසම්පන්න, දුප්පත් සහ පොහොසත්, පහත් සහ උසස්, මෝඩ සහ බුද්ධිමත් ලෙස දැකිය හැකිය. මෙයට හේතුව සහ තත්ත්වය කුමක්ද?''

ඊට පසු බුදුපියාණන් වහන්සේ මෙසේ වදාළහ: ''ශිෂ්‍යයෙනි, සත්ත්වයෝ කර්මයේ අයිතිකරුවෝ වෙති. ඔවුහු ඔවුන්ගේ කර්මයෙන් උත්පාදවෙති. ඔවුහු කර්මයට බැඳී සිටිති. ඔවුහු කර්මය ඔවුන්ගේ සරණය කර ගනිති. සත්ත්වයන් පහත් සහ උසස් යනුවෙන් වෙන්කොට හඳුන්වන්නේ කර්මය විසිනි.'' ''ඔබවහන්සේගේ පිළිතුර කෙටි සහ විස්තර නොමැති නිසා එහි අර්ථය මට නොවැටහේ. ඔබවහන්සේ ධර්මය විස්තරාත්මකව උගන්වන්නේ නම්, හොඳයි. එවිට මට එය හොඳින් තේරුම්ගත හැකි වනු ඇත.'' ''එසේ නම් කල්පනාවෙන් සවන් දෙන්න. අවධානය යොමු කරන්න. මම පැහැදිලි කරන්නෙමි.''

(අ) පුරුෂයෙකු හෝ ස්ත්‍රියක සත්ත්වයන් ඝාතනය කරන්නේ යැයි, මිනීමරු, ලේ තැවරුණු, පහර දෙන හිංසනයේ යෙදෙන සහ අනුකම්පා විරහිත යැයි සිතමු. එවැනි ක්‍රියාවේ යෙදෙන නිසා, මරණයෙන් පසු කය බිඳීයාමෙන් පසු, ඔවුන් උත්පත්තිය ලබන්නේ දුප්පත්, රළු ස්ථානයක, අඳුරු ගමනාන්තයක හෝ අපායේ ද විය හැකිය. ඔහු එවැනි ස්ථානයක නැවත නොඉපදුනොත්, මිනිසෙකු ලෙස කුමන තැනක උත්පත්තිය ලැබුවත්, ඔහුගේ ආයු කාලය අඩුය. කෙටි ආයුෂ සහිත ජීවිතයකට යොමු වන්නේ මේ ආකාරයටයි. එනම්, ප්‍රාණඝාතය, මිනීමරු, ලේ තැවරුණු, පහර දෙන සහ ප්‍රචණ්ඩත්වය සහ අනුකම්පා විරහිතවීම යනාදියයි.

(ආ) පුරුෂයෙකු හෝ ස්ත්‍රියක ප්‍රාණඝාතයෙන් වැළකෙයිද, පොල්ල සහ කඩුව පසෙකට දමයිද, සහ සියලු සත්ත්වයන් කෙරෙහි සැලකිල්ලෙන්, කරුණාවෙන් සහ අනුකම්පාවෙන් ක්‍රියා කරයිද, එවැනි ක්‍රියා නිසා, මරණයෙන් පසු ශරීරය අහෝසිවීමෙන්, ඔවුන් උත්පත්තිය ලබන්නේ සතුටුදායක ගමනාන්තයකය, දිව්‍යලෝකයක පවා උත්පත්තිය ලැබිය හැකිය. එම පුද්ගලයා එවැනි ස්ථානයක උපත නොලැබ මිනිස් ලෝකයේ උත්පත්තිය ලබන්නේ නම්, එවිට ඔහු උපදින ඕනෑම තැනක ඔහුට දීර්ඝායුෂ ලැබේ. දීර්ඝායුෂ ලැබීමට මාර්ගය මෙයයි. එනම්, ප්‍රාණ නැසීමෙන් වැළකීම, පොල්ල සහ කඩුව පසෙකට දැමීම සහ සියලු සත්ත්වයන් කෙරෙහි සැලකිල්ලෙන්, කරුණාවෙන් සහ අනුකම්පාවෙන් ක්‍රියා කිරීමයි.

(ඇ) ඒ ආකාරයටම ධර්මදේශනය ඉදිරියට යයි. සත්ත්වයන්ට තුවාල කිරීම අයහපත් ගමනාන්තයකට හෝ නැවත ඉපදීමට, නිදන්ගත රෝගියෙකු බවට පත්වීමට හේතු වේ. තුවාල කිරීමෙන් වැළකීමෙන් යහපත් ගමනාන්තයකට යෑමට හෝ නැවත උත්පත්තිය, සෞඛ්‍යමත් මිනිසෙකු වීමට හේතු වේ. කෝපය, වහා කිපෙනසුළු වීම, අයහපත් ගමනාන්තයකට යෑමට හෝ විරූපී වීමටද හේතු වේ. කෝපවීමෙන් සහ වහා කිපීමෙන් වැළකීම යහපත් ගමනාන්තයකට යෑමට හෝ ආකර්ශණීය මිනිසෙකු ලෙස නැවත උපත ලැබීමට හේතු වේ. ඊර්ෂ්‍යා කිරීම සහ අමනාපය අයහපත් ගමනාන්තයකට

යාමට හෝ බලසම්පන්නබව නොමැති මිනිසෙකු ලෙස ඉපදීමට හේතු වේ. ලෝභී සහ කිසිවක් බෙදා හදා නොගැනීම, අයහපත් ගමනාන්තයකට හෝ දුප්පත් සහ අහිමි පුද්ගලයෙකු බවට පත්වීමට හේතු වේ. පරිත්‍යාගශීලී වීම යහපත් ගමනාන්නතයකට හෝ ධනවත් මිනිසෙකු වීමට හේතු වේ. අහංකාර සහ උද්ධච්ඡ වීම අයහපත් ගමනාන්තයකට හෝ පහත් කුලයක හෝ පහත් පංතියක උත්පත්තිය ලැබීමට හේතු වේ. අහංකාර සහ උද්ධච්ඡ නොවීම යහපත් ගමනාන්තයකට හෝ ඉහළ කුලයේ හෝ ඉහළ පංතියේ මිනිසෙකුව උත්පත්තිය ලැබීම යනාදියට හේතු වේ M.III,202-06 .

(23) මේ දෙදෙනා තථාගතයන් වහන්සේ වැරදි ලෙස අර්ථ නිරූපණය කරති. [6] ඒ කුමන දෙදෙනාද? ඍජු අර්ථයක් ඇති සේ වක්‍ර අර්ථයක් ඇති ධර්මදේශනයක් ගන්නා පුද්ගලයා සහ, ඍජු අර්ථයක් ඇති දේශනයක් වක්‍ර අර්ථයක් ඇති සේ ගන්නා පුද්ගලයයන් දෙදෙනාය. තථාගතයන් වහන්සේ වැරදි ලෙස අර්ථකථනය කරන පුද්ගලයන් මේ දෙදෙනාය A.I,60.

(24) මෙම ශරීරය පැරණි කර්මය වේ. එය දැනෙන දෙයක් ලෙස, පෙනෙන ආකාරයට චේතනාවෙන් උත්පාදනය කර හැඩගස්වා ඇත S.IV,132.

(25) බුදුපියාණන් වහන්සේ මෙසේ වදාළහ: ''අනවබෝධයෙන් සිටින සාමාන්‍ය පුද්ගලයෙකුට, ප්‍රසන්න, වේදනාකාරී සහ මධ්‍යස්ථ හැඟීම් දැනෙන අතර, උපදෙස් ලබන උතුම් ශ්‍රාවකයෙකුටද එය එසේ දැනේ. එසේ නම් ඒ දෙදෙනා අතර ඇති වෙනස කුමක්ද?'' භික්ෂූන් පිළිතුරු දුන්හ: ''අපගේ ධර්මයෙහි පදනම ඇත්තේ ඔබවහන්සේ තුළය. කරුණාකර මෙම කරුණ අපට වටහා දෙන්න. එයට සවන් දීමෙන්, එය අපගේ මතකයේ රැඳෙනු ඇත.''

''මහණෙනි, අනවබෝධයෙන් යුක්ත සාමාන්‍ය පුද්ගලයාට වේදනාවක් දැනෙන විට, ඔහු වැළපෙයි, හඬයි, ඔහුගේ පපුවට ගසා ගනියි, සිහි විකල් වේ. ඔහුට කායික සහ මානසික වශයෙන් හැඟීම් දෙකක් ඇති වේ. ඔහු එක් ඊතලයකින් පහර ලැබ ඊළඟට දෙවන ඊතලයෙන් පහර ලැබූවෙකු මෙන්ය. නමුත්, අවබෝධයට පත් උතුම් ශ්‍රාවකයෙකුට වේදනාව දැනෙන නමුත්, ඔහු වැළපෙන්නේ නැත, හඬන්නේ නැත, පපුවට ගසා ගන්නේ නැත, සිහි විකල් වන්නේ නැත. ඔහුට දැනෙන්නේ කායික හැඟීම පමණි. ඔහු එක් ඊතලයකින් පහර ලැබූවෙකු හා සමානය. නමුත්, දෙවන ඊතලයකින් පහර ලැබීම මඟහරියි'' S.IV,208.

(26) නිශ්චිතව තක්සේරු කළ නොහැකි කාරණා හතරක් තිබේ. ඒ හතර මොනවාද? බුදුපියාණන් වහන්සේගේ විෂය පථය, ධ්‍යානවල [7] විෂය පථය, කර්මවල ප්‍රතිවිපාක සහ ලෝකයේ ආරම්භය යන කාරණා හතරයි. පුද්ගලයෙකු මෙම කරුණු හතර පිළිබඳව කල්පනා නොකළ යුතුයි. එසේ

කිරීමට උත්සාහ කිරීමෙන් පිස්සු සෑදීමට හෝ ඉච්ඡා භංගයට පත්වීමට හේතු වේ A.II,80.

(27) මිගසල උපාසිකාව ආනන්ද හිමියන්ට මෙසේ පැවසුවාය: ''ආනන්ද හිමියන් වහන්ස, බ්‍රහ්මචාරී සහ බ්‍රහ්මචාරී නොවන යන දෙදෙනාටම ඔවුන්ගේ ඊළඟ ජීවිතයේ හරියටම එකම ගමනාන්තයක් තිබිය හැකි තැන බුදුපියාණන් වහන්සේගේ මෙම ඉගැන්වීම්වලට අනුව තේරුම් ගත යුත්තේ කෙසේද? මගේ පියා පුරින ඔහුගේ බිරිඳගෙන් වෙන්ව ජීවත් වෙමින්, ගමේ පුරුද්ද වූ ලිංගික ක්‍රියාවන්ගෙන් වැළකී බ්‍රහ්මචාරී ජීවිතයක් ගත කළේය. ඔහු මිය ගිය විට, බුදුපියාණන් වහන්සේ පැවසුවේ ඔහු සකදාගාමී ඵලයට පැමිණ, එක වරක් නැවත එන්නෙකු [8] ලෙස දිව්‍යමය පථයක නැවත ඉපිද ඇති බවත්ය. මගේ පියාගේ මාමා වන ඉසිදත්ත බ්‍රහ්මචාරී නොවූ අතර, ඔහු ප්‍රීතිමත් විවාහ ජීවිතයක් ගත කළේය. නමුත්, ඔහු මිය යන විට බුදුපියාණන් වහන්සේ පැවසුවේ ඔහු ද සෝවාන් ඵලයට පත්වී සිට දිව්‍ය පථයක උත්පත්තිය ලැබූ බවයි. බ්‍රහ්මචාරී පුද්ගලයෙකු සහ එසේ නොවන අයෙකුද එකම ආකාරයේ නැවත උත්පත්තියක් ලැබිය හැක්කේ කෙසේද?''

''සොහොයුරිය, එය බුදුපියාණන් වහන්සේ පැවසූ පරිදිමය.''

පසුව, ආනන්ද හිමියෝ බුදුපියාණන් වහන්සේ හමුවී මිගසල ඇසූ දේ උන්වහන්සේට පැවසූහ. ඊට පසු බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: ''මෙම මිගසල උපාසිකාව කව්ද? හුදෙක් අඥාන බුද්ධියක් ඇති මෝඩ ගැහැනියකි. කව්ද උසස් සහ කව්ද පහත් යනුවෙන් කියන්නට හැකි යැයි කියන ඔවුන් කව්ද? ලෝකයේ හය ආකාරයක පුද්ගලයෝ සිටිති. ඒ හය කව්ද?

(අ) මෘදු, යහපත් සහෘදයෙකු, මිතුරන් විසින් ප්‍රිය කළ පුද්ගලයෙකු සිටී යැයි අපි කියමු. නමුත්, ඔහු ධර්මය පිළිබඳ ඉගැන්වීම් උගෙන නැත, ඔහුට ඒ පිළිබඳ අවබෝධයක් නැත, භාවනාමය දියුණුවක් ලබා නැත. එම නිසා මරණයේදී ශරීරයෙන් බැහැර වන විට, ඔහු අහිතකර, නුසුදුසු ස්ථානයක උත්පත්තිය ලබයි.

(ආ) ඊට පසු මෘදු, යහපත් සහෘදයෙකු, මිතුරන් විසින් ප්‍රියකරනු ලබන පුද්ගලයෙකු ඇතැයි අපි පවසමු. ඔහු ධර්මය ඉගෙන ගෙන ඇත, ඔහුට ඒ පිළිබඳ යම් අවබෝධයක් ඇත, සහ ඉදහිට භාවනාමය දියුණුවක්ද ලබා ඇත. [9] එම නිසා, මරණයේදී ශරීරය වෙන්ව යන විට, ඔහු හිතකර, සුදුසු ස්ථානයක උත්පත්තිය ලබයි.

දැන් විවේචනාත්මක පුද්ගලයන් මෙසේ කියනු ඇත: ''මොහුට අනෙක් පුද්ගලයාට මෙන්ම සමාන ගුණාංග ඇත. එසේ නම් එක් කෙනෙකු උසස් සහ

අනෙකා පහත් වන්නේ කෙසේද?'' එවැනි තීරණයක් නිසැකවම බොහෝ කාලයකට ඔවුන්ගේ හානිකර බවට සහ දුක් විඳීමට හේතුවනු ඇත. මෙම පුද්ගලයන් දෙදෙනා අතරින් දෙවැන්නා අනෙක් පුද්ගලයා අභිබවා යයි. ඇයි? එයට හේතුව, ධර්ම ගංගාව ඔහු රැගෙන යන බැවිනි. නමුත්, මෙම වෙනස තථාගතයන් වහන්සේ හැර දැනගත හැක්කේ කාටද? එම නිසා, ආනන්ද, මිනිසුන්ගේ කර්මය විනිශ්චය කරන්න එපා. මිනිසුන් මත විනිශ්චය තීන්දු කරන පුද්ගලයෝ තමන්ටම හානි කර ගනිති. තථාගතයන් වහන්සේ හෝ උන්වහන්සේ වැනි කෙනෙකුට පමණක් මිනිසුන් මත විනිශ්චය තීන්දු කළ හැකි වේ.

(ඇ) ඊට පසු, කෝපවන, උඩඟු සහ ඉඳහිට ලෝභ ද වන පුද්ගලයෙකු ඇතැයි කියමු. ඔහු ධර්මයේ ඉගැන්වීම් ඉගෙන ගෙන නැත, ඒ පිළිබඳ අවබෝධයක් නැත, භාවනාමය දියුණුවක් ද ලබා නොමැත. එම නිසා, මරණයේදී ශරීරය බිඳීයාමෙන් පසු ඔහු අහිතකර සහ නුසුදුසු ස්ථානයක උපත ලබයි.

(ඈ) ඊට පසු, කෝපවන, උඩඟු සහ ඉඳහිට ලෝභද වන පුද්ගලයෙකු ඇත. නමුත්, ඔහු ධර්මය ඉගෙන ගෙන ඇත, ඒ පිළිබඳ යම් අවබෝධයක් ඇත, ඉඳහිට භාවනාමය දියුණුවක් ද ලබයි. එම නිසා, මරණයෙන් පසු ශරීරය බිඳී ගිය පසු, ඔහු සුදුසු ස්ථානයක උපත ලබයි.

මෙම පුද්ගලයන් දෙදෙනා අතර, දෙවැන්නා අනෙක් පුද්ගලයා අභිබවා යයි, වඩා උසස් වේ. ඒ ඇයි? එයට හේතුව, ධර්ම ගංගාව ඔහු රැගෙන යන බැවිනි. නමුත්, මෙම වෙනස තථාගතයන් වහන්සේ හැර වෙන කවුරු දන්නේද? එම නිසා, ආනන්ද, මිනිසුන්ගේ කර්මය විනිශ්චය නොකරන්න. මිනිසුන් මත විනිශ්චය තීන්දු නොකරන්න. මිනිසුන් මත විනිශ්චය තීන්දු කරන පුද්ගලයෝ තමන්ටම හානි කර ගනිති. තථාගතයන් වහන්සේ හෝ උන්වහන්සේ වැනි කෙනෙකුට පමණක් මිනිසුන් මත විනිශ්චය තීන්දු කළ හැකි වේ.

(ඉ) දැන්, අපි කෝපයට පත් වන, උඩඟු සහ රළු ලෙස කතා කරන පුද්ගලයා පිළිබඳව විමසමු. ඔහු ධර්මය ඉගෙන ගෙන නැත, අවබෝධ කරගෙන නැත, ඔහුට භාවනාමය දියුණුවක් ද නැත. මරණයේදී ශරීරය බිඳීයාමෙන් පසු, ඔහු නැවත උපත ලබන්නේ දුක්ඛිත තත්ත්වයකය, අයහපත් ගමනාන්තයකය, පහත් ලෝකයකය, සමහර විට අපායේය.

(ඊ) අවසාන වශයෙන්, කෝපයට පත්වන, උඩඟු සහ දැන් හා පසුව, රළු ලෙස කතා කරන පුද්ගලයා ගැන විමසා බලමු. නමුත්, ඔහු ධර්මය උගෙන ඇත, ධර්මය අවබෝධ කර ගෙන ඇත, සහ භාවනාමය දියුණුවක් ද ලබා ඇත. මරණයෙන් පසු, ශරීරය බිඳී ගිය පසු, ඔහු හිතකර සහ සුදුසු ස්ථානයක උපත ලබයි. ආනන්ද, විවේචනාත්මක පුද්ගලයන් මෙසේ මත පළ කරනු ඇත:

''මොහුට අනෙක් පුද්ගලයාට මෙන්ම සමාන ගුණාංග තිබේ. එක් කෙනෙකු පහත් සහ අනෙකා උසස් විය යුත්තේ ඇයි?'' එම විනිශ්චය නිශ්චිතවම බොහෝ කාලයකට ඔවුන්ගේ හානියට සහ දුක් විඳීමට හේතු වේ.

මේ දෙදෙනා අතර, දෙවැන්නා අනෙක් පුද්ගලයා අභිබවා යයි. ඒ ඇයි? එයට හේතුව ඔහු ධර්ම ගංගාව රැගෙන යාමයි. නමුත් මෙම වෙනස, තථාගතයන් වහන්සේ හැර වෙන කෙනෙකු  දන්නේ නැත. එම නිසා, මිනිසුන්ගේ (කර්මය සම්බන්ධයෙන්) විනිශ්චය නොකරන්න. විනිශ්චය මිනිසුන් මත තීන්දු නොකරන්න. මිනිසුන් මත විනිශ්චය තීන්දු කරන පුද්ගලයන් ඔවුන්ටම හානි කර ගනී. මිනිසුන් මත විනිශ්චය තීන්දු කළ හැක්කේ තථාගතයන් වහන්සේ හෝ එවැනි උත්තමයෙකුටම පමණය.

ඔවුන් අතර, ආනන්ද, කෝපය සහ උඩඟු බව ඇති පුද්ගලයා සහ කාලයෙන් කාලයට වචන හුවමාරුවේ යෙදෙන, නමුත්, (ධර්මය පිළිබඳව ඉගැන්වීම්වලට) සවන් දුන්, (ඒවා පිළිබඳව) උගත්, සහ (ඒවා) නිරීක්ෂණය තුළින් විනිවිද බැලූ, සහ තාවකාලික විමුක්තිය ලැබූ, අනෙක් පුද්ගලයා අභිබවා ගොස් උසස් බවට පත් වේ. ඒ කුමන හේතුවක් නිසාද? එයට හේතුව ධර්ම ගංගාව ඔහු රැගෙන යන නිසාය. නමුත්, මෙම වෙනස තථාගතයන් වහන්සේ හැර වෙන කවුරු දන්නේද? එම නිසා, ආනන්ද, මිනිසුන්ගේ කර්මය සම්බන්ධයෙන් විනිශ්චය නොකරන්න. මිනිසුන් මත විනිශ්චය තීරණ නොකරන්න. මිනිසුන් මත විනිශ්චය තීරණ කරන අය තමන්ටම හානි කර ගනියි. මිනිසුන් මත විනිශ්චය තීරණ කළ හැක්කේ තථාගතයන් වහන්සේ හෝ එවැනි උත්තමයෙකුට පමණි.

සැබැවින්ම, මිගසල නමැති උපාසිකාව, මෝඩ, ස්ත්‍රියකගේ බුද්ධි මට්ටමින් යුක්ත අදක්ෂ ස්ත්‍රිය කවුද? තවද, උසස් සහ පහත් ලෙස අනෙක් පුද්ගලයින් පිළිබඳ දැනුම (කවුද) ඇති පුද්ගලයන් කවුද? A.III,348.

(28)ස්ත්‍රියක හෝ පුරුෂයෙකු, ගෘහමූලිකයෙකු හෝ භික්ෂුවක, මේ ආකාරයෙන් ආවර්ජනය කළ යුත්තේ කුමන ප්‍රයෝජනය සඳහාදඃ ''මම මගේ කර්මයේ හිමිකරුවෙමි, මගේ කර්මයේ උරුමක්කාරයාය, මා මගේ කර්මයෙන් හටගෙන ඇත, කර්මය මගේ ඥාතියාය, කර්මය මගේ තෝරාගැනීමයි. යහපත් හෝ අයහපත්, මා කරන ඕනෑම කර්මයක හිමිකරුවා මම වෙමි. ''මිනිසුන් කයෙන්, වචනයෙන් සහ මනසින් වැරදි හැසිරීම්වල යෙදේ. නමුත්, යම් කෙනෙකු මෙම මාතෘකාව ගැන නිතර ආවර්ජනය කරන විට, එවැනි වැරදි හැසිරීම් මුළුමනින්ම අත්හැර තිබේ, නැතහොත් අවම වශයෙන් අඩුවී තිබේ.

(28 b) (අ) කයෙන්, වචනයෙන් හෝ මනසින් ක්‍රියාවක් සිදු කරන්නට අදහස් කරන විට, ඔබ මෙසේ ආවර්ජනය කළ යුතුයිඃ ''මෙම ක්‍රියාවෙන් මට, අනෙක් අයට හෝ දෙදෙනාටම  අවාසියක් සිදු වේද? එය වේදනාකාරී ඵලයක් ඇති

වන සදාචාරමත් නොවන ක්‍රියාවක් විය හැකිද?'' එසේ යැයි ඔබ තීරණය කරන්නේ නම්, ඔබ අනිවාර්යයෙන්ම එය නොකළ යුතුයි. නමුත් ආවර්ජනය මත ඔබඃ ''මා කරන්නට යන මේ ක්‍රියාව මට, අනෙක් අයට හෝ දෙපාර්ශ්වයටම හානියක් නොවේ. එය ප්‍රසන්න ප්‍රතිඵල ඇති වන සදාචාරමත් ක්‍රියාවක්'' යැයි සිතන්නේ නම්, ඔබ එය කළ යුතුයි.

(ආ) කයෙන්, වචනයෙන් හෝ මනසින් ක්‍රියාවක් සිදු කරන විට, ඔබ මෙසේ ආවර්ජනය කළ යුතුයිඃ ''මා මේ කරන ක්‍රියාවෙන් මට, අනෙක් අයට හෝ දෙපාර්ශ්වයට අවාසියක් සිදු වේද? එය වේදනාකාරී ඵලයක් ඇති කරන සදාචාරමත් නොවන ක්‍රියාවක් ද?'' එසේ යැයි ඔබ තීරණය කරන්නේ නම්, ඔබ අනිවාර්යයෙන්ම එය කිරීම නැවැත්විය යුතුයි. නමුත්, ආවර්ජනය මත ඔබඃ ''මා මේ කරන ක්‍රියාව මට, අනෙක් අයට හෝ දෙපාර්ශ්වයටම අවාසියක් ඇති නොවේ. එය ප්‍රසන්න ප්‍රතිඵලයක් ඇති වන සදාචාරාත්මක ක්‍රියාවක්'' යැයි ඔබ සිතන්නේ නම්, ඔබ එය කළ යුතුයි.

(ඇ) කයෙන්, වචනයෙන් හෝ මනසින් ක්‍රියාවක් සිදු කළ පසුද, ඔබ මෙසේ ආවර්ජනය කළ යුතුයිඃ ''මා මේ සිදු කළ ක්‍රියාව මට, අනෙක් අයට හෝ දෙපාර්ශ්වයන්ට අවාසියක් සිදු කර ඇද්ද? එය වේදනාකාරී ප්‍රතිඵලයක් ඇති කළ සදාචාරමත් නොවන ක්‍රියාවක්ද?'' එය එසේ යැයි ඔබ නිගමනය කළහොත්, ඔබ ඒ පිළිබඳව නොසඟවා හෙළි කළ යුතුයි, වරද පිළිගත යුතුයි, ගුරුවරයාට හෝ ආධ්‍යාත්මික ජීවිතයේ ප්‍රඥාවන්ත හිතවතෙකු සමග ඒත්තු ගැන්විය යුතුයි. මෙසේ කරමින් ඔබ අනාගතයේදී එවැනි දෙයක් සිදු වීම වළක්වා ගැනීමට අධිෂ්ඨාන කර ගත යුතුයි. ආවර්ජනය පිළිබඳව ඔබ සිතන්නේ නම්ඃ ''මා මේ කළ ක්‍රියාවෙන් මට හෝ අනෙක් අයට හෝ දෙපාර්ශ්වයට අවාසියක් සිදු නොවීය. එය ප්‍රසන්න ප්‍රතිඵලයක් ගෙන දෙන යහපත් ක්‍රියාවකි.'' එවිට ඔබ සතුටු විය යුතුයි, ප්‍රීති විය යුතුයි. සදාචාරාත්මක ක්‍රියාවන්වල අඛණ්ඩව, දිවා රෑ පුහුණු විය යුතුයි M.I,415-8.

(29) උතුම් ශ්‍රාවකයෙකු මෙසේ ආවර්ජනය කරයිඃ ''ඔවුන්ගේ කර්මයට එකම උරුමක්කාරයා මම නොවෙමි, එකම හිමිකරු මම නොවෙමි, හටගත්තේ මා පමණක් නොවේ, එකම ඥාතියා මම නොවෙමි, එකම තෝරා ගැනීම මම නොවෙමි. යහපත් හෝ අයහපත්, ඕනෑම කර්මයක උරුමක්කාරයා වන්නේ, යහපත් හෝ අයහපත් කර්ම සිදු කරන්නාය. යහපත් හෝ අයහපත්, සියලු සත්ත්වයෝ ඔවුන් විසින් සිදු කළ කර්මවල උරුමක්කාරයෝ වෙති. හිමිකරුවෝ වෙති, ඔවුන්ගේ කර්මවලින් හටගත්තෝ වෙති, ඥාතියෝ වෙති, තෝරා ගැනීම වෙති.'' එම පුද්ගලයා නිතර මෙම මාතෘකාව ගැන, නිතර නිතර සලකා බලන විට මාර්ගය උත්පාදනය වේ. ඔහු මෙම මාර්ගයේ සැලසුමක් අනුව ඉදිරියට යන විට, එය වර්ධනය වේ, බුද්ධිය වැඩිදියුණු වේ.

ඔහු එසේ කරන විට, බන්ධන සම්පූර්ණයෙන්ම අතහැරේ. මූලික ප්‍රවණතා මුලිනුපුටා දැමේ [10] A.III,74.

(29 a) උතුම් ශ්‍රාවකයෙක් මෙසේ ආවර්ජනය කරයිඃ ''ඔවුන්ගේ කර්මයෙහි එකම උරුමක්කාරයා, අයිතිකරු, හටගත්තේ, ඥාතියා, තෝරාගැනීම මා පමණක් නොවේ. ඔවුන් විසින් කරන යහපත් හෝ අයහපත් යන ඕනෑම කර්මවල උරුමක්කාරයා කවුද? සියලු ජීවීහු ඔවුන්ගේ කර්මවල උරුමක්කරුවෝ වෙති, අයිතිකරුවෝ වෙති, හටගත් අය වෙති, කර්මය ඔවුන්ගේ ඥාතියා වෙති, තෝරාගැනීම වෙති. යහපත් හෝ අයහපත් යන ඔවුන් විසින් කරන ලද ඕනෑම කර්මයක අයිතිකරුවෝ වෙති.'' ඔහු නිතර මෙම මාතෘකාව පිළිබඳව ආවර්ජනය කරන විට, මාර්ගය උත්පාදනය වේ. ඔහු මාර්ගයේ සැලසුමක් අනුව ඉදිරියට යන විට, එය දියුණු වේ, බුද්ධිය වැඩිදියුණු වේ. ඔහු මෙසේ කරන විට, බන්ධන අත්හැරේ, එවිට මතුපිටට යටින් පවතිනා ගති [10] මුලිනුපුටා දැමේ A.III,74.

(29 b) යම් කෙනෙකු කෙරෙහි ඇතිවිය හැකි අමනාපය ඉවත් කිරීමේ ක්‍රම පහක් ඇත. ඒ පහ මොනවාද? කෙනෙකු අමනාප වන පුද්ගලයා කෙරෙහි මෛත්‍රිය වර්ධනය කර ගත යුතුයි. කෙනෙකු ඔවුන් කෙරෙහි අනුකම්පාව වර්ධනය කර ගත යුතුයි. කෙනෙකු ඔවුන් කෙරෙහි උපේක්ෂාව උපදවා ගත යුතුයි. කෙනෙකු හුදෙක් එම පුද්ගලයා නොසලකා හරිමින් ඔහු කෙරෙහි අවධානය යොමු නොකළ යුතුයි. කෙනෙකු සත්ත්වයන් ඔවුන්ගේ කර්ම උරුමකර ගන්නා බවට අදහස භාවිත කරමින් මෙසේ සිතිය යුතුයිඃ ''මෙම පුද්ගලයා ඔහුගේ කර්මයේ උරුමක්කාරයා වේ. අයිතිකරු වේ. ඔහු කර්මයෙන් උත්පාදනය වූවෙකි. කර්මය ඔහුගේ ඥාතියාය. කර්මය ඔහුගේ තෝරාගැනීමයි. යහපත් හෝ අයහපත් යන ඕනෑම කර්මයක් කිරීමෙන් ඔහු කර්මයේ අයිතිකරු වේ.'' පුද්ගලයෙකු කෙරෙහි ඇති විය හැකි ඕනෑම අමනාපයක් ඉවත් කිරීමේ පස් ආකාරය මෙයයි A.III,185.

(30 a) දුක්විඳීමේ මූලාරම්භය මෙයයි. සතුට සහ රාගය, මෙතැන සහ අතන සතුට සොයමින්, එනම්, ඉඳුරන් පිනවීමට ඇති තණ්හාව, පැවැත්ම සඳහා තණ්හාව, සහ නොපැවැත්මට ඇති තණ්හාව සමග නැවත නැවත පැවැත්මට තණ්හාව (තන්හා පොනොබ්භවිකා), හේතු වේ S.V,421.

(30 b) කර්මයෙන් ලෝකය ඉදිරියට යයි. කර්මයෙන් මිනිස්සු ඉදිරියට යති. කැරකෙන රෝදයට සූදානම් වූ කඩ ඇණය මෙන් මිනිසුන්ගේ බැඳීම ලෙස කර්මය ඇත Sn.654.

(30 c) කර්මයේ ආරම්භය සම්බන්ධයෙන් හේතු තුනක් තිබේ. මොන තුනද? අතීතයේදී ආශාව සහ රාගය ඇති කළ හැකි දේ කෙරෙහි ආශාව ඇති වේ.

අනාගතයේදී ආශාව සහ රාගය ඇති කළ හැකි දේ කෙරෙහි ආශාව මතු වේ. තවද වර්තමානයේ ආශාව සහ රාගය උපදවන දේ කෙරෙහි ආශාව පැන නගී.

(අ) අතීතයේ ආශාව සහ රාගය ඇති කළ දේවල් කෙරෙහි ආශාව ඇති වන්නේ කෙසේද? අතීතයේ ආශාවන් සහ රාගය උපද්දවූ දේ ගැන යම් කෙනෙකු සිතන සහ කල්පනා කරන විට, ආශාව සහ රාගය වැඩි වෙයි. එසේ කරන විට, ආශාව වඩා වැඩි වේ. ආශාව පොළඹවන විට, ඒවායෙන් එම පුද්ගලයා බන්ධනය වේ. මෙම මානසික මෝහයෙන් මුළාවීම මා හඳුන්වන්නේ බන්ධනයක් ලෙසයි. අතීතයේදී ආශාව සහ රාගය ඇති කළ දේ කෙරෙහි ආශාව සහ රාගය ඇතිවන්නේ මේ ආකාරයටයි.

(ආ සහ ඇ) අනාගතයේ ආශාවන් සහ රාගය උපදවා ගත හැකි දේ සහ වර්තමානය තුළ ආශාව සහ රාගය උපදවන දේ සමග සිදුවන්නේද එසේමයි.

කර්මයේ ආරම්භය සඳහා මෙම හේතු තුනක් තිබේ. ඒ තුන මොනවාද? අතීතයේ ආශාව සහ රාගය ඇති කළ දේවල් කෙරෙහි ආශාව ඇති නොවේ. අනාගතයේදී ආශාව සහ රාගය උපදවා ගත හැකි දේ සඳහා ආශාව ඇති නොවේ. වර්තමානයේ ආශාව සහ රාගය උපදවන දේ කෙරෙහි ආශාව ඇති නොවේ.

(ඈ) අතීතයේ ආශාව සහ රාගය ඇති කළ දේවල් කෙරෙහි ආශාව ඇති නොවන්නේ කෙසේද? අතීතයේදී ආශාව සහ රාගය ඇති කළ දේවල් කෙරෙහි ආශාවෙන් සිටීමෙන් ඇති වන ප්‍රතිඵලය කුමක් දැයි යම් කෙනෙකුට වැටහේ. මෙය අවබෝධ කර ගැනීමෙන් කෙනෙකු එය නොකරයි. එය නොකිරීමෙන් මනස සන්සුන් වේ. ප්‍රඥාවෙන් එය දැකීමෙන් කෙනෙකුට අතීතයේ ආශාව සහ රාගය ඇති කළ දේ කෙරෙහිවූ ආශාව වළක්වා ගත හැකි මාර්ගය මෙය බව පෙනේ.

(ඉ සහ ඊ) අනාගතයේදී ආශාව සහ රාගය ඇති කළ හැකි දේ සහ වර්තමානයේ ආශාව සහ රාගය උපදවන දේ සමග යම් කෙනෙකු එසේම කරයි A.I,265.

(31) උපන් සත්ත්වයන්, සහ උපදින්නට සිටින සත්ත්වයන්ගේ පැවැත්ම සඳහා පෝෂක වර්ග හතරක් ඇත. ඒ හතර මොනවාද? කෑමට යෝග්‍ය ආහාර, ගොරෝසු සහ සියුම්, ස්පර්ශය, මානසික චේතනාව (මනෝ සඤ්චේතනා) සහ විඥානයයි. මෙම පෝෂක වර්ග හතරේ ප්‍රභවයන් ලෙස තෘෂ්ණාව ඇත, එනම් එහි මූලාරම්භය ලෙස, ඒවා උපදින්නේ සහ නිපදවන්නේ තෘෂ්ණාව විසිනි M.I,261.

(32) ශරීරය ඕජෝගුණයෙන්, තාපයෙන් සහ විඥානයෙන් තොර වූ විට, එය පසෙකට විසි වේ, ඉවත් වේ, සහ ලී කොටයක් මෙන් අසංඥව වැතිර තිබේ. තමන්ගේ කාලය අවසන්වූ තැනැත්තා සම්බන්ධයෙන්, ඔහුගේ ශාරීරික, වාචික, සහ මානසික ක්‍රියාකාරකම් වැළකී, නැවතේ. ඔහුගේ ඕජෝගුණය නැතිවී, තාපය බිඳ වැටේ, ඔහුගේ පහසුකම් සම්පූර්ණයෙන්ම බිඳ වැටී ඇත M.I,296 .

(33) කරුණු තුනක එකතුවක් සිදු වූ විට, ගර්භාශය තුළ කලලරූපය පිළිසිඳ ගැනීම සිදු වේ. එනම් මවගේ සහ පියාගේ එක්වීම, මවගේ සශ්‍රීකත්වය සහ උපදින්නට නියමිත ජීවියාගේ පෙනී සිටීමයි M.I,266.

(34) ''ඉන්ධන නොමැතිව, ඉන්ධන සමගින් ගින්දර දැල්වෙන ආකාරයටම, මම ද කියමි, නැවත ඉපදීම සිදුවන්නේ ඉන්ධන ඇති අයෙකුට මිස, ඉන්ධන නොමැති කෙනෙකුට නොවේ.''

''නමුත්, යහපත් ගෞතමයාණන් වහන්සේ, සුළඟට යම් දුරකට ගිනි දැල්ලක් විහිදෙන විට, ඔබවහන්සේ කියන්නේ එහෙනම්, ඒ එහි ඉන්ධන කියාද?''

''සුළඟින් යම් දුරකට දැල්ලක් විහිදුන විට, මම කියන්නේ එයට ඉන්ධන සැපයෙන්නේ සුළඟින් බවයි, එහි ඉන්ධන සුළඟයි.''

''හොඳයි, ගෞතමයාණන් වහන්ස, යම් ජීවියෙකු ශරීරය අත්හළ නමුත්, තවමත් නැවත ඉපදී නැති විට, ඔබවහන්සේ පවසන්නේ එසේ නම්, ඒ එහි ඉන්ධන යැයි කියාද?''

''පුද්ගලයෙකු ශරීරය අත්හළ නමුත්, තවමත් නැවත ඉපදී නැති අවස්ථාවේ, මා පවසන්නේ එයට ඉන්ධන සපයන්නේ තණ්හාවෙන් බවයි, තණ්හාව එහි ඉන්ධනයි'' S.IV,399-400.

(35) ''කර්මය අවබෝධ කළ යුතුයි, කර්මය නැවැත්වීමට ඇති මාර්ගය අවබෝධ කළ යුතුයි.'' යනුවෙන් පැවසූ විට, මෙය පැවසුවේ කුමන හේතුවක් නිසාද?

(අ) මා කර්මය යනුවෙන් හඳුන්වන්නේ චේතනාවයි. (චේතනා) යම් කෙනෙකු ශරීරයෙන්, වචනයෙන් හෝ මනසින් අදහස් කර ක්‍රියා කරයි.

(ආ) කර්මයේ ප්‍රභවය සහ සම්භවය කුමක්ද? ස්පර්ශය (ඵස්ස) එහි ප්‍රභවය සහ සම්භවයයි.

(ඇ) කර්මයේ විවිධත්වය මොනවාද? කර්මය අපායේ අත්විඳිය හැකිය. සත්ත්ව ලෝකය තුළ කර්මය අත්විඳිය හැකිය. පීඩාවට පත් වූ ආත්මයන් තුළ කර්මය

අත්විඳිය හැකිය. කර්මය මිනිස් ලෝකය තුළ අත්විඳිය හැකිය. දිව්‍ය ලෝකයේ කර්මය අත්විඳිය හැකිය. මෙය කර්මයේ විවිධත්වය ලෙස හැඳින්විය හැකිය.

(ඈ) කර්මයේ ප්‍රතිඵල කුමක්ද? මා කියන්නේ කර්මයේ ප්‍රතිඵල තුන් ආකාර බවයි. මේ ජීවිතයේ අත්විඳීම්, හෝ ඊළඟ භවයේ හෝ ඊළඟ අවස්ථාවකදී අත්විඳීම් වශයෙනි. මෙය කර්මයේ ප්‍රතිඵලය ලෙස හැඳින්වේ.

(ඉ) කර්මය නැවැත්වීම යනු කුමක්ද? ස්පර්ශය නැවැත්වීම සමග කර්මය නැවැත්වීම සිදු වේ.

(ඊ) ආර්ය අෂ්ඨාංගික මාර්ගය කර්මය නැවැත්වීමේ මාර්ගයයි. එනම්, සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා ආජීව, සම්මා කම්මන්ත, සම්මා වායාම, සම්මා සති සහ සම්මා සමාධි වශයෙනි.

යම් උතුම් ශ්‍රාවකයෙකු කර්මය අවබෝධ කරගෙන, එහි ප්‍රභවය, මූලාරම්භය සහ විවිධත්වය, එහි ප්‍රතිඵල, නැවැත්වීම සහ එය නැවැත්වීමට මඟ අවබෝධ කළ විට, ඔහු මෙම විනිවිද දකින ආධ්‍යාත්මික ජීවිතය (නිබ්බේධික-බ්‍රහ්මචරියා) යනු කර්මය නැවැත්වීම බව අවබෝධ කර ගනී A.III, 415.

(36) ඇලීම හේතුව වෙමින් සුදුසු බවට පත්වෙයි, සුදුසු බවට පත්වෙමින් ඉපදීම, ඉපදීම හේතුව බවට පත්වෙමින් දුක් විඳීම, දුක් විඳීම හේතුව බවට පත්වෙමින් විශ්වාසය, විශ්වාසය හේතුව බවට පත්වෙමින් සතුට, සතුට හේතුව බවට පත්වෙමින් ප්‍රීතිප්‍රමෝදය, ප්‍රීතිප්‍රමෝදය හේතුව බවට පත්වෙමින් සංතෘප්තිමත්බව, සංතෘප්තිමත්බව හේතුව බවට පත්වෙමින් සමාධිය, සමාධිය හේතුව බවට පත්වෙමින් කරුණු පිළිබඳව ඇති සැටියෙන් දැනුම සහ දැක්ම, එනම් අතහැරීම ඇති වේ. අතහැරීම හේතුව බවට පත්වෙමින්, ආශාවන් වියැකී යන අතර, එමගින් විමුක්තිය ඇති වේ S.II,31-2.

(37 a) පැරණි දේ විනාශ වී, අලුත් දේ මතු නොවන්නේ අනාගත පැවැත්ම ගැන මනසේ උනන්දුවක් නැති, එම බීජ විනාශ වූ, වර්ධනය සඳහා තවදුරටත් ආශාවක් නැති අයටය. ප්‍රඥාවන්තයන් පහනක් මෙන් ආශාවන් යටපත් කර ගනී Sn.235.

(37 b) කර්මයේ ආරම්භයට මෙම හේතු තුන තිබේ. ඒ තුන මොනවාද? ලෝභය, වෛරය සහ මෝහයයි. ලෝභය, වෛරය හෝ මෝහයෙන් සැකසුණු, උපන්, හේතුවූ හෝ ආරම්භවූ ඕනෑම කර්මයක් එම පුද්ගලයා නැවත කොතැනක උපන්නත්, යළිත් වැඩේ. එම කර්මය කොතැනක වැඩුනත්, එහි ප්‍රතිවිපාක පුද්ගලයෙකු අත්විඳින්නේ එම ස්ථානයේදීය. එය මෙම භවයේදී, ඊළඟ භවයේදී, හෝ ඊළඟ නැවත ඉපදීමකදී හෝ සිදු විය හැකිය. මනා ලෙස භූමිය සකස් කළ කෙතක බීජ වගාකර පසුව ප්‍රමාණවත්

වර්ෂාපතනයක් ලැබුණේ යැයි සිතමු. මේ සියල්ල නිසා, එම බීජ මුල් ඇද, වැඩී මෝරනු ඇත. ලෝභය, වෛරය හෝ මෝහයෙන් සැකසුණු ඕනෑම කර්මයක් සම්බන්ධයෙන්ද එය එසේමයි.

කර්මයේ මූලාරම්භය සඳහා තවත් හේතු තුනක් තිබේ. ඒ තුන මොනවාද? අලෝභය, අදෝෂය, සහ අමෝහයයි. ලෝභය, වෛරය සහ මෝහය නැති වූ විට, එවැනි කර්ම අත්හැරේ. එය අනාගතයේදී තවදුරටත් මතු නොවන පරිදි, තල් ගසක කඳක් මෙන් මුලෙන්ම කපා විනාශ කර දමනු ලැබේ. මිනිසෙකු හොඳ බීජ ගෙන ඒවා පුළුස්සා අළු බවට පත් කර, අළු සුළඟේ පොළා හෝ වේගයෙන් ගලායන ගඟකට ඉවත දමන්නේ යැයි සිතමු. මේ ආකාරයට අනාගතයේදී තවදුරටත් මතුවීමට ඉඩ නොතබමින්, බීජ මුලෙන්ම කපා දමා, තල් ගසක කඳක් මෙන් කපා දමා විනාශ කරනු ලැබේ. කර්මයේ ආරම්භය ඇතිවීමට හේතු තුන මෙයයි A.I,135.

(38) ''ආශාව හෝ වෛරය නැති, නොකැළඹුණු, සෑම අතින්ම දැනුවත් සහ නිරන්තර සිහියෙන් යුක්තවූ ඒ උතුම් ශ්‍රාවකයා, සතර දිශාවටම කරුණාව, මුදිතාව සහ උපේක්ෂාව පතුරුවමින් වාසය කරයි. ඉහළට, පහළට, හරහට සහ සැමතැනම, තමන්ට මෙන්ම සියල්ලන්ටම, මුළු ලෝකයටම, පෘථුල ලෙසින්, පැතිරෙනසුලු, මිනිය නොහැකි සහ වෛරය සහ අමනාපයෙන් සම්පූර්ණයෙන්ම තොර වූ මෛත්‍රිය, මුදිතාව සහ උපේක්ෂාව පිරුණු මනසකින් පතුරුවා හරිමින්, ඔහු වාසය කරයි. ඔහු දනී: 'කලින් මගේ මනස පටු සහ නොදියුණු වූ නමුත්, දැන් එය මිනිය නොහැකිය, හොඳින් දියුණු වී ඇත. කිසිම මැනිය හැකි කර්මයක් එහි ඉතිරි වී නැත.' දැන් මහණෙනි, ඔබ කුමක් සිතන්නේද? කුඩා කාලයේ සිටම තරුණයෙකු ආදරයෙන් හෝ කරුණාවෙන්, මුදිතාවෙන් හෝ උපේක්ෂාවෙන් මනසේ නිදහස වර්ධනය කර ගන්නේ නම්, ඔහු අයහපත් කර්ම කිසිවක් කරයිද?''

''නැත ස්වාමීනී.''

''එසේම ඔහු අයහපත් කර්ම නොකළේ නම්, දුක්විඳීම් ඔහුට බලපායිද?''

''නැත ස්වාමීනී. අයහපත් කර්ම කිසිවක් නොකරන පුද්ගලයෙකු දුක් විඳින්නේ කෙසේද?''

එබැවින් පුරුෂයෙකු හෝ ස්ත්‍රියක මෙම චිත්ත විමුක්තිය මෛත්‍රිය, කරුණාව, මුදිතාව සහ උපේක්ෂාව තුළින් වර්ධනය කර ගත යුතුයි. මිය යන විට කිසිම පුරුෂයෙකුට හෝ ස්ත්‍රියකට තම ශරීරය රැගෙන යා නොහැකිය. සත්ත්වයන්ගේ හරය මනසයි. උතුම් ශ්‍රාවකයා දනී: ''අතීතයේදී මා කළ කුමන හෝ අයහපත් කර්මයකින් උපන් මෙම කයට මෙහිදී ඒවායේ ප්‍රතිඵල ලැබෙණු ඇත.' මෛත්‍රිය, කරුණාව, මුදිතාව සහ උපේක්ෂාව තුළින් මනසේ විමුක්තිය

මේ ආකාරයට දියුණු කළ විට, එය ප්‍රඥාවන්ත පුද්ගලයෙකු ඉහළ තත්ත්වයකට නොපැමිණියේ නම්, ආපසු නොපැමිණීමට[11] මඟ පාදයි'' A,V,299-300.

(39) නැවත ඉපදීමේ ක්‍රම හතර පිළිබඳ ධර්මය ඉගැන්වීමේ බුදුපියාණන් වහන්සේගේ ක්‍රමය අද්විතීයයි. කෙනෙකු මවකගේ ගර්භාශය තුළට අවිඥානක ලෙස බැස, අවිඥානක ලෙස එහි රැඳෙමින්, අවිඥානක ලෙස එයින් පිටත් වේ. නැතහොත්, කෙනෙකු සිහි කල්පනාවෙන් යුතුව ගර්භාශයකට ඇතුළු වේ, නමුත්, අවිඥානක ලෙස එහි රැඳේ, නමුත්, සිහි කල්පනාවෙන් එයින් පිටත් වේ D.III,103.

(40) මහානාම නම් ශාක්‍යයා බුදුපියාණන් වහන්සේ බැහැදැකීමට පැමිණ මෙසේ කීවේය: ''බුදුපියාණන් වහන්ස, මේ කපිලවත්ථුවේ ධනවත්බව, සමෘද්ධිමත්බව, සමග ජනාකීර්ණ සහ තදබදයක් ද ඇත, එහි මහාමාර්ග සහ අතුරු මාර්ග කාර්යබහුලය. ඔබවහන්සේ සහ ගෞරවනීය භික්ෂූන් වහන්සේලා බැහැදැකීමෙන් පසු, හවස් වරුවේ මම නගරයට ඇතුළුවන විට, සමහර අවස්ථාවලදී, මට ඇතෙකු හෝ අශ්වයෙකු, අශ්ව කරත්තයක්, කරත්තයක් හෝ මිනිසෙකු ද හමු වේ. ඔබවහන්සේ, ධර්මය සහ සංඝයා කෙරෙහි යොමු වූ මගේ සිහි කල්පනාව සම්පූර්ණයෙන්ම වික්ෂිප්ත කරයි. මම සිතමි: 'ඒ වේලාවේ මා මිය ගියේ නම්, මා කොතැන නැවත ඉපදේද, මගේ නැවත ඉපදීම කුමක් වේද?''

බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: ''මහානාම බිය නොවන්න. බිය නොවන්න. ඔබගේ මනස බොහෝ කාලයක් තිස්සේ විශ්වාසය සහ ගුණවත්බව, අධ්‍යයනය, ත්‍යාගශීලීබව සහ ප්‍රඥාව තුළ ස්ථිරව පිහිටුවා ගෙන ඇති හෙයින්, ඔබගේ මරණය, මිය යෑම අයහපත් එකක් නොවනු ඇත. සතර මහා මූලද්‍රව්‍යයන්ගෙන් සෑදුණු දෙමාපියන්ගෙන් පැවත එමින්, බත් සහ කැඳවලින් පවත්වා ගෙන යන, වෙනස්වීමට යටත්වූ ශරීරය වැහැරී යනු ඇත, දිරා යනු ඇත, කඩා වැටෙනු ඇත, කපුටන් සහ ගිජුලිහිණියන්, උකුස්සන්, සුනඛයන්, හිවලුන් සහ අනෙක් සතුන් කා දමනු ඇත. නමුත්, විශ්වාසය සහ ගුණවත්බව, අධ්‍යයනය, ත්‍යාගශීලීබව සහ ප්‍රඥාව යන කරුණු තුළ දීර්ඝ කාලයක් මුළුල්ලේ ස්ථිරව පිහිටුවා ඇති මනස ඉහළට සහ ගෞරවයට පාත්‍රවනු ඇත S.V,369.

(41) කර්මයේ විවිධත්වය කුමක්ද? කර්මය අපායේදී අත්විඳිය යුතුව ඇත, කර්මය සත්ත්ව ලෝකයේ අත්විඳිය යුතුව තිබේ. කර්මය දුක් විඳින ප්‍රේත ලෝකයේ අත්විඳිය යුතුව ඇත, කර්මය මනුෂ්‍ය ලෝකයේ අත්විඳිය යුතුව ඇත, එසේම කර්මය දිව්‍ය ලෝකයේද අත්විඳිය හැකිය. මෙය කර්මයේ විවිධත්වය ලෙස හැඳින්වේ A.III, 415.

(42) ''ඒ කෙසේද යහපත් ගෞතමයාණන් වහන්ස, ක්‍රියාව කරන තැනැත්තා එම ක්‍රියාවේ ප්‍රතිඵලය අත්විඳින්නා හා සමානද?''

''එය එක් අන්තයකි.''

''එසේ නම් ක්‍රියාවේ ප්‍රතිඵලය අත්විඳින තැනැත්තාට වඩා ක්‍රියා කරන තැනැත්තා වෙනස්ද?''

''එය තවත් අන්තයකි. මෙම අන්තයන් දෙකටම නොඇලී තථාගතයන් වහන්සේ මධ්‍යම ප්‍රතිපදාවේ ධර්මයක් උගන්වයි''S.I,7-6.

**සටහන්**

1. ඒ කාලයේ සිටි ප්‍රධාන ආගමික ගුරුවරුන්ගේ ප්‍රධාන වර්ග දෙක වූයේ සාම්ප්‍රදායික නොවන තාපසවරුන් (සාමණ) සහ වෛදික බ්‍රාහ්මණවාදයේ පාරම්පරික පූජකවරුන් වූ බ්‍රාහ්මණයන්ය.[back]
2. 'සර්' යනු ගෞරවය දැක්වීමේ භාෂිතයකි. A term of respect meaning 'sir'. [back]
3. බ්‍රාහ්මණ ආගමේ කුල ක්‍රමයේ සහ රොඩී කුලයේ අය වෙනුවෙන් වෙන් කළ පහත් කොට සලකන රැකියා සහ ශිල්ප වේ. These were the despised jobs and crafts reserved for low castes and outcastes in the Brahmanical caste system. [back]
4. බ්‍රාහ්මණ ආගමේ ඉහළම දෙවිවරු දෙදෙනෙකි. Two of the highest gods in Brahminism. [back]
5. ඒ සන්තුෂ්ටිය, ආදරය සහ කරුණාවයි. That is, contentment, love and kindness. [back]
6. නිර්වාණයට එළඹි පුද්ගලයෙකු ආමන්ත්‍රණය කරන භාෂිතයකි. එහි අදහස 'ඒ අනුව එක වරක් පැමිණි උතුමන්' සහ 'ඒ අනුව එක වරක් පිටත්වූ උතුමන්' යනුවෙනි. A term for someone who has attained complete awakening, meaning both 'The Thus Come One' and 'The Thus Gone One'. [back]
7. ප්‍රබල භාවනා තුළින් අත්දකින ගැඹුරු ආධ්‍යාත්මික තත්ත්වයකි. බුදුපියාණන් වහන්සේ එය තත්ත්වයන් හතරකට වෙන් කළ සේක. හැම එකක්ම ඊට පෙර එකට වඩා වැඩියෙන් යහපත් වේ. A profound spiritual state experienced through intensive meditation. The Buddha divided it into four stages, each one more refined than the one before it. [back]
8. නිර්වාණයට මගපෙන්වන තත්ත්වයන් හතරෙන් දෙවැන්න. The second of the four stages leading to awakening. [back]
9. සමය විමුත්ති - භාවනා කරන විට සමහර විට ඇතිවන මෙම තත්ත්වයන් මෙයින් විස්තර කෙරේ. නිර්වාණ අවබෝධය ඇතිවන ගති ලක්ෂණ බොහොමයක් මේවායේ ඇත. නමුත් ඉතා ඉක්මනින් පහව

යයි. *Samaya vimutti.* This refers to states of mind sometimes attained during meditation, which have many of the characteristics of awakening but which soon fade. [back]

10. මෙම පාදකවූ ප්‍රවණතා (අනුසය), ආසවයන්ගේ අලුතෙන් සූත්‍රගත කළ දෙයක් සේ පෙනෙන්ට පුළුවනි. ඒවායෙන් හතක් සඳහන් වේ. These underlying tendencies (*anusaya*) can be seen as a reformulation of the *āsavas*. Seven of them are mentioned at A.IV,9. [back]
11. නිර්වාණ මාර්ගයට යොමු කරවන තත්ත්වයන් හතරෙන් තුන්වැන්න. The third of the four states leading to awakening. [back]

# පරිශිෂ්ටය II: සුනාමි, බෞද්ධ මතය

මුළු විශ්වයම එකිනෙකට සම්බන්ධ වූ හේතු ඵලයන්ගෙන් යුත් ජාලයක් බව බුදුදහමේ හේතුඵල දහම උගන්වයි. හේතු වර්ග දෙකක් ඇත - ස්වාභාවික හේතුව සහ සදාචාරාත්මක හේතුව වශයෙනි. ස්වාභාවික හේතුකාරයට මිනිසුන් හොඳ හෝ නරක වීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාකාරකමක් නැත. එය හුදෙක් විශ්වයේ විවිධ බලවේග එකිනෙකා මත ක්‍රියා කිරීම පිළිබඳ කාරණයකි. වැසි කුණාටුවක් ඇති වීම හෝ අස්වැන්නක් මේරීම ස්වාභාවික හේතුව සඳහා උදාහරණ වේ. ස්වාභාවික හේතුන්වලට නිසැකවම අපට බලපෑමක් ඇති කළ හැකිය - වර්ෂාපතනයකට හසුවීමෙන් අපට සෙම්ප්‍රතිශ්‍යාවක් ඇති විය හැකිය. නමුත් සෙම්ප්‍රතිශ්‍යාවකින් පෙළීම සදාචාරාත්මක හෝ දුරාචාරමය අතීත ක්‍රියාවක් සමග කිසිදු සම්බන්ධයක් නැත. එය ස්වාභාවික හේතුවක ස්වාභාවික බලපෑමකි. සදාචාරාත්මක හේතුව වන්නේ මිනිසුන් සිතන ආකාරය, ක්‍රියා කරන ආකාරය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ට හැඟෙන ආකාරයයි. බුදුපියාණන් වහන්සේගේ කර්මය පිළිබඳ ඉගැන්වීම සැලකිලිමත් වන්නේ සදාචාරාත්මක හේතු ගැන පමණි. යම් කෙනෙකුට උපකාර කිරීමෙන්, ඔවුන්ට ස්තුති කිරීමෙන් ඇති වන සතුට, යමක් සොරකම් කිරීම, ඒ සම්බන්ධයෙන් අල්ලා ගැනීම, ඊට පසු අපහසුතාවට හෝ ලැජ්ජාවට පත් වීම, සදාචාරාත්මක හේතු සාධක සඳහා උදාහරණ වනු ඇත. පුද්ගලයෙකු සතු සතුට හෝ අසතුට ඔවුන් ක්‍රියා කළ ආකාරයෙහි ප්‍රතිඵලයකි. පුද්ගලයෙකු ඔහුගේ ක්‍රියාවන්ට ''ප්‍රදානයක් ලැබීම'' හෝ ''දඬුවම් විඳීම'', ඔවුන්ගේ සතුට හෝ අසතුට, හුදෙක් ඔවුන් විසින් කරන ලද ක්‍රියාවන්ගේ ප්‍රතිඵලයකි. දැන් අපි මෑත කාලයේදී ඇති වූ සුනාමිය දෙස කර්ම ධර්මය සැලකිල්ලට ගනිමු.

සුනාමිය ස්වාභාවික හේතු මත සිදුවීමකට උදාහරණයකි. පෘථිවිය මතුපිට ඇති භූ චලන සම්බන්ධ තහඩු භූමිකම්පාවක් ඇති කරමින් චලනය වෙයි. එයින් මුදා හැරෙන ශක්තිය විශාල තරංග නිර්මාණය කරයි. ඒවා වෙරළ තීරයකට

පහර දුන්නොත්, විනාශයක් ඇති කළ හැකිය. මෑත කාලයේදී ඇති වූ සුනාමියෙන් එම ප්‍රදේශවල ජනතාව දුක්වේදනා වර්ග දෙකකට මුහුණ දුන්හ - ස්වාභාවික හේතූන් නිසා ඇතිවන වේදනා සහ සදාචාරාත්මක හේතූන් නිසා ඇති වන වේදනා, එනම් - කර්මය නිසාය. මහා ජලගැල්මකදී, ගසක් වැටීමෙන් පුද්ගලයෙකුට තුවාල වන්නට ඉඩ ඇත, යකඩ කැබැල්ලකට කැපී හෝ තාප්පයක වැදී පොඩි පට්ටම්වීමක් සිදු විය හැකිය. මේවා ස්වාභාවික හේතූන් නිසා ඇති වන වේදනාවලින් ඇති වන බලපෑම් සඳහා උදාහරණ වන අතර, අතීත සදාචාරාත්මක හෝ දුරාචාර ක්‍රියා සමග ඒවාට කිසිදු සම්බන්ධයක් නැත.

කර්මය, මිනිසුන් සිතාමතා සිදු කරන සිතුවිලි, වචන සහ ක්‍රියා (කර්මය) සහ එම ප්‍රතික්‍රියාවල බලපෑම් (විපාක) ගැන සැලකිලිමත් වේ. සුනාමියට මිනිසුන් ප්‍රතිචාර දැක්විය හැකි ආකාර සහ ඒවායෙන් ඇති විය හැකි බලපෑම් පිළිබඳව උදාහරණ මම දෙන්නෙමි. පුරුෂයෙකු සහ ගැහැනියක සිටියේ යැයි සිතමු. දෙදෙනාම සුනාමියෙන් තුවාල වී, නිවෙස් සහ ජීවනෝපාය අහිමිවී සිටියහ. පුරුෂයා කලකිරීමට පත් වී සිටියේය, ''ඇයි මම'' ඔහු හඬා වැටෙයි. ''මම අද නගරයෙන් බැහැරව සිටියා නම්'', ඔහු කෝපයෙන් සහ කනගාටුවෙන් කියයි. මේ ආකාරයට සිතීමෙන් ඔහු ඔහුගේ දුක්විඳීම වැඩි කර ගනියි. නමුත් ඉක්මනින්ම ඔහුගේ සිතුවිලි වෙනස් වෙයි. ඔහුගේ අසල්වැසියාගේ නිවසට සුළු හානියක් සිදු වී ඇති බව දකින ඔහු මෙසේ සිතුවේය : ''ඒ එපා කරපු මිනිසා, මා කවදාවත් ඔහුට කැමති වුණේ නැහැ. ඔහුගේ නිවසට හානියක් නොවීම කලකිරීමට හේතුවකි.'' ඔහු ඔහුගේ දුක් විඳීම් තව තවත් වැඩිකරන අතර, කෑත සහ ඍණාත්මක මානසික තත්ත්වයන් බලවත් කරමින්ද සිටියේය. පසුව, ඔහු මෙසේ සිතුවේයඃ ''හොඳයි, සෑම මිනිසෙකුටම තමන් පමණයි', ඔහු ඊට පසු, අත්හැර ගොස් ඇති නිවෙස්වලින් යමක් සොරකම් කළ හැකි දැයි බැලීමට අවට ඇවිදින්නට පටන් ගත්තේය. දැන් ඔහුගේ ඍණාත්මක සිතුවිලි සහ හැඟීම් ඍණාත්මක ක්‍රියා බවට පත්වීමට මෙහෙයවුණි.

දැන් අපි කාන්තාවගේ ප්‍රතිචාරය කෙසේ දැයි බලමු. ආරම්භක කම්පනයෙන් ඇය යළි ප්‍රකෘති තත්ත්වයට එළඹෙන විට, ඇයගේ පළමු සිතුවිල්ල වූයේඃ ''දිවි ගලවා ගැනීමට හැකිවූ මා කොතරම් වාසනාවන්තද?''. ඇය දුක් වින්ද නමුත්, පසුතැවිල්ලෙන්, බලාපොරොත්තු සුන්වීමෙන් හෝ කෝපවීමෙන් ඇයගේ දුක් විඳීම වැඩි කර ගත්තේ නැත. ඊට පසු ඈ මෙසේ සිතුවායඃ ''මට වඩා නරක තත්ත්වයට පත්වූ අය ඇති. ඔවුන්ට උපකාර කිරීමට මට කළ හැකි යමක් ඇද්දැයි මම බලමි,'' ඈ තුවාලවූවන් සොයා බැලීමට පටන් ගත්තාය. අන් අය ගැන සිතීමෙන් ඇයට ඇයගේම තත්ත්වයන් පිළිබඳව ඇති වූයේ මැදහත් බවකි. එය ඇගේ දුක තවදුරටත් වැඩි නොකරයි. ඊළඟ දවසේ රජය විසින් බෙදා හරින ආහාර ටිකක් ඇයට ලබා ගත හැකි විය. ඈ ඉදිරියට යන විට, ආහාර කිසිවක් නොලැබූ දරුවෙකු දැක ගන්නට හැකි විය. ඇය දරුවා

අස්වසමින්, එම ආහාර ඔහු සමග බෙදා ගනියි. දරුවා තනිවී සිටින බව දැන ඈ ඔහු රැකබලා ගැනීමට තීරණය කළාය. දින කිහිපයකට පසුව, දරුවාගේ පියා ඔහු දැක දරුවා රැක බලා ගැනීම ගැන ඇයට බෙහෙවින් ස්තූති කළේය. පියා මේ වන විට සිය සොහොයුරිය සමග සුනාමියෙන් පීඩාවට පත් නොවූ නගරයක ජීවත් වන අතර, ඔවුන් සමග ආහාර සහ නවාතැන් ලබා ගන්නා ලෙස ඇයට ආරාධනය කළේය. එම කාන්තාවගේ ධනාත්මක සිතුවිලි සහ ක්‍රියා දැන් ඇයගේ ජීවිතයට ධනාත්මක බලපෑමක් ඇති කර තිබේ.

දැන්, පුරුෂයා එක් ආකාරයකටත්, ස්ත්‍රිය තවත් ආකාරයකටත්, ප්‍රතිචාර දැක්වූයේ ඇයි? ඒ ඔවුන්ගේ අතීත කර්මවලට අනුව, ඔවුන් අතීතයේදී විවිධ අත්දැකීම් ලබන විට ප්‍රතිචාර දක්වා ඇති ආකාරයටයි. අතීතයේදී පුරුෂයාගේ ඍණාත්මක මානසික පුරුදුවලින් (කර්ම) අදහස් වන්නේ දැන් ඔහුට ඍණාත්මක මානසික පුරුදු ඇති බවත්, සහ එමගින් අනාගතයේදී ද ඔහුට ඍණාත්මක මානසික පුරුදු ඇති වීමට ඉඩ ඇති බවත්ය. මෙම මානසික පුරුදු නිසා ඔහු වෙනත් ලෙසකින්, වඩාත් දුක් විඳිනු (විපාක) ඇත. එම කාන්තාව (ඇය බෞද්ධ, ක්‍රිස්තියානි, මුස්ලිම් හෝ ආගමක් නැති කෙනෙකු විය හැකිය.) ඉගෙන ගෙන ඇත්තේ සහ සැමවිටම විශ්වාස කර ඇත්තේ, හොඳ සිතුවිලි සහ ක්‍රියාවන් වැදගත් බවත්ය. ඒවා වැඩිදියුණු කිරීමට සැමවිටම ඇය උත්සාහ ද කර ඇත. අතීතයේදී ඇය සතුව පැවති ධනාත්මක මානසික පුරුදු (කර්මවලින්) අදහස් වන්නේ ඇයට වර්තමානයේදී ධනාත්මක මානසික පුරුදු තිබෙන බවත්, අනාගතයේදීද ඇයට ධනාත්මක මානසික පුරුදු ඇති වීමට බොහෝ ඉඩ කඩ ඇති බවත්ය. මෙම මානසික පුරුදු ඇගේ දුක්විඳීම් අවම කර, දරුවාගේ පියා, ඇය රැක බලා ගැනීමට ද හේතු විය. වෙනත් වචනවලින් කිවහොත්, ඇයගේ අතීත ධනාත්මක ක්‍රියා (කර්ම) දැන් ධනාත්මක බලපෑමක් (විපාක) ඇති කිරීමට හේතු වී ඇත.

එනිසා, බුදුදහමට අනුව, සුනාමියෙන් කායික පීඩාවට පත්ව අත්දැකීම් ලැබීම විවිධ ස්වාභාවික හේතුන්වල ප්‍රතිඵලයකි. මෙම ස්වාභාවික හේතුන්වලට ඔවුන් ප්‍රතික්‍රියා දක්වන ආකාරය ඔවුන්ගේ කර්මයයි. එනම්, අනාගතයේදී ඔවුන්ගේ ඍණාත්මක හෝ ධනාත්මක ප්‍රතික්‍රියා (හෙට, ඊළඟ මාසය, ඊළඟ වසර, සමහර විට ඊළඟ භවය) ඔවුන්ගේ විපාක බවට පත් වේ. සීමිත දැනුමක් සහ බලයක් ඇති මිනිසුන් වශයෙන් අපට, ස්වාභාවික හේතු කෙරෙහි ඇත්තේ සීමිත බලපෑමක් පමණි. කෙසේ නමුත්, අපට එක් එත් තත්ත්වයන්ට අනුකූලව අපගේ ප්‍රතික්‍රියා සකස් කිරීමට සහ බලපෑම් කිරීමට හැකියාව ඇත. අපගේ මනස ධනාත්මක ආකාරයෙන් දියුණු කර ගැනීමට අප කිසිදු උත්සාහයක් නොගන්නේ නම්, අනාගතයේදී ඉතා ප්‍රබල අනපේක්ෂිත සහ පිළිගත නොහැකි අවස්ථාවන්ට අප ගොදුරු විය හැකිය. අපගේ මනස වර්ධනය කර ගැනීමට අප උත්සාහ දරන්නේ නම්, විශේෂයෙන්ම භාවනාව තුළින්, අනාගත විපත්තිවලදී විඳදරාගැනීමට සහ ජයග්‍රහණය කිරීමට පවා අපට වඩා හොඳින්

සූදානම් විය හැකිය. ප්‍රවෘත්ති දෙකම උදාහරණවලින් පිරී ඇත. මිනිස්සු මෙසේ අසති: ''මෙවැනි දරුණු තත්ත්වයන් යටතේ ශෝකය, කාංසාව සහ බියෙන් නිදහස්ව සිටින්නේ කෙසේද?'' නමුත්, සමහර මිනිස්සු එසේ සිටිති. ලංකාවේ එක් මිනිසෙකුට තම බිරිඳ සහ දරුවන් දෙදෙනා අහිමි විය, සැබැවින්ම ඔහු ශෝකයෙන් ඇළලී ගියේය. කෙසේ නමුත්, බුදුදහම පුහුණු කරන බෞද්ධයෙකු වශයෙන්, දින දෙකකට පසු ඔහු ශෝකයෙන් ප්‍රකෘති තත්ත්වයට පැමිණියේය. ඒ ඔහුට කුසගින්නෙන්, හඬමින්, තමන්ගේ මිය ගිය දෙමාපියන්ගේ සිරුරු අසල සිටි දරුවන් දෙදෙනෙකු හමුවූ විටය. ඔහු ඔවුන් දෙදෙනා හදාවඩා ගැනීමට තීරණය කළේය. පෙනෙන ආකාරයට වෙනත් මිනිසුන්ද එම දරුවන් දැක ඇති නමුත්, උපකාර කිරීමට කිසිවක් කර නැත. ඔහු සමග සාකච්ඡා කළ අයෙකුට ඔහු පවසා ඇත්තේ, ඔහුට දැන් තිබෙන ප්‍රශ්න මධ්‍යයේදී පවා, එම හදාවඩා ගත් දරුවන් ඔහුට අලුත් අරුතක් සහ ශක්තියක් ජීවිතය ඉදිරියට ගෙන යාමට ලබාදී ඇති බවයි. අවස්ථාවෙන් ප්‍රයෝජන ගනිමින් කොල්ලකෑමට, මංකොල්ලකෑමට සහ සොරකම් කිරීමට පෙලඹෙන මිනිසුන් පිළිබඳව තොරතුරු අපි අසා ඇත්තෙමු. අප සෑම දෙනාම අප ක්‍රියා කරන ආකාරයට කටයුතු කිරීම තෝරා ගන්නා අතර, ඒවායේ ප්‍රතිඵලද ඒ අනුව අපි අත්විඳින්නෙමු. එක් සිංගප්පූරු ජාතිකයෙක් සුනාමිය සිදුවූ අවස්ථාවේදී ඒ පිළිබඳව අසා, අනතුරට පත්වූවන්ට බෙදා දීමේ චේතනාවෙන් ඔහුගේ වාහනය පුරවා ආහාර සහ ජලය රැගෙන තායිලන්තය බලා ගියේය. ශෝචනීය ලෙස, ඔහුගේ වාහනය ලිස්සා අනතුරට පත්වී ඔහු මරණයට පත්විය: ''ඔහු යහපත් ක්‍රියා සිදු කර තිබියදීත්, ඔහුට එම ඉරණම අත්වූයේ ඇයි?'' එවැනි ප්‍රශ්නයක් ස්වාභාවික හේතු සහ සදාචාරාත්මක හේතු අතර ව්‍යාකූලත්වයක් ඇති කර තිබෙන බව පෙන්වා දෙයි. අනෙක් අයගේ දුක්විඳීම් කෙරෙහි ඉතා කඩිනම් සහ ප්‍රායෝගික ප්‍රතිචාර දැක්වීමෙන් පෙන්නුම් කරන්නේ ඔහුට මහත්වූ අනුකම්පාවක් තිබූ බවත්, එයින් ඔහුට ඊළඟ භවයේදී ඉතා ධනාත්මක ප්‍රතිඵල ලැබෙන බවත්ය. ඔහුට මුහුණ දෙන්නට සිදුවූ අනතුර ඔහුගේ යහපත් හෝ අයහපත් ක්‍රියා සම්බන්ධයෙන් කිසිදු සම්බන්ධතාවක් නැත. එය ස්වාභාවික හේතුවක ප්‍රතිඵලයකි - එනම් මොහොතකට අවධානය යොමු නොවීම, දෝෂ සහිත තිරිංග, වර්ෂාව නිසා මාර්ගය ලිස්සනසුලු වීම යනාදියයි.

යහපත් වීම යනු කිසි දිනක අප ස්වාභාවික හේතූන් මත, දුක්විඳින්නේ නැති බව නොවේ. එයින් අදහස් වන්නේ අප ස්වාභාවික හේතු මත දුක්විඳින විට, අපගේ දුක්වේදනා එකතු කරමින් සෘණාත්මක ලෙස ඒවාට ප්‍රතිචාර දැක්වීමේ ප්‍රවණතා අඩු බවයි. සුනාමියෙන් සිදුවූ මරණ සහ තුවාල සිදුවූයේ ඒ මිනිසුන්ගේ අතීත අකුසල් කර්මවල ප්‍රතිඵලයක් ලෙස බව සමහර දැනුම්වත් නොමැති බෞද්ධයෝ කියති. මෙය බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ ධර්මයට පටහැනි බව අමුතුවෙන් කිව යුතු නැත. දේවදහ සූත්‍රයේ (M.II,214, also A.I,173 ) බුදුපියාණන් වහන්සේ පැවසුවේ අප අත්දකින සෑම දෙයක්ම අතීත කර්ම

(සබ්බං තං පුබ්බේකතහේතු) නිසා සිදු වන්නේ යැයි යන විශ්වාසය සාවද්‍ය සහ මිත්‍යා අදහසක් බවයි. බුදුපියාණන් වහන්සේ සිවක සූත්‍රයේ (S. IV,228) පැවසුවේ අප සමහර විට අත්විඳින දුක් කම්කටොලු කර්මය නිසා විය හැකි බවත්, නමුත් එය රෝග, කාලගුණය, නොසැලකිල්ල හෝ බාහිර හේතූන් නිසා ද විය හැකි බවයි. මෙම හේතු අතරෙන් තුන්වැන්න සහ අවසාන හේතු මෙයට හොඳ උදාහරණ වනු ඇත. ධනාත්මක හෝ ඍණාත්මක හෝ සියලු කර්මවලට නිසැකවම බලපෑමක් ඇත. නමුත්, සියලු බලපෑම් කර්මය නිසා සිදු නොවේ.

නමුත්, මෙම ව්‍යසනයට සම්බන්ධ නොවීමට තරම් වාසනාවන්ත වූ අප ගැන කුමක් කිව යුතුද? බුදුපියාණන් වහන්සේගේ කර්මය පිළිබඳ ඉගැන්වීම අපට අදාළ වන්නේ කෙසේද? ඉහත සඳහන් පුරුෂයා සහ ස්ත්‍රිය මෙන්, සුනාමිය කෙරෙහි අපගේ ප්‍රතික්‍රියා ධනාත්මක හෝ ඍණාත්මක විය හැකිය. පුද්ගලයෙකු ඛේදවාචකය පිළිබඳව කියවා, ඔහුගේ උරහිස් ගස්සා ක්‍රීඩා පිටුවට යොමුවිය හැකිය. ඛේදවාචකයට පත්වූවන්ට ආධාරයක් දෙන ලෙස ඉල්වූ විට ඔහු මේ සතියේ මුදල් නැතැයි කියමින් කිසිවක් දීම ප්‍රතික්ෂේප කළ හැකිය. නැතහොත්, ඔහු ආධාරයක් කර, ඊට පසු සැම තැනම, සැම දෙනාටම ඔවුන්ගේ ඇගයීම හෝ අනුමැතිය ලබා ගැනීම සඳහා ඒ බව කියන්නට ඉඩ තිබේ.

ඔහු සැම විටම කළ ආකාරයට වඩා වෙනස් ලෙස ප්‍රතිචාර දැක්වීමට අවස්ථාවක් ලබා දී ඇත. නමුත්, එයින් ප්‍රයෝජන ගැනීමට ඔහු අපොහොසත් වී ඇත. ඔහු වැඩිදියුණු වී වෙනස් වීමට අපොහොසත් වී ඇත. ඔහු හුදෙක් ඔහුගේ පැරණි පුරුදු (අතීත කර්ම), වන නොසැලකිලිමත් බව, ලෝභය, උඩඟුකම, සහ උනන්දුවක් නැතිකම ඉදිරියට ගෙනයාමට ඉඩ දී ඇත. නමුත්, කෙනෙකු සැමවිටම වඩා නොසැලකිලිමත් සහ තමා තුළම ගැලීමෙන් යුක්ත වූවායැයි කියමු. නමුත්, සුනාමියෙන් විපතට පත්වූවන් රූපවාහිනියෙන් දකින විට ඇයට ස්ථානීයව හට ගන්නා තියුණු වේදනාකාරී අනුකම්පාවක් දැනේ. ඊට පසු, අතීතයේදී ඇය සිදු කළ පරිදි අනුකම්පාවේ චංචලනයෙන් නොසලකනවා වෙනුවට, ඇය ඒ අනුව ක්‍රියා කිරීමට තීරණය කළාය. ඇය රතු කුරුස සංවිධානයට ගොස්, සැබැවින්ම ත්‍යාගශීලී පරිත්‍යාගයක් කළාය. එතැන සිටින විට, ස්වේච්ඡා සේවකයන් බඳවා ගැනීම පිණිස තිබූ දැන්වීම දැක, ක්ෂණිකවම අත්සන් තබා, ඊළඟ සති කිහිපය තුළ ඇයගේ සියලු නිදහස් කාලය පරිත්‍යාග එකතු කිරීමට සහ වෙනත් ආකාරවලින් උපකාර කිරීමට කාලය ගත කළාය. එහි ප්‍රතිඵලයක් ලෙස, ඇය ඇගේ ආත්මාර්ථකාමී මානසික පුරුදු දුර්වල කර ධනාත්මක පුරුදු ශක්තිමත් කර ගන්නට ඇත. යම් තරමකට ඇය දියුණු වී වෙනස් වන්නට ඇත. හැකි අවස්ථාවලදී එවැනි ධනාත්මක ආකාරවලට අනාගතයේදී ක්‍රියා කළහොත්, ඇය ක්‍රමයෙන් වඩා ප්‍රසන්න පුද්ගලයෙකු බවට පත්වනු ඇත. සමහර විට වඩා සතුටෙන් සිටින පුද්ගලයෙකු

වන්නට ඉඩ ඇත. මේ අනුව, සුනාමිය වැනි ඛේදවාචකයට පවා සැබැවින්ම ධනාත්මක පැත්තක් තිබිය හැකිය. පළමුව, එය ත්‍යාගශීලීත්වය, සැලකිල්ල සහ කරුණාව වර්ධනය කර ගැනීමට අවස්ථාවක් විය හැකිය. දෙවනුව, දුක්ඛ සත්‍යය පිළිබඳව මෙනෙහි කිරීමට අපට අවස්ථාවක් විය හැකිය, ජීවිතයේ කොන්දේසි සහිත ලෝකය  අසතුටුදායක බව බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ ධර්මය මෙනෙහි කිරීමට අවස්ථාවක් වේ. එවැනි මෙනෙහි කිරීමෙන් කිසිවක් ගණනකට නොගෙන සිටීමේ අපගේ පුරුද්දෙන් අපට අවදි විය හැකිය. අපගේ ජීවිතය කෙතරම් සැපපහසු වුවත්, එය ඕනෑම වේලාවක  වෙනස් විය හැකි බව අපට මතක් කර දෙයි. හරයක් නැති ලෞකික ලුහුබැඳීම්වලින් ආධ්‍යාත්මික අරමුණු කරා අප හැරවීමට මෙය උපකාරී වේ.

# සංක්ෂිප්තයන්

| | |
|---|---|
| A | අංගුත්තර නිකාය Anguttara Nikaya, |
| Cp | චරියාපිටක Cariyapitaka, |
| Cp-a | චරියාපිටක අත්ථකථා Cariyapitaka Atthakatha |
| Dhs | ධම්මසංගනී Dhammasangani, |
| Dhp | ධම්මපද Dhammapada, |
| It | ඉතිවුත්තක Itivuttaka, |
| Ja | ජාතක සහ විවරණ Jataka and its commentary. |
| M | මජ්ඣිම නිකාය Majjhima Nikaya. |
| Mv | මහාවස්තු Mahavastu |
| Mil | මිලින්දපඤ්හ Milindapanha. |
| S | සංයුත්ත නිකාය Samyutta Nikaya. |
| Sn | සුත්ත නිපාත Sutta Nipata. |
| Th, Thi | ථේරගාථා සහ ථේරීගාථා Theragatha and Therigatha. |
| Ud | උදාන Udana. |
| Vin | විනය Vinaya. |
| Vism | විසුද්ධිමග්ග Visuddhimagga. |

මිනිසුන් දුප්පත් වන්නේ ඔවුන්ගේ අවසාන ජීවිතයේ ත්‍යාගශීලීභාවය නොමැතිකම නිසා යන්න ඇත්තක් ද? ඔබ මේ ජීවිතයේ වැරදි ලෙස හැසිරුණහොත්, ඔබ කැරපොත්තෙකු ලෙස නැවත ඉපදිය හැකි ද? 2004 වසරේදී ඇති වූ සුනාමියෙන් මිනිසුන් දහස් ගණනක්ගේ මරණය සිදුවීම සාමුහික කර්මයට උදාහරණයක් ද? ඊටත් වඩා වැදගත් වන්නේ බුදුපියාණන් වහන්සේ කවදා හෝ එවැනි දේ උගන්වා තිබේද?

මුල් කාලීන පැරණි බෞද්ධ ග්‍රන්ථවල විස්තර කර ඇති පරිදි කර්මය සහ පුනර්භවය, පසුකාලීන බෞද්ධයන් විසින් අවබෝධ කර ගත් ආකාරය සහ අද ඒවා බොහෝ විට විඥානවාදී සහ නූතන අදහස් අදහස් සමග පටලවාගෙන ඇති ආකාරයට වඩා සැලකිය යුතු ලෙස වෙනස් වන බව මෙම ග්‍රන්ථයේ කතුවරයා තර්ක කරයි. කර්මය සහ පුනර්භවය පිළිබඳ බුදුපියාණන් වහන්සේගේ අදහස් නිසිලෙස අවබෝධ කර ගත් විට, යහපත් ආචාර ධර්ම, මානුෂීය සහ දයානුකම්පාව පෙරදැරි සමාජ බැඳීම සහ නිරවුල් ප්‍රායෝගික බුද්ධියට එකඟව පදනම සකස් වන බව බෞද්ධ ග්‍රන්ථවලින් උන්වහන්සේ බොහෝ උපුටා දැක්වීම් භාවිත කරමින් පෙන්වා දෙති.

පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික ස්වාමීන් වහන්සේ ඕස්ට්‍රේලියාවේ උපත ලබා, වයස අවුරුදු 18දී බෞද්ධයෙකු විය. 1970 දශකයේ මුල් කාලයේදී ඔහු භික්ෂුවක වීම සඳහා තායිලන්තයට සහ බුරුමයට ගොස්, අවසානයේ ඉන්දියාවට ගොස් අනගාරික ධර්මපාලතුමාගේ අවසන් ශ්‍රාවකයා වූ පූජ්‍ය මාටිවැල්ලේ සංඝරතන හිමියන් යටතේ 1976දී පැවිදි වූහ.

එතැන් සිට උන්වහන්සේ ශ්‍රී ලංකාවේ සහ සිංගප්පූරුවේ වැඩ විසූහ. ධම්මික ස්වාමීන් වහන්සේ ශ්‍රී ලංකාවේ කැලණිය විශ්ව විද්‍යාලයේ පාලි සහ බෞද්ධ අධ්‍යයනය පිළිබඳව පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යාපනය ලැබූ අතර, නිලඹේ භාවනා මධ්‍යස්ථානයේ සම-ප්‍රාරම්භකයෙක් ද වූහ. උන්වහන්සේ 2000 වසරේ දී බර්ලිනයේ පැවැත්වූ යුරෝපීය බෞද්ධ සංගමයේ සහස්‍ර වර්ෂ සම්මේලනයේ ථේරවාදය නියෝජනය කළහ.

ප්‍රසිද්ධ ධර්ම කථිකයෙකු සහ ලේඛකයෙකු වන ධම්මික හිමියෝ බුදුදහමේ විවිධ කරුණු පිළිබඳව ග්‍රන්ථ රාශියක් රචනා කර ප්‍රකාශයට පත් කර ඇති අතර, උන්වහන්සේගේ වඩාත් ජනප්‍රිය ග්‍රන්ථය වූ 'හොඳ ප්‍රශ්න - හොඳ පිළිතුරු' යන ග්‍රන්ථය භාෂා 30කට වැඩි ප්‍රමාණයකට පරිවර්තනය කර ඇත.

උන්වහන්සේ වර්තමානයේ උතුරු ඕස්ට්‍රේලියාවේ අර්ධ-හුදෙකලාවේ වැඩ වසති.